259 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 259 - இல. 02
Volume 259 - No. 02

2018 මාර්තු 07වන බදාදා
2018 மார்ச் 07, புதன்கிழமை
Wednesday, 07th March, 2018

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්න:**

උතුරු පළාතේ ස්වේච්ඡා ගුරුවරුන්ට ස්ථිර පත්වීම්

**ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව:**

සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

**පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය:**

සම්මත කරන ලදි.

**ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි.

**ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි.

**බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදි.

---

# பிரதான உள்ளடக்கம்

**நிலையியற் கட்டளைகள் பற்றிய குழுவின் அறிக்கை**

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை**

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

வட மாகாணத் தொண்டர் ஆசிரியர்களுக்கு நிரந்தர நியமனம் வழங்குதல்

**நிலையியற் கட்டளைகள் பற்றிய குழுவின் அறிக்கை**

திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவை**

நிறைவேற்றப்பட்டது

**மிகைப்பொருள் திணிப்பெதிர்ப்பு மற்றும் எதிரீட்டுத்தீர்வைகள் சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம்முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**முற்பாதுகாப்பு வழிமுறைகள் சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம்முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்படுதலிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் பற்றிய சர்வதேசச் சமவாயச் சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம்முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

---

# PRINCIPAL CONTENTS

REPORT OF THE COMMITTEE ON STANDING ORDERS

PUBLIC FINANCE COMMITTEE REPORT

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Permanent Appointments to Volunteer Teachers in Northern Province

REPORT OF THE COMMITTEE ON STANDING ORDERS:

Passed as amended

CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT:

Passed

ANTI-DUMPING AND COUNTERVAILING DUTIES BILL:

Read a Second, and the Third time, and passed as amended

SAFEGUARD MEASURES BILL:

Read a Second, and the Third time, and passed as amended

INTERNATIONAL CONVENTION FOR THE PROTECTION OF ALL PERSONS FROM ENFORCED DISAPPEARANCE BILL:

Read a Second, and the Third time, and passed

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2018 මාර්තු 07වන බදාදා***
*2018 மார்ச் 07, புதன்கிழமை*
*Wednesday, 07th March, 2018*

**අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් 2001, 2002, 2003, 2004, 2005, 2006, 2007, 2008, 2009 සහ 2010 වර්ෂ සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා මම ඉදිරිපත් කරමි.

එම වාර්තා ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් නියමයන් මම ඉදිරිපත් කරමි.

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 10 දිනැති අංක 2053/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව සබරගමුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයක් පිහිටුවීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 29 දිනැති අංක 2056/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## நிலையியற் கட்டளைகள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF THE COMMITTEE ON STANDING ORDERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග කාලීනව සංශෝධනය කිරීම සඳහා යෝජිත ස්ථාවර නියෝග කෙටුම්පත ඇතුළත් කරන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභා වාර්තාව 2017 නොවැම්බර් 07වැනි දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව 2018.02.19වැනි දින පාර්ලිමේන්තුවේදී විවාදයට ලක් කළ අතර එහිදී ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා තව දුරටත් සලකා බැලීමට කරන ලද ඉල්ලීම පරිදි ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ සහ සිව් සාමාජික විශේෂ කාරක සභාවේ මන්ත්‍රීවරුන් ද ඇතුළුව සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් විශේෂ රැස්වීමක් 2018.03.05 වැනි දින පවත්වන ලදී.

එම විශේෂ රැස්වීමේදී මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා පිළිබඳව 2018.03.06වැනි දින රැස්වූ කාරක සභාව නැවතත් දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර එම යෝජනා සංශෝධිත ආකාරයෙන් ඇතුළත් ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව මම පිළිගන්වමි.

***එම වාර්තාව සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*இவ்வறிக்கை சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the said Report do lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on "Notification under Excise Ordinance", which was referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) භාර (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත යටතේ 60වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 61වැනි වගන්තිය යටතේ නියෝග;

(iii) (276 වැනි අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥා පනතේ 7වැනි වගන්තිය යටතේ රීති; සහ

(iv) 2013 සහ 2014 වර්ෂ සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රුවන් විජයවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් තුන මම පිළිගන්වමි.

(1) තංගල්ල, ශ්‍රී ලංකා බන්ධනාගාරයේ සේවය කරන එල්.ඒ. ඉන්දික ලසත් කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) දියතලාව, විහාරකැලේ, "තරුෂි" යන ලිපිනයෙහි පදිංචි එස්.එම්.පී. සංජීවනී සන්දනායක මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) දියතලාව, පහළ කදුරුගමුව, ඇල්ලෙබැද්දේගල පාර යන ලිපිනයෙහි පදිංචි ටී.එම්. දීපා ශ්‍රියාකාන්ති මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, කොට්ටාව, මාලපල්ල, අතුරුගිරිය පාර, අංක 248 සී දරන ස්ථානයෙහි පදිංචි ඒ.ආර්. සමිතදාස මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිළුම් අමුණුගම මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාව : විස්තර
### இலங்கைக் கணக்காய்வு சேவைப் பிரமாணக் குறிப்பு: விபரம்
### SRI LANKA AUDIT SERVICE MINUTES: DETAILS

138/'15

**1. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාව සකස් කිරීමට පත් කරන ලද විද්වත් කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද;

(ii) එම කමිටුව පත් කළ දිනය කවරේද;

(iii) එම කමිටුව මෙම ව්‍යවස්ථාව සකස් කර අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාව සම්මත කිරීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

(iii) නොඑසේ නම්, විගණන සේවා ව්‍යවස්ථාව සම්මත කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයකදීද;

(v) මෙම සේවා ව්‍යවස්ථාව සම්මත කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும் சட்டமும் ஒழுங்கும் பற்றிய அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை கணக்காய்வு சேவைப் பிரமாணக் குறிப்பைத் தயாரிப்பதற்காக நியமிக்கப்பட்ட நிபுணர்கள் குழுவின் அங்கத்தவர்கள் யார்;

(ii) மேற்படி குழு நியமிக்கப்பட்ட திகதி யாது;

(iii) மேற்படி குழு குறித்த சேவைப் பிரமாணக் குறிப்பைத் தயாரித்துமுடித்த திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கை கணக்காய்வு சேவைப் பிரமாணக் குறிப்பை நிறைவேற்றுவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், அது எத்திகதியில்;

(iii) இன்றேல், கணக்காய்வு சேவைப் பிரமாணக் குறிப்பை நிறைவேற்றுவதற்கு நடவடிக்கை மேற்கொள்வாரா;

(iv) ஆமெனில், அது எத்திகதியில்;

(v) மேற்படி சேவைப் பிரமாணக் குறிப்பை நிறைவேற்றுதல் தாமதமாவதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister, Minister of National Policies and Economic Affairs and Minister of Law and Order:

(a) Will he inform this House-

(i) the members of the expert committee appointed to prepare the Sri Lanka Audit Service Minutes;

(ii) the date of appointment of the committee; and

(iii) the date, the committee completed the Service Minutes?

(b) Will he also inform this House-

(i) whether action has been taken to adopt the Sri Lanka Audit Service Minutes;

(ii) if so, the date;

(iii) if not, whether measures will be taken to adopt the Audit Service Minutes;

(iv) if so, the date; and

(v) the reasons for delaying the adoption of the aforesaid Service Minutes?

(c) If not, why?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) විගණන සේවා ව්‍යවස්ථාව සකස් කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ආ) (i) ඔව්.

(ii) 1984 මාර්තු මස 20වන දින.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මීට කලකට පෙර ශ්‍රී ලංකා විගණන සේවා සංගමය විසින් එවන ලද ලිපියකුත් මගේ අතේ තිබෙනවා. රාජ්‍ය ආදායම් ප්‍රභවය පිළිබඳව වගකීම දරන ආයතනය විධියට විගණකාධිපති දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වන, විගණන සේවා ව්‍යවස්ථාව අනුමත කර ගැනීම සම්බන්ධ ක්‍රමවේදයට අමාත්‍යාංශය දක්වන්නේ මොන විධියේ දායකත්වයක්ද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, විගණන සේවා ව්‍යවස්ථාව පිළිබඳව එතුමාගේ ප්‍රශ්නයට අපි පිළිතුරු දුන්නා. 1984 මාර්තු මස 20 වන දින තමයි එය ස්ථාපිත කරලා තිබෙන්නේ. එහි යම් යම් සංශෝධන කරන්න ඕනෑය කියලා 2013දී ඒ සම්බන්ධයෙන් වෙනම කමිටුවක් පත් කරලා තිබුණා. ඒ කමිටුවේ නිර්දේශයක් තමයි ඒ විගණන සේවා ව්‍යවස්ථාව සංශෝධනය කරන්න ඕනෑය කියන එක. නමුත් මේ වන කොට සංශෝධන සහිත විගණන පනත් කෙටුම්පතක් පිළිබඳව ඉදිරියට කටයුතු කරන්න මේ අවුරුද්දේ පෙබරවාරි 27 වන දා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා සඳහන් කළ කාරණය පැන නැඟුණේ 2013 දීයි. 2013දී මා මේ ප්‍රශ්නය අහපු වෙලාවේ, එදා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා වශයෙන් සිටි දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් මෙයට උත්තරයක් දුන් බව මට මතකයි.

එතුමාට ඒ කාරණය මතකද දන්නේ නැහැ. ඒ වෙලාවේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමා දීපු උත්තරය මා ළඟ තිබෙනවා. එතුමා සඳහන් කළේ, "මාස තුනක් ඇතුළත මේ ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාවට අදාළ කාරණය විසඳනවා"ය කියලායි. දැන් ආපසු වතාවක් පෙබරවාරි මාසයේ ඒ පිළිබඳ කමිටුවක් පත් කරනවා. ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාව පිළිබඳව සියලු පාර්ශ්වවල අදහස් අරගෙන, ඒ අයගේ වෘත්තීය ගරුත්වය ආරක්ෂා වන විධියට, ඒ අයට ආත්ම තෘප්තියෙන් යුතුව වැඩ කරන්න පුළුවන් වන විධියට මේ ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාව සඳහා අවශ්‍ය සංශෝධන කටයුතු කරයි, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගනීවි කියලා දැන් විගණන නිලධාරින් බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ නිසා තමයි ශ්‍රී ලංකා විගණන සේවා සංගමය මේ මන්ත්‍රීවරුන්ට ලිපියක් යොමු කරමින්, මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියා ඉල්ලන්නේ.

පසුගිය මැතිවරණයේදී මේ රටේ ජනතාව ආණ්ඩුවට සංඥාවක් දුන්නා. ඒ වාගේම, හොරු ඇල්ලීම පිළිබඳ කාරණයේදී අපේ පසුගාමීත්වය පිළිබඳව අපට බරපතළ චෝදනා එල්ල වෙනවා. ඒ නිසා අපි වහාම සිදු කර ගත යුතු, අවශ්‍ය මූලික ව්‍යුහාත්මක වෙනස්කම්වත් අපට කරන්න බැරි වුණොත්, ඒක ඛේදවාචකයක් බවට පත් වෙනවා. කොපමණ කාල රාමුවක් තුළ මේ කටයුත්ත නිමා කරලා, විගණන සේවයේ නිලධාරින් තෘප්තිමත් කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න අමාත්‍යාංශයට හැකි වේවිද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, මට ඒ පිළිබඳ කාල වකවානුවක් මෙතැන කියන්න බැහැ. නමුත් ඒ කාරණය මම ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානයට යොමු කරලා, ඉතාම කඩිනමින් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න සලස්වන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හදිසි කටයුත්තක් වශයෙන් ඒ කාරණය කෙරෙහි අවධානය යොමු කරන්න, ගරු ඇමතිතුමා.

ප්‍රශ්න අංක 2 - 1199/'16 - (3), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 - 1402/'16 - (2), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, අද දින මෙම න්‍යාය පත්‍රයේ පෙළ ගස්වා තිබෙන ප්‍රශ්න 15, අඩුම තරමින් දෙවැනි වතාවට හෝ තුන්වැනි වතාවට අහන ප්‍රශ්න. මේ ප්‍රශ්න 15ම මීට කලින් අහපු ඒවා. පිළිතුරු අපේක්ෂාවෙන් අදත් ඒවා අහලා තිබෙනවා. ඉතින් මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න ගරු ඇමතිවරුන් දිගින් දිගටම සහභාගි නොවෙන්නේ ඇයි කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. අද මුළු රටේම තිබෙන්නේ අරාජික තත්ත්වයක්; රජයක් නැති තත්ත්වයක්. විශේෂයෙන් සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සියලු මිනිසුන්ගේ ජීවිත ආරක්ෂාව වෙනුවෙන් හදිසි තීරණ ගැනීම සඳහා පාර්ලිමේන්තුව -ව්‍යවස්ථාදායකය- මීට වඩා වගකීමකින් මැදිහත් විය යුතුයි කියලායි අපි කල්පනා කරන්නේ. දැනට තිබෙන්නේ අරාජික තත්ත්වයක්. ඇමතිවරුන් ප්‍රශ්නවලට උත්තර දෙන්නවත් පැමිණෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග සංශෝධනයේදී ඒ ගැන අවධානය යොමු කරලා ප්‍රශ්නයකට තුන් වතාවකට වඩා කල් නොදෙන්න අපි තීරණය කළා. ඒ තීරණය ගැනීම ගැන ඒ කමිටුවට බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 4 - 1508/'17 - (3), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera )
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 1639/'17 - (3), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

## රත්මලාන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය: පාඨමාලා
## இரத்மலானை தொழிற்பயிற்சிப் பல்கலைக்கழகம்: பாடநெறிகள்
## UNIVERSITY OF VOCATIONAL TECHNOLOGY, RATMALANA: COURSES

1648/'17

**6. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රත්මලාන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක වන පීඨ සහ දෙපාර්තමේන්තු කවරේද;
(ii) එම එක් එක් පීඨය මඟින් පවත්වනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලා වෙන් වෙන් වශයෙන් කවරේද;
(iii) දැනට මෙහි සේවයේ නියුතු අධ්‍යයන හා අනධ්‍යයන සේවක සංඛ්‍යාව, එක් එක් දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;
(iv) මෙම විශ්වවිද්‍යාලයේ පවතින සේවක පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்மலானை தொழிற்பயிற்சிப் பல்கலைக்கழகத்தில் தற்போது இயங்கும் பீடங்கள் மற்றும் திணைக்களங்கள் யாவையென்பதையும்;
(ii) அந்த ஒவ்வொரு பீடத்தினாலும் நடத்தப்படும் தொழிற்பயிற்சிப் பாடநெறிகள் வெவ்வேறாக யாவையென்பதையும்;

( iii ) தற்போது இங்கு பணிபுரியும் கல்வி மற்றும் கல்வி சாரா ஊழியர்களின் எண்ணிக்கை ஒவ்வொரு திணைக்களத்திற்கமைய வெவ்வேறாக யாவையென்பதையும்;

( iv ) இந்தப் பல்கலைக்கழகத்தில் நிலவும் ஊழியர் வெற்றிடங்களை நிரப்புவதற்காக அமைச்சு எடுக்கும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Skills Development and Vocational Training:

(a) Will he inform this House-

(i) what Faculties and Departments are in operation at the University of Vocational Technology at Ratmalana at present;

(ii) what vocational training courses are conducted by each such Faculty, separately;

(iii) how many members of academic and non-academic staff are serving at each Department of the University, separately; and

(iv) what steps are being taken by the Ministry to fill the existing vacancies on the staff of the University?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) රත්මලානේ පිහිටි වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පහත සඳහන් පීඨ සහ දෙපාර්තමේන්තු ක්‍රියාත්මක වේ.

1. කර්මාන්ත හා වෘත්තීය තාක්ෂණ පීඨය (FIVT)

* ගොඩනැඟිලි සේවා තාක්ෂණ දෙපාර්තමේන්තුව
* නිෂ්පාදන තාක්ෂණ දෙපාර්තමේන්තුව
* යාන්ත්‍රි විද්‍යුත් තාක්ෂණ දෙපාර්තමේන්තුව
* කෘෂිකර්ම හා ආහාර තාක්ෂණ දෙපාර්තමේන්තුව
* ඉදිකිරීම් තාක්ෂණ දෙපාර්තමේන්තුව
* සිනමා හා රූපවාහිනී දෙපාර්තමේන්තුව
* හෝටල් කළමනාකරණ දෙපාර්තමේන්තුව

2. පුහුණු කිරීම් තාක්ෂණ පීඨය (FTT)

* අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව
* කළමනාකරණ අධ්‍යයන දෙපාර්තමේන්තුව
* තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තුව
* භාෂා අධ්‍යයන දෙපාර්තමේන්තුව.

(ii) කර්මාන්ත හා වෘත්තීය තාක්ෂණ පීඨය (FIVT)

* නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය
* මෙකාට්‍රොනික් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය
* ගොඩනැඟිලි සේවා තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය
* ඉදිකිරීම් හා සම්පත් කළමනාකරණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය
* ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය
* ආහාර සැකසුම් තාක්ෂණය පිළිබඳ උපාධිය
* සිනමා සහ රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය

පුහුණු කිරීම් තාක්ෂණ පීඨය (FTT)

* ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය
* මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය
* බහු මාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය
* ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය
* තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය
* කර්මාන්ත කළමනාකරණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය

(iii) අධ්‍යයන කාර්ය මණ්ඩලය

| | පීඨය | කථිකාචාර්ය |
|---|---|---|
| | කර්මාන්ත හා වෘත්තීය තාක්ෂණ පීඨය (FIVT) | |
| 1 | පීඨාධිපති කාර්යාලය | 1 |
| 2 | ගොඩනැඟිලි සේවා තාක්ෂණ දෙපාර්තමේන්තුව | 5 |
| 3 | නිෂ්පාදන තාක්ෂණ දෙපාර්තමේන්තුව | 3 |
| 4 | යාන්ත්‍රි විද්‍යුත් තාක්ෂණ දෙපාර්තමේන්තුව | 5 |
| 5 | කෘෂිකර්ම හා ආහාර තාක්ෂණ දෙපාර්තමේන්තුව | 4 |
| 6 | ඉදිකිරීම් තාක්ෂණ දෙපාර්තමේන්තුව | 5 |
| 7 | සිනමා හා රූපවාහිනී දෙපාර්තමේන්තුව | 2 |
| 8 | හෝටල් කළමනාකරණ දෙපාර්තමේන්තුව | 1 |
| | එකතුව | 26 |
| | පුහුණු කිරීම් තාක්ෂණ පීඨය (FTT) | |
| 1 | පීඨාධිපති | 1 |
| 2 | අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව | 4 |
| 3 | කළමනාකරණ අධ්‍යයන දෙපාර්තමේන්තුව | 5 |
| 4 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තුව | 6 |
| 5 | භාෂා අධ්‍යයන දෙපාර්තමේන්තුව 7 | |
| | එකතුව | 23 |

අනධ්‍යයන කාර්ය මණ්ඩලය

අනධ්‍යයන කාර්ය මණ්ඩලය පීඨ වශයෙන් වෙන්කර නොමැති අතර, සංචිතයක් වශයෙන්

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

කටයුතු කරනු ලබයි. දැනට සේවයේ නියුක්ත සේවක සංඛ්‍යාව 121කි. ඇමුණුම 01 බලන්න. ඇමුණුම **සභාගත*** කරමි.

ඇමුණුම 01

කාර්යමණ්ඩල තොරතුරු 2017.10.23 දිනට

අනධ්‍යයන කාර්යමණ්ඩලය

| අනු අංක | තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | සත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | ජ්‍යෙෂ්ඨ මට්ටම | | | |
| 1 | උපකුලපති | 1 | 1 | 0 |
| 2 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| 3 | අධ්‍යක්ෂ (මුදල්) | 1 | 1 | 0 |
| 4 | අධ්‍යක්ෂ (මාධ්‍ය හා තොරතුරු සේවා) | 1 | 1 | 0 |
| 5 | අධ්‍යක්ෂ (ප්‍රවේශ,තත්ත්ව පාලන අනුමත කිරීම) | 1 | 1 | 0 |
| | තෘතීය මට්ටම | | | |
| 6 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | 1 | 1 | 0 |
| 7 | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති | 1 | 1 | 0 |
| | ද්විතීක මට්ටම | | | |
| 8 | සහකාර මූල්‍යාධිකාරී | 3 | 3 | 0 |
| 9 | සංඛ්‍යාන නිලධාරී | 1 | 0 | 1 |
| 10 | සහකාර ලේඛකාධිකාරී | 3 | 2 | 1 |
| 11 | නිෂ්පාදක | 1 | 1 | 0 |
| 12 | අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| 13 | පද්ධති පාලක | 2 | 1 | 1 |
| 14 | සහකාර පුස්තකාලයාධිපති | 3 | 2 | 1 |
| 15 | ආශ්‍රිත නිලධාරී | 18 | 16 | 2 |
| 16 | වැඩ අධිකාරී | 1 | 1 | 0 |
| 17 | වැඩසටහන් නිලධාරී | 2 | 2 | 0 |
| | ප්‍රාථමික මට්ටම | | | |
| 18 | කාර්මික නිලධාරී (ආලෝකකකරණ) | 1 | 1 | 0 |
| 19 | කාර්මික නිලධාරී (පරිගණක) | 1 | 1 | 0 |
| 20 | කාර්මික නිලධාරී (විද්‍යාගාර) | 4 | 4 | 0 |
| 21 | කළමනාකරණ සහකාර | 45 | 44 | 1 |
| 22 | රියදුරු | 7 | 7 | 0 |
| 23 | වීඩියෝ කැමරා ශිල්පී | 4 | 2 | 2 |
| 24 | ශ්‍රව්‍ය දෘෂ්‍ය පටිගත කරන්නා | 1 | 1 | 0 |
| 25 | විදුලි කාර්මික | 1 | 0 | 1 |
| 26 | ජලනල කාර්මික | 1 | 0 | 1 |
| 27 | විද්‍යාගාර සහකාර | 1 | 1 | 0 |
| 28 | වායු සමීකරණ ශිල්පී | 1 | 0 | 1 |
| 29 | පුස්තකාල සහායක | 1 | 1 | 0 |
| 30 | උයන්පල්ලා | 1 | 0 | 1 |
| 31 | පරිගණක විද්‍යාගාර සහායක | 1 | 1 | 0 |
| 32 | කාර්යාල සහායක | 22 | 21 | 1 |
| 33 | බස් කොන්දොස්තර/කාර්යාල සහායක | 1 | 1 | 0 |
| | එකතුව | 135 | 121 | 14 |

පහත සඳහන් තනතුරු ඉදිරියෙන් දක්වා ඇති සංඛ්‍යාව දරන්නාට පමණක් පෞද්ගලික වනසේ තබා ඇත.

| | |
|---|---|
| පද්ධති පාලක | 1 |
| කාර්මික නිලධාරී (ආලෝකකරණ) | 1 |
| කළමනාකරණ සහකාර | 1 |
| රියදුරු | 1 |

(iv) ඔව්.

පුරප්පාඩු සේවක සංඛ්‍යාව දැනට ද්විතියික මට්ටමේ 06ක් සහ ප්‍රාථමික මට්ටමේ 08ක් වශයෙන් පවතින අතර, එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, මේ අවස්ථාවේ ගරු නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා නැති නිසා ඔබතුමා මගේ අතුරු ප්‍රශ්නය එතුමාට යොමු කරයි කියා මා බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම රත්මලාන වෘත්තීය පුහුණු විශ්වවිද්‍යාලයේ ඉතා වැදගත් පාඨමාලා රාශියක් අපේ රටේ උසස් අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වෙනවා. ගරු ඇමතිතුමනි, අද තිබෙන ප්‍රශ්නය තමයි, විශේෂයෙන්ම බැලුවාම ඒ සියලු දරුවෝ අධ්‍යාපනය ලබාගෙන -දැනුම ලබාගෙන- ඊට පස්සේ උපාධිය ලබාගත්තත් ඔවුන්ගේ සේවය මේ රටට සපයන්න නොහැකි වීම. බොහෝ ශිෂ්‍යයෝ අධ්‍යාපනය ලබාගෙන විදේශ රටවලට යනවා. එම නිසා මම යෝජනාවක් කරන්න කැමැතියි. එහි අධ්‍යාපනය ලබන දරුවන්ගේ හැකියාවන් දේශීය ආර්ථිකයට යොදාගන්න පුළුවන් වැඩ සටහනක් හදලා තිබෙනවාද, එහෙම නැත්නම් එවැනි වැඩ සටහනක් හදන්න කියලා මා අමාත්‍යාංශයට යෝජනා කරන්න කැමැතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

අපි එම කරුණ අදාළ අමාත්‍යතුමාට යොමු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 7 -1669/'17- (2), ගරු අශෝක ප්‍රියන්ත මහතා.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Question No. 8 - 1690/'17 -(2) The Hon. Douglas Devananda.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்தக் கேள்வியைக் கேட்கிறேன்.

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)
Sir, I ask for two weeks' time to answer this Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 - 1695/'17 - (3), ගරු මොහොමඩ් නවවි මහතා.- *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 - 1697/'17 - (2), ගරු බිමල් රත්නායක මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 11 - 1732/'17 - (3), ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා.- [සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 12 - 1743/'17 - (2), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා.- [සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 13 - 1750/'17 - (3), ගරු ලකී ජයවර්ධන මහතා.- [සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 14 - 1842/'17 - (2), ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය.

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்தக் கேள்வியைக் கேட்கிறேன்.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 15 - 1879/'17 - (2), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.- *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 2 - 1199/'16 - (3), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 1639/'17 - (3), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 - 1695/'17 - (3), ගරු මොහොමඩ් නවවි මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මොහොමඩ් නවවි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 - 1697/'17 - (2), ගරු බිමල් රත්නායක මහතා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, බිමල් රත්නායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් සහ විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## උතුරු හා නැගෙනහිර මුස්ලිම් පාසල් : ඉස්ලාම් අධ්‍යයනය සහ අරාබි ඉගැන්වීම
## வடக்கு, கிழக்கு முஸ்லிம் பாடசாலைகள்: இஸ்லாமியக் கற்கைகள் மற்றும் அரபு கற்பித்தல்
## MUSLIM SCHOOLS IN NORTHERN AND EASTERN PROVINCES: TEACHING OF ISLAMIC STUDIES AND ARABIC

1732/'17

11. **ගරු බුද්ධික පතිරණ මහතා (ගරු සෙයියිඩ් අලි සාහීර් මවුලානා මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Seyed Ali Zahir Moulana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත් තුළ පිහිටි එක් එක් අධ්‍යාපන කලාපයට අයත් මුස්ලිම් පාසල් සංඛ්‍යාව කවරේද;

(ii) ඉස්ලාම්, ඉස්ලාම් අධ්‍යයනය සහ අරාබි ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය සිදු කරන සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ (ඉස්ලාම්) නම් කවරේද;

(iii) සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් (ඉස්ලාම්) නොමැති අධ්‍යාපන කලාපවල නම් කවරේද;

(iv) මෙම කලාපවල ඉහත කී විෂයයන් ඉගැන්වීම අධීක්ෂණය කිරීමේ කාර්යය පවරනු ලැබ ඇති අධීක්ෂකවරුන් කවුරුන්ද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (විශේෂ කාණ්ඩය - ඉස්ලාම්) සඳහා පුරප්පාඩු දෙකක් පමණක් ගැසට් නිවේදනය තුළ පළ කරන ලද බවත්;

(ii) විෂයමාලාව තුළ ආගමික අධ්‍යාපනය අනිවාර්ය බවත්;

(iii) ඉස්ලාම් ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය නොකිරීම, මුස්ලිම් ශිෂ්‍යයන්ගේ ආගමික අධ්‍යාපනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන බවත්; එතුමා දන්නේද?

(ඇ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයෙහි (විශේෂ කාණ්ඩය - ඉස්ලාම්) සේවක සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, වැඩබලන පදනම මත සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් (ඉස්ලාම්) පත් කිරීමට පියවර ගනු ලබන්නේද;

(iii) එසේ නම්, එය සිදු කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களிலுள்ள ஒவ்வொரு கல்வி வலயத்தின் கீழும் காணப்படு கின்ற முஸ்லிம் பாடசாலைகளின் எண்ணிக்கை யையும்;

(ii) இஸ்லாம், இஸ்லாமியக் கற்கைகள், அரபு ஆகிய கற்பித்தல்களை மேற்படி வலயங்களில் மேற்பார்வை செய்கின்ற உதவிக் கல்விப் பணிப்பாளர்களின் (இஸ்லாம்) பெயர்களையும்;

(iii) உதவிக் கல்விப் பணிப்பாளர்கள் (இஸ்லாம்) இல்லாத கல்வி வலயங்களின் பெயர்களையும்;

(iv) இந்தக் கல்வி வலயங்களில் மேற்படி பாடங்கள் தொடர்பான கற்பித்தலை மேற்பார்வை செய்வதற்குப் பணிக்கப்பட்ட மேற்பார்வை யாளர்களின் பெயர்களையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கை கல்வி நிர்வாக சேவை (விசேட பதவியணி - இஸ்லாம்) தொடர்பான வர்த்தமானி அறிவித்தலில் இதற்கென இரண்டு வெற்றி டங்கள் மாத்திரம் காணப்படுவதாக குறிப்பிடப் பட்டிருந்ததையும்;

(ii) பாடத்திட்டத்தில் சமய பாடம் கட்டாயமான தென்பதையும்;

(iii) இஸ்லாம் பாடத்தை மேற்பார்வை செய்யாமல் விடுவதானது முஸ்லிம் மாணவர்களுடைய சமயக் கல்வியில் பாதகமான தாக்கத்தை ஏற்படுத்துமென்பதையும்

அவர் அறிவாரா?

(இ) (i) இலங்கை கல்வி நிர்வாக சேவை (விசேட பதவியணி - இஸ்லாம்) பதவியணியில் அதிகரிப் பினை மேற்கொள்வதற்கான நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(ii) இல்லையெனில், பதிற் கடமை அடிப்படையில் உதவிக் கல்விப் பணிப்பாளர்களை (இஸ்லாம்) நியமிப்பதற்கான நடவடிக்கை மேற்கொள்ளப் படுமா என்பதையும்;

(iii) அவ்வாறெனில், எப்போது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல் ஏன்?

asked the Minister of Education :

(a) Will he inform this House-

(i) the number of Muslim schools under each Education zones in the Northern and Eastern provinces;

(ii) names of Assistant Directors of Education (Islam) of above zones who supervise teaching of Islam, Islamic Studies and Arabic;

(iii) names of Education zones which do not have ADE (Islam); and

(iv) supervisors assigned to supervise the teaching of above subjects in these zones?

(b) Is he aware that-

(i) only two vacancies for Sri Lanka Education Administrative Service (Special grade- Islam) were depicted in the gazette notification;

(ii) religious education is compulsory in the Curriculum; and

(iii) non-supervision of Islam will have an adverse effect on the religious education of Muslim students?

(c) Will he also inform this House-

(i) whether action will be taken to increase the cadre of SLEAS (Special grade - Islam);

(ii) if not, whether action will be taken to appoint ADE (Islam) on acting basis; and

(iii) if so, when?

(d) If not, why?

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැගෙනහිර පළාත - 365

උතුරු පළාත - 63

නැගෙනහිර පළාත

කින්නියා - 66, අක්කරෙයිපත්තු - 71, ත්‍රිකුණාමලය - 20, මුතූර් - 36, කන්තලේ - 07, ත්‍රිකුණාමලය උතුර - 02, මඩකලපුව-මධ්‍යම - 75, කල්මුණේ - 43, සමන්තුරෙයි - 45.

මඩකලපුව, මඩකලපුව - බටහිර, පදිරිප්පු, කල්කුඩා, තිරික්කෝවිල්, අම්පාර, මහඔය, දෙහිඅත්තකණ්ඩිය - මුස්ලිම් පාසල් නැත.

උතුරු පළාත

යාපනය - 02, කිලිනොච්චිය - 01, වව්නියා - දකුණ - 12, මුලතිව් - 02, මන්නාරම - 35, මඩු - 11.

දිවයින්, වලිකාමම්, තෙන්මාරච්චි, මඩමාරච්චි, තුණුක්කායි, වව්නියාව උතුර - මුස්ලිම් පාසල් නැත.

(ii) නැගෙනහිර පළාත

කින්නියා කලාපය -

1. එම්.සී. නසාර් මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
2. ඒ නසූර්කාන් මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
3. ඒ.එම්. කලීම් මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

අක්කරෙයිපත්තු කලාපය

1. ඒ.එම්. රහුමතුල්ලා මයා - සහකාරඅධ්‍යාපන අධ්‍යක්ෂ
2. ඒ.ආර්.එම්. මනාෆ් මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
3. එන්.ටී. නසීර් මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

පහත නම් සඳහන් ගුරු උපදේශකවරුන් වැඩබලන සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වශයෙන් සේවය කරයි.

කන්තලේ කලාපය - කේ.එම්. හනීෆා මයා - ගුරු උපදේශක

මඩකලපුව මධ්‍යම කලාපය- එම්.අයි. අබ්දුල් ගෆූර් මයා - ගුරු උපදේශක

කල්මුණේ කලාපය - එස්. සිරාජුදීන් මයා - ගුරු උපදේශක

සමන්තුරෙයි කලාපය - එම්.අයි. හජ්ජි මොහොමඩ් මයා - ගුරු උපදේශක

උතුරු පළාත

වව්නියාව දකුණ - ඒ.ආර්.එම්. ජමීල් මයා - ගුරු උපදේශක

උතුරු හා නැගෙනහිර අනෙකුත් කලාපවලට අධීක්ෂණය සිදු කරන සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දැනට නොමැත.

(iii) නැගෙනහිර පළාත

ත්‍රිකුණාමලය, මුතූර්, ත්‍රිකුණාමලය උතුර.

උතුරු පළාත

යාපනය, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම, මඩු.

(iv) ඔව්.

නැගෙනහිර පළාත

| | | |
|---|---|---|
| කින්නියා | - | ඒ.එම්. කලීම් මයා. |
| අක්කරෙයිපත්තුව | - | ඒ.ආර්.එම්. මනාෆ් මයා, එන්.ටී. නසීර් මයා. |
| කන්තලේ | - | කේ.එම්. හනීෆා මයා. |
| මඩකලපුව මධ්‍යම | - | එම්.අයි. අබ්දුල් ගෆූර් මයා. |
| සමන්තුරෙයි | - | එම්.අයි. හාජි මොහොමඩ් මයා. |
| කල්මුණේ | - | එස්. සිරාජුඩීන් මයා. |

උතුරු පළාත

වව්නියාව දකුණ - ඒ.ආර්.එම්. ජමීල් මයා - ගුරු උපදේශක.

උතුරු පළාතේ අනෙකුත් කලාපවල අධීක්ෂණය කිරීමේ කාර්යය පවරනු ලැබූ අධීක්ෂකවරුන් නොමැත.

(ආ) (i) සීමිත පදනම වටතේ බඳවා ගැනීම සඳහා 2015.08.01 දිනට පැවැති පුරප්පාඩු සංඛ්‍යාව දෙකකි.

(ii) සියලුම දෙනාට ආගමික අධ්‍යාපනය අනිවාර්ය වේ.

(iii) ඔව්. සියලුම ආගමික අධ්‍යාපන ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය සිදු කළ යුතුයි.

(ඇ) (i) අනුමත සේවක සංඛ්‍යාව වැඩි කිරීමේ අවශ්‍යතාවක් නිරීක්ෂණය නොවන අතර, පවතින පුරප්පාඩ් කඩිනමින් පිරවීම මඟින් මෙම ගැටලුව නිරාකරණය කළ හැක.

(ii) කලාප අධ්‍යාපන කාර්යාලවල දැනටමත් එම පළාත්වල වැඩබලන පදනම මත සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පත් කර ඇත.

(iii) මේ වන විටත් එම පළාත්වල වැඩබලන පදනම මත සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරන් පත් කර තිබේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 12 - 1743/'17 - (2), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු කථානායකතුමනි, ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13 -1750/'17- (3), ගරු ලකී ජයවර්ධන මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 15 -1879/'17- (2), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුරු ලබාදෙන්න කල් ඉල්ලන විට ඉදිරියේදී ඒ සඳහා තුන් වාරයකට වඩා අවස්ථාව ලබානොදෙන්නයි අපි තීරණය කර තිබෙන්නේ. ඒ සඳහා සහයෝගය ලබාදෙන්න කියා මා රජයෙන් ඉල්ලා සිටිනවා.

මීළඟට, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### උතුරු පළාතේ ස්වේච්ඡා ගුරුවරුන්ට ස්ථිර පත්වීම්
### வட மாகாணத் தொண்டர் ஆசிரியர்களுக்கு நிரந்தர நியமனம் வழங்குதல்
### PERMANENT APPOINTMENTS TO VOLUNTEER TEACHERS IN NORTHERN PROVINCE

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நன்றி! கௌரவ சபாநாயகர் அவர்களே, வடக்கு மாகாணத்திலுள்ள பாடசாலைகளில் தொண்டர் ஆசிரியர் களாகப் பணியாற்றி வருகின்ற சுமார் 1,050 பேருக்கான நேர்முகப் பரீட்சை கடந்த வருடம் யூலை மாதம் 28, 29, 30ஆம் திகதிகளில் கல்வி அமைச்சின் ஏற்பாட்டில் யாழ்ப்பாணம் பொது நூலகக் கட்டிடத்தில் இடம்பெற்றதாகவும் நேர்முகப் பரீட்சை இடம்பெற்று சுமார் ஒரு மாதம் கழிந்த நிலையில், அதில் 676 பேர் தேர்ந்தெடுக்கப்பட்டனர் என்றும் அவர்களில் "லொக் புக்" தகுதி அடிப்படையில் 182 பேர் தெரிவு செய்யப்பட்டு நியமனங்கள் வழங்கப்படுமெனக் கூறப்பட்ட தாகவும் அறிய முடிகிறது. எனினும், இதுவரையில் எவருக்குமே நியமனங்கள் வழங்கப்படவில்லை என்றும் தெரிய வருகின்றது.

மேற்படி தொண்டர் ஆசிரியர்கள் சுமார் நீண்ட காலமாக மிகவும் பாதிப்புற்ற நிலையில் தமது கடமைகளை மேற்கொண்டு வருவதும் தற்போது வடக்கு மாகாணப் பாடசாலைகளில் ஆசிரியர்களுக்கான வெற்றிடங்கள் பல காணப்படுவதும் தாங்கள் அறிந்த விடயமாகும். தேர்ந்தெடுக்கப்பட்ட 676 தொண்டர் ஆசிரியர்களும் தங்களுக்கான நியமனங்களை எதிர்பார்த்துள்ளனர். இந் நிலையில், கடந்தகால யுத்த நிலைமைகள் காரணமாக ஏற்பட்டிருந்த இடப்பெயர்வுகளால் தங்களுக்குரிய "லொக் புக்" தகுதிகளை இழந்துள்ள 494 தொண்டர் ஆசிரியர்களின் மாற்றீடு ஆவணங்களை அதாவது வரவுப் பதிவேடு, கருத்தரங்குகளில் கலந்துகொண்ட மற்றும் பரீட்சைகளில் தோற்றிய பதிவுகள், பாடவிதான விடயங்கள் போன்றவற்றைக் கருத்திற்கொண்டு,

**மேலே குறிப்பிட்ட 676 தொண்டர் ஆசிரியர்களுக்கும் நிரந்தர நியமனங்களை வழங்குவதற்கு நடவடிக்கை எடுத்து உதவ முடியுமா?**

மேற்படி எனது கேள்விக்கான பதிலையும் எடுக்கப்படக் கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கங்களையும் கௌரவ கல்வி அமைச்சர் அவர்கள் வழங்குவாரென எதிர்பார்க்கின்றேன்.

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ டக்ளஸ் தேவானந்தா அவர்களால் நிலையியற் கட்டளை 23(2)இன் கீழ் எழுப்பப்பட்ட வினாவுக்கான விடை பின்வருமாறு:

தேசியக் கொள்கை மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரினால் முன்வைக்கப்பட்ட இலக்கம் அப/18/0246/706/011 மற்றும் 2018.01.29ஆம் திகதிய அமைச்சரவைப் பத்திரத்துக்கு 2018.02.27ஆம் திகதி அமைச்சரவையின் தீர்மானம் கிடைத்துள்ளது. அந்த அமைச்சரவைத் தீர்மானத்திற்கு அமைவாக 'லொக்' குறிப்பிற்குப் பதிலாக விண்ணப்பதாரிகளினால் முன்வைக் கப்படும் சத்தியக் கடதாசியுடன் உறுதிப்படுத்தக்கூடிய வேறு தடயங்களும் கருத்தில்கொள்ளப்படும். அதாவது, 'லொக் புக்' அவசியமில்லை. சத்தியக் கடதாசி கொடுத்தால் அவற்றை ஏற்றுக்கொண்டு, அவர்களுக்கு நியமனங்கள் கொடுப்பதற் கான ஏற்பாடுகள் செய்யப்பட்டிருக்கின்றன. அது அமைச்சரவையில் ஏற்றுக்கொள்ளப்பட்டிருக்கிறது. அதன் பிரகாரம், மீண்டும் நேர்முகப் பரீட்சையை நடத்தி, வட மாகாணத்தில் தொண்டர் ஆசிரியர் சேவையில் ஈடுபட்ட 676 பேரை இலங்கை ஆசிரியர் சேவையின் 3ஆம் வகுப்பின் IIஆம் தரத்திற்குச் சேர்த்துக்கொள்வதற்கு நடவடிக்கை எடுக்கப்படும். இதனடிப்படையில், 20ஆம் திகதியளவில் இவர்களுக்கான நேர்முகப் பரீட்சையை நடத்துவதற்கு நடவடிக்கை எடுக்கப் பட்டிருக்கிறது.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මහතා

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, මේ වන විටත් මහනුවර දිස්ත්‍රික්කයට ඇඳිරි නීතිය දමලා. ඒ දිස්ත්‍රික්කයේ සිංහල ජනතාව, විශේෂයෙන් මුස්ලිම් ජනතාව දෙගොල්ලන්ම අද ජීවත් වන්නේ බියෙන්. ආණ්ඩුවේ ඇමතිවරුත් චෝදනා කරන්නේ ආණ්ඩුවට; පොලීසියට. මේ තත්ත්වය මෙහෙම දිග්ගැස්සෙන්න ඉඩ දීලා ආණ්ඩුව කිසි ගානක් නැතිව බලාගෙන ඉන්නවා. මේක ජාතික ආපදාවක් වාගේ තත්ත්වයක්. කරුණාකරලා මේක ඇවිලෙන්න ඉඩ දෙන්න එපා. මේ විනාශය පිළිබඳව දැන් එන ආරංචි අපට හිත සතුටු කරවන ආරංචි නොවෙයි. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ රටේ ආණ්ඩුවක් කියලා එකක් තිබෙනවා නම්; පණ ඇති ආණ්ඩුවක් කියලා එකක් තිබෙනවා නම් මේ විනාශය නවත්වන්න. ඒක කරන්න බැරි නම්, කරුණාකරලා තමුන්නාන්සේලා කරන්න පුළුවන් කෙනකුට භාර දෙන්න. මේ විධියට රට අරාජික වෙලා, රටේ මිනිස්සුන්ට නීතිය අතට අරගෙන, කඩු, පොලු අර ගෙන කපා කොටා ගන්න, ගිනි තියා ගන්න, මරා ගන්න ඉඩ දීලා ඔහේ අත පය බැඳගෙන බලාගෙන ඉන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මේ ගැන අද උදේත් අපි අවධානය යොමු කළා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මේක අපේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දන්නවා. මම දන්නවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මේ විනාශ වන්නේ අපේ සමාජයයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන අද උදේත් කථා කළා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒ ගැන කථා කරන්න වගකිව යුතු ඇමති කෙනෙක්වත් නැහැ. ඇමතිලා කප්පරක් ඉන්නවා. අවශ්‍ය වෙලාවට බෙහෙතකටවත් සොයා ගන්න ඇමති කෙනෙක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
රටේ මෙහෙම විපතක් වෙලා තිබෙන අවස්ථාවක තමුන්නාන්සේලා ඒකට ගත්ත පියවර මොකක්ද කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development)
ඊයේ ගරු අගමැතිතුමා මේ ගැන කථා කළා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඊයේ කියලා අද වැරදුනාද? අපි දන්න ඒවා මෙතැන කියන්නේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඔබතුමා වාඩිවෙන්න. ගරු ප්‍රධාන සංවිධායකතුමා පිළිතුරු දෙයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන සංවිධායකතුමාට කථා කරන්න ඉඩ දීලා ගරු දිලිප් වෙදආරච්චි ඇමතිතුමා ඉඳගන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ඊයේ උදේ වරුවේත් රටේ පවතින තත්ත්වය පිළිබඳව කැබිනට් මණ්ඩලය වෙනමම සාකච්ඡා කළා. හවස ආරක්ෂක ප්‍රධානීන් කැඳවලා නැවත වතාවක් සාකච්ඡා කළා. අවශ්‍ය පියවර සියල්ලම ගැනීමට රජය පසුබට වන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, රට දැනුවත් කිරීම සඳහා අද කැබිනට් මාධ්‍ය හමුවට වගකිව යුතු ඇමතිවරු කිහිප දෙනෙක් සහභාගිවෙලා, මාණ්ඩලික ප්‍රධානීන්, ආරක්ෂක ප්‍රධානීන් ඇවිල්ලා පවතින තත්ත්වය පිළිබඳව රට දැනුවත් කළා. ඒ නිසා යථා තත්ත්වයට පත් කරන්න රජයේ සම්පූර්ණ අවධානය යොමු වෙලා තිබෙනවා. දැනුත් වගකිව යුතු අමාත්‍යවරුන් හැම කෙනෙකුම එම කටයුතුවල නිරත වෙමින් සිටින්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඒ ගැන අද උදේ වරුවේත් සාකච්ඡාවක් තිබුණු බව මා දන්නවා. මම අද පෞද්ගලිකවත් ආරක්ෂක අමාත්‍යාංශය හා අනෙක් සියලුම නිලධාරින් සමඟ සාකච්ඡා කළා. ගරු විමල් වීරවංශ මැතිතුමා සඳහන් කළ කාරණය ගැන නැවතත් අපි අවධානය යොමු කරන්නම්.

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු යටතේ අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 5 දක්වා විවාද කරන්න තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු විමල් වීරවංශ මැතිතුමා නැඟූ ප්‍රශ්නය ගැන කථා කරනවා නම්, මේ වනවිට මහනුවර දිස්ත්‍රික්කයේ නගර රාශියක ඉතාම නරක තත්ත්වයක් ඇති වී තිබෙන බව අපි කවුරුත් දන්නවා. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා රජය වෙනුවෙන් ලබා දුන් පිළිතුර ප්‍රමාණවත් නැහැ. මොකද, රජයේ ඇමතිවරුන් ප්‍රසිද්ධියේ රජයටම චෝදනා කරන නිසා, මෙම තත්ත්වය තවත් නරක තත්ත්වයකට පරිවර්තනය වෙමින් පවතිනවා.

ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා හදිසි නීතිය පනවා තිබෙනවා. ඒ ගැන ඔබතුමාත් දන්නවා, පාර්ලිමේන්තුවත් දන්නවා. A State of Emergency has been declared. Why a State of Emergency has been declared is because the situation is bad. The normal, civil officers cannot control the situation. That is why His Excellency the President has declared a State of Emergency. එතකොට පාර්ලිමේන්තුවට හදිසි නීතිය ප්‍රකාශයට පත්වීම අනිවාර්යයෙන් දැනුම් දීම සිද්ධ වෙනවා. ගරු කථානායකතුමනි, මේ බරපතළ තත්ත්වය ගැන වගකීමක් ගත හැකි කිසිවකු නැත්නම්, ගරු කථානායකතුමා හැටියට ඔබතුමා සියලු ප්‍රධාන නියෝජිත සංවිධානවල, පක්ෂවල සාකච්ඡාවක් කැඳවා මෙයට මැදිහත් වන ලෙස අපි මහජන මන්ත්‍රීවරුන් හැටියට සියලු දෙනාගේ ජීවිත වෙනුවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මෙය කල් දමන වේලාවක් නොවෙයි කියන එක සලකන්න කියලාත් ඉතාම ඕනෑකමින් අපි මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ප්‍රධාන කටයුතු වශයෙන් අද ගන්න තිබෙනවා කරුණු 5ක්. මම ගරු සභාවේ අවධානය යොමු කරවනවා, අප පළමුවෙන්ම පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය විවාද කර අවසන් කළොත් සභාවේ එකඟත්වයෙන් විවාදයකට අපට අවස්ථාව තිබෙනවාය කියන කාරණය. සභාව එකඟද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අපි එකඟයි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය ගැනීම ගැන. අපි රජයෙන් ඉල්ලීමක් කරනවා. දැන් මේ ගරු සභාවේ ගරු අමාත්‍යතුමාත් ඉන්නවා. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත බරපතළ කාරණාවක් ලෙස ගෙන සාකච්ඡා කරන්න තිබෙන කාලය අඩුකම නිසා අද දින විවාදයට නොගෙන කල් තබා ප්‍රමාණවත් පරිදි සාකච්ඡා කිරීම සඳහා අපට අවස්ථාවක් ලබා දෙන්න කියන ඉල්ලීම විශේෂයෙන් ගරු අමාත්‍යතුමාත් සිටින මේ වෙලාවේ මම කරනවා. ගරු අමාත්‍යතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා එයට එකඟ වෙන්න කියා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විදේශ කටයුතු ගරු අමාත්‍යතුමා.

**ගරු තිලක් මාරපන මහතා (සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலக் மாரபன - அபிவிருத்திப் பணிப்பொறுப்புகள் அமைச்சரும் வெளிநாட்டலுவல்கள் அமைச்சரும்)
(The Hon. Tilak Marapana -Minister of Development Assignments and Minister of Foreign Affairs)

අද මුළු දවසම තිබෙනවා. එය මදි ද, ගරු මන්ත්‍රීතුමා? අද දවස පුරාම මෙය විවාද කළාම-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Can we not take that up on the third week?

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)

Is the whole day not enough for this? I know your concerns. Your concerns are particularly in relation to Clause 8 of this Bill. When this came up in the Sectoral Oversight Committee also, what I was thinking is that we can move an amendment to Clause 8 excluding Sri Lankans. That would satisfy your concerns completely. මොකද, මේ පනත් කෙටුම්පතේ වෙනත් කිසිම දෙයක් නැහැ, ගරු මන්ත්‍රීතුමා. මේ පනත් කෙටුම්පතේ තිබෙන ඔක්කෝම විධිවිධාන ඉදිරියට කෙරෙන වරදවල් වෙනුවෙන් විතරයි. There is nothing retrospective. ඉස්සර -අතීතයේ- කරපු කිසිම දෙයක් මේ පනත් කෙටුම්පතෙන් වරදක් හැටියට ගණන් ගැනෙන්නේ නැහැ. අනාගතයේ සිදු කරන දේවල් සම්බන්ධයෙන් විතරයි මේ පනත් කෙටුම්පත ක්‍රියාත්මක වන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු අමාත්‍යතුමනි, අපට බැරිද ඔබතුමා ගෙනෙන ශ්‍රී ලංකාව මෙයින් ඉවත් කිරීම කියන සංශෝධනය-

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)

ශ්‍රී ලාංකික පුරවැසියන්. [බාධා කිරීමක්] ඔබතුමා අධීක්ෂණ කමිටුවේ - That is the only concern that you had. That is regarding Clause 8.

වාසුදේව නානායක්කාර මැතිතුමාත් මේ ප්‍රශ්නයමයි මතු කළේ. එතුමා කිව්වා, 8 වෙනි වගන්තිය ප්‍රකාරව පිටරට ආණ්ඩුවකට අවස්ථාවක් තියෙනවා, යම්කිසි වරදක් කර ඇති අපේ ලාංකික කෙනෙක් ඒ රටට ගෙන ගිහින් නඩු දමන්න කියලා. ඒක වළක්වන්න මම කැමැතියි, මේ 8 වෙනි වගන්තියට අපි සංශෝධනයක් ඉදිරිපත් කරමු; මේ 8 වෙනි වගන්තිය ශ්‍රී ලාංකික පුරවැසියන්ට බලපාන්නේ නැහැයි කියලා. ඒකට මම කැමැතියි, ගරු අගමැතිතුමාගෙනුත් ඒක,-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේ කාරණාව කල් තියලා ඔබතුමා සකසන ලද -draft - කරපු සංශෝධනය ගැන සාකච්ඡා කරලා, ඊට පස්සේ වෙන දවසක,-

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)

ඒ සංශෝධනය ඉතාම සුළු සංශෝධනයක්. එතකොට 8 වෙනි වගන්තිය සම්පූර්ණයෙන්ම ලංකාවේ පුරවැසියෙකුට කිසිම ආකාරයකින් බලපාන්නේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු ගරු ඇමතිතුමාගෙන් කාරණා දෙකක් මා ඕනෑකමින් ඉල්ලනවා. අපේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමන් කිව්වා වාගේ අද එකම වෙලාවේ මාතෘකා දෙකක් සාකච්ඡාවට භාජනය වෙනවා, ස්ථාවර නියෝගවලට අදාළ කරුණුත්; ඒ වාගේම බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පතට අදාළ කරුණුත් වශයෙන්. මා හිතන්නේ මේ පනත් කෙටුම්පත, රටේ ජනතාව සැලකිල්ලෙන් අවධානය යොමු කළ යුතු පනත් කෙටුම්පතක් බවයි. මාතෘකා දෙකක් ගැන පැය කීපයක් පමණයි විවාදය තිබෙන්නේ. අපි කාරුණිකව ඔබතුමාගෙන් ඉල්ලන්නේ මේ පනත් කෙටුම්පතේ තිබෙන බලපෑම් සහගත ස්වභාවය ගැන සලකා ඊළඟ පාර්ලිමේන්තු සතියේ මේ පනත් කෙටුම්පත ගැන විතරක් සම්පූර්ණ දවසක් සාකච්ඡාවට ගන්න අවස්ථාව දෙන්න. එතකොට ඔබතුමාගේ සංශෝධනයෙන් ඔය කියන වෙනස හරියට වෙනවාද නැද්ද කියන එකත් අපට හඳුනා ගන්න පුළුවන්. දෙවන කාරණය තමයි පනත් කෙටුම්පතේ 8 වෙනි වගන්තිය ශ්‍රී ලාංකිකයන්ට බලපාන්නේ නැත්නම්, එම වගන්තිය තිබීමේ තේරුමක් නැහැ. එහෙම නම් ඒ වගන්තිය ඉවත් වෙන්න ඕනෑ.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)

තේරුමක් තිබෙනවා. පිටරටක පුරවැසියෙකු යම් කිසි වරදක් කරලා ලංකාවට ඇවිල්ලා හැංගිලා හිටියොත්, මේ රටින් ඔහුව ගෙනියලා නඩු දමන්න ඒ රටේ ආණ්ඩුවට අවස්ථාවක් තිබෙන්න ඕනෑ. ඒකට හරියන්න තමයි 8වෙනි වගන්තිය තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම 8වෙනි වගන්තිය හරියට කියෙව්වොත්, තමුන්නාන්සේට වැටහෙයි, එම වගන්තියෙන් කියලා නැහැයි කියන එක, අපි ඒ පුද්ගලයාව භාර දෙන්න ඕනෑ කියලා. මේ වගන්තියෙන් කියන්නේ, අපි මොකක්ද කරන්නේ කියලා අපි දැනුම් දෙන්න ඕනෑ කියලායි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු ඇමතිතුමනි, මේ පනත් කෙටුම්පත විතරක් නොවෙයි ඔතැනදී සලකා බලන්න ඕනෑ. අත්සන් කරපු ප්‍රඥප්තියත් සලකා බලන්න ඕනෑ. ප්‍රඥප්තියයි, පනත් කෙටුම්පතයි දෙක එකට තියලා සලකා බලන්න ඕනෑ.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)

අත්සන් කරපු ප්‍රඥප්තියෙන් වැඩක් නැහැ. මොකද, අත්සන් කරපු ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරන්න තමයි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒක ලංකාවේ නීතියක් හැටියට ස්ථාපිත කරන්නේ. ලංකාවේ නීතියක් හැටියට ස්ථාපිත වුණේ නැත්නම්, ප්‍රඥප්තියේ මොන දෙයක් තිබුණත් ඒකෙන් වැඩක් නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

නීතියක් හැටියට සම්මත වුණේ නැත්නම් ඒක හරි. නමුත්, දැන් මේක නීතියක් හැටියට සම්මත කරන්නයි යන්නේ.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
එතකොට මේක සම්මුතියත් එක්ක සලකා බලන එකෙන් ඇති වැඩක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, අද දිනට නියමිත අනෙක් වැඩ කටයුතු සඳහා වැඩි වෙලාවක් යයි කියලා මම හිතන්නේ නැහැ. එහෙම වැඩිවෙලාවක් ගතවෙලා, මෙම පනත් කෙටුම්පත ගැන විවාද කරන්න වෙලාව මදි වුණොත්, අපි අද දින මේ සම්බන්ධයෙන් විවාද කරලා, වැඩිදුර විවාදය පසු දිනකට යොදා ගනිමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි එහෙම කරමුද? අද අපි විවාදය කරලා අවශ්‍ය වුණොත් ඉදිරි දිනයකට ගෙන යන්න පුළුවන් නේ.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
කලිනුත් මේක පාර්ලිමේන්තුවේ, -

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එහෙම කැමැතියි, ගරු කථානායකතුමනි. අපි විවාදය ගනිමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. එහෙම කරමු. අපි මේ විවාදය ආරම්භ කරමු. අවශ්‍ය වුණොත්, we can decide.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Clause 8 වලට අදාළ amendment එකේ draft එක එවන්න.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. කියන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පතට අදාළව අත්සන් කරන ලද ජාත්‍යන්තර ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ පිටපත් අපි ලිපියක් මඟින් තමුන්නාන්සේගෙනුත් මීට පෙර අවස්ථාවක ඉල්ලුවා. මේ ප්‍රඥප්තිය බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පතක් තමයි අද විවාදයට ගැනීමට නියමිතව තිබෙන්නේ. ගරු විදේශ කටයුතු ඇමතිතුමනි, මේ දක්වා ගරු මන්ත්‍රීවරු 225දෙනාට එම ප්‍රඥප්තිය ලැබී නැහැ. අපි ඒ ප්‍රඥප්තිය සොයා ගත්තා. නමුත්, සිංහල හා දෙමළ පිටපත් අපට ලැබුණේ නැහැ. එවැනි තත්ත්වයක් තුළ තමයි තමුන්නාන්සේ කියන්නේ, "8වන වගන්තියේ, 'ශ්‍රී ලාංකික පුරවැසියන්ට' කියන කොටස ඉවත් කරමු" කියලා.

ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා වෙත කරන ලද ඉල්ලීමකට අනුව මේ පනත් කෙටුම්පත සාකච්ඡා කිරීම එක වතාවක් කල් තැබුවා. මේක බලවත් පනත් කෙටුම්පතක් නිසාත්, ජාත්‍යන්තර ප්‍රඥප්තියක් බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පතක් නිසාත්, එක වතාවක් කල් දමා තිබෙන නිසාත්, එම ප්‍රඥප්තිය අපට ලබා දී නැති නිසාත්, අපි ඔබතුමාගෙන් ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත පිළිබඳ සාකච්ඡාවත්, මේ සාකච්ඡාවත් එකට පටලවා ගන්නේ නැතුව මේ විවාදය වෙනත් දවසක යොදාගෙන සාකච්ඡා කරමු කියලා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, ඊයේ දිනයේ විවාද කරන්නට තිබුණු Anti-Dumping and Countervailing Duties Bill එකත්, අද දින විවාද කරන්න නියමිතව තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම පනත් කෙටුම්පත අද විවාදයට ගන්නවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒකත් බරපතළ විධියට සාකච්ඡාවට ලක් වන පනත් කෙටුම්පතක්. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත පිළිබඳ සාකච්ඡාවත්, Anti-Dumping and Countervailing Duties Bill එකත් අද විවාද කරන්න ගත්තොත්, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක පළමුවෙන් විවාද කරන්න පටන් ගන්න බලාපොරොත්තු වනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපි කියන්නේ, ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත පිළිබඳව වෙනත් දවසක විවාද කරමු කියලායි. මොකද, ඒකත් බරපතළ ලෙස සාකච්ඡාවට ලක් වන පනත් කෙටුම්පතක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි කාලය බලලා ඒ විධියට කරමු. ගරු ඇමතිතුමා එකඟ වුණා, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත

පිළිබඳ විවාදය පටන් අරගෙන අවස්ථානුකූලව තවත් දවසක් දෙන්න. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ. අපි විවාදය පටන් ගනිමු.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, Sectoral Oversight Committee එකේදී ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාත්, මමත් ගරු තිලක් මාරපන මැතිතුමාගේ අවධානයට මෙම පනත් කෙටුම්පතේ තිබෙන කරුණු පිළිබඳ තත්ත්වයන් ඉදිරිපත් කළා. ගරු ඇමතිතුමනි, එතැනදී ඔබතුමා ඉදිරිපත් කළ අදහස් ඒ ආකාරයට සිද්ධ වන්නේ නැති බව අපේ නීතිඥයන් විසින් අපට පිළිතුරු ලබා දීමක් කළා.

මොකද, ඔබතුමා සඳහන් කළ දේ අපි අපේ නීතිඥයින්ට කිව්වාම, -මෙය අතීතයට බලපාන්නේ නැහැ කිව්වාම- ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව ස්වයංක්‍රීයව අතීතයට බලපාන බවට තමයි ඔවුන් විසින් අපට උපදෙස් දුන්නේ. එම නිසා ඔබතුමා මේ ගරු සභාවට සහතික වෙනවා නම්, මෙය අතීතයට බලපාන්නේ නැහැ කියලා-

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
ගරු මන්ත්‍රීතුමා, අතීතයට බලපාන්නේ මොන වගන්තියෙන්ද කියලා -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒක විවාදයේදී ගනිමුද, ගරු ඇමැතිතුමා?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
වගන්තිය නිසා නොවෙයි ඒක වෙන්නේ. ජාත්‍යන්තර ප්‍රඥප්තියට අපි එකඟ වුණාට පසුව, අතීතයේ සිදු වුණු දේවල් සම්බන්ධයෙනුත් එලෙසින්ම කටයුතු කරන්න අපි බැඳිලා ඉන්නවා කියන එක තමයි අපේ නීතිඥයින් ඉදිරිපත් කළ තර්කය.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රඥප්තියේ මොනවා තිබුණත්, අපි මොනවා කරන්න බලාපොරොත්තු වුණත්, එකඟ වුණත් මේ නීතිය ගෙනෙන්නේ ඒ ප්‍රඥප්තිය ලංකාවේ බලාත්මක කිරීමේ අරමුණින්. ලංකාවේ බලාත්මක වෙන්න ගෙනෙන මේ නීතියේ තිබෙන කරුණු තමයි ලංකාවට අදාළ වෙන්නේ. වෙන කිසි දෙයක් නොවෙයි. ප්‍රඥප්තියේ තිබෙන කරුණු උසාවියේ කථා කරන්න බැහැ. මේ පනත් කෙටුම්පතේ තිබෙන දේවල් විතරයි උසාවියේ කථා කරන්න පුළුවන් වන්නේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
දැන් ඔබතුමා කියන ආකාරයට මේ ජාත්‍යන්තර ප්‍රඥප්තිය අපට බලපාන්නේ මේ පනත් කෙටුම්පත සම්මත කළාට පසුව, අහවල් දවසින් පසුව කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද? එවැනි තත්ත්වයක් ඇති කරන්න පුළුවන් කියන සහතිකය ඔබතුමාට දෙන්න පුළුවන්ද?

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
මම සහතිකයක් දෙන්න අවශ්‍ය නැහැ. මේ පනත් කෙටුම්පතේ තිබෙනවා නේ. මේ පනත් කෙටුම්පතේ තිබෙන විධිවිධාන අනුව මේ පනත් කෙටුම්පත සම්මත වී නීතියක් හැටියට ස්ථාපිත වුණාට පසුව සිදු කරන දේවල් තමයි වැරදි හැටියට ගණන් ගැනෙන්නේ. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙත් එහෙම සඳහන්ව තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවත් නීතියක් සම්මත වෙන්න කලින් කරපු ක්‍රියාවක්, නීති විරෝධී ක්‍රියාවක් හැටියට දැක්වෙන නීතියක් පනවන්න අපට බැහැ. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය ආරම්භ කරන්න අවස්ථාව දෙන්න. අද Items තුනටයි හතරටයි සුළු වෙලාවයි ගත වෙන්නේ. [බාධා කිරීමක්] අපි අද සාකච්ඡා කරමු. So, we can start the Debate. Hon. Minister, we can start the Debate today and then, we will continue. හරි, එහෙම කරමු. බොහොම ස්තුතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I want to raise an urgent matter. ගරු කථානායකතුමනි, අපි Provincial Councils Elections (Amendment) Bill එක සම්මත කළා. According to that Act, මේ කමිටුව විසින් වාර්තාවක් සකස් කොට අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතුයි. ඒ වාගේම ඊ ළඟ වගන්තියේ කියනවා, "මෙය පාර්ලිමේන්තුවට සති දෙකක් ඇතුළත ඉදිරිපත් කළ යුතුයි" කියලා.

ඊළඟට, මේ මාසය අවසන් වීමට පෙර මේ පනත අනුව දැනට ආණ්ඩුකාරවරයාගේ පාලනයේ තිබෙන පළාත් සභාවන් සම්බන්ධයෙන් ඡන්ද විමසීමකට යෑම පිළිබඳ තීරණයක් පාර්ලිමේන්තුව ගත යුතුයි. එය මේ පාර්ලිමේන්තුවට බලපාන නිසායි මා මේ හදිසි ප්‍රශ්නය නැඟුවේ. අද මාර්තු මාසයේ 7වෙනි දා. මෙය හදිසියේ ගන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. මොකද, මේ වාර්තාව ඇමතිතුමා ඉදිරිපත් කළේ ඊයේ. මාර්තු 31වැනි දා වන විට පළාත් සභා 3ක මැතිවරණයට යෑම සඳහා රජය කටයුතු කරන්න බලාපොරොත්තු වන්නේ කුමන ආකාරයෙන්ද? මේ පනත ප්‍රකාරවද, එහෙම නැත්නම් මේ පනත යළි සංශෝධනය කරලාද? මොකද, අපට තව සුමාන 3ක කාලයක් තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, පුළුවන් නම් හෙට පිළිතුරක් දෙන විධියට මෙක අදාළ අමාත්‍යවරයාට යොමු කරන්නම්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
But, it is a serious matter, Sir.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I know. I understand that.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
So, we should summon a meeting.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Mr. Speaker, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුමන්තිරන් මැතිතුමා.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
We have not got copies of what was said to be tabled by the Hon. Minister of Provincial Councils and Local Government yesterday.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Apparently, all the CDs were given.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Okay.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 5 දක්වා. පළමුවෙන් අපි විෂය අංක 4 සහ 5 ගන්නවා.

## ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## நிலையியற் கட்டளைகள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF THE COMMITTEE ON STANDING ORDERS

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී***
***ඊට අදාළ ප්‍රශ්නය [පෙබරවාරි 19]***
*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [ பெப்ருவரி 19]*
*Order read for resuming Adjourned Debate on Question - [19th February]*

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව සලකා බැලීම." [ගරු අජිත් පී. පෙරේරා මහතා]

"பாராளுமன்றத்தின் திருத்தப்பட்ட வரைவு நிலையியற் கட்டளைகள் தொடர்பாக 2017 நவம்பர் மாதம் 07 ஆம் திகதி செவ்வாய்க்கிழமை சமர்ப்பிக்கப்பட்ட நிலையியற் கட்டளைகள் பற்றிய குழுவின் அறிக்கையினைப் பரிசீலித்தல்." - [மாண்புமிகு அஜித் பீ. பெரேரா]

"Report of the Committee on Standing Orders in relation to the revised Draft of the Standing Orders of Parliament presented on Tuesday, November 07, 2017,- Consideration.". - [*The Hon. Ajith P. Perera*]

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාරක සභා අවස්ථාව. සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

[පාර්ලිමේන්තුව කාරක සභාව බවට පරිවර්තනය වෙයි.]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව අනුව 1 සිට 31 දක්වා ස්ථාවර නියෝගවලට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි,-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, විරුද්ධ පක්ෂයේ නායකයා තේරීම පිළිබඳ ස්ථාවර නියෝගයට අලුතෙන් සංශෝධනයක් ගෙන ආ යුතුයි කියලා ඒකාබද්ධ විපක්ෂය ඔබතුමා ඉදිරියේ විශේෂ ඉල්ලීමක්

කළා. මෙය පුද්ගලයෙක් සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි. මේ පාර්ලිමේන්තුව වෙනස් වී තිබෙනවා. පාර්ලිමේන්තුව වෙනස් වෙන නිසා ස්ථාවර නියෝග වෙනස් කිරීමේ අවශ්‍යතාවකට පැමිණ තිබෙන නිසායි අද අපි මේ ස්ථාවර නියෝග වෙනස් කිරීමකට යොමු වෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අග්‍රාමාත්‍යවරයා හැටියට පිළිගන්නේ පාර්ලිමේන්තුවේ බහුතරයකගේ විශ්වාසය ඇති තැනැත්තායි. දහනව වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේත් එය ඇතුළත්. අපි ඔබතුමාගෙන් අවම වශයෙන් ඉල්ලා-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, අපි එය අවසානයේ ගනිමු, දැනට මේවා ටික ගිහිල්ලා-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේවා ටික ගියාට පසුව ඔක්කොම ටික ගිහිල්ලා ඉවරයිනේ, ගරු සභාපතිතුමනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, ඒකට පිළිතුරක් දෙන්නට පුළුවන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එතකොට ඔක්කොම ගිහිල්ලා ඉවරයි නේ. Let us not get into an unnecessary debate and a division. I am only trying to canvass our view.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, I know that.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොකද, 30වෙනි ස්ථාවර නියෝගයට එන්නට පෙර Questions යටතේ හෝ විපක්ෂ නායකවරයෙකුට වගකීම් රාශියක් තිබෙනවා. ඉතා පැහැදිලිව විපක්ෂ නායකතුමා Constitutional Council එකේ ඉඳගන්නවා; අනිවාර්යයෙන් ඉඳ ගන්නට ඕනෑ. විපක්ෂ නායකවරයා තේරීම පිළිබඳ සංශෝධනයට අපි ඡන්ද විමසීමක් ඉල්ලන්නේ නැහැ. අපි කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අග්‍රාමාත්‍යවරයා ලෙස පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසය ඇති තැනැත්තා පත් වනවා වාගේ විරුද්ධ පක්ෂයේම ඉඳගෙන ඉන්න බහුතර මන්ත්‍රීවරුන්ගේ විශ්වාසය දිනාගෙන සිටින තැනැත්තා විපක්ෂ නායකවරයා ලෙස කථානායකවරයා විසින් පිළිගත යුතුයි කියලා. මේක කිසිම අසාධාරණයක් ඇති සංශෝධනයක් නොවෙයි. ඒ අර්බුදය අද පවතින නිසායි මේ සංශෝධනය ඉල්ලා සිටින්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඊයේ හැන්දෑවේත් අපි මේ ගැන කථා කරන්නට විශේෂ කමිටුවක ඉඳගත්තා. ඒකේ තීරණයත් අපිට දැන් ඔබතුමාට දෙන්නට පුළුවන්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අදහස් පිළිබඳව ඊයේ දිනයේදීත්, මීට කලිනුත් දීර්ඝව සාකච්ඡා කෙරුණා. මෙහිදී වෙනත් රටවල විපක්ෂ නායකවරයා තෝරා ගැනීම පිළිබඳ වූ සම්ප්‍රදායයන් පිළිබඳව අපි සලකා බැලුවා. ඒ වාගේම මමත් වසර ගණනාවක් තිස්සේ මේ කමිටුව රැස්වෙද්දී මේ ප්‍රශ්නය පිළිබඳව හැම දාමත් කථා කළ බව ඒ කමිටුවේ සාමාජිකයකු හැටියට මට කියන්න පුළුවන්. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඉදිරිපත් කරන ප්‍රශ්නයේ තිබෙන බරපතළකම අපි පිළිගන්නවා. නමුත් වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදාය තිබෙන අනික් රටවල තත්ත්වයන් දෙස බැලුවාම අපට පෙනී යනවා, ඒ ඒ රටවල තිබෙන සම්ප්‍රදායයන් තුළින් තමයි මෙය ගොඩ නැඟී තිබෙන්නේ කියලා. සුවිශේෂයෙන් මතු වී තිබෙන මේ තත්ත්වය හැම දාම මතු වන එකක් නොවෙයි. මෙය ඉතාම විශේෂ තත්ත්වයක්. එතුමාගේ මතයට අපි ගරු කරනවා. නමුත් මා හිතන හැටියට අපි මෙතැනින් ඉදිරියට යා යුතුව තිබෙනවා, ගරු සභාපතිතුමනි. මොකද, ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ සියයට 100කම එකඟතාවක් නොවෙයි. ඒ කෙසේ වෙතත් අපි පිළිගන්නවා, විපක්ෂයේ බහුතර මතය තිබෙන තැනට තමයි යා යුත්තේ කියලා. කලින් මේ ප්‍රශ්නය මතු වූ අවස්ථාවේදී එය යම් යම් ක්‍රමවලට විසඳා ගත්තා. ඒ නිසා අපි මෙතැනින් ඉදිරියට යා යුතුයි කියන එකයි, මගේ යෝජනාව.

ගරු සභාපතිතුමනි, ස්ථාවර නියෝග 32 සඳහා සංශෝධනයක් ඉදිරිපත් කරනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු සභාපතිතුමනි, වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදාය තුළ මන්ත්‍රී ආසන 16ක් ලබාගත් පක්ෂයක මන්ත්‍රීවරයකු විරුද්ධ පක්ෂයේ නායකයා වන්නේ ලෝකයේ කුමන පාර්ලිමේන්තුවේද? විපක්ෂයේ බහුතරය නියෝජනය නොකරන විපක්ෂ නායකවරයෙක් පත්වෙලා තිබෙන්නේ ලෝකයේ මොන පාර්ලිමේන්තුවේද? ඒ නිසා ගරු සභාපතිතුමනි, - [බාධා කිරීමක්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු සභාපතිතුමනි, ඒ තිබෙන විකෘතිය නිසා අද මේ රටේ ජන මතය නිසියාකාරව මේ පාර්ලිමේන්තුවේ නිරූපණය වන්නේ නැහැ. ඒ විකෘතිය ප්‍රකෘතියක් බවට පත් කරන්න පුළුවන් සංශෝධනයක් ගැනයි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා සඳහන් කරන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, මෙම ප්‍රශ්නය මතුවෙලා තිබෙන්නේ, "එක්සත් ජනතා නිදහස් සන්ධානය" කියන පක්ෂය තුළම කණ්ඩායම් දෙකක් ගොනුවෙලා තිබෙන නිසායි. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ බුලත් කොළේ ලකුණින් ඡන්දය ඉල්ලපු එතුමන්ලා එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ඉවත්වෙලා, තමන්ගේ පක්ෂපාතිත්වය නීත්‍යනුකූලව අත් හැරලා, අලුත් පක්ෂයක් ගොඩ නඟා තිබෙනවා. එතුමන්ලා අලුත් පක්ෂයට යනවා නම් එය එතුමන්ලාගේ වැඩක්. එහෙම වෙන්නේ නැති නිසායි, මේ ප්‍රශ්නය මතු වන්නේ.

ගරු සභාපතිතුමනි, ඉදිරියට යන්න මා අවසර පතනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මා හිතන හැටියට අපි රටවල් විසි ගණනක පමණ සම්ප්‍රදායයන් පිළිබඳව බැලුවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ රටවල සම්ප්‍රදායයන් අපි සලකා බැලුවා. මේ සම්බන්ධයෙන් ඉදිරියට යන්න අපට ඉඩ දෙන්න, ගරු සභාපතිතුමනි.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Sumanthiran.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
May I only say this, Sir, since the Hon. Weerawansa referred to the present situation. It is not anybody's desire that a smaller section of a group occupies the Chair of the Leader of the Opposition. There are six recognized political parties that have been returned to this Parliament and two of those parties are in the Government. Therefore, the party that has the third largest number is entitled to the Leader of the Opposition post. Since he referred to the present situation, I am saying this. But, if some Members who are seated in the Opposition clearly declare that they are not a party that is part of the Government, then the situation will change.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මේ සම්බන්ධයෙන් අපි නීති උපදෙස් ද ලබා ගත්තා. ගරු බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු සභාපතිතුමනි, වර්තමානයේ තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් නොවෙයිනේ අපි මේ ස්ථාවර නියෝග සම්මත කර ගන්නේ. ඔබතුමා වෙහෙස වෙලා, එම කමිටුව වෙහෙස වෙලා මේ ස්ථාවර නියෝග හදන්නේ අනාගතයටයි. අනාගතයේ ඇති වන පාර්ලිමේන්තුවලටත් පූර්වාදර්ශය වෙන්නේ අද දිනයේ සම්මත කරන මේ ස්ථාවර නියෝග නේ. එතකොට, අනාගතයේ දවසකත් මන්ත්‍රීවරුන් බහුතරයක් සිටින පාර්ශ්වයක් විපක්ෂය නොවන ලෙස සලකන්නට ඉඩ ප්‍රස්ථාව ලැබෙනවා, අද මෙය සම්මත කළොත්. ඒ නිසා තමයි ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් ගෙනෙන යෝජනාව ඉතාම සාධාරණ, යුක්තිසහගත, බැලූ බැල්මටම නිවැරදි යෝජනාවක් වෙන්නේ. ඒ නිසා විපක්ෂය ලෙස පෙනී සිටින මන්ත්‍රීවරුන්ගෙන් බහුතරය කැමති වෙන මන්ත්‍රීවරයා විපක්ෂ නායක වෙන්න ඕනෑ. ආණ්ඩුව ලෙස පෙනී සිටින මන්ත්‍රීවරුන්ගේ බහුතරයෙන් අග්‍රාමාත්‍යතුමා පත් වෙනවා නම්, විපක්ෂ නායකවරයාත් ඒ මූලධර්මයට අනුවම පත් වෙන්නට ඕනෑය කියන එක බොහොම සරල සිද්ධාන්තයක් නේ. අද තිබෙන මේ අවුල්සහගත, අරාජික, විකෘති තත්ත්වය ගැන නොවෙයි අපි කථා කරන්නේ. මේ ස්ථාවර නියෝගය අද මේ විධියට සම්මත කළාම, මතු දවසක ඇතිවන පාර්ලිමේන්තුවටත් අපි මේ ප්‍රශ්නය ඉතිරි කරනවා. ඒ නිසා මේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා මැදිහත් වෙන ලෙස ඔබතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අපි මේ ගැන ඊයේත් සාකච්ඡා කළා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එතුමා දරන මතයේ තිබෙන වටිනාකමත් අපි අගය කරනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු සභාපතිතුමනි, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා "ලිඛිතව භාරදීමේ" අවශ්‍යතාවක් ගැන සඳහන් කළා. මම මේ වෙලාවේ ඒ ගැන සඳහන් කරන්න කැමැතියි. ජාතික නිදහස් පෙරමුණ හැටියට මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් ඔබතුමාට ලිඛිතව භාර දුන්නා, "එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් අපි ඉවත් වෙලා ඉන්නේ. ඒ නිසා අපි වෙනම කණ්ඩායමක් හැටියට පිළිගන්න" කියලා. නමුත් ඒ පිළිගැනීමවත් ඔබතුමා කළේ නැහැ. [බාධා කිරීමක්] ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ කාරණය තර්ක දාලා එහාට මෙහාට විසි කරන්නේ නැතිව, අගමැති පත් කරන මූලධර්මයම විපක්ෂ නායක පත් කර ගැනීමටත් යොදා ගන්නා එකනේ කරන්න තිබෙන්නේ. ඒක කරන්න බැරි ඇයි?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
32වන ස්ථාවර නියෝගයට අදාළ සංශෝධනය ඉදිරිපත් කරන්න. ඒක දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ යෝජනාවක්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ යෝජනාව පිළිගන්නවා.

ගරු සභාපතිතුමනි, 32වන ස්ථාවර නියෝගයට පහත සඳහන් සංශෝධනය මම ඉදිරිපත් කරනවා.

"32 (3) වගන්තියට ඉක්බිතිව පහත සඳහන් කොටස ආදේශ කරන්න.

'පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ප්‍රශ්නයක් සඳහා අවම වශයෙන් තුන්වන අවස්ථාවේදීවත් පිළිතුරු සැපයිය යුත්තේ ය.' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, 33වන ස්ථාවර නියෝගයට පහත සඳහන් සංශෝධනය මම ඉදිරිපත් කරනවා.

"33(1) හි, "අතුරු ප්‍රශ්න තුනකට" යන වචන වෙනුවට "අතුරු ප්‍රශ්න දෙකකට" යන වචන ආදේශ කරන්න."

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අංක 34 සිට 37 දක්වා වන ස්ථාවර නියෝගවලට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, 38වන ස්ථාවර නියෝගයට පහත සඳහන් සංශෝධනය මම ඉදිරිපත් කරනවා.

ස්ථාවර නියෝග 38(7) හි, "අතුරු ප්‍රශ්න තුනකට" යන වචන වෙනුවට "අතුරු ප්‍රශ්න දෙකකට" යන වචන ආදේශ කරන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අංක 39 සිට 48 දක්වා වන ස්ථාවර නියෝගවලට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, 49වන ස්ථාවර නියෝගයට පහත සඳහන් සංශෝධනය මම ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, ස්ථාවර නියෝග 49හි අතුරු විධානය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

"එසේ වුවද, කථානායකවරයා විසින් ඡන්දය දීම සඳහා ඉඩ ලබා දෙනු ලැබූ කාලය අවසාන වූ බවට ප්‍රකාශ කරනු ලැබීමට පෙර එම මන්ත්‍රීවරයා විසින් එම ඉල්ලීම කරනු ලැබිය යුත්තේය."

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අංක 50 සිට 78 දක්වා වන ස්ථාවර නියෝගවලට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ස්ථාවර නියෝග 79. මෙය ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ යෝජනාවක්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, 79 වන ස්ථාවර නියෝගයට සංශෝධනයක් ඉදිරිපත් කරනවා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

"වෙත්‍රධාරිවරයා විසින් එම නියෝගය ක්‍රියාවේ යෙදවීම සඳහා කටයුතු කළ යුත්තේ ය" යනුවෙන් 79(1) වගන්තියේ අවසන් වාක්‍යය සංශෝධනය කළ යුතුයි.

එතුමාගේ යෝජනාව අපි පිළිගෙන තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අංක 80 සිට 84 දක්වා වන ස්ථාවර නියෝගවලට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ගරු සභාපතිතුමනි, අපි පාර්ලිමේන්තුව රැස්වන වේලාව වැඩි කරන්න ඕනෑය කියලා යෝජනා කළා. පාර්ලිමේන්තුව අඟහරුවාදා උදේ වරුවේ පටන්ගෙන-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒ ගැන මම දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත් පැහැදිලි කරලා දුන්නා. අපි මේ කාරණය රජය සමඟත් සාකච්ඡා කළා. සඳුදා පාර්ලිමේන්තුව රැස්වනවා නම් කැබිනට් මණ්ඩලය රැස්වෙන්න අවස්ථාවක් ගන්න පුළුවන්ද, එහෙම නැත්නම් අනික් දවස්වල, දවසකට පැය ගණනේ පැය පහක් අරගෙන කටයුතු කිරීමට පුළුවන්ද කියලා සාකච්ඡා කරලා, ඊට අදාළ අතුරු යෝජනා පසුව ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා. අගමැතිතුමා සමඟ මේ ගැන සාකච්ඡා කළාම එතුමා ඒ පිළිබඳව දැනුවත් කරන්නම් කිව්වා. අමතරව පැය පහක්, හයක් ලබා දෙන්න ඕනෑය කියන කාරණය අපි පිළිගත්තා. බොහොම ස්තුතියි, ඒ කාරණය මතු කළාට.

අංක 85 සිට 88 දක්වා වන ස්ථාවර නියෝගවලට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ වගන්ති සම්මත කරන වේගය පොඩ්ඩක් slow කළොත් හොඳයි. මොකද, මුළු පාර්ලිමේන්තුවේම අනාගතය පිළිබඳව ඔබතුමාටත්,-

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේවා සංශෝධනය කරන්න අවුරුදු පහක් විතර ගතවෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අවුරුදු දෙක හමාරක් තිස්සේ මම මේ ගැන බැලුවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ කටයුත්තට අවුරුදු දෙකහමාරක් ගත වුණා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කිසිම ආකාරයකින් බය වෙන්න එපා. අද pressure නඟින්නේ නැහැ. අද අපි බොහොම සහයෝගයෙන් මේ වැඩ කටයුත්ත කරන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
හොඳයි. මම ඒක අගය කරනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, "Order in Parliament" යටතේ කොටසක් තිබෙනවා, මන්ත්‍රීවරු පිරිසක් එකවර නම්කොට සභාගැබෙන් ඉවත් කිරීම සඳහා. මේ කොටස වෙනස් කරන්න එදා එකඟ වුණා. ඒ නිසා මේ කොටස වෙනස් කරන්න. You cannot bring in a Motion to suspend the Members of Parliament wholesale, you have to name one by one. That was agreed. මේ සංශෝධනය අවශ්‍යයි නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sumanthiran, you were also there when we discussed that.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Dinesh Gunawardena, you read that. It is very clear. We read it yesterday again. It says, "Not more than one Member shall be named at the same time," meaning, ordinarily, you can name only one Member, you cannot name a second Member. Then it goes on to say, "unless several Members...". Now, what happens is, you cannot name a group. Each Member has to be named separately, but it is an exception to the first part of the sentence which says that at a time only one Member can be named. So, here, if more than one have jointly disregarded the authority, the Chair can name the Members one by one; all must be named separately. That is very clear in this. That is why we decided to let it stand. Your concern is there in this.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
This is the existing one.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

I try to understand what you are explaining. But, according to this, the Speaker or the Chair or the Leader of the House, whoever there at that moment, can move that all the Members be named. Why do we not make a little amendment, so that the sentence is broken? This being together, you can name the Members wholesale.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

But, you have to name them one by one. That is the point. You cannot otherwise name.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, මේ වගන්තියෙන් කිසිසේත්ම ඉඩ සලසන්නේ නැහැ, මන්ත්‍රීවරුන් 05ක්, 10ක් එකවර නම් කරන්න. එක් එක් ගරු මන්ත්‍රීතුමන්ලාගේ හෝ මන්ත්‍රීතුමියන්ලාගේ නම් වෙන වෙනම කියවනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, අපේ උගත් නීතිඥ ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා, he is a very respected legal luminary in this House. What I am saying is, let us break the sentence. "Not more than one Member shall be named at the same time", let us put a full stop there, and then the sentence is broken. The Hon. Marapana could also give us some advice on this.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

This is the existing one; we have not changed it.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Shall we agree to that?

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

We have not changed it.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Shall we agree to that? Why do you not agree to that? The next sentence starts with "Unless...".

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

The meaning does not change. It is the existing sentence.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

The meaning does not change; the meaning is clear when you put a full stop. "Not more than one Member shall be named at the same time. ", එතැනට නැවතීමේ ලකුණ අවශ්‍යයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

මේක අලුත් එකක් නොවෙයි. පරණ වගන්තියමයි ඇතුළත් කර තිබෙන්නේ. [බාධා කිරීමක්] මා අතින් එහෙම වෙන්නෙත් නැහැ, ඒ නිසා භය වෙන්න එපා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අපි බොහොම සහයෝගයෙන් මේක කළේ. මේකට සම්බන්ධ තව වගන්තියක් තිබුණා. මෙහි යම් බරපතළකමක් තිබෙනවා. මන්ත්‍රීවරුන් පිරිසක් නම් කරලා, ඒ අයව ඉවත් කරලා ඡන්ද විමසීමක් තියන්න පුළුවන්. ලංකාව පිළිබඳ බරපතළ තත්ත්වයක් ඇති කළ හැකි යම් පනත් කෙටුම්පතක් ගෙන ආපු දවසකට, අපි කණ්ඩායමක් එයට විරුද්ධ වුණොත් ඒ සියලු දෙනාවම තහනම් කරලා ඉවතට ගෙන ගිහිල්ලා, ඊට පසුව ඡන්ද විමසීම පවත්වන්න පුළුවන්. මේ වගන්තිය ආවේ voting එකක් ගැන සාකච්ඡා කරන වෙලාවේ. ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා ඉතා හොඳින් ඒක පැහැදිලි කළා. ඒ නිසා මේක හුදෙකලා වූ- It is not an isolated Section: it relates to other matters.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, මෙම වගන්තිය අපි වෙනස් කරලා නැහැ. මේ වගන්තිය දැනට අවුරුදු 30කට වැඩිය මේ පාර්ලිමේන්තුවේ පරීක්ෂාවට ලක් වුණා. මේ පාර්ලිමේන්තුවේ ඔය කියන ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්න, අර්බුද, කලකෝලාහල, පහරදීම්, උද්ඝෝෂණ ඔක්කෝම අපි දැකලා තිබෙනවා. ඔබතුමා මට වඩා දැකලා ඇති. මේ වගන්තිය tested. කථානායකවරුන්ගේ පරීක්ෂාවට ලක් වෙලා තිබෙනවා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඒ නිසා full stop එක තිබුණත් නැතත්, - full stop එක තබන එක නොවෙයි ප්‍රශ්නය. ඊයේ කමිටුව විසින් මේක පරීක්ෂා කර බැලුවා. ඔබතුමාගේ මතය අපි සලකා බැලුවා. ඒ නිසා full stop එක තබන එක නොවෙයි,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

භය වෙන්න එපා. මගෙන් එහෙම දෙයක් වෙන්නෙත් නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඔබතුමාගේ මතය අපි අගය කරනවා - [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

එහෙම වෙන්නේ නැත්තේ මොකද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

Do not worry.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ගරු සභාපතිතුමනි,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
Hon. Chairman, the matter at hand is not how you would act, but what is there in the Standing Orders. So, I do beg to differ with the Hon. Sumanthiran because in the Report of the Committee on Standing Orders, under No. 77 (4) says, "Not more than one Member shall be named at the same time, unless several Members present together have jointly disregarded the authority of the Chair." So, if several Members have jointly disregarded the authority of the Chair, then, they can be named.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
They can be named one by one.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
But, we have very well-behaved MPs. So, it will not arise anyway.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
That is what the Hon. Sumanthiran says. But, it does not say that they have to be named one by one.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු සභාපතිතුමනි,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් එහෙම දෙයක් වුණේම නැහැ කියලා කියන්න බැහැ. අපේ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා පාර්ලිමේන්තුවට එන එක තමුන්නාන්සේ තහනම් කළා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒක පොඩි දෙයක් නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒක වෙනම දෙයක්. ඔබතුමා නොවෙයි නේ දිගටම ඔය පුටුවේ ඉන්නේ. අර වාගේ කෙනෙකු ඇවිල්ලා ඔය පුටුවේ වාඩි වුණොත් මන්ත්‍රීවරුන් 225 දෙනාම නම් කරලා එළියට දමාවි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, අපි ඊළඟ එකට යමු. [බාධා කිරීම්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අංක 88 සිට 122 දක්වා ස්ථාවර නියෝගවලට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු තාරක බාලසූරිය මැතිතුමා.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
Hon. Chairman, again we request you to slow down the pace, because we cannot keep up with it. Referring to No. 91 of the Report of the Committee on Standing Orders -

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
That has already passed.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
Yes, you are going at a fast pace. So, we cannot keep up with it. Sir, I am referring to No. 91 (m) of the Report of the Committee on Standing Orders which states; "The Members shall except when voting, make an acknowledgement to the Chair on entering and leaving the Chamber."

We feel that it is unnecessary because this practice is adhered by all Members. So, we feel that by including such juvenile sections into the Standing Orders, it only highlights and brings down the standard of this House. So, we hope that you will adhere to our request.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Yes, at the moment, it is a convention. So, if you do not want to have it, by all means. That is not a problem. - [*Interruption*.] Yes, I know. It is a convention only.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Yes, Hon. Sumanthiran.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

We discussed it yesterday. I agree with the Hon. Balasuriya that this need not be there. But at the same time, how it will work is that it just draws the attention of Members and reminds them that this is a convention, because sometimes some conventions are being forgotten. So, it is a good thing to have it there. Now for instance, we have a Standing Order that states, "Members shall not read newspapers,..." I mean, that sounds more juvenile than this. But, we have it. That is probably because some Members have the habit of sitting in the Chamber and reading newspapers. After that section came in, I do not see any Member reading newspapers inside the Chamber. So, it is just to remind that when you enter and leave, you make an acknowledgement to the Chair. That is all.

Thank you, Sir.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Okay.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

[*Interruption*.] We are making a joke of this.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Member, you have been insisting on this, but I think it was passed by the Committee on Standing Orders.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

Sir, we can proceed now.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ස්ථාවර නියෝග 123 සඳහා සංශෝධන ඉදිරිපත් කරන්න. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා යෝජනා කළ සංශෝධනය.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු සභාපතිතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ඉල්ලීමට ගරු කරමින්, එතුමාගේ වටිනා අදහස් සැලකිල්ලට ගනිමින් මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"123(2) වගන්තියට ඉක්බිතිවම පහත කොටස ආදේශ කරන්න;

'(3) අමාත්‍යාංශ ලේකම්වරුන්, විදෙස් දූත මණ්ඩල ප්‍රධානීන් සහ උසස් නිලතල පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරනු ලබන තෝරාගත් සංස්ථාවල සභාපතිවරු යන තනතුරු සඳහා පුද්ගලයින් පත් කරන ලද්දා වූ හෝ නිලයක් දැරීමට නම් කරන ලද්දා වූ හෝ අවස්ථාවකදී, නෙමසක කාලයක් තුළ ඔවුන්ගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදුකළ යුත්තේ ය.' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Then, the other subsections have to be renumbered.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඒ අනුව ස්ථාවර නියෝග 123හි අන්තර්ගතය නිවැරදි කළ යුතුය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 124 සිට 142 දක්වා සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් මෙම කාරණය පිළිබඳව කරුණු ඉදිරිපත් කළා. උපදේශක කාරක සභා පිළිබඳ අදහස

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

නැවත ඇතුළත් විය යුතුයි කියා ඔවුන් ඉල්ලා සිටියා. නමුත්, දැනට සාර්ථකව ක්‍රියාත්මක වන ක්‍රමවේදයන්ට අමතරව එයින් ආවරණය නොවන ක්ෂේත්‍රයක් වශයෙන් තමයි මෙය ඉදිරිපත් වෙන්නේ.

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 111 ට ඉක්බිතිවම පහත සඳහන් නව ස්ථාවර නියෝගය ඇතුළත් කරන්න;

'112. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා.

1. පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ සංඛ්‍යාවට සමාන වන්නා වූ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සංඛ්‍යාවක් ස්ථාපනය කළ යුත්තේ ය.

   අ. සභාපති ලෙස කැබිනට් අමාත්‍යවරයා
   ආ. රාජ්‍ය අමාත්‍යවරයා
   ඇ. නියෝජ්‍ය අමාත්‍යවරයා; සහ
   ඈ. තේරීම් කාරක සභාව විසින් නම් කළ වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස් දෙනෙක්.

2. ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් කාරක සභාවට යොමු කරනු ලබන කාරණා සලකා බැලීම කාරක සභාවේ කර්තව්‍යය විය යුතු ය.

3. ඉහත සාමාජිකයන්ට අමතරව වෙනත් ඕනෑම මන්ත්‍රීවරයෙකුට ද කාරක සභාවේ සභාපතිගේ අවසරය ඇතිව රැස්වීම් සඳහා සහභාගී විය හැක්කේ ය.

4. කාරක සභාව මසකට වරක් රැස්විය යුතු අතර, රැස්වී සති දෙකක් ඇතුළත ඊට අදාළ කරුණු පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේ ය.

5. කාරක සභා රැස්වීම් කැඳවීම අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ඡා කර සිදු කළ යුත්තේ ය.

6. කාරක සභාව ඉදිරියට යම් තැනැත්තෙකු කැඳවා ප්‍රශ්න කිරීමට ද, යම් ලියකියවිලි, පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ගෙන්වා පරීක්ෂා කරනු ලැබීමට ද කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

7. කාරක සභා සඳහා වන සාමාන්‍ය රීති අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සඳහා ද අදාළ විය යුත්තේ ය.' "

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියවපු එක ගැන මූලික ගැටලුවක් නැහැ. "විෂය භාර ඇමතිවරයා මූලාසනය දැරිය යුතුයි." කියලා මෙහි සඳහන්ව නැහැ නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමනි, මෙහි කියන්නේ මෙහෙමයි:

"1. පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ සංඛ්‍යාවට සමාන වන්නා වූ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සංඛ්‍යාවක් ස්ථාපනය කළ යුත්තේ ය." කියලායි කියන්නේ. එතකොට අමාත්‍යාංශයකට එකයි. එහි සාමාජිකයන් විධියට, "අ. සභාපති ලෙස කැබිනට් අමාත්‍යවරයා" සඳහන් වෙනවා. ඒ කියන්නේ, එම විෂයෙහි කැබිනට් අමාත්‍යවරයා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, එතැන "විෂය භාර" කියන වචන දෙක තිබුණොත් හොඳයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, මම යෝජනා කරනවා, "112 (1) (අ) සභාපති ලෙස අදාළ විෂය භාර කැබිනට් අමාත්‍යවරයා" ලෙස එකතු කළ යුතුයි කියා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එසේ කරන එක බොහොම හොඳයි. බොහොම ස්තුතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, ඒ අනුව පහත සඳහන් ස්ථාවර නියෝග, නව ස්ථාවර නියෝග 112ට අනුව සංශෝධනය විය යුතුය:

(1) ස්ථාවර නියෝග අංක 113

(අ) 113 (1) හි 1 වන පේළිය පහත දැක්වෙන පරිදි සංශෝධනය විය යුතුය:

"ආංශික අධීක්ෂණ කාරක සභාවල සහ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල සංයුතිය, සාමාජික සංඛ්‍යාව, ඒවායේ කර්තව්‍ය සහ ගණපූරණය"

(ආ) 113 (1) (ඉ) ට ඉක්බිතිව පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

"(ඊ) අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා"

(2) ස්ථාවර නියෝග අංක 124

124 (2) (ඌ) හි "ආංශික අධීක්ෂණ කාරක සභා," යන්නට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

"අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා,"

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

[පාර්ලිමේන්තුව එක්රැස් වෙයි.]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ

අමාත්‍යතුමා වෙනුවෙන්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග" ලෙස පිළිගනු ලබන බවද, ගරු කථානායකතුමා විසින් නිවේදනය කරන දින සිට එය බලාත්මක විය යුතු බවද යෝජනා කරමි. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කරගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා පාර්ලිමේන්තු මහ ලේකම්වරයාට අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය

பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவை

CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී***
***ඊට අදාළ ප්‍රශ්නය [2018 පෙබරවාරි 19]***

*ஒத்திவைக்கப்பட்ட குழு மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [ 2018 பெப்ருவரி 19]*

*Order read for resuming Adjourned Debate on Question - [ 19th February, 2018]*

"පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ චර්යා ධර්ම සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා පිළිගන්වන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ අවසන් කෙටුම්පත අනුමත කළ යුතුය." [ගරු අජිත් පී. පෙරේරා මහතා]

" பாராளுமன்ற உறுப்பினர்களின் நடத்தை தொடர்பில், 2017 நவம்பர் மாதம் 07ஆம் திகதி, செவ்வாய்க்கிழமை சமர்ப்பிக்கப் பட்ட பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவை யின் இறுதி வரைவு அங்கீகரிக்கப்படுமாக." - *[மாண்புமிகு அஜித் பீ. பெரேரா]*

"That the final draft of the Code of Conduct for Members of Parliament relating to their conduct which was presented on Tuesday, November 07, 2017, be approved." - [*The Hon. Ajith P. Perera*]

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

.]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
"පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය යුතු යයි මම යෝජනා කරමි."

සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

[පාර්ලිමේන්තුව කාරක සභාව බවට පරිවර්තනය වෙයි.]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
1 සිට 58 දක්වා වගන්ති සඳහා සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

[පාර්ලිමේන්තුව එක්රැස්වෙයි.]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය සංශෝධන රහිතව සම්මත කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කෙටුම්පත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය ලෙස පිළිගනු ලබන බවද, ගරු කථානායකතුමා විසින් නිවේදනය කරනු ලබන දින සිට එය බලාත්මක විය යුතු බවද යෝජනා කරමි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා පාර්ලිමේන්තු මහ ලේකම්වරයාට අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම මෙය අවස්ථාවක් කර ගන්නවා, පාර්ලිමේන්තුවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මාගේ හෘදයංගම ස්තුතිය පුද කරන්න. අවුරුදු විසි ගණනකට පස්සේ අපට මෙම සංශෝධන ගෙනැල්ලා අලුත් යෝජනා ක්‍රමයක් ඇති කිරීමට හැකි වීම ගැන අපි සියලු දෙනාම සන්තෝෂ වනවා. මේ තුළින් අපට විනයගරුක පාර්ලිමේන්තුවක්, ආදර්ශවත් පාර්ලිමේන්තුවක්, ලෝකයම පිළිගන්නා පාර්ලිමේන්තුවක් ඇති කිරීමට හැකි වේවා! කියා මා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම මීට ඉහත අවස්ථා කිහිපයකදීම මා සඳහන් කළා, අන්තර්ජාතික පාර්ලිමේන්තු සංගමය විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ඉතාමත් උසස් මට්ටමේ ආදර්ශවත් පාර්ලිමේන්තුවක් වශයෙන් පිළිගෙන තිබෙන බව. ඒ පිළිගැනීම තවදුරටත් ශක්තිමත් කිරීමට අද තමුන්නාන්සේලා දුන් මේ සහයෝගය තුළින් අලුත් ගමනක් ආරම්භ කිරීමට හැකි වේවා! කියා මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, රජය වෙනුවෙනුත් මේ ගැන විශේෂයෙන් යමක් සඳහන් කළ යුතුයි. වර්තමාන යහපාලන රජය බලයට පත් වෙන්න පෙර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම සංග්‍රහයක් සකස් කරන බවට අපි මැතිවරණ පොරොන්දුවක් ලබා දුන්නා. රටේ ජනතාව එය අනුමත කළා. වසර දෙකහමාරක් පමණ ගත වුණත් සියලුම පක්ෂවල ගරු මන්ත්‍රීතුමන්ලාගේ උපරිම සහයෝගයෙන්, අදහස් සලකා බලමින්, ශ්‍රේෂ්ඨ සම්ප්‍රදායන් පිළිබඳව, ලෝකයේ සම්ප්‍රදායන් පිළිබඳව කරුණු සලකා බලමින් අපට පුළුවන්කම ලැබුණා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයක් හඳුන්වා දෙන්න. ඒක මේ රටම ලබපු ජයග්‍රහණයක්. ඒ වාගේම අපේ පාර්ලිමේන්තුව ලබපු ජයග්‍රහණයක් වශයෙන් අපට සලකන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුව ආදර්ශයක් සැපයිය යුතු තැනක් වුණත්, පසුගිය කාලයේ ඒ ආදර්ශය සපයන්න අප අසමත් වුණා. නමුත් අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ චර්යා ධර්ම සංග්‍රහය ගැඹුරින් අධ්‍යයනය කරමින් ඒ අනුව කටයුතු කළොත්, අපේ මේ පාර්ලිමේන්තුව ආදර්ශවත් තැනක් බවට නැවතත් පත් කරන්න හැකියාව ලැබෙනවා. ඒ වාගේම පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධනය කිරීමත් කාලීන අවශ්‍යතාවක්ව තිබුණා. ඒ සඳහාත් අවස්ථාව ලැබුණා. අපි ඒ ගැන ඉතාම සතුටු වනවා. රජය වෙනුවෙන් පාර්ලිමේන්තුවේ සියලුම නිලධාරීන්ටත්, ඒ වාගේම සියලුම පක්ෂවල ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ඒ සඳහා අදහස් දක්වපු සියලු දෙනාටත් අපේ ගෞරවය හා ස්තුතිය පිරිනමන්න මා කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. පාර්ලිමේන්තුවේ නිලධාරි මණ්ඩලය ඒ වෙනුවෙන් විශේෂ කැපවීමක් කළ බව මමත් සඳහන් කරන්න කැමැතියි.

යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2 සහ 3.

# ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත
## மிகைப்பொருள் திணிப்பெதிர்ப்பு மற்றும் எதிரீட்டுத் தீர்வைகள் சட்டமூலம்
## ANTI-DUMPING AND COUNTERVAILING DUTIES BILL

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී***
***ඊට අදාළ ප්‍රශ්නය [2017 දෙසැම්බර් 11]***
***"පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතු ය" [ගරු මලික් සමරවික්‍රම මහතා]***
***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [2017 டிசம்பர் 11]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு மலிக் சமரவிக்கிரம]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [ 11th December,2017 ]*
*"That the Bill be now read a Second time".- [ The Hon. Malik Samarawickrama]*
*Question again proposed.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ අංක 1 සහ 2 යටතේ සඳහන් විවාදය කල් තබනු ලැබූ පනත් කෙටුම්පත් දෙකත්, අංක 3 යටතේ සඳහන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත දෙවනවර කියවීම සඳහාත් ඉදිරිපත් කරනවා.

[අ.භා. 2.17]

**ගරු තිලක් මාරපන මහතා (සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலக் மாரபன - அபிவிருத்திப் பணிப் பொறுப்புகள் அமைச்சரும் வெளிநாட்டலுவல்கள் அமைச்சரும்)
(The Hon. Tilak Marapana -Minister of Development Assignments and Minister of Foreign Affairs)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, මෙහි සඳහන් කරලා තිබෙන සෑම වරදක්ම වාගේ අපේ ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ සහ අනෙක් නීතිවල දැනටමත් වැරදි හැටියට ගණන් ගන්නා වැරදි. අපට මේ පනත් කෙටුම්පත ගෙනෙන්න හේතු වුණේ ඇයි? 2015 දෙසැම්බර් 10 වනදා මේ ජාත්‍යන්තර සම්මුතියට අපි -ශ්‍රී ලංකාව- අත්සන් කරලා, 2016 වසරේදී නැවත අනුමැතියක් ලබා දුන්නා. ඒ ජාත්‍යන්තර සම්මුතිය ප්‍රකාරව මේකට සරිලන දේශීය නීති රටාවක් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගන්න අපි වගකීමක් දරා තිබෙනවා. We have brought this piece of legislation to Parliament in conformity with that international obligation because we have to give effect to what we have undertaken through this Convention that we have signed.

ඇත්ත වශයෙන්ම මේ ජාත්‍යන්තර සම්මුතියට අපි අත්සන් කළත්, ඒ ජාත්‍යන්තර සම්මුතිය නොවෙයි ලංකාවේ නීතිය හැටියට ගණන් ගැනෙන්නේ. ලංකාවේ නීතිය හැටියට ගණන් ගැනෙන්නේ අපි අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පතේ සඳහන් කර තිබෙන නීතියයි. ගරු කථානායකතුමනි, අපි මේ නීතිය විග්‍රහයකට ලක් කළොත් මෙහි 3 වන වගන්තියෙන් කියන්නේ රජයට සම්බන්ධ නිලධාරියෙක් යම් කිසි කෙනෙකු අත් අඩංගුවට ගෙන හෝ රඳවා ගැනීමක් කර, ඒක පිළිනොගෙන සිටියොත්, ඒ කරුණ සඟවා ගෙන සිටියොත්, එහෙමත් නැත්නම් ඒ අත් අඩංගුවට ගත් පුද්ගලයාගේ වර්තමාන තත්ත්වය පිළිබඳව තොරතුරු නොදී සිටියොත්, එවැනි දෙයක් කළොත් මෙම පනත් කෙටුම්පත ප්‍රකාරව රජයට සම්බන්ධ ඒ නිලධාරියා වරදකට යටත් කර, අවුරුදු විස්සකට වැඩි නොවන කාලයක් සඳහා සිර දඬුවමකට ලක් වීමට අවකාශය තිබෙනවා. රුපියල් ලක්ෂ දහයකට වැඩි නොවන දඩ මුදලකටත් යටත් වෙනවා. ඒ වාගේම වන්දි වශයෙන් රුපියල් ලක්ෂ පහකට අඩු නොවන මුදලක් ඒ සිර කරගෙන සිටි පුද්ගලයාට ගෙවීමටත් යටත් වෙනවා. ඒ වාගේම 3 (2) උප වගන්තිය යටතේ රජයට සම්බන්ධ නැති වෙනත් පුද්ගලයකු නීති විරෝධීව යම් කිසි කෙනෙකුව බලහත්කාරයෙන් පැහැර ගත්තොත් හෝ සඟවාගෙන සිටියොත් හෝ එවැනි පුද්ගලයකු සම්බන්ධයෙන් තොරතුරු නොදී සිටියොත් ඒ පුද්ගලයාටත් ඒ ආකාරයෙන්ම දඬුවම් කිරීමට අවකාශය ලැබෙනවා.

ගරු කථානායකතුමනි, 3 (1) උප වගන්තියේ කිව්ව ආකාරයට රජයට අනුයුක්ත නිලධාරියා අධීක්ෂණය කරන උසස් නිලධාරියෙක් මේ පිළිබඳව දැන ගෙන යම් කිසි අනුබල දීමක් කළොත් ඔහුටත් මේ පනත් කෙටුම්පත ප්‍රකාරව දඬුවම් කිරීමට අවකාශය තිබෙනවා.

ගරු කථානායකතුමනි, කලින් සිදුවුණු ක්‍රියා වරදවල් හැටියට පරිවර්තනය කිරීමට මෙම පනත් කෙටුම්පතෙහි කිසිම වගන්තියක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මෙය සම්පූර්ණයෙන්ම ඉදිරියට අදාළ වෙන පනත් කෙටුම්පතක් විතරයි. මෙම පනත් කෙටුම්පතෙහි සඳහන් ක්‍රියාවලට පටහැනිව ඉදිරියේදී යම්කිසි ක්‍රියාමාර්ගයක් ගත්තොත්, එවැනි ක්‍රියා පමණයි මෙම පනත් කෙටුම්පත ප්‍රකාරව වරදක් හැටියට ගණන් ගන්න පුළුවන් වෙන්නේ.

ගරු කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පත ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට ඉදිරිපත් වුණු අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු කරුණු ඉදිරිපත් කරමින්, විශේෂයෙන්ම මෙම පනත් කෙටුම්පතෙහි 8 වන වගන්තිය පිළිබඳව යම්කිසි මතයක් ඉදිරිපත් කළා. 8 වන වගන්තිය හරියට කියවා බැලුවොත් එහි සඳහන් කර තිබෙන්නේ මොකක්ද කියන එක අපට පෙනී යනවා. එහි සඳහන්ව තිබෙන ආකාරයට යම්කිසි වරදක් කර තිබෙන පුද්ගලයෙක් පිළිබඳව පිටරට රජයකින් අපේ රජයෙන් තොරතුරු විමසූ අවස්ථාවකදී, අපි එම පුද්ගලයා සම්බන්ධයෙන් කුමන ආකාරයක ක්‍රියාමාර්ගයක් ගන්නවාද කියන එක දන්වන්න අපේ රජය බැඳී සිටිනවා. එපමණයි. වෙන කිසි දෙයක් නොවෙයි. ඇත්ත වශයෙන්ම අපි එම පුද්ගලයා භාර දෙන්න ඕනෑය කියන එකවත් මෙම වගන්තියේ සඳහන් වෙන්නේ නැහැ. මෙම වගන්තියේ සඳහන් කර තිබෙන්නේ, අපි එම තැනැත්තාට නඩු පවරනවාද, එහෙම නැත්නම් මොන ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට බලාපොරොත්තු වෙනවාද කියන එක එම රජයට දැනුම් දෙන්න ඕනෑය කියන එකයි. හැබැයි, මෙතැනදී ගරු මන්ත්‍රීවරුන් යම්කිසි සැකයක් ඉදිරිපත් කරපු නිසා, ඇත්ත වශයෙන්ම මෙම වගන්තිය කිසිම ආකාරයකින් ලංකාවේ පුරවැසියෙකුට බලපාන අන්දමට පනවන්න නොවෙයි අපි බලාපොරොත්තු වුණේ කියන එක සඳහන් කරන්න ඕනෑ. ඒ පිළිබඳව කිසිම සැකයක් පැන නොනඟින හැටියට මෙම පනත් කෙටුම්පතෙහි 8 වන වගන්තියේ 7 වන පේළියේ, "කරනු ලැබූ" කියන තැනට "ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන" කියන වචන ටික ආදේශ කරන්න කියලා මම යෝජනා කරනවා, ගරු කථානායකතුමනි. එසේ ආදේශ කළාම, 8 වන වගන්තියේ සඳහන් කරුණු ශ්‍රී ලාංකික පුරවැසියෙකුට බලපාන්නේ නැහැ කියන එක පැහැදිලි වෙනවා. ඒ වාගේම ආංශික අධීක්ෂණ කාරක සභාවේදී මතු වුණු සැකය දුරු කර ගන්නත් පුළුවන් වෙනවා.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Sumanthiran, please.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Minister, this is just to get a clarification. That Clause 8 is obviously with regard to a person who has committed an offence on foreign soil. So ordinarily, that country will have jurisdiction over that person whether he be a Sri Lankan or of another nationality, if he was in that country. The question is, if he has escaped and come to Sri Lanka, according to the amendment that you will be moving later, "if he is a Sri Lankan, he can escape that jurisdiction, come and hide here and this will not apply to him." That is what you are going to do.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
No. Hon. Member, you will see what this Clause contemplates is that a foreign government can make inquiries from the Sri Lankan Government as to any person who has committed any offence is presently in Sri Lanka.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
No, the measures taken is either to extradite or to prosecute. So, if you are going to exempt that person from even being prosecuted in Sri Lanka-

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
No, he is not going to be exempted from anything. Only thing is, if you put the words "other than a Sri Lankan national", then we are not obliged to give that information in respect of a Sri Lankan national.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
( மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Why should you not give, if it is an offence committed -

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)

Hon. Member in my opinion, there is no need to put that word because that is redundant. But what I say is in order to satisfy someone, it does not matter if we put that in, because this does not in anyway obligate us to extradite that person.

ඒ නිසා ගරු කථානායකතුමනි, මම යෝජනා කරනවා, මේ පනත් කෙටුම්පත පිළිගෙන එය සම්මත කළ යුතුය කියා. මෙය සම්මත කිරීමෙන් අපේ රටට කිසිම හානියක් සිද්ධ වන්නේ නැහැ. මේ වාගේ පනත් කෙටුම්පත් තිබෙන එකෙන් අපි මුළු ලෝකයටම පෙන්වනවා, අපේ රට ශිෂ්ටාචාරවත් සමාජයක් ඇති රටක්ය කියන එක. මොකද, නීතියේ ආධිපත්‍යය පිළිගෙන මේ වාගේ ක්‍රියාවලට අප තදින්ම විරුද්ධ වනවා කියන පණිවුඩය යවන එක තමයි අපට අවශ්‍ය කරන්නේ. බොහොම ස්තුතියි.

[2.27p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Mr. Speaker, for the opportunity to speak on the International Convention for the Protection of All Persons from Enforced Disappearance. We welcome the move by the Government to make municipal law in respect of an international Convention that the Government has acceded to.

This particular Convention deals with enforced disappearances, a scourge that has affected our country much more than it has affected many other countries of the world. There are also other countries that have suffered from this kind of crime, but Sri Lanka has had a long history of disappearances. One must understand the serious nature of disappearance. It is worse than even the crime of murder - for in a murder the next of kin know the fate of the person who has been murdered or who is missing; they know what has happened to that person. But, in the case of disappearances, they live in constant hope that the person is living somewhere and will return one day. The numbers of these disappeared persons or who had been made to disappear is enormous in Sri Lanka. During the second JVP uprising in 1988/89, it was reported that more than 60,000 people went missing. Officially, I think around 30,000 was acknowledged, but it is believed that more than 60,000 youth went missing. People cannot just go missing - they are not objects that fall between cracks and cannot be found later. They are made to disappear.

Subsequently, during the long armed conflict that raged in the North and the East, particularly during the last phase, tens of thousands had gone missing and the complaints are that they did not just go missing, that they surrendered to the security forces, but are not to be found now. The Government itself appointed commissions. I refer particularly to the Paranagama Commission appointed by the previous Government and the Report that was submitted to this Parliament, which clearly states that there were reported cases of over 20,000 persons who had been handed over or who had surrendered to the security forces and had gone missing and another 5,000 of disappeared persons, not enforced, but disappeared persons. So, this is a very serious issue.

I heard the Hon. Minister say that if we make this into law, we will be telling the whole world that we are a country that abides by the rule of law and by all these ideals and so on. I beg to defer, Hon. Minister. That is not when we will become an ideal country in the world, but we will become an ideal country in the world when there are no more disappearances in this country and when we effectively punish those responsible for the disappearances. That is when the rule of law reigns in this country, not when the Government, even when enacting legislation to comply with international obligations, is bending backwards to protect those who are responsible.

It is obvious and so plainly clear today in this House when this Bill is to be enacted into law that the concerns are all about offenders not coming within the purview of the law, not getting caught. We are concerned that what if they get caught elsewhere, what if Sri Lankans are found to have committed these offences in another country, perhaps? This is all about protecting the offenders of this most heinous crime and that, I think, exposes the intention of the Government, that this is not a noble thing that the Government is doing, but is as an eyewash to satisfy various persons, to tell the world that we are complying with these international obligations and also exposes that it is a Government that does not have the will to actually go after persons who are responsible for these crimes. It may be that the people against whom or towards whom the finger is pointed are from the security forces. But, that makes no excuse. Whoever it be, if they are responsible for enforced disappearance, they must be made to acknowledge, answer and be punished for that offence. The whole Convention that we have ratified is for that purpose, not to find loopholes for members of the security forces to slide through and escape.

So, the intention of the Government is most important and again, may I say with respect to the Hon. Minister, even the attempt to say that this is only for the future and not for the past, I say, is pathetic because all what you are trying to do and what you are saying is that persons who are responsible for enforced disappearances in the past - you are giving an assurance in this House - would not be pursued. You are telling them, “Do not worry, you have committed this offence, but we would not come after you”. Your slant is entirely to reassure offenders that they would not be punished. I did not hear the tone from you which said, “We will go after the offenders and will punish them; we will ensure that this will not happen again because we punish”.

The whole of yesterday, we debated the present situation in the country. We are very concerned about that because that situation still continues. From both sides of the House, we said, “It is because of impunity, because offenders are not punished, because offenders are not prised out and made a spectacle that this continues".

This will apply with great force to the issue of enforced disappearances also. It is because your intent is to protect offenders of these heinous crime that it

continues. So, it maybe that, according to what you say, this is for the future. I do not agree; it cannot be for the future. If there is an offence of disappearance, that must be inquired into, offenders must be found out and prosecuted. But, by saying that it is only for the future, what you are communicating is that those who have done it in the near past are all safe, that they do not have to worry. [*Interruption.*] Yes, safe. I am saying that the entire tone of your presentation of this Bill is to give the assurance to offenders, "Do not worry, you would not be pursued". And that, we find severely problematic when in the next breath you say, "We will be a country that abides by all these obligations, a country where the rule of law will reign".

So, whilst welcoming this effort to enact into municipal law an international obligation, I want to place on record our disappointment with the attitude with which this Government is bringing this Bill, bending backwards to assure offenders that they will not be pursued.

Thank you.

[අ.භා. 2.37]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, අද දිනය විශේෂ දිනයක්. මොකද, ප්‍රචණ්ඩත්වයට, කලහකාරිත්වයට, එහෙම නැත්නම් ඒකාධිපතිත්වයට වියරුවැටී සිටි සමාජයක් වෙනස් කරන්නට තීන්දු රැසක් අද මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ගන්නා දිනයක්. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත, ඒ වාගේම පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත, ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කියන කාරණා විවාදයට ගන්නා දිනයක්.

මම දන්නවා ගරු කථානායකතුමනි, ඔබතුමාටත් අද දිනය විශේෂ දවසක් බව. ඔබතුමා එදා දේශපාලන ක්ෂේත්‍රයට ආපු දවසේ සිට උත්සාහ කළේ යහපත් සමාජයක් රටට නිර්මාණය කිරීමට අවශ්‍ය අඩිතාලම දමන්නයි. ඒ නිසා අද දිනය ඔබතුමාත්, ඒ වාගේම යහ පාලන රජයත්, අප සියලු දෙනාත් මේ රටේ යහ පාලනයක් ඇති කිරීම සඳහා පියවර ගත් දිනයක් විධියට දකිනවා. අපි දන්නවා, "ඉන්දියන් සාගරයේ මුතු ඇටය" එහෙම නැත්නම් "ධර්මද්වීපය" කියලා මේ දිවයින විරුදාවලි ලැබූ රටක් බව. නමුත් පසුගිය කාලයේ වෙච්ච සිද්ධීන් දෙස බැලුවාම මේ රට "ඉන්දියන් සාගරයේ වධකාගාරය" කියා කියන්න පුළුවන් තත්ත්වයට පත්වෙච්ච රටක්. ඉන්දියන් සාගරයේ වධකාගාරයක් වෙච්ච මේ රට, ලෝකයේම පිළිකුලට ලක්වෙච්ච මේ රට, විවිධ ජාතීන් අතර හැලහැප්පීම් ඇති කරලා විවිධ අඩන්තේට්ටම් සිදුවෙච්ච මේ රට යහ පාලනයක් තුළ නැවතත් ධර්මද්වීපයක් කිරීමට ගත් පියවරක් ලෙස මා මෙය දකිනවා. එදා දහම් දිවයිනක් ලෙස පැවතුණත් දශක කිහිපයක් දෙස ආපසු හැරී බැලුවාම අපි දකිනවා, විවිධ දේශපාලන හේතූන් මත දේශපාලන කණ්ඩායම්වල බලය තහවුරු කර ගැනීමට මේ රටේ මාධ්‍යවේදීන්, මේ රටේ වෘත්තිකයන්, මේ රටේ ව්‍යාපාරිකයන් කී දෙනෙක් බලහත්කාරයෙන් අතුරුදහන් කෙරෙව්වාද කියා. නමුත් ඒකට තිත තැබීම සඳහා මේ ගත් උත්සාහය මන්ත්‍රීවරයෙක් වශයෙන් මා අගය කරනවා.

ගරු කථානායකතුමනි, 1971 දිහා බැලුවොත් විශ්වවිද්‍යාලවල සිසුන් කී දෙනෙක් අතුරුදහන් වුණාද? ඒ සිසුන්ගේ සමහර දෙමාපියන් "මේ දරුවන් හෙට එයි, අනිද්දා එයි, ඊළඟ දවසේ එයි" කිය කියා මඟ දෙපස බලා ඉඳලාම මිය ගිහින් තිබෙනවා. ඇස් දල්වාගෙන බලා ඉඳලා ඒ සමහර දෙමාපියන් මිය ගිය අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. ඒ බලාපොරොත්තු ඉෂ්ට කර ගන්න බැරුව, බලාපොරොත්තු බොඳ වෙලා ගිහිල්ලා ඒ අය මිය ගිහින් තිබෙනවා. ඒ වාගේම 1988, 1989, 1990 භීෂණ සමය දිහා බලන්න. කී දෙනෙක් නම් අතුරුදහන් වුණාද? සමහරවිට අද වෙනතුරුත් ඒ අයගේ ඥාතීන්, ඒ අයගේ දරුවන්, ඒ අයගේ දෙමාපියන් ඔවුන් එයි කියා බලාගෙන ඉන්නවා. මැරුණා කියන එක පිළි නොගෙන දේවාලවලට ගිහිල්ලා, පල්ලි පන්සල්වලට ගිහිල්ලා පඬුරු ගැට ගසා "මගේ දරුවා අද ඒවි, හෙට ඒවි, මගේ දරුවා ගැන තොරතුරක් දැනගන්න අවශ්‍යයි" කියා කීදෙනකු නම් දෑස් දල්වාගෙන ඉන්නවාද? ඒ වාගේම පසුගිය යුද සමය දිහා බැලුවාම, සිංහල සොල්දාදුවන්ගේ දෙමව්පියන්, සිංහල සොල්දාදුවන්ගේ බිරින්දෑවරුන්, සිංහල සොල්දාදුවන්ගේ මව්වරුන් පියවරුන් කීදෙනකු නම් තවමත් බලාගෙන ඉන්නවාද, ඒ අයට, ඒ අයගේ දරුවන්ට අදාළ නීතිමය කටයුතුවත් කරගන්න බැරිව?

ඒ විතරක් නොවෙයි. උතුරට නැඟෙනහිරට ගිහින් බැලුවොත් පෙනේවි, ද්‍රවිඩ, මුස්ලිම් ජනතාවටත් අත් වූ ඉරණම ඒකයි කියා. ඒ විතරක් නොවෙයි. පසු ගිය දශකය දිහා බැලුවොත් එක්නැළිගොඩ ප්‍රධාන කොට ගත් මාධ්‍යවේදීන් කීදෙනකු අතුරුදහන් වුණාද? පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ සාමාජිකයන් වන ලලිත්, කුගන් ආදි පුද්ගලයන්, විවිධ දේශපාලන චරිත රඟ පාන්න ගිය පුද්ගලයන් -ඒ වාගේ දේශපාලන නායකයන්- කීදෙනෙකු අතුරුදහන් වුණාද? ඒ අතුරුදහන්වීම්වලට සිංහල ද, දෙමළ ද, මුස්ලිම් ද, මොන ආගමේ ද කියා වෙනසක් තිබුණේ නැහැ. පොදුවේ හැම ජාතියකම අය අතුරුදහන් වුණා. උතුරේ සමහර ද්‍රවිඩ තරුණයන් ඉන්නවා, අතුරුදහන් වුණා කියා රට හැර ගිය. නමුත් එසේ රට හැර ගිය අය ගැන විස්තර සොයා ගන්න බැරි වීම නිසා, විස්තර සොයා ගැනීමට අපොහොසත් වීම නිසා, ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් නොතිබීම නිසා සමහර විට අපි ලෝකයේ අපවාදවලට ලක් වනවා, 'මෙන්න මේ රටේ පුද්ගලයන් අතුරුදහන් වුණා' කියා. ඒ අය අතුරුදහන් වුණාද, එහෙම නැත්නම් රට හැර ගිහින් වෙනත් රටක ජීවත් වනවාද කියන එක හෙළිදරව් කරගැනීමේ හැකියාවක් මේ කාර්යාලය පිහිටුවීම තුළ අද අපට ලැබෙනවා. ගරු කථානායකතුමනි, මම විශේෂයෙන් කියනවා, මේකට සිංහල ද, දෙමළ ද, මුස්ලිම් ද, බුද්ධාගම ද කියා භේදයක් නැති බව. කප්පම් ගැනීමට වෙනත් කණ්ඩායම් -එදා රජය හා සම්බන්ධ කණ්ඩායම්- සමහර විට හමුදා නිලධාරින්ගේ වෙස් අරගෙන කටයුතු කළා. ඒ අය හමුදා නිලධාරින් නොවෙයි. සමහර විට හමුදා නිලධාරින්ගේ වෙස් අරගෙන, පොලිස් නිලධාරින්ගේ වෙස් අරගෙන සුදු වෑන් අරගෙන ඇවිල්ලා කප්පම් ගැනීම සඳහා බලහත්කාරයෙන් අතුරුදහන් කරපු අය ඉන්නවා. ඒ වාගේම තමන්ගේ දේශපාලන මතයට විරුද්ධ වුණා නම් ඒ අය අතුරුදහන් කරපු අවස්ථා පසු ගිය දශකය තුළ අපි අනන්ත අප්‍රමාණ දැක්කා. රාජ්‍ය බලය යොදා ගෙන වෘත්තීය සමිති නායකයන් අතුරුදහන් කරපු අවස්ථා තිබුණා. "සුදු වෑන් සංස්කෘතිය" කියා වෙනම සංස්කෘතියක් පසු ගිය ආණ්ඩුව කාලයේ පැවතුණා. ඒ පැහැරගත් හැම කෙනාම කාගේ හෝ දරුවෙක්; කාගේ හෝ පියෙක්; කාගේ හෝ සහෝදරයෙක්; කාගේ හෝ ස්වාමිපුරුෂයෙක්. ඒ අයගේ පවුල්වල සාමාජිකයන් අද වනතුරුත් ඇස් දල්වාගෙන ඉන්නවා, 'හෙට මගේ දරුවා ඒවි. හෙට මගේ ස්වාමි පුරුෂයා ඒවි. හෙට මගේ පියා මාව බලන්න ඒවි' කියා. මා අර කලින් කිව්වා වාගේ දේවාල ගණනේ ගිහිල්ලා පඬුරු ගැට ගසගසා, සාස්තර අසඅසා මිථ්‍යා විශ්වාස ඇදහිලි පස්සේ ඔවුන් යනවා. කරන්න වෙනත් දෙයක් නැහැ. ඒ මිථ්‍යා විශ්වාස පසුපසත් ගිහින් බලාගෙන ඉන්නවා, මේකට උත්තරයක් ලැබේවි කියා.

නමුත්, අද මේ පනත් කෙටුම්පත ක්‍රියාත්මක කිරීම තුළින් මේ අයට යම් සහනයක් ලැබෙයි කියා හිතනවා. පසුගිය කාලයේ අපේ

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

රටේ මිනිසුන් ජීවත් වුණේ හෙට දිනය ගැන විශ්වාසයක් නැතිවයි. හෙට දිනයේ වෙන්නේ මොනවාද කියලා දන්නේ නැහැ. මොකද, මේකට ආගමක් මුල් වුණේ නැහැ. මේකට ජාතියක් මුල් වුණේ නැහැ. මේකට වයසක් මුල් වුණේ නැහැ. කිසිම සාධකයක් නැතිව, හිටපු ගමන් රට වැන් එකකින් ඇවිල්ලා උස්සා ගෙන යනවා. මේ රටේ එහෙම තත්ත්වයක් තිබුණා. සමහර තරුණ අය තමුන්ගේ ජීවිතයේ ස්ථිරතාවක් දකින්නේ නැතිව, තමන්ගේ උගත්කම පාවිච්චි කරලා, උගත්කමට ලෝකයේ තිබෙන ඉල්ලුම පාවිච්චි කරලා පවුල් පිටින් මේ රට හැරගියා. තවත් සමහර අය මරණයට තිබෙන බියෙන්, ජීවිතය ගැට ගහ ගන්න ඕනෑ නිසා ඇති වෙච්ච එඩිතරභාවයෙන් විවිධ ක්‍රමවලින් -බෝට්ටුවලින්, එහෙමත් නැත්නම් විවිධ අක්‍රමවත් ක්‍රමවලින්, විවිධ අන්තරාදායක ක්‍රමවලින්- රට හැර ගිය අවස්ථා අපි දැකලා තිබෙනවා. මේ රටේ ජීවත්වෙන ජනතාවට තමුන්ගේ ජීවිතය ගැන ස්ථිරත්වයක් තියා ගන්න බැරිව ගියා. 2015 ජනවාරි 08වෙනි දා ජනතා විප්ලවයක් බිහි වෙන්න මෙය එක් හේතුවක් වුණා.

ගරු කථානායකතුමනි, මේ රටේ සහජීවනය ඇති කරන්න, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්න, මේ රටේ යහපාලනය ඇති කරන්න, ආගම් කුල දේශපාලන භේදයකින් තොරව මේ රටේ සියලු ජනතාවට තමුන්ගේ ජීවිතය ගැන සහතිකයක් ලබා දෙන්න පුළුවන් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉතාමත්ම එඩිතරව, විවිධ බාධක මැද්දේ ගෙනැල්ලා සම්මත කර ගැනීමට උත්සාහ කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා; මම සතුටු වෙනවා. ගරු කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පත විශේෂයෙන්ම අප සම්මත කරන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, මෙය රණවිරුවන්ට නැත්නම් දේශපාලන නායකයන්ට දඬුවම් පමුණුවන්න ගෙනෙන වෛරී සහගත පනත් කෙටුම්පතක් කියලාත් අර්ථ කථනයක් දෙන්න විවිධ කණ්ඩායම් කටයුතු කරනවා. විශේෂයෙන්ම අද මේ පනත් කෙටුම්පත ගැන පැහැදිලි කරද්දී කිවුවා, මේ පනත් කෙටුම්පත සම්මත වූ දා සිට වුණු සිද්ධීන් සඳහා පමණයි මේ පනත් කෙටුම්පත බලාත්මක වෙන්නේ කියලා. එහෙම පැහැදිලිව කියද්දීත් එදා වුණු සිද්ධියක් ගැන කථා කරලා මෙන්න රණවිරුවන් අත් අඩංගුවට ගන්න හදන ක්‍රමවේදයක්, එහෙම නැත්නම් එදා හිටපු දේශපාලන නායකයන් අත් අඩංගුවට ගන්න හදන ක්‍රමවේදයක් කියලා බොරු මතයක් ජනතාවට මවා පාලා කඩාකප්පල්කාරී ක්‍රියාවක නිරත වෙමින් මේ රටේ ජනතාවට ලැබෙන මෙම මහඟු අවස්ථාව ගිලිහී යන්නට කටයුතු කරනවා. කොටින්ම කිව්වොත්, මේක එහෙම ආයතනයක් නොවෙයි. මේ පිහිටුවන්නේ උසාවියක් නොවෙයි.

මේ පිහිටුවන්නේ, ආගම් භේදයක් හෝ ජාති භේදයක් නැතුව මේ රටේ අතුරුදන් වූ දසදහසක් ජනතාව ගැන ඇත්ත හෙළි කර ගැනීමට, එහෙම නැත්නම් තමන්ගේ ඥාතියාට සිදු වුණේ මොකක්ද කියා සොයා බලන්නන්ට විසඳුම් ලබා දෙන ආයතනයක්. මෙය ඒ සඳහා ස්ථාපිත කරන ආයතනයක් මිස, අධිකරණයක් නොවෙයි කියන එක අපි පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. යම් පුද්ගලයෙක් අතුරුදන් වෙලා නම් ඔහු ජීවතුන් අතර ඉන්නවාද නැද්ද, ඔහු වෙනත් රටකට ගිහින් ජීවත් වනවාද, ඔහු අතුරුදන් වුණේ කොහොමද, මරණයට පත් වුණාද, මරණයට පත් වුණේ කොහොමද, ඒ කොහේදීද, කවදාද කියන තොරතුරු දැනගන්න පුළුවන් ආයතනයක් තමයි මේ පිහිටුවන්නේ. කොටින්ම කිව්වොත්, මෙයින් සිද්ධ වන්නේ මේ රටේ මානව හිමිකම් තහවුරු කිරීමක් මිසක් වෙන දෙයක් නොවෙයි.

විශේෂයෙන්ම වින්දිතයට පත් වුණු අයට මේ ආයතනය නිසා යම් සහනයක් වනවා විතරක් නොවෙයි, මේ රටේ විවිධ කාරණා සම්බන්ධයෙන් විවිධ මත පළ කරන අයගේ ජීවිතයට සහතිකයක් දෙනවා. "උද්ඝෝෂණය කළත්, ආණ්ඩුවට විරුද්ධ වුණත්, මොන මතය දැරුවත් අපි ඔයගොල්ලන්ගේ ජීවිතය ආරක්ෂා කරනවා, බලහත්කාරයෙන් අතුරුදන් කරන්නේ නැහැ" කියන ඒ සහතිකය දෙන පනත් කෙටුම්පතක් වශයෙන් මම විශේෂයෙන්ම මෙය සඳහන් කරනවා.

ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත ගෙනෙන්න හදන විට කොච්චර විරුද්ධ වුණාද කියලා අපි දැක්කා. අද දවසේත් විරුද්ධ වුණා. මේ ඒකාබද්ධ කල්ලිය මේ රටට මහා පිළිලයක්; මේ ගරු සභාවට පිළිලයක්; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පිළිලයක්. ඒ විතරක් නොවෙයි, මේ ඒකාබද්ධ විපක්ෂය කියා ගන්නා කණ්ඩායම ආණ්ඩුවට පිළිලයක්. මේ රට වෙනුවෙන් වැදගත් දෙයක් කරන්න යන කොට ඔවුන් කොරහේ කිඹුල්ලු පෙන්වන න්‍යාය පාවිච්චි කරලා හැම දේම කඩාකප්පල් කරන බව අපි දැකලා තිබෙනවා. මේ රටේ ජනතාව ඒ අයගෙන් බේරා ගන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව අප්‍රසාදයට ලක්වන විධියට, හැල්ලුවට පත්වන විධියට කලහකාරීව හැසිරෙන හැටි අපි දැක තිබෙනවා. මේ සභා ගර්භයේ බුදියාගෙන රැය පහන් වනතුරු සිටි හැටි අපි දැක්කා. වැදගත් පනත් කෙටුම්පතක් ගෙනෙන කොට, "අපි මෙය කියවා නැහැ; සිංහල හා දෙමළ භාෂා පරිවර්තන ලැබිලා නැහැ" යනාදි වශයෙන් කෑකෝ ගහලා විවිධ දේවල් කිව්වා. මේ පනත් කෙටුම්පතේ යම් වැරැද්දක් තිබෙනවා නම් නීතියේ පිහිට පතන්න තිබුණා. මීට පෙර ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා පනත් කෙටුම්පත් අවලංගු කරගත් අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. මෙම පනත් කෙටුම්පතේදී එහෙම නීතියේ පිහිටක් පැතුවාද? නැහැ. එහෙම නැත්නම් මේ පනත් කෙටුම්පත ගැන විවාද කරන කොට, ගරු සභාවට ඇවිල්ලා පනත් කෙටුම්පත ගැන කථා කරලා, මෙන්න මේ සංශෝධන පනත් කෙටුම්පතට එකතු කරන්න කියලා සක්‍රීය ලෙස දායක වන ක්‍රමවේදයක් අනුගමනය කළාද? නැහැ. ගරු කථානායකතුමනි, මොන බාධක ආවත් මේ කඩාකප්පල්කාරීන්ට මේ රටේ පාලනය වෙනස් කරන්න දෙන්න බැහැ. මේ කඩාකප්පල්කාරීන් උත්සාහ කරන්නේ, මේ විධියට කටයුතු කරලා නැවතත් මහින්ද පාලනයකට මේ රට තල්ලු කරන්නයි. එලෙස කරලා, හොරකම් හා වංචා සම්බන්ධයෙන් චෝදනා තිබෙන අය බේරා ගන්න නැවතත් අලුත් ආණ්ඩුවක් ගෙනෙන්න උත්සාහ කරනවා. මේ වැදගත් පනත් කෙටුම්පත සම්මත කළ යුතුයි කියන යෝජනාව ඉදිරිපත් කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the Opposition, it is your turn. Before you start, Mr. Deputy Chairman of Committees will take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Leader of the Opposition.

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලංකාවේ පළමුවැනි වතාවට facebook, viber ඇතුළු සියලු සමාජ මාධ්‍ය ජාල මේ වන විට අක්‍රිය වෙලා තිබෙනවා. මේ සම්බන්ධව -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
It is not a point of Order. Hon. Sampanthan, you may start now.

[2.50 p.m.]

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)
Thank you, Mr. Deputy Chairman of Committees.

As has been mentioned already Sir, this issue of enforced disappearances, of persons suddenly disappearing in this country has existed for a long, long time. We are aware that during the JVP insurrection in the '70s and the late '80s this happened and several tens of thousands of youth disappeared. As a matter of fact, Hon. Mahinda Rajapaksa, who was then an Opposition Member of Parliament, on behalf of those people even went to Geneva, to the UN, with documents to explain what was happening to the international community in regard to the people in this country. So, this is a matter Sir, which has been going on for a long time and we had a war for several decades. It came to an end in 2009. Both during the war and after the war came to an end, there has been a very widespread complaint by people in this country, particularly from the North and the East, that a large number of citizens who are Tamils have disappeared. You are aware, Sir, that over the past several years, these people who are the next of kin of the disappeared persons have been demonstrating and demanding that they be made aware of what happened to their next of kin, many of whom were surrendered by them to the authorities, whether it be the police or the army, and I think it is a very legitimate demand which must be addressed. Today, the Sri Lankan Government is moving to enact a law to bring into operation the international convention pertaining to enforced disappearances and prescribing several offences that have been committed and can be committed in the future under that law.

There are a few points I want to make in regard to the overall situation relating to this matter. There seems to be an impression sought to be created by some people in this country that the international community is interfering somewhat unnecessarily in the affairs of this country and that that is not acceptable, that this must be terminated and that such action on the part of the international community impinges on the sovereignty of this country. We all want the sovereignty of our country protected. There can be no question about that. When you talk in terms of sovereignty, it has certain definitions. It does not mean the freedom of the wild ass, that in the name of sovereignty you can do whatever you like, violate all international conventions, violate international treaties, violate commitments made by you to the international community and say that we are sovereign, we can do what we like and nobody else can talk about what we do. That is not acceptable, Sir. That is not in keeping either with domestic or international law and is something which is outrageous in my respectful submission. Even beyond that, an effort is sometimes made to make out that the international community is supportive of the LTTE and is against the Sri Lankan Armed forces.

I think nothing had been further from the truth, Sir. We all know that the LTTE was engaged in a war. They had reasons good or bad or both good and bad for the commencement of the war. They fought the war for a long period of time, for over 30 years. They gave the Sri Lankan State a real run, there is no question about that. Eventually, they were defeated.

But what must be remembered is that the international community, particularly countries like India, completely backed the Sri Lankan State in regard to the conduct of the war against the LTTE. The LTTE was banned in all those countries. The LTTE's efforts to muster support for the war in that country in various ways was hindered, impeded and prevented. Many countries gave you vital intelligence in regard to various activities of the LTTE, particularly the movement of arms. You worked in close collaboration with countries like India, which supported you completely to eradicate the LTTE because you made out that the LTTE was a hindrance to a political resolution and that is why the LTTE was eliminated. You stated that there would be a resolution politically and those countries supported you in the belief that you will keep your commitment. But the fact of the matter is that, up to date, though nine years have lapsed since the end of the war, and though it is almost two-and-a-half years since the present Government came into power, we have not yet - though we do concede that there have been some movements towards the political resolution - been able to achieve a political resolution of the conflict. Despite the commitments made by the previous Government to the international community, particularly to India, to Secretary-General to the UN and the commitment made by even the present Government to the international

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

community, there has been no final resolution, a political resolution of the conflict yet. You must not forget, Sir, that you were able to win the war primarily because of the support you received from the international community. That cannot be denied.

I wish to make this point, Sir, because the misperception and misrepresentation that the international community is seeking to punish Sri Lanka because Sri Lanka defeated the LTTE must not prevail in this country and if that impression continues to prevail in this country that would not be helpful towards movement in the right direction and towards bringing about a political resolution of the conflict.

Having said that, I want to make a few comments in regard to the Hon. Minister's speech. I am sorry I was not here during the whole of the Hon. Minister's speech, I came only towards the very end of it. But I heard that the Hon. Minister very clearly stated that this law would apply only to the future and not in regard to what happened in the past. I do not know why that should be so, Sir. Nobody is targeting anyone in particular. The Sri Lankan security forces fought the war on behalf of the Sri Lankan Government. They were engaged in a war in keeping with the policy of the Sri Lankan Government to eradicate the LTTE. They were carrying out the directions of the Government. I do not think they committed any offence whatever in their war against the LTTE. But beyond that if the members of the security forces have been guilty of excesses against unarmed civilians, even against unarmed combatants, if they had disappeared after they surrendered to the Sri Lankan security forces, I do not think that can be put on the same basis as the Sri Lankan forces being engaged legitimately in the conduct of a war as per the policy decisions of the State. There must be a distinction drawn between the actions of the Sri Lankan security forces in pursuance of the policy enunciated by the Government, in pursuance of the decision made by the State and excesses committed by them against unarmed civilians or even unarmed combatants. What this law seeks to deal with is the responsibility of the State which cannot be denied. The law seeks to deal with such actions, not actions pertaining to the war in which the forces were engaged in accordance with the policy of the Government, if they went beyond that and they took into custody unarmed civilians, took into custody unarmed combatants or such persons surrendered to them and if they have been done away with, if they were females if they have been raped and killed that must be dealt with. There should be no question about that and such crimes must be prosecuted. If we do not prosecute those crimes, is it your position that you are not prosecuting such crimes for the reason that such crimes were committed either explicitly or impliedly with your sanction. If you are not prepared to prosecute them it would mean that you sanctioned or approved either implicitly or explicitly the commission of such crimes by such people. I do not think that is acceptable. There must be a clear distinction drawn between the conduct of the war by the security forces in keeping with the policy of the State and the excesses committed by the security forces pertaining to unarmed Tamil civilians and unarmed combatants.

Therefore, Sir, I think, while on the whole, the law fills a vacuum that has existed in our legal system for quite some time, the Government must ensure that the law is applied in such a way that the victims of such actions on the part of whomever are satisfied, that the laws of this country are applicable to what happened to their next of kin and that those persons are dealt with.

I would with those submissions, Sir, conclude my speech, but I do think that it is a duty of the Government to rethink this whole question of this law being made applicable only to the future and not to the past. Sri Lanka is facing enough problems on the international front on the question of violations of human rights laws, international humanitarian laws, accountability, truth and justice and I do not think that we should be seemed to be dodging or not facing up to situations that we have to face up to. I think, Sir, the Government should rethink its decision in regard to this matter.

Thank you.

[பி.ப. 3.05]

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා (ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ் - விளையாட்டுத்துறை பிரதி அமைச்சர்)
(The Hon. H.M.M. Harees - Deputy Minister of Sports)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்படுதலிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் பற்றிய சர்வதேச சமவாயச் சட்டமூலம் சம்பந்தமான விவாதத்தில் சில விடயங்களைக் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, கடந்த யுத்த காலத்தில் வலுக்கட்டாயமாகக் காணாமலாக்கப்பட்டவர்கள் பற்றிய பிரச்சினைக்கு இந்த நாடு இன்னமும் ஒரு தீர்வுக்கு வராத சூழலில், மீண்டும் நாட்டின் பல்வேறு பாகங்களிலும் இனச் சுத்திகரிப்புச் செயற்பாடு - நான் பேசிக் கொண்டிருக்கின்ற இச்சந்தர்ப்பத்தில்கூட - இடம்பெற்றுக் கொண்டிருக்கின்றது. நல்லாட்சி அரசாங்கம் ஆட்சிக்கு வந்தபின்பு இந்த விடயம் சம்பந்தமாக எடுத்துக் கூறப்பட்டது. அதாவது, இந்த நாட்டில் சிறுபான்மைத் தமிழ், முஸ்லிம் மக்களுக்கு எதிராகச் செயற்படுகின்ற இனவாதக் குழுக்களைக் கட்டுப்படுத்து வதற்குப் புதிய சட்டங்களைக் கொண்டுவர வேண்டும் என்று இந்த நாட்டின் சிறுபான்மைக் கட்சிகள் அதேபோன்று பெரும்பான்மைத் தேசியக் கட்சிகளின் சில பிரதிநிதிகள் பலமுறை இந்த அரசிடம் கூறியிருக்கின்றார்கள். குறிப்பாக, மதங்களுக்கு எதிராகச் செயற்படுபவர்களுக்கும் மத ஸ்தலங்களைத் தாக்குகின்றவர்களுக்கும் கடும் தண்டனை அளிக்கின்ற வகையில் மதநிந்தனைச் சட்டத்தை அமுல்படுத்தியும் அதேபோன்று அவ்வாறான குழுக்களைக் கட்டுப்படுத்துகின்ற வகையில் புதிய சட்டங்களைக் கொண்டுவந்தும் நடவடிக்கை எடுக்க வேண்டும் என்று நாம் இந்தச் சபையில் பல்வேறு சந்தர்ப்பங்களிலும் கூறி வந்தோம். ஆனால், இந்த நாட்டின் அரசும் அதன் தலைமையும் இவ்விடயத்தில் கவனயீனமாக இருந்ததால், அன்று அம்பாறை

நகரின் பள்ளிவாசல் உட்பட, வியாபாரத் தலங்கள் அழிக்கப்பட்டன. அது சம்பந்தமாகப் பலமுறை நாங்கள் கூறியிருந்தும் அங்கிருந்த பொலிஸாரோ, பாதுகாப்புப் படையினரோ தகுந்த நேரத்தில் செயற்படவில்லை. அவர்கள் குறித்த செயற்பாடுகளைக் கட்டுப்பாட்டுக்குள் கொண்டுவர முயற்சிக்காமையால் அவர்களை மீறி அங்கு சில சம்பவங்கள் இடம்பெற்று அந்த மக்களுக்கு அநீதி இழைக்கப்பட்டுள்ளது.

இது சம்பந்தமாகப் பிரதமர் அவர்கள் தலையிட்டு அந்தப் பிரதேசத்திற்கு வந்து இந்தப் பிரச்சினைகளுக்கு ஒரு முழுமையான தீர்வை வழங்க வேண்டும் என்பதற்காகவும் எதிர்காலத்தில் ஏனைய இடங்களிலும் இத்தகைய வன்முறைச் சம்பவங்கள் இடம்பெறக்கூடாது என்பதற்காகவும் அங்கு அவருக்கு வருமாறு நாங்கள் அழைப்பு விடுத்தோம். அவர் கடந்த 3ஆந் திகதி வருவதாக இருந்தும் அம்பாறையிலிருந்த ஓர் அமைச்சர் அதற்குத் தடையை ஏற்படுத்தியிருந்தார். மீண்டும் வருமாறு நாங்கள் வலுக்கட்டாயப்படுத்தியதனால், எமது அழுத்தம் காரணமாக அவர் அங்கு வந்தார். ஆனால், பாதிக்கப்பட்ட அம்பாறைப் பிரதேசத்திலுள்ள பள்ளிவாசலைப் பார்வையிடுவதற்குக்கூடப் பிரதமருக்குத் தைரியமில்லாமல், துறைமுக அபிவிருத்தி என்ற போர்வையில் ஒலுவில் பிரதேசத்திற்கு வந்து எங்களுடைய முஸ்லிம் சமூகத்தின் பிரதிநிதிகளைச் சந்தித்தார். அப்பொழுது அந்த மாவட்டத்தின் பாராளுமன்றப் பிரதிநிதி என்ற அடிப்படையில், "இந்த அநீதியான செயற்பாடுகள் அம்பாறையுடன் முடிந்துவிட வேண்டும்" என்று நான் கூறினேன். அத்துடன், "உள்நாட்டுப் பாதுகாப்புக்குப் பொறுப்பான அமைச்சர் என்ற ரீதியில் நீங்கள் சரியான பாதுகாப்பு ஏற்பாடுகளைச் செய்து குறித்த செயற்பாடுகளைக் கட்டுப்பாட்டுக்குக் கொண்டுவாருங்கள்" என்று நாங்கள் அவரிடம் கூறியிருந்தோம். அதற்குப் பிரதமர் அவர்கள் செவிசாய்க்கவில்லை.

அடுத்த தினம் கண்டிப் பகுதியில் ஒரு சிங்கள இளைஞர் நாலு முஸ்லிம் இளைஞர்களால் கொல்லப்பட்டார். அந்த நாலு இளைஞர்களும் செய்த கொடூரத்தை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். அந்தப் பெரும்பான்மைச் சகோதரர் அநியாயமாகக் கொல்லப்பட்டிருப்பதை நியாயப்படுத்துவதற்கு எந்தக் கட்டத்திலும் நாங்கள் தயாரில்லை. ஆனால், அந்த விடயத்தை மையமாக வைத்து இனவாதக் குழுக்கள் கண்டி, திகன பிரதேசத்தில் குறித்த செயற்பாடுகளில் ஈடுபட்டுள்ளன. இப்பொழுதும் திகன பிரதேசத்தில் ஒரு பதற்றமான சூழ்நிலை நிலவுவதாக எனக்குத் தொலைபேசி அழைப்பு வந்திருக்கின்றது. அன்றிரவும் நேற்றும் நான் அந்தப் பிரதேசத்திற்குச் சென்றிருந்தேன். பள்ளிவாசல்கள் மற்றும் வீடுகள் அதேபோன்று வியாபார ஸ்தலங்கள் எல்லாம் அங்கு அழிக்கப்பட்டிருந்தன. ஒரு முஸ்லிம் இளைஞரும் படுகொலை செய்யப்பட்டிருந்தார். அங்கு பாதுகாப்பு ஏற்பாடுகள் சரிவரச் செய்யப்படாமையே இதற்கான காரணமாகும். நேற்றுக் காலை ஜனாதிபதி அவர்கள் அவசரகாலச் சட்டத்தைப் பிரகடனப்படுத்திய பின்புதான் இராணுவம் அதேபோன்று ஏனைய படைகளும் அங்கு வந்து முகாமிட்டு பாதுகாப்பு நடவடிக்கைகளில் ஈடுபட்டன. இருந்தாலும், அங்கு நேற்றிரவும் தாக்குதல் நடத்தப்பட்டுள்ளது. அது மட்டுமல்ல, நான் பேசிக் கொண்டிருக்கின்ற இவ்வேளையிலும்கூட கண்டி மாவட்டத்தின் பல இடங்களில் கொடூரத் தாக்குதல்கள் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன. பெண்கள் தங்களது உயிரைப் பாதுகாப்பதற்காகக் காடுகளுக்குள் ஓடிக் கொண்டிருக்கின்றார்கள். அங்கு சரியான பாதுகாப்பு முறைமை ஏற்படுத்தப்படவில்லை. அதற்கான முழுப் பொறுப்புக்களையும் இந்த அரசு ஏற்க வேண்டுமென்பதுதான் எமது சமூகத்தின் குற்றச்சாட்டாக இருக்கின்றது.

இன்று இந்த நாடு பெரும் படைகளை வைத்திருக்கின்ற போதிலும் அங்கு சரியான பாதுகாப்பு நடைமுறை ஏற்படுத்தப் படவில்லை. இராணுவம், கடற்படை, விமானப்படை, பொலிஸ் என்று படைகளை வைத்திருக்கின்ற அரசு, அந்த மாவட்டத்தின் குறித்த பிரதேசங்களில் முன்னெச்சரிக்கையாகப் பாதுகாப்பு ஏற்பாடுகளைச் செய்வதற்கு ஏன் தயங்கியது? தங்களுக்கு எதிராகக் கொண்டு வரப்படவிருக்கின்ற நம்பிக்கையில்லாப் பிரேரணை அதேபோன்று மத்திய வங்கிமீதான குற்றச்சாட்டுக்களை வேறு திசைக்குத் திருப்புவதற்காகவா, இவ்வாறான இனக் கலவரங்கள் அரசுக்குத் தேவைப்படுகின்றது? என்று எமது முஸ்லிம் சமூகம் இன்று சந்தேகிக்கின்றது. ஆனால், இந்த நாடு பல யுத்த அனுபவங்களைக் கொண்டுள்ளது. நாட்டில் வன்முறை ஏற்படப் போகின்றது என்று முன்கூட்டியே அறிந்திருந்தால், அதற்கேற்பச் செயற்பட்டிருக்கலாம். அதாவது, கண்டி மாவட்டத்தில் எங்கெங்கு முஸ்லிம் மக்களுடைய பிரதேசங்கள், வணக்கஸ்தலங்கள் இருக்கின்றன என்பதை இன்றைய நவீன ஜீ.பீ.எஸ். வசதிகளுக்கேற்ப இலகுவாக அறிந்து ஓரிரு மணித்தியாலங்களுக்குள் அவ்விடங்களுக்கு ஆயிரக்கணக்கான படைவீரர்களை அனுப்பி அந்த இடங்களைப் பாதுகாக்கக்கூடிய வாய்ப்பு இந்த அரசுக்கு இருந்தது. ஆனால், அவர்கள் ஏன், இதைச் செய்யத் தவறினார்கள்? என்பதுதான் எங்களுடைய கேள்வியாக இருக்கின்றது.

இன்று நாங்கள் மிகுந்த வெட்கத்துடன் பேசுகின்றோம். இருந்தபோதிலும் இன்று நிலைமை கட்டுக்கடங்காமல் போய்க்கொண்டிருக்கின்றது. ஆனால், எப்பொழுதுமே முஸ்லிம் இளைஞர்கள் மற்றும் பொதுமக்கள் அஹிம்சையை விரும்புகிறவர்கள். நேற்றுக் கிழக்கு மாகாணத்தில் இடம்பெற்ற ஹர்த்தால் என்ற நடவடிக்கையைக் காட்டி, இப்பொழுது சம்பந்தப்பட்டவர்கள் கற்களைக் கைகளில் எடுத்திருக்கிறார்கள். மக்கள் இதனால் மிகுந்த பயத்தில் இருக்கின்றார்கள். நாளை அவை ஆயுதங்களாக மாறுகின்ற சூழ்நிலை ஏற்பட்டால், இந்த நாடு எங்கே போய் முடியுமென்பதுதான் எங்களுடைய கேள்வியாகும். நேற்று முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் இந்தச் சபாபீடத்தின் மத்தியில் வந்து அமர்ந்து போராடியபொழுது அந்தச் செயற்பாடு இங்கு ஏளனமாகப் பார்க்கப்பட்டது. குறிப்பாக, ஆளுங்கட்சியில் இருக்கின்ற பல அமைச்சர்கள் பாதுகாப்பு ஏற்பாடுகள் சரி செய்யப்பட்டுவிட்டது - எல்லாம் முடிந்துவிட்டது என்ற வகையில் கூறினார்கள். ஆனால், நடந்தது என்ன? எங்களுடைய இந்தப் போராட்டம் நடந்த ஓரிரு மணித்தியாலங்களில் மீண்டும் தாக்குதல் தொடுக்கப்பட்டது. இந்தத் தாக்குதல் யாரால் மேற்கொள்ளப்படுகின்றது? குறித்த முஸ்லிம் இளைஞனுடைய ஜனாஸா அடக்கம் செய்யப்பட்டபோது அங்கு நானும் சென்றிருந்தேன். அங்கு அந்த ஜனாஸா அமைதியான முறையில் அடக்கம் செய்யப்பட்டது. ஆனால், அந்த உடல் அடக்கம் செய்யப்பட்டு ஓரிரு மணித்தியாலங்களில் மீண்டும் மெனிக்கின்ன பிரதேசத்திலுள்ள பள்ளிவாசல் தீக்கிரையாக்கப்பட்டது. அந்த வகையில் இன்று அக்குரணை, அம்பத்தன, கட்டுகஸ்தோட்டை என்று கண்டி மாவட்டத்தின் பல்வேறு பிரதேசங்கள் கட்டுக்கடங்காத வன்முறையினால் ஒரு போர்க்களமாக மாறியிருக்கின்றன.

இவ்வாறான நிலைமைகளால் இந்த அரசாங்கத்தில் அங்கம் வகிக்கின்ற எங்களுக்கு வெட்கமாக இருக்கின்றது. அதாவது, இன்று எங்களுடைய சமூக இளைஞர்களே எங்களை நோக்கி, "உங்களுடைய அமைச்சுப் பதவிகளை இராஜினாமா செய்யுங்கள்! உங்களுக்கு வெட்கமில்லையா?" என்றெல்லாம்

[ගරු එච්.එම්.එම්. හරීස් මහතා]

கேட்கின்றார்கள். ஆகவே, அரசியல் ரீதியாக நாங்கள் நிர்வாணப்படுத்தப்பட்டுள்ளோம். "ஆடைகளின்றி நீங்கள் செல்லுங்கள்" என்று அவர்கள் எங்களிடம் சொல்கின்ற அளவுக்கு நிலைமை மாறியிருக்கின்றது. எனவேதான் அரசின் தலைமையில் இருக்கின்ற மாண்புமிகு பிரதமர் அவர்களுக்கு ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றோம். அதாவது, "நீங்கள் பெரும் அரசியல் நெருக்கடிகளைச் சந்தித்துக் கொண்டிருக்கிறீர்கள்! ஒரு நம்பிக்கையில்லாப் பிரேரணையை எதிர்நோக்கியிருக்கின்ற உங்களுக்கு இறுதியாக எச்சரிக்கை செய்கின்றோம்; இந்த நாட்டிலிருக்கின்ற 21 முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களும் அந்தப் பிரேரணை வருகின்ற பொழுது உங்களுக்கு எதிராக வாக்களிக்க வேண்டிய ஒரு சூழ்நிலை வரும் என்பதை நாங்கள் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றோம்; அந்த நிலைமை வராமலிருக்க வேண்டுமென்றால் இந்த நாட்டின் நாலாபுறமும் இருக்கின்ற முஸ்லிம் சமூகம் மற்றும் சிறுபான்மை யினங்களைப் பாதுகாப்பதற்காக உங்களுடைய படைகளின் அதியுச்ச பலத்தை நீங்கள் பயன்படுத்த வேண்டும்; அதாவது, படைகளுக்குக் கடுமையான அதிகாரங்களைக் கொடுத்து சிறுபான்மைச் சமூகங்களுக்குப் பாதுகாப்புக் கொடுங்கள்!" என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 3.15]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ඉඩ ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය අනුව මේ රටට ගෙන ආ යුතු නීති රීති මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර පවත්වනු ලබන මේ විවාදයේදී අපට පෙන්වා දීමට තිබෙන කරුණු කිහිපය දැක්වීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. මේ ජාත්‍යන්තර සම්මුතිය ලංකාවේ නීතියක් බවට පරිවර්තනය කිරීමේ පනත් කෙටුම්පත මේ ආකාරයට ගෙනෙන්නට පෙර මේ රටේ පුද්ගලයන්ව බලහත්කාරයෙන් අවතැන් කිරීම, අතුරුදහන් කිරීම, රැඳවීම, පුද්ගලයන්ට අවහිර කිරීම, පුද්ගලයන්ගේ නිදහසට බාධා කිරීම වාගේ නීති අපේ රටේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ තිබෙනවා. අද මේ ගෙනෙන පනත් කෙටුම්පතේ තිබෙන අලුත් දේවල් වන්නේ යම් කෙනෙකු අත් අඩංගුවට ගෙන රඳවා තබා ගනිමින් ඔහු අත් අඩංගුවට ගත් බව නොපිළිගැනීම, එහෙම නැත්නම් රහසිගතව අත් අඩංගුවේ රඳවා ගැනීම ආදියයි. මේ වාගේ තවත් අතිරේක කරුණු මේ සම්මුතිය හරහා ගෙන එන මේ පනත් කෙටුම්පතේ තිබෙනවා. මම නම් කල්පනා කරන්නේ මේ නීති, අණපනත්වල තිබෙන කරුණු පුළුවන් තරම් ඒකාබද්ධ විය යුතුයි කියලායි. මේ පනත් කෙටුම්පතේ සඳහන් කරලාත් තිබෙනවා, දණ්ඩ නීති සංග්‍රහයේ ඊට අදාළ වගන්ති. ඒ වගන්තිවලට තව තවත් අවශ්‍ය සංශෝධන එකතු වෙනවා නම් මම හිතන විධියට මේ අවශ්‍යතාව ඉටු වෙනවා. සම්මුතිය පනතක් බවට පරිවර්තනය කිරීමට අපට එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් යම් බල කිරීමක් තිබෙනවා නම් ඒක වෙනම කාරණයක්. යම් සම්මුතියක් අත්සන් කළාම එය අත්සන් කළ රටවලට එය නීතියක් බවට පෙරළීමට බල කිරීමක් තිබෙනවා නම් එය වෙනම ප්‍රශ්නයක්. එසේ නැත්නම් මම කල්පනා කරන්නේ දැනට බොහෝ දුරට මේ කරුණු ඇතුළත්ව තිබෙන අපේ නීති රාමුවට, අතිරේකව අඩු පාඩුව තිබෙන දේවල් සංශෝධන ලෙස එකතු කරන්නට අපට බැරිද කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තිලක් මාරපන මැතිතුමා මූලාසනය දැරූ කාරක සභාවකදී තමයි අපි මේ කාරණය සාකච්ඡා කළේ. ඒ අවස්ථාවේදී අපි ප්‍රධාන වශයෙන් කරුණු දෙකකට යොමු වුණා. ඉන් එක කරුණක් තමයි මම මේ සඳහන් කළ කරුණ. ඒ වෙලාවේ අපට ඒකට පිළිතුරු ලැබුණා. ඒ ලැබුණු පිළිතුරුවල තිබුණේ මේවා වෙනම සම්මුතියක් ලෙස නීතිගත විය යුතු බවයි.

මම දන්නේ නැහැ ඉන්දියාව හෝ දකුණු ආසියාතික රටවල් මේ සම්මුතියේ අත්සන්කරුවන් හැටියට ඉන්නවාද, ඉන්නවා නම් ඒ අය තමන්ගේ රටවල මේ සම්මුතියට අනුකූලව අණපනත් පැනවීමට ක්‍රියා කර තිබේද කියලා. ඒ තොරතුරු ලබා ගැනීමට මම උත්සාහ කළා. නමුත් මට ඒ තොරතුරු ලබා ගැනීමට බැරි වුණා. මම දන්නේ නැහැ අපට දැන් වන විට ඒ පිළිබඳව තොරතුරක් රජයේ පාර්ශ්වය වෙතින් දැන ගන්නට පුළුවන්ද කියලා. මේ පනත් කෙටුම්පතින් උදර්පනය කියන කාරණය නිශ්චිත කරලා නැහැ. විදේශිකයෙක් ලංකාවේදී අපරාධයක් කොට හෝ විදේශයකදී අපරාධයක් කොට ලංකාවේ සැඟවී ඉන්නවා නම්, නීතියෙන් පැන යමින්, බේරී යමින්, සැඟවෙමින් ඉන්නවා නම් - a fugitive- ඒ පුද්ගලයා සොයලා අදාළ වූ රටවලට උදර්පනය කිරීමේ නීතියක් තිබෙනවා. උදර්පන නීතියට අතිරේකව, උදර්පනය කිරීමේ ඉල්ලීමක් ලැබුණු විට, එම උදර්පනය සලකා බැලීමට ඇමතිවරයාට අයිතියක් තිබෙනවාය කියලා මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙනවා.

මම එදා කාරක සභාවේදී පෙන්නුවා වාගේම අද පෙන්වා සිටින්නේත් මෙය ලංකාවේ පුරවැසියන්ට බලපාන්නේ නැති බවයි. එය අපි ඉතා පැහැදිලිව කිව යුතුයි. එසේ නොකියන තුරු එය එක්තරා විධියකට විවාදයට තුඩු දිය හැකි විවෘත ප්‍රශ්නයක් හැටියට ඉතිරි වෙන්න පුළුවන්.

මට අපේ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කිව්වා, "මෙය ලංකාවේ පුරවැසියන් කෙරෙහි බලපාන්නේ නැති බවට ආණ්ඩු පාර්ශ්වයෙන් දැන්වීමක් ලැබිලා තිබෙනවා." කියලා. එයට එකඟයි කියලා එහි සඳහනක් කරන්න මම කැමැතියි. මම හිතන්නේ එය එසේ වෙනවා නම් හොඳයි කියලායි. එතකොට අපට ඒ කාරණාව විවෘතව අවසන් කළ හැකි ප්‍රශ්නයක් බවට පත් වෙනවා. ඒ වාගේම මේ සම්මුතියෙන් මතු වෙන නීතිය, ඒ අනුව කළ යුතු උදර්පනය, ඒ අනුව ඇති වන ඉල්ලීම් යන මේ සියල්ලම බලපාන්නේ ලංකාවේ පුරවැසියන් නොවන අයට බව අපට ප්‍රකාශ වීමට හැකි නම්, අපට මේ ප්‍රශ්නය බොහෝ දුරට විසඳන්න පුළුවන්.

උදර්පන නීතිය අංක 8 දරන උදර්පන පනත යටතේ 1977 වසරේ තමයි නීතිගත කරලා තිබෙන්නේ. එම නීතියේ සඳහන් කරුණු සියල්ල මේ පනත් කෙටුම්පත යටතේත් අදාළ වන අතර, එම උදර්පන නීතියට අලුත් ඡේදයක්, එහෙම නැත්නම් අලුත් උපඡේදයක් අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතට එකතු කිරීමට යෝජනා කරලා තිබෙනවා. ඒ අනුව එම සංශෝධනය උදර්පන නීතියට එකතු වෙනවා. අනෙක් ඒවා ගැනත් මම කිව්වේ ඒකම තමයි. උදර්පන නීතියට අලුත් ඡේදයක් එකතු වෙනවා වාගේම, අපේ රටේ හුඟ කලක සිට මිනිසුන්ව බලෙන් තියා ගන්න බැහැ, මිනිසුන්ව සඟවා ගන්න බැහැ, මිනිසුන්ව රඳවා ගන්න බැහැ කියන වටිනා නීති ටික තිබෙනවා. මේ නීතිවලට තවත් එකතු කළ යුතු දේවල් එකතු කළා නම්, මේ කාරණය මීට වඩා ලෙහෙසි වෙනවා කියලායි මම හිතන්නේ.

උදර්පනය කිරීමට හේතු වන කරුණු කියන එක ගැන සාකච්ඡා වුණා. මේ කමිටුවේදීත් සාකච්ඡා වුණා. යම් රටක් විසින් උදර්පනය කිරීමට හේතු වන වැරැදි සිදු කරන ලද පුද්ගලයන්, එම අපරාධය සිදු කිරීමට යොදා ගත්තා වූ ස්ථානය ඒ රට නම්, තිබෙන්නා වූ ගිවිසුම් අනුව එම පුද්ගලයන් උදර්පනය කිරීමට එම රටට අයිතියක් තිබෙනවා. ගිවිසුම් තිබෙන රටවල් එක්ක විතරයි අපට මේ ගනුදෙනුව තිබෙන්නේ. නමුත් දැන් මේ නීතිය අනුව, මේ සම්මුතියට අත්සන් කරපු සියලු රටවලට සම්මුතික රටවල් හැටියට එම අයිතිය ලැබෙනවා. එහෙම අයිතිය ලැබෙනකොට ඒ අයට එම ඉල්ලීම කළ හැකි වන්නේ එම අපරාධය, වරද කරන ලද්දේ යම් රටක නම් ඒ රටේ කරන ලද එම අපරාධය පිළිබඳ එම රටට අදාළ පුද්ගලයා අවශ්‍ය වී තිබෙන බව පෙනී යනවා නම්, ඒ සඳහා අපේ රටට එම පුද්ගලයා සම්බන්ධයෙන් ඉල්ලීමක් කළොත් එම පුද්ගලයා උදර්පනය කිරීම සලකා බැලීමට අපේ අමාත්‍යවරයාට වගකීමක් තිබෙන බව තමයි මෙහි සඳහන් වන්නේ.

මේ කාරණාව සම්බන්ධයෙන් වූ සාකච්ඡාව අපට ඉතා නිරවුල්ව අවසන් කරන්න පුළුවන්. බලහත්කාරයෙන් රඳවා තබා ගැනීමේ වරද කවුරුත් පිළිගන්නා වරදක්. නමුත්, මේක වරදක් කියලා අපි කොපමණ පිළිගත්තත්, සමහර වෙලාවට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින් බලහත්කාරයෙන් පුද්ගලයන් රඳවා ගෙන සිටින බව අප කවුරුත් දන්නවා. එසේ රඳවා ගෙන හිඳිමින් රඳවා ගෙන නැති බව ප්‍රකාශ කරනවා. මේ නීතියේ හැටියට දැන් ඒක ලොකු වරදක්. ඒක දීර්ඝ කාලීන සිර දඬුවමක් ලැබිය හැකි වරදක්. නමුත්, දැන් වුණත් කවුරු හෝ බලහත්කාරයෙන් රඳවා ගෙන සිටියොත්, නැත්නම් ඒ පුද්ගලයාට තමන්ගේ නිදහස අහිමි කරලා ඒ පුද්ගලයා යම් අත් අඩංගුවක තබා ගෙන ඔහු එසේ අත් අඩංගුවක සිටින බව ප්‍රකාශ නොකිරීම, නැත්නම් එසේ නොපිළිගැනීම අපේ රටේ දැනට තිබෙන නීතිය අනුවත් එක්තරා විධියක බරපතළ වරදක්. ඔය කියන abduction, wrongful confinement කියන්නා වූ වරදවල මූලික ස්වභාවය තමයි එක පැත්තකින් රඳවා ගෙන සිටීම. නමුත්, අනික් පැත්තෙන් රඳවා ගත් බව නොපිළිගෙන ඉන්නවා. මේක පොලීසියට ගහන්න බැහැයි කියනවා වාගේ නීතියක්. පොලීසියට ගහන්න පුළුවන් බලයක් නීතියෙන් නැහැ. නමුත්, පොලීසියට සාධාරණ බලයක් පාවිච්චි කළ හැකියි, යම් කිසි තත්ත්වයක් පාලනය කර ගන්න. ඒ වාගේ අවස්ථාවලදී තමයි නීතිය ක්‍රියාවට නැඟීමට යොමු වන අය නීතියේ මුවාවෙන් සැඟවෙමින් එක්තරා විධියකට මේ නීතියේ නොකළ යුතු යැයි කියන දේ සිදු කරන ක්‍රම යොදා ගන්නේ.

එක කියමනක් මා ඊයේ දැක්කා. සත්‍යතාවේ හඬක්, සත්‍යතාවේ පෙනුමක් ඇති විධියේ වචනවලින් යම් අසත්‍යයන් ඉදිරිපත් කිරීමට සමහරුන්ට තිබෙන හැකියාව අපේ රටේ බරපතළ කාරණයක් වෙලා තිබෙනවා. ඒ නිසා මෙවැනි අවස්ථාවකත් මෙය නොකළ යුතුයි කියලා නීතියේ තිබුණාට මේවා යම් මුවාවකින් කළ හැකි විධියට ඉඩක් ලැබෙන තත්ත්වය වළක්වන්නත් අපි පියවර ගත යුතු බව කියමින් මා නිහඬවනවා. ස්තුතියි.

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කොපමණ වෙලාවක් තිබෙනවාද කියලා දැනගන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
විනාඩි 10යි.

[අ.භා. 3.26]

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය බලගැන්වීම සඳහා අපේ රටේ නීතියක් සම්පාදනය කිරීම සම්බන්ධයෙනුයි අපි මේ විවාදය පවත්වාගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාගේ නීති අපේ රටේ පාර්ලිමේන්තුවට සම්මත කරන්න සිදුවීම අහම්බෙන් වූ දෙයක් නොවෙයි. නිදහසින් පස්සේ සැහෙන කාලයක් උතුරේත්, දකුණේත් අපි ඉතාම දරුණු ගණයේ සිවිල් යුද්ධවලට සමාජයක් හැටියට මුහුණ දුන්නා. අපි ඒවාට විවිධ නම් දීලා කැරැල්ල කිව්වත්, නැඟිටීම කිව්වත්, බෙදුම්වාදය කිව්වත්, අවසන් වශයෙන් ගත්තාට පස්සේ ඒවා අපට පොදුවේ හඳුන්වන්න පුළුවන්, 'සිවිල් යුද්ධ' කියලා. සිවිල් යුද්ධයක ස්වභාවය තමයි, සමස්ත සමාජයම සමස්ත සාපරාධීකරණයකට ලක් වීම. ඒක රජය වෙන්න පුළුවන්, ආරක්ෂක අංශ වෙන්න පුළුවන්, සටන් වදින්නන් වෙන්න පුළුවන්, අරගළ කරන්නන් වෙන්න පුළුවන්, ජනමාධ්‍ය වෙන්න පුළුවන්, රාජ්‍ය සේවය වෙන්න පුළුවන්, පොදු ජන සමාජය වෙන්න පුළුවන්. ඕනෑම සමාජයක් සමස්ත සාපරාධීකරණයකට ලක් වීමයි සිවිල් යුද්ධයකින් සිද්ධ වන්නේ. නමුත්, අපි සමාජයක් හැටියට දීර්ඝ කාලීනව පෙන්වා දුන්නේ මොකක්ද? ශිෂ්ට සම්පන්න දියුණු ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් හැටියට ඒවා විසඳාගන්න අපි කල් ගන්නවා, නැත්නම් ඒවා අමතක කරනවා, අපි අසමත් වනවා කියන එකයි අපි පෙන්වා දුන්නේ. අපේ රට වාගේ රටවල ඇතිවන මේ ප්‍රශ්න ජාත්‍යන්තරකරණයට ලක් වුණේ ඒ නිසායි. ඒවා අපි කැමැති දේවල් නොවෙයි. නමුත්, ඒවා සිද්ධ වෙලා තිබෙන දේවල්.

ඒ යථාර්ථයට අපට මුහුණ දෙන්න සිද්ධවෙලා තිබෙනවා. ඒ නිසා තමයි, මේ ප්‍රශ්න විසඳීමේදී ජාත්‍යන්තරය එක්කත් අපට වැඩ කරන්න සිද්ධවෙලා තිබෙන්නේ. නමුත් මගේ මූලික අදහස තමයි, ජාත්‍යන්තර සම්මුතියක් තිබුණත්, නැතත්; ජාත්‍යන්තරය එය අපෙන් ඉල්ලුවත්, නැතත් අපේ සමාජයට මෙවැනි යන්ත්‍රණයක්, මෙවැනි ක්‍රියාදාමයක් අද අත්‍යවශ්‍යවෙලා තිබෙනවාය කියන එක. අද අපි මේ කථා කරන්නේත් අපේ ලංකාවේ සමාජය එක්තරා ආකාරයකට බියෙන් සලිතවෙලා තිබෙන අවස්ථාවකයි; ඕනෑ නම් අනාගත සිවිල් යුද්ධයක බීජ අපට දකින්න පුළුවන් අවස්ථාවකයි. එම නිසා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන අපි මේ දෙස ඉතාම වගකීමකින් යුක්තව බලන්න අවශ්‍යයි.

ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා උදර්පන නීතිය සම්බන්ධයෙන් එක කාරණාවක් ඉදිරිපත් කළා. මා එතුමාට ඉතාම ගරු කරනවා. උදර්පන නීතිය සම්බන්ධයෙන් පැහැදිලිතාවක් ලැබෙන්න ඕනෑ. ලංකාවේ පුරවැසියන්ට බලනොපාන ආකාරයට මෙය සඳහන් වන්න ඕනෑය කියන ඒ යෝජනාව වැදගත් යෝජනාවක් හැටියට මම සලකනවා. මම හිතනවා, ඒ සම්බන්ධයෙන් රජය පැත්තෙන් ශුභවාදී ප්‍රතිචාරයක් දක්වයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වන අවස්ථාවේදී ඉතාම වැරැදි අවබෝධයක් මේ රටේ සමාජගත කරන්න යම් යම් පිරිස් උත්සාහ ගත්තා. ඒක හරියට කොත්තු රොටියේ ගහපු වඳ පෙත්ත වාගෙයි. මේ පනත් කෙටුම්පත ගැන කිව්වේ මොකක්ද? මේ පනත් කෙටුම්පත, මේ රටේ පැවති යුද්ධයේදී ත්‍රස්තවාදය පරාජය කරන්න කටයුතු කළ

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

යුද හමුදාවල සේවය කළ ආරක්ෂක සෙබළුන් දං ගෙඩියට ගෙන යන්න සකස් කළ පනත් කෙටුම්පතක්ය කියලා මේ සම්බන්ධයෙන් ඉතාමත් නරක, වැරැදි චිත්‍රයක් සමාජගත කරන්න සමහර අය උත්සාහ ගත්තා.

විශේෂයෙන්ම මා මේ අවස්ථාවේ කියන්න කැමැතියි, එවැනි කුණු වූ අධ්‍යාත්මයන් ඇති පුද්ගලයන් අද ඇතිවෙලා තිබෙන තත්ත්වයත් සම්බන්ධයෙනුත් ඒ ආකාරයටම වැඩ කර ගෙන යනවාය කියන එක. මම හිතන හැටියට මේ ගැන අවධානයට ලක් කරන්න ඕනෑ හොඳම වෙලාව තමයි මේ අවස්ථාව. අපි පහු කරගෙන ආපු සිවිල් යුද්ධ ඉතිහාසය මහා භයානක ඉතිහාසයක්; අප සියලුදෙනාගේම මනුෂ්‍යත්වය අභිමි කරපු ඉතිහාසයක්. එහෙම නම්, එයින් ගොඩ එන්න සිටින අපි දියුණු මනුෂ්‍යයන් හැටියටයි වැඩ කරගෙන යන්න ඕනෑ. ඒ නිසා මේ පනත් කෙටුම්පත සම්මත වන මේ අවස්ථාවේදී, ජාත්‍යන්තර සම්මුතියට අදාළ නීතියක් ලංකාවේ බලගැන්වෙන මේ අවස්ථාවේදී, මේ සමාජය නැවත භයෙන් සලිත කරන්න, වැරැදි චිත්‍ර මවා පාන්න, මේවා සම්බන්ධයෙන් කුමන්ත්‍රණය කරලා සමාජයේ ඉදිරි ගමන වළක්වන්න නොවෙයි අපි වැඩ කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා මේ නීතිය ශිෂ්ට සම්පන්න නීතියක් හැටියට පිළිගෙන ඉදිරියට යන්න අවශ්‍ය වන්නේ, අනාගතයේදී මේ රටේ මෙවැනි සිවිල් යුද්ධ ඇති වීම වැළැක්වීම සඳහා ගන්නා වූ පූර්ව සූදානමක් හැටියටයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ අවස්ථාවේදී සිංහල සමාජය සහ මුස්ලිම් සමාජය අතර ලොකු ආතතියක්, එකිනෙකා කෙරෙහි සැකයක්, බියක් ඇතිවෙලා තිබෙනවා. මීට අවුරුදු ගණනාවකට කලින් දළදා මාලිගය ඉදිරිපිට එල්ටීටීඊ ත්‍රස්තවාදී බෝම්බයක් පිපිරුණු වෙලාවේ, මේ රටේ සිංහල, බෞද්ධ සමාජය ඉතාම සාමකාමීව හැසිරුණා. නමුත් පසුගිය දා සිදු වුණු සිද්ධියෙන් පස්සේ එවැනි තත්ත්වයක් දකින්න ලැබුණේ නැහැ. මෙයින් පෙනෙන්නේ මොකක්ද? මෙය හුදෙක් නිසර්ගයෙන්, අහම්බෙන් මිනිසුන් තුළ තිබෙන ජාතිවාදී, වර්ගවාදී හැඟීම් එළියට දමනවා පමණක් යයි කියා හිතන්න අමාරුයි. මේවා පිටි පස්සේ ලේ සුවඳට ඉව අල්ලන, අපේක්ෂා භංගත්වයට පත් වූ යම් යම් පිරිස් කටයුතු කරනවාය කියන එක අපට පෙනෙන්න තිබෙනවා. එම නිසා අපි මේ අවස්ථාවේදී, මහ ජනතාව නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුම දේශපාලන පක්ෂවල නායකයන්ගෙන් සමන්විත සර්වපාක්ෂික සමුළුවක් කැඳවන්නය කියලා ජනාධිපතිතුමාගෙන් ඉල්ලන්න කැමැතියි. සමාජයේ පවතින බිය සැක තුරන් කරලා, සමාජයේ ආවේගශීලීව වැඩ කරන පිරිස් පාලනය කරලා, සිංහල, දෙමළ, මුස්ලිම් ජන වර්ගවල සමඟිය ආරක්ෂා කරලා, දැනට ඇති වී තිබෙන වෛරීසහගතබව නිවන්න මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂ නායකයන්ට යම්කිසි කාර්ය භාරයක් පවරන්න කියලා අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලන්න කැමැතියි. ඒ වෙනුවෙන් සර්වපාක්ෂික සමුළුවක් කැඳවා, මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුම නායකයන් එකාවන්ව සමඟි බැම්මෙන් වැඩ කරලා, මේ ඇතිවෙලා තිබෙන ආතතිය, භය තුරන් කරන්න සියලුදෙනාම ඉදිරිපත්වෙලා වැඩ කරන්න කියලා මේ වැදගත් පනත් කෙටුම්පත සම්මත කර ගන්න යන මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි. සමහර අය යෝජනා කළ පමණින් ජාතිවාදී, ආගම්වාදී හැඟීම් තුරන් වන්නේ නැහැයි කියලා මම කියන්න කැමැතියි. ඒවා තුරන් කරපු සමාජයක් තිබෙනවාය කියන එක යථාර්ථයක් නොවෙයි. තමන්ගේ ජාතියට, තමන්ගේ ආගමට, තමන්ගේ රටට දක්වන ඇල්ම ඉතාම හොඳ දෙයක්. නමුත් ඒකෙන් අගතියට ගිහිල්ලා; ඒකෙන් අන්ධභාවයට පත්වෙලා; වෛරයට, ද්වේෂයට පත්වෙලා වැඩ කරනවා නම් ඒක දියුණු සමාජයක ලක්ෂණයක් නොවෙයි. කෙනෙකු තමන්ගේ ආගම මුවාවෙන් ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට යනවා නම් ඔහුගේ ආගමිකත්වය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම නැත්නම් ඒ ආගම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ දෙකම අදාළයි. කවුරු හෝ ආගම වෙනුවෙන් ප්‍රචණ්ඩකාරී ක්‍රියාවලට යනවා නම් ඔහුගේ ආගමිකත්වය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම නැත්නම් ඔහු අදහන ආගම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මෙන්න මේ තත්ත්වය පිළිබඳව සිතා බලන්න හොඳ අවස්ථාවක් අද අපේ සමාජයට උදාවෙලා තිබෙනවා. අපි, අප ගැනම, අපේ ක්‍රියාකාරකම් ගැනම බරපතළව ආපස්සට හිතා බලන්න ඕනෑවෙලා තිබෙනවා. ජනමාධ්‍යයට සම්බන්ධ කෙනෙකු හැටියට මම විශේෂයෙන්ම මේ වෙලාවේදී සඳහන් කරන්න කැමැතියි, මේ සෘජු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා හදිසි නීතිය, ආරක්ෂක හමුදා සහ බිම් මට්ටමේ සංහිඳියාව පමණක් නොව අපේ සන්නිවේදන සංහිඳියාවත් ඉතාම වැදගත්වෙලා තිබෙන බව. අපේ සන්නිවේදන අවකාශය බිම් මට්ටමට වඩා; ආයුධ අරගෙන ගිනි තියන්න, කපන්න, කොටන්න යන අයට වඩා දුර්ගන්ධයට පත්වෙලා තිබෙනවා; වඩා ප්‍රචණ්ඩත්වයට ලක්වෙලා තිබෙනවා. අද අපට යම් යම් පියවර ගන්න වෙලා තිබෙනවා, සන්නිවේදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් යම් තාක්ෂණ නියාමනයන් ඉදිරිපත් කර ගන්න. තාවකාලිකව මුත් ඒවා අද අවශ්‍යවෙලා තිබෙනවා.

ඉන්දියාව, ප්‍රංශය, ජර්මනිය ආදී හැම රටකම වාගේ මේ වාගේ සිද්ධීන් ඇති වුණු වෙලාවන්හිදී යම් යම් පියවර ගන්න වෙලා තිබෙනවා. අද මේ රටට විශේෂයෙන්ම අලුත් නීතියක් අවශ්‍යවෙලා තිබෙනවා. වෛරී ප්‍රකාශන වැළැක්වීම සඳහා වූ - වෛරී ප්‍රකාශනවලට එහෙමත් නැත්නම් Hate speechesවලට එරෙහි - නීතියක් අද මේ පාර්ලිමේන්තුව සම්මත කර ගන්න අවශ්‍යවෙලා තිබෙනවා. මම ඉතා පැහැදිලිව කියන්න කැමතියි, මේක ඉතාම විවාදාත්මක බව.

අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට එරෙහි වුවක් හැටියට මෙය අර්ථ කථනය කරන්න පුළුවන්. මේ වාගේ නීති-රීති ඉදිරිපත් කරපු හැම සමාජයකම මේ වාගේ විවාද ඇති වුණා; මේ වාගේ අභියෝග මතු වුණා. නමුත් ඒවා සම්මත කරගෙන, මේ ඇති කර ගන්නා වූ ගැටුම්වලින් පුළුවන් තරම් ඈත් වෙන්න ඒ සමාජවලට හැකියාවන් තිබෙනවා. අපි ඒ පුරෝගාමී කටයුතුත් කරන්න අවශ්‍යයි. මේ වාගේ පනත් කෙටුම්පත්, මේ වාගේ සම්මුති බලාත්මක කරන වෙලාවේදී ඒ දිහාත් යොමු වෙන්න ඕනෑ කියලා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 3.36]

**ගරු මාවෙයි සෝ. සේනාධිරාජා මහතා**
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இந்தப் பாராளுமன்ற அவையிலே "வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்படுதலிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் பற்றிய சர்வதேசச் சமவாயம்" என்ற ஒரு சட்டமூலம் கொண்டுவரப்பட்டிருக்கின்றது. இது ஆங்கிலத்திலே International Convention for the Protection of All Persons from Enforced Disappearance என்று சொல்லப் படுகின்றது. இதனை ஒரு முன்னேற்றகரமான நடவடிக்கை என்று நாங்கள் குறிப்பிடலாம். 'வலுக்கட்டாயமாகக் காணாமலாக்கப்பட்டவர்கள்' என்ற இந்த சொல் எங்கிருந்து வந்தது? யுத்த காலத்தில், யுத்தம் முடிவடைந்த காலத்தில் போரினால் காணாமற் போனவர்கள் பற்றியதாகத்தான் இந்த சட்டமூலம் இருக்குமென்று நாங்கள் எதிர்பார்த்தோம்.

அதிலிருந்துதான் இந்த சொல்லாட்சியும் வருகின்றது. இது சாதாரணமாகக் காணாமல் போனவர்கள் பற்றிய விடயம் அல்ல. போர் காலத்திலும் அதற்குப் பின்னரும் வலுக்கட்டாயமாக - enforced disappearances - காணாமலாக்கப்பட்டவர்கள் பற்றியதாக இருக்க வேண்டும். அந்த வகையில் இதற்குச் சரியான ஓர் அர்த்தம் இருக்க வேண்டும். ஆகவே, அமைச்சர் அவர்கள் இந்த சட்டமூலத்தைச் சமர்ப்பித்து எதிர்கால நடைமுறைகளை ஒட்டியதாகப் பேசியதை நாங்கள் ஏற்றுக்கொள்ளவில்லை. அப்படியுமிருக்கலாம். அதாவது இடம்பெற்ற ஒரு நிகழ்ச்சியானது சட்டரீதியானதாக இல்லாமல் நீதி முறைமைக்கு எதிரானது என்றால் அது தொடர்பில் சட்டம் கொண்டுவரப்படலாம். அந்த வகையில் ஒரு சட்டமூலம் கொண்டுவரப்படுகின்றபொழுது அது அந்த மக்களுக்கு நம்பிக்கையை ஏற்படுத்தக்கூடியதாக இருக்க வேண்டும். குறித்த நடவடிக்கைகள் எதிர்காலத்திலே நடைபெறாமல் தடுப்பதும் அதனுடைய ஒரு முக்கியமான பகுதியாக இருக்க வேண்டும். போருக்குப் பின்னர் கிட்டத்தட்ட 16,000 - 20,000 பேர் காணாமல் ஆக்கப்பட்டார்கள் என்ற ஒரு பதிவு இருக்கின்றது. இன்று வெவ்வேறு சர்ந்தர்ப்பங்களில் காணாமலாக்கப்பட்டவர்கள் இருந்தால், அவர்கள் பற்றியும் விசாரிக்கப்பட்டுத் தீர்மானம் எடுக்க வேண்டும். ஆயினும், அந்த விடயங்களைவிட இவர்களுடைய விடயம்தான் மிகவும் முக்கியமானது.

இலங்கையில் இனப்பிரச்சினை தீர்க்கப்படாமல், பல ஜனநாயகப் போராட்டங்கள் இராணுவ ரீதியாக அடக்கியொடுக்கப்பட்ட காரணத்தினால் இராணுவத்தினருக்கும் விடுதலைப் புலிகளுக்கும் இடையில் ஓர் ஆயுதப் போராட்டம் நடைபெற்றது. அந்தக் காலகட்டத்தில் காணாமலாக்கப்பட்டவர்கள் கிட்டத்தட்ட 20,000 பேர் என்று சொன்னால், அந்த மக்கள் தங்களுடைய கைகளில் ஆயுதங்களைக் கொண்டுபோனவர்கள் அல்லர்; போர் முடியும் தறுவாயில் இராணுவத்தினரிடம் சரணடைந்தவர்கள். அதாவது, அவர்களுடைய பெற்றோர் அல்லது உடன்பிறந்தவர்களால் இராணுவத்தினரிடம் கையளிக்கப்பட்டவர்கள். ஆகவே, அவர்களுக்கு நீங்கள் பதில் சொல்ல வேண்டும். ஏனைய விடயங்களாயின் பொதுவாக ஆராய்ந்து அவற்றுக்கான தீர்வைக் காணலாம். ஆனால், இந்தச் சட்டத்தினுடைய வலுவானது அப்படி இராணுவத்தினரிடம் கையளிக்கப்பட்டவர்கள் எங்கே இருக்கின்றார்கள்? என்று கேட்கும்போது விடை காணக்கூடியதாக இருக்க வேண்டும். அந்தப் பெற்றோர் அவர்களைத் தேடி இன்றைக்கும் தெருத்தெருவாக அலைந்து தேடிக்கொண்டிருக்கின்றார்கள் - அரசாங்கத்திடம் பதில் சொல்லுமாறு கேட்டுக்கொண்டிருக்கின்றார்கள்; சர்வதேச நாடுகளிடமும் கேட்கின்றார்கள்.

இன்று இந்தச் சட்டமூலமானது, போர் முனையிலும் போருக்குப் பின்னரும் ஏற்பட்ட போர்க் குற்றங்களை விசாரிப்பதற்கென, 2012ஆம் ஆண்டில் ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையிலே பல நாடுகளுடைய இணக்கத்துடனான பிரேரணையின் அடிப்படையில் கொண்டுவரப்பட்டிருக்கின்றது. ஆகவே, காணாமலாக்கப்பட்டவர்களுடைய பிரச்சினைக்கு அந்த அடிப்படையிலிருந்துதான் தீர்வு காணப்படல் வேண்டும். குறித்த சம்பவங்கள் சென்ற ஆட்சிக்காலத்திலே இடம்பெற்றிருந்தாலும் இந்த ஆட்சி அதற்குப் பொறுப்புச் சொல்லவேண்டிய கடப்பாட்டைக் கொண்டிருக்கின்றது என்பதையும் நாங்கள் வலியுறுத்த விரும்புகின்றோம். இனப்பிரச்சினைக்குத் தீர்வு காணப்படும்; காணாமலாக்கப்பட்டவர்கள் விடயத்தில் தீர்வு கிடைக்கும் என்ற நம்பிக்கையோடுதான் இந்த அரசாங்கத்திற்கு எங்களுடைய மக்கள் வாக்களித்தார்கள்; ஜனாதிபதியையும் தேர்ந்தெடுப்பதற்கு உதவினார்கள். அந்த மக்களுக்கு நாங்கள் பதில் சொல்லக் கடமைப்பட்டிருக்கின்றோம்.

ஐ.நா. மனித உரிமைகள் பேரவையின் கூட்டத்தொடர் நடைபெற்றுக்கொண்டிருக்கின்ற இந்த நேரத்திலே, இச்சட்டமூலத்தை அவர்கள் ஏற்றுக்கொள்வார்கள் என்று நான் நம்பிக்கை கொள்ளவில்லை. எங்களுடைய மக்களும் இதனை ஏற்றுக்கொள்ள மாட்டார்கள். ஏனெனில், இந்தச் சட்டமூலம் காணாமல் ஆக்கப்பட்டவர்களுக்கு ஒரு விடையாக அமையும் என்று நாங்கள் நம்பவில்லை. இதற்காக நியமிக்கப்பட்ட ஆணைக்குழுவினால் குறித்த விடயம் முறையாக விசாரிக்கப்பட்டு விடை காண்பதனூடாகக் குற்றவாளிகள் கண்டுபிடிக்கப்பட்டு, அதன்பின்னர் அந்த மக்கள் யார் யார் அந்த உறவுகள் என்பதை அடையாளப்படுத்துவதன்மூலம் அவர்களுக்குரிய நிவாரணத்தை வழங்குகின்ற வகையிலும், இனிமேல் இவ்வாறான சம்பவங்கள் நடைபெறக்கூடாதென்ற வகையிலும் ஒரு சட்டத்தைக் கொண்டுவருவதுதான் அடிப்படையில் மிகமுக்கியமானதும் நீதியானதுமாகும். இருந்தபோதிலும், மனித உரிமைகள் பேரவையினுடைய தீர்மானத்தையிட்டுச் சமாதானம் சொல்வதற்காகவே இன்று இந்தச் சட்டமூலத்தை நீங்கள் சமர்ப்பித்திருக்கின்றீர்கள்.

இந்த நாட்டிலே போரில் ஈடுபட்டுக் குற்றமிழைத்தவர்களும் அதற்கு அப்பால் சமகாலத்திலே குறிப்பாக அரசாங்கத்தின் சார்பில் ஆயுதம் வைத்துக்கொண்டு சர்வதேச நீதி நெறிமுறைகளுக்கு மாறாகக் குற்றமிழைத்தவர்களும் இருக்கின்றார்கள். ஆனால், ஆயுதம் ஏந்தாத மக்கள் - பாதுகாப்புக் கருதி ஒன்றுகூடிய மக்கள் - பாதுகாப்பான இடத்துக்கு வாருங்கள் என்ற அழைக்கப்பட்ட மக்கள், அதைவிடப் போரின் இறுதிக் கட்டத்திலே "ஆயுதத்தைவிட்டு நாங்கள் சரணடைகின்றோம்" என்று இராணுவத்திடம் சரணடைந்தவர்கள் பற்றித்தான் உங்களிடத்தில் நாங்கள் கேட்கின்றோம். அவ்வாறு கையளிக்கப்பட்டவர்கள் எங்கே? என்று உங்களிடம் வேண்டுகோள் விடுக்கின்றோம். இங்கே கௌரவ அமைச்சர் நிமல் சிறிபால த சில்வா அவர்கள் இருக்கின்றார். மஹிந்த ராஜபக்ஷ அவர்கள் ஜனாதிபதியாக இருந்த காலத்தில் தமிழ்த் தேசியக் கூட்டமைப்புடன் பேச்சுவார்த்தை நடத்தியபோது, அவர் முன்னிலையிலும் காணாமல் ஆக்கப்பட்டவர்கள் விடயம் பேசப்பட்டது. அந்தநேரத்தில், கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்கள் “அதற்கான ஒரு பதிவு இருக்கின்றது” என்று பதில் சொன்னார்.

காணாமலாக்கப்பட்ட மக்களில் இராணுவத்தினரிடம் சரணடைந்தவர்களுடைய பட்டியல் உங்களிடம் இருக்கிறதா, இல்லையா? என்று நாங்கள் கேட்கின்றோம். அது பதியப்பட்டிருந்ததாக எங்களுக்குத் தகவல் கிடைத்தது. ஆகவே, அந்தப் பதிவு சம்பந்தமான தகவல்களை இப்போது பகிரங்கப்படுத்த வேண்டுமென்று கேட்கின்றோம். அதனடிப்படையில் மேதகு ஜனாதிபதி அவர்கள் நியமித்திருக்கின்ற ஆணைக்குழு விசாரணை நடத்த வேண்டும். அதைவிட, பொதுமக்கள் கொல்லப்பட்டார்களா, இல்லையா? என்பது பற்றிச் சொல்ல வேண்டும். அவர்கள் கொல்லப்பட்டிருக்கலாம்! ஆகவே, அவர்களுக்கு என்ன நடந்தது என்பதைச் சொல்லவேண்டிய பொறுப்பு இந்த அரசாங்கத்திற்கு, இந்த ஆணைக்குழுவிற்கு இருக்கவேண்டும். அதுதான் முக்கியமானது.

இந்த நாட்டிலே ஓர் இனப்பிரச்சினை தீர்க்கப்படவில்லை என்பதால், ஜனநாயக ரீதியான போராட்டங்கள் எழுந்தபோது அவை இராணுவ ரீதியாக அடக்கியொடுக்கப்பட்டன. அந்த

[ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා]

ஆயுதப் போர் நடைபெற்றபோது சர்வதேச ரீதியாக அதாவது, நோர்வே நாட்டினுடைய அனுசரணையுடன் விடுதலைப் புலிகளும் அரசாங்கமும் போர் நிறுத்தம் செய்து 2003இலே ஒஸ்லோவில் ஓர் உடன்படிக்கை செய்யப்பட்டது. அதனுடைய இலக்கு இந்த நாட்டின் இனப்பிரச்சினைக்குத் தீர்வு காணப்பட வேண்டும் என்பதாகும். உள்ளக சுயநிர்ணய உரிமை அடிப்படையில் சமஷ்டிக் கட்டமைப்புடனான ஓர் அரசியல் தீர்வு எட்டப்பட வேண்டும் என்று அங்கே இணக்கம் காணப்பட்டது. ஆனால், அது நடைமுறைக்கு வரவில்லை. ஆனபடியால், ஓர் அரசியல் இலக்கை அடைவதற்காக இந்த நாட்டினுடைய போர் இருந்ததே தவிர, மக்கள் காணாமலாக்கப்படுவதற்காக அல்ல. இன்று யுத்தம் முடிவடைந்துவிட்டது. ஆகையினால், சரணடைந்தவர்கள் மக்களாக இருந்தாலும் சரி, போராளிகளாக இருந்தாலும் சரி அவர்கள் எங்கே என்பதற்குப் பதில் சொல்லவேண்டிய கடப்பாடு, அவர்களின் குடும்பங்களுக்கு நிவாரணமளிக்க வேண்டிய கடப்பாடு, அவர்கள் தொடர்பில் முழுமையாக விசாரிக்கக்கூடிய தத்துவங்கள் இந்த ஆணைக்குழுவிற்கு இருக்கவேண்டும். ஆனால், சர்வதேச ரீதியாக இந்த அரசுக்கு அழுத்தங்கள் வந்ததனால், 7 - 8 ஆண்டுகளுக்குப் பின்னர் இன்று கொண்டுவரப்பட்டுள்ள இந்தச் சட்டமூலம் தெளிவற்றதாக, சரியான ஒரு தத்துவத்தைக் கொண்டிருக்காததாக, உண்மைகள் வெளியே கொண்டுவர முடியாததாக, பொறுப்புக்கூறுவதிலிருந்து பின்வாங்கக் கூடியதாக இருப்பதனால் இதனை நாங்கள் ஏற்றுக்கொள்ளவில்லை.

மேதகு ஜனாதிபதி அவர்களிடமும் கௌரவ பிரதமர் அவர்களிடமும் இந்தச் சமயத்தில் நாங்கள் ஒரு கோரிக்கையை முன்வைக்கின்றோம். அதாவது, இந்த ஆணைக்குழு கடந்த காலத்தில் குறிப்பாகப் போர்க்களத்திலே சரணடைந்தவர்கள், இராணுவத்தினரிடம் கையளிக்கப்பட்டவர்கள் தொடர்பில் சம்பந்தப்பட்ட குடும்பங்களுக்கு உண்மையை வெளிப்படுத்தி, அதற்குரிய நிவாரணத்தைக் காணவேண்டும். இந்த நாட்டின் இனப்பிரச்சினை தொடர்பில் நல்லிணக்கம் ஏற்படுவதற்குரிய பொறுப்பை இந்த ஆணைக்குழு மூலமாக அரசாங்கம் நிறைவேற்ற வேண்டிய கடப்பாடிருக்கின்றது என்று திட்டவட்டமாக நான் கூறிவைக்க விரும்புகின்றேன். இந்த உண்மைகள் வெளியே கொண்டுவரப்படாவிட்டால், இந்த நாட்டில் ஓர் அரசியல் தீர்வு ஏற்படுவதற்கு இடமில்லை; நல்லிணக்கம் எற்படுவதற்கு இடமில்லை. ஆகவே, அதை உணர்ந்து இந்தச் சட்டமூலத்தில் தெளிவான திருத்தமொன்றைக் கொண்டுவரவேண்டும். அதாவது, சரணடைந்தவர்களாவது எங்கே இருக்கின்றார்கள்? அல்லது அவர்கள் இல்லையா? என்பதை நீங்கள் குறிப்பிடுவதற்கு உண்மையை வெளிப்படுத்தும் வகையில் இந்தச் சட்டமூலத்தை மாற்றியமைக்க வேண்டுமென்று கேட்டுக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.48]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි අද මේ සාකච්ඡාවට ගෙන තිබෙන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත පිළිබඳව මගේ අදහස් දැක්වීමට අවතීර්ණ වීමට කලින්, මේ රටේ අද උද්ගත වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව කරුණු කිහිපයක් මේ ගරු සභාව හමුවේ තබන්න මම බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහනුවර දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශ ආවරණ වන විධියට ඒ පැතිර යමින් තිබෙන ගැටුම්කාරී වාතාවරණය ඉතා අවාසනාවන්ත තත්ත්වයක්. ඒ අවාසනාවන්ත තත්ත්වය පාලනය කිරීමට සුදුසු පියවර ගන්න මේ ආණ්ඩුව තවමත් පොහොසත් වෙලා තිබෙනවාය කියලා අපට පෙනෙන්නේ නැහැ. ආණ්ඩුව තුළම ඉන්න ඇතැම් කල්ලි උත්සාහ කරනවා මේ තත්ත්වය රටේ අනෙක් ප්‍රදේශ කරා ව්‍යාප්ත කරන්න. මුස්ලිම් ජනතාව සම්බන්ධයෙන් සිංහල ජන සමාජයේ කාලයක් තිස්සේ ගොඩ නැඟුණු යම්කිසි තැති ගැන්මක් තිබෙනවා වෙන්නට පුළුවන්. මේ මෑතක සිට ඔවුන් අඳින පළඳින විධිය වෙනස් වෙන්න ගන්නවා. අරාබි අනන්‍යතාව ලංකාව ඇතුළට ගෙනෙන්න හදනවා. ඒ විතරක් නොවෙයි. ඒ සමාජයේ ඇතැම් අන්තවාදී කණ්ඩායම් කිපෙන සුලු ප්‍රකාශ පසුගිය කාලය තුළ සිදු කරන්න ගත්තා. මේ වාගේ විවිධ හේතු නිසා සිංහල ජන සමාජයේ ඇතැම් කොටස් තුළ යම්කිසි ආතතියක් තිබිය හැකිව තිබෙනවා.

පුද්ගලයකු මරා දැමුවා මුස්ලිම් තරුණයන් තුන් හතර දෙනෙක් එකතු වෙලා. ඒ සිද්ධිය තමයි උපයෝගී කොට ගැනුණේ, මොකක් හෝ තිබුණු ආතතියක්, ගබඩා කර ගෙන තිබුණු ආතතියක් පිට කර හරින්න.

අපේ සමාජය විවිධත්වයෙන් පිරුණු සමාජයක් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. තිස් අවුරුදු යුද්ධයකින් මේ රටේ දෙමළ, සිංහල ජනතාව බැට කෑවා. ඒ වේදනාවෙන් පීඩා වින්දා. මේ ඉදිරිපත් කර තිබෙන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත වැනි පනත් කෙටුම්පත් ගැන මේ ගරු සභාවේ අද සාකච්ඡා කරලා වාද කරන්න සිද්ධ වෙලා තිබෙන්නේත් ඒ අතීතයෙන් ගලා එන සිද්ධි දාමයේ කොටසක් ලෙසයි. මා හිතන විධියට මේ ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා, මේ රටේ තිබුණු සාමකාමී ජීවන තත්ත්වය රකින්න. ආණ්ඩුව කෙරෙහි මහජනයා තුළ විශ්වාසයක් නැහැ. සිංහල ජන සමාජය විශේෂයෙන්ම හිතනවා ආණ්ඩුව තමන් ආරක්ෂා කරන්නේ නැහැ කියලා. මුස්ලිම් ජන සමාජයටත් අද ඒ පිළිගැනීමට එන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඇත්තටම අද මේ රටේ ආණ්ඩුවක් නැති තත්ත්වයකටයි පත්වෙලා තිබෙන්නේ. එහෙම තත්ත්වයක් යටතේ තමුන්නාන්සේලා කරමින් ඉන්නේ මොකක්ද? ජිනීවා සමුළුවේදී එකඟ වුණා ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක ගිවිසුමකට. ඇමෙරිකා එක්සත් ජනපදය ලංකාවට රැහැනිව ගෙනාපු යෝජනාවට එකඟ වුණු ලෝක ඉතිහාසයේ පළමුවැනි රට ලංකාව. කිසියම් රටකට එරෙහිව ඇමෙරිකාව හෝ වෙනත් කවුරු හෝ ගෙනාපු යෝජනාවකට සම අනුග්‍රාහකත්වයත් දරපු එකම රට මේ රට. අබල දුබල වුණු පාලනයක් තිබෙන අද, ජාත්‍යන්තරව එකඟ වුණු ඒ කොන්ත්‍රාත්තුව ඉටු කිරීම පමණයි මේ රටේ සිද්ධ වෙන්නේ. මේ පනත් කෙටුම්පතත් ඒ කොන්ත්‍රාත්තුවලට අයිති පනත් කෙටුම්පතක්. අපි මේ සමස්ත සංදර්භය තේරුම් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගිනි නිවනවා වෙනුවට මොකක්ද කරන්නේ? CID එකේ ලොක්කා ශානි අබේසේකර මහනුවරට යවලා, ලොහාන් රත්වත්තේයි, දිළුම් අමුණුගමයි තමයි මේවා මෙහෙයවූවේ කියලා වාර්තාවක් හදන්න

කියලා උපදෙස් දීලා තිබෙනවා. මේ වෙලා තිබෙන විපත හරහාත් දේශපාලන කුපාඩිකම් කරන්නයි හදන්නේ. මා මේ කියන්නේ දැන් මහනුවර තිබෙන තත්ත්වය ගැන. කවුරු හෝ තමන්ගේ විරුද්ධවාදියකු පිට ඒක පටවලා අත හෝදා ගන්න වාගේම, ඒකෙනුත් මොකක් හෝ දේශපාලන වාසියක් ගන්න බලනවා.

දැන් බලන්න, මේ කලබලකාරී තත්ත්වයත් එක්ක මේ පනත් කෙටුම්පත ගැන සමාජයේ සාකච්ඡාවක් සිද්ධ වුණේ නැහැ. මේ පනත් කෙටුම්පතේ තිබෙන විසකුරුභාවය ගැන කථා වුණේ නැහැ. ඔබතුමා දන්නවා, මේක ඕපපාතිකව එන පනත් කෙටුම්පතක් නොවෙයි. මංගල සමරවීර හිටපු විදේශ ඇමතිවරයා ඇමෙරිකානු යෝජනාවට එකඟ වුණා. ඒ යෝජනාවේ තිබෙනවා කළ යුතු කාර්යභාරය මොනවාද කියලා. රණ විරුවන් දඩයම් කරන්නේ ඒ න්‍යාය පත්‍රයට අනුවයි. අභූත චෝදනා එල්ල කරලායි රණ විරුවන් දඩයම් කරන්නේ.

දැන් බලන්න, නාවික හමුදාවේ හිටපු ප්‍රධාන නිලධාරියෙක් තමයි කොමදෝරු දසනායක කියන්නේ. කොමදෝරු දසනායකට ඇප ලැබුණා. ඔහුට විරුද්ධව සාක්ෂිය දීපු හිටපු එල්ටීටීඊ සාමාජිකයා අධිකරණයට ඇවිල්ලා කිව්වා, "මේ සාක්ෂිය මගෙන් බලෙන් ගත්තේ. ඇත්ත සිද්ධිය මෙන්න මේකයි" කියලා. ඒ නිසා ඔහුට ඇප ලැබුණා. අද CID එක කරන්නේ රණ විරුවන්ට විරුද්ධව බොරු සාක්ෂි හදන එක; ගෝඨාභය රාජපක්ෂ දඩයම් කරන්න බොරු සාක්ෂි හදන එක. එම නිසා මේ සන්දර්භය යටතේ තමයි අපට මේ පනත් කෙටුම්පත ගැන අපට කියවන්න වෙන්නේ. මේ පනත් කෙටුම්පතේ තිබෙන අකුරුවලින් විතරක් මේ තත්ත්වය මනින්න බැහැ. මේ පනත් කෙටුම්පතේ තිබෙන අකුරුවලින්, වාක්‍යවලින් විතරක් මේ තත්ත්වය මනින්න බැහැ. අපි ඒක තේරුම් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අතුරුදහන් වූවන්ගේ තොරතුරු විමර්ශනය කරන කාර්යාලයක් පිහිටුවනවා. ව්‍යවස්ථාදායක මණ්ඩලයෙන් ඒ මණ්ඩලයේ ප්‍රධානීන් හැටියට ඉන්න අයගේ නම් ටික ජනාධිපතිට යවනවා. ඒ අය අතර ඉන්නේ නිමල්කා ප්‍රනාන්දු ඇතුළු කුප්‍රකට කොටි හිතවාදී නඩයක්. ජිනීවා මානව හිමිකම් සමුළුවට ගිහින් මේ රටේ හමුදාවට විරුද්ධව අභූත චෝදනා නඟන නිමල්කා ප්‍රනාන්දු මැතිනිය ඇතුළු කුප්‍රකට කොටි හිතවාදී නඩයක් තමයි ඒ මණ්ඩලයේ ඉන්නේ. ඒ ව්‍යවස්ථාදායක මණ්ඩලයේ අපේ පරණවිතාන මහත්මයාගේ නායකයාත් ඉන්නවා. ඒ පාඨලී චම්පික රණවක මහත්මයා. එතුමා සිංහල බෞද්ධ; බෙදුම්වාදයට එරෙහි. නමුත් නිමල්කා ප්‍රනාන්දුගේ නමත් සම්මත වෙලා යනවා. අරුම පුදුම කාලයේ වැඩ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හරි නම් අතුරුදහන් වූවන්ගේ කාර්යාලයේ ප්‍රධානීන් කරන්න ඕනෑ, මධ්‍යස්ථ පිරිසක්; මෙහෙම දෙයක් වෙලා ද නැද්ද කියලා සාධාරණව සොයන පිරිසක්. නමුත් එහෙම පිරිසකට නොවෙයි ඒ කාර්යාලය භාර වෙන්නේ. තමුන්නාන්සේලාට ඒ නම් ටික දෙන්නේත් පිටරටින්; ඇමෙරිකන් තානාපති කාර්යාලයෙන්. ඒ න්‍යාය පත්‍රයට අනුව සියල්ල දිගේලි වෙනවා. ඒ කාර්යාලය වැඩ පටන් ගන්නවා. අපේ හමුදාව පුද්ගලයන් අතුරුදහන් කරලා බලෙන් තියා ගත්තාය කියලා බොරු සාක්ෂි හදලා, රණ විරුවන් දඩයම් කරන්න බඩු ගෙවන ජනතාවගේ සල්ලිවලින් ඒ කාර්යාලය නඩත්තු වෙනවා. ලෝකයේ කොහේද මෙහෙම දෙයක් වෙලා තිබෙන්නේ?

තමුන්නාන්සේලා ඔළුව උඩ තියාගෙන ඉන්න ඇමෙරිකා එක්සත් ජනපදය මේ ප්‍රඥප්තියට අත්සන් කරලා තිබෙනවා ද? තමුන්නාන්සේලා අසල්වාසී ඉන්දියාවෙන් අහලා බලන්න, ඒ ප්‍රඥප්තියට අත්සන් කළාට ඒ රට ඇතුළේ එය නීතියක් හැටියට බලාත්මක වෙන්න ඉඩ දීලා තිබෙනවාද කියලා? නමුත් මේ රටේ මේ සිද්ධ වෙන්නේ වෙන මොකවත් නොවෙයි. මේ රටේ මේ වෙන්නේ, මේ රටේ හමුදාව යුද අපරාධ කළාය කියන මිථ්‍යාව සනාථ කරන්න, නොවෙච්ච දෙයක් වුණාය කියලා සනාථ කර පෙන්වන්න වුවමනා කරන උපකරණ ටික, යාන්ත්‍රණය අපිම අපේ වියදමින් හදලා දෙන එක. මෙහෙම රූකඩ පාලනයක් නම් ලංකා ඉතිහාසයේ කවදාවත් අපට දකින්න ලැබුණේ නැහැ.

ගරු තිලක් මාරපන විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමාට අපි ගරු කරනවා. ඔබතුමා මහත්මයෙක්. නමුත් ඔබතුමාගේ මහත්මාකමට කරන්න දෙයක් නැහැ, ඇමති හැටියට තමුන්නාන්සේට මේ කරුමයට කර ගහන්න වෙනවා. එහෙම හිතුවාම ඔබතුමා ගැනත් අපට දුක හිතෙනවා. මේක මහා පාපකර්ම පනත් කෙටුම්පතක්. මේ ගැන බොහොම ලස්සන කථා ටිකක් කියන්න පුළුවන්. "අතුරුදහන් කිරීමක් වුණොත් එතැනින් එහාට විතරයි මේ පනත බලපාන්නේ. ලංකාවේ කෙනෙක් වෙන රටක උසාවියකට ගෙන ගිහින් නඩු අහන්න බැහැ." එහෙම කියන්න පුළුවන්. තමුන්නාන්සේ එහෙම කිව්වාට මේ පනත් කෙටුම්පතේ කොහේවත් එහෙම දෙයක් නැහැ. තමුන්නාන්සේ මේ ගරු සභාවට පනත් කෙටුම්පතට අදාළ සංශෝධන දීලාත් නැහැ. දැන් සභාවේ තිබෙන පනත් කෙටුම්පතයි අපි සාකච්ඡාවට ගන්නේ. තමුන්නාන්සේ යමක් කටින් කිව්වාට ඒක නීතියක් බවට පත් වෙන්නේ නැහැ. එහෙම නම් ඒ සංශෝධනය මේ සභා ගැබ තුළ තිබෙන්නට ඕනෑ. ඒ සංශෝධනය මේ සභා ගැබ තුළ නැතිව, විෂය භාර අමාත්‍යවරයාගේ මුවින් පළ කරන අදහස් මත පමණක් පදනම්ව මේ පනත් කෙටුම්පත ගැන සහතිකයක් දෙන්න අපි කාටවත් බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පත මේ තිබෙන විදියට සම්මත වුණොත්, අපේ හමුදා නිලධාරීන්ට විරුද්ධව මේ ප්‍රඥප්තියට අත්සන් කර තිබෙන ඕනෑම රටක උසාවියකදී නඩු අහන්න පුළුවන්. ඒ අය ඒ රටට ඉල්ලුවොත් භාර දෙන්න ලංකා රජය බැඳිලා ඉන්නවා. තමුන්නාන්සේ අපට ඒ සංශෝධනය පෙන්නුවා නම් අපට මේ ටික නොකියා ඉන්න පුළුවන්. ඒ අය ඒ යම් රටකට ඉල්ලුවොත් භාර දෙන්න ලංකා රජය බැඳිලා ඉන්නවා.

මීට ටික දවසකට කලින් එල්ටීටීඊ හිතවාදීන් මහා බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලයට ඇවිත් උද්ඝෝෂණය කරනකොට, ලංකාවේ කොඩිය පාගනකොට, මහා බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලයේ හිටපු නිලධාරියෙක්, ආරක්ෂක හමුදා සාමාජිකයෙක් එතුමාගේ නිල ඇඳුමේ තිබෙන ලංකාවේ ජාතික කොඩිය පෙන්වපු එකේ වරදට, බෙල්ල ඉස්සරහින් ඇඟිල්ල ගෙන ගිය එකේ වරදට වහාම ලංකාවට පටවා එව්වා, එතුමාට ආරක්ෂාව නැහැ කියලා.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඩයස්පෝරාවේ න්‍යාය පත්‍රයට දුවන ආණ්ඩුවක්. ගරු ඇමතිතුමනි, ඔබතුමා වාගේ කෙනෙක් මේ පාප කර්මයට කර ගහන එක අපට දුකක්. මේක අනාගතයේ මේ රටේ මිනිස්සු මහා ද්‍රෝහී ලියවිල්ලක් ලෙස සලකන පනත් කෙටුම්පතක්. මේක හුදකලා පනත් කෙටුම්පතක් නොවෙයි. සමස්ත ක්‍රියාදාමය සමඟයි මේ ගැන සලකා බලන්න වෙන්නේ. අද දැනුවත් වුවමනාවක් තිබෙනවා ලංකාවේ ආරක්ෂක හමුදාවලට එරෙහිව ක්‍රියාත්මක වෙන්න. ඒක ඩයස්පෝරාව මඟින් එන වුවමනාවක්. ඒ වුවමනාව තමයි ඇමෙරිකාව ඇතුළු ඒ රටවල් නියෝජනය කරන්නේ. ඒක තමයි ඩයස්පෝරාව ඇතුළු ඒ රටවල් නියෝජනය කරන්නේ. ඒකට තමයි මංගල සමරවීර මහත්මයලා අවනත වුණ; යටත් වුණේ. ඒක ලෝකය දිනා ගත්තා නොවෙයි. ලෝකය දිනා ගත්තා නම් ඇමෙරිකා එක්සත් ජනපදය මොකද අපේ ආණ්ඩුව කාලයේත් නතර නොකරපු ජීඑස්පී සහනය නතර කළේ? ලෝකය දිනා ගත් නිසා ද එහෙම කළේ?

[ගරු විමල් වීරවංශ මහතා]

අපේ ආණ්ඩුව කාලයේත් තිබුණා ජීඑස්පී බදු සහනය. ඒවා නකර කළේ ඇයි?

ලෝකය දිනා ගත්තා නොවෙයි, තමුන්නාන්සේලා ලෝකයේ බලවතුන්ට යටත් වුණා. තමන්ගේ රාජ්‍යයට සාමය දිනා දුන් ආරක්ෂක හමුදා පාවා දෙන්න ඕනෑ කරන දේවල්වලට "කරන්නන් ස්වාමිනී" කියලා එකඟ වුණා. 2013 මැයි මාසයේ ගෝලීය දෙමළ සංසදයේ ප්‍රධානීන් එක්ක සාකච්ඡාවක් සිංගප්පූරුවේ සිද්ධ වුණා. ඒක තිබෙන්නේ TamilNet වෙබ් අඩවියේ. ඒ සාකච්ඡාවට ගියේ කවුද? අද මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විධියට කටයුතු කරන මංගල සමරවීර, (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න. ඊළඟට, කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ ප්‍රධානි තමිල් මාරන්. මේ අය තමයි එක්සත් ජාතික පක්ෂයේ වුවමනාව පැත්තෙන් එම සාකච්ඡාවට ගියේ. අර පැත්තෙන් ආවා, ගෝලීය දෙමළ සංසදයේ ප්‍රධානීන්.

ගරු ඇමතිතුමනි, එම TamilNet වාර්තාවේ ගෝලීය දෙමළ සංසදය කියනවා, "රාජපක්ෂ රෙජීමය පලවා හරින්න මංගල සමරවීර හිඟන්නෙක් සේ අපෙන් උදව් ඉල්ලා හිටියා. අපි කොන්දේසි දහයකට -ප්‍රතිපත්ති දහයකට - යටත්ව රාජපක්ෂ රෙජීමය පළවා හරින්න එකඟ වුණා" කියලා. අන්න ඒ ප්‍රතිපත්ති දහයේ තිබෙනවා, යුද අපරාධ කරපු රණවිරුවන් දඬුවම් කිරීම කියලා. ඒ ප්‍රතිපත්ති දහයෙන් පළමුවැනි එක තමයි, නාමකරණය කුමක් වුවත් අභ්‍යන්තර ස්වයං පාලනය ලැබෙන ආකාරයේ ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කිරීම. බල පෙරළියට දෙමළ ඩයස් පෝරාවේ සහාය ගැනීම සඳහා මේ රටට අහිතකර එකඟතාවක් එතැන ඇති වුණා. අන්න ඒ එකඟතාවට අදාළ පියවර තමයි මේ ගන්නේ. දෙමළ ජාතික සන්ධානය අඬන්නේ ඒවා ප්‍රමාදයි කියලා. ඒගොල්ලන්ට තිබෙන්නේ ඒ ප්‍රශ්නය. නමුත් මේ වෙන්නේ, එම එකඟතාවට අදාළ දේවල්. මහ බැංකුව, ස්වර්ණ මහල් - ඊඒපී - ජාලයට අයත් ආයතන එල්ටීටීඊ මුදල්වලින් දුවන මැලේසියාව හරහා එන සමාගමකට දෙනවා. නමුත් ඊට වඩා වැඩි ලංසුවක් මේ රටේ ව්‍යාපාරිකයකු තබා තිබෙනවා.

"ස්වර්ණවාහිනී" නාලිකාව ඇතුළු ඊඒපී මාධ්‍ය ජාලයට අයිති ආයතන මිලදී ගන්න අර එල්ටීටීඊ මුදල් තිබෙන, පිටින් ආ ඒ ව්‍යාපාරිකයාට වඩා "හිරු" එෆ් එම් නාලිකාවේ අයිතිකාර සමාගම වැඩි ලංසුවක් තබා තිබෙද්දීත්, මහ බැංකුව ඒක දෙන්නේ කාටද? එම විදේශයෙන් එන සමාගමට. මොකක්ද හේතුව? අද මේ රටේ පෞද්ගලික ආයතන හෝ මොනවා හෝ විකිණෙන ඒවා ගන්න ඩයස්පෝරාව පැත්තෙන් එනවා නම්, ඒ ගොල්ලන්ට තමයි අවස්ථාව දෙන්නේ. "හිරු" මාධ්‍ය ජාලය ඒ ආයතන ගන්න ඊට වඩා වැඩි ලංසුවක් ඉදිරිපත් කළත්, ඒ ගොල්ලන්ට දෙන්නේ නැහැ. එතැනට මේ ආණ්ඩුව පත් වෙලා ඉවරයි. අද කළු සල්ලිවල තිප්පොළක් හැටියට මේ රට හංවඩු ගහලා ඉවරයි. මේ රට කළු සල්ලි තිප්පොළක් වුණේ කොහොමද? දෙමළ ඩයස්පෝරාවේ ගොඩ ගැහිලා තිබෙන, එල්ටීටීඊ එක වෙනුවෙන් ගොඩ ගහපු සල්ලි අද කළු සල්ලි හැටියට මේ රට ඇතුළට එනවා. ඒ නිසා කරුණාකරලා ඒක තේරුම් ගන්න. මේ ගත වෙච්ච අවුරුදු තුන ඇතුළත තමුන්නාන්සේලා මේ රට නැඟිටින්න බැරි වෙන විධියේ විපතකට ඇද වට්ටා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාලය අවසන් වෙන්න විනාඩියකට කලින් පොඩි අනතුරු ඇඟවීමක් කළා නම් මනරම්. එකපාරටම අවසන් කිව්වාම නවත්වා ගන්න බැහැ නේ. බස් එකක් වුණත් එහෙම නවත්වා ගන්න බැහැ, gear මාරු කර ගන්න ඕනෑ. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට විනාඩි 13ක් ලබා දුන්නා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පත්වලින් ඉරණම තීරණය වෙන්නේ කාගේද? මේ රටට සාමය දිනා දුන් රණවිරුවන්ගේ. ඔබතුමා කිව්වාට මේක අතීතයට බලපාන්නේ නැහැ කියලා, මේකේ කොහේවත් එහෙම සඳහනක් නැහැ. බලය කියන්නේ තාවකාලිකව ලැබෙන දෙයක්. ඒ තාවකාලිකව ලැබෙන බලය තමන්ගේ රටත්, ලාංකීය ජාතියත් බිල්ලට දීලා තහවුරු කර ගන්න හදනවා නම් ඒක සාර්ථක වෙන්නේ නැහැ. මේ රටේ ජන මතය තමුන්නාන්සේලා දන්නවා. ඒ ජන මතය දිහා බලන්න. කාට පොරොන්දු වුණත්, ඒ ජන මතයට රුහුණි අණ පනත් ගෙන එන එක නවත්වන්න. එහෙම නොවුණොත් තමුන්නාන්සේලාට වෙන්නේ, පසුගිය පළාත් පාලන මැතිවරණයටත් වඩා අන්ත පරාජයකට ඇද වැටෙන්නයි. කවුරුවත් හිතනවා නම් මේ රටේ ජනතාව අඳ, ගොළු, බිහිරි පාසලක් කියලා, ඒක එහෙම නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක පැත්තකින් අපි ඉතා වගකීමෙන් මේ කාරණය පිළිබඳව ඉල්ලීමක් කරනවා. කන්ද උඩරට -මහනුවර- දැන් ඇවිලෙන ගින්න නිවන්න. ගින්න අවුළුවපු අය කවුද කියලා තමුන්නාන්සේලා දන්නවා. කුලියාපිටියේ කඩවලට ගිනි තිබ්බා. ඒකට පිරිස රැගෙන ආපු වාහනය සීසීටීවී කැමරාවල තිබෙනවා. වාහනය අයිති කාටද? එක්සත් ජාතික පක්ෂ නාගරික මන්ත්‍රී එරාන් හල්පගේට. පොලීසිය ගියා ඔහුව අත් අඩංගුවට ගන්න. නමුත්, ගන්න දෙන්නේ නැහැ, උඩින් එනවා, calls . මම මේ ඉතා වගකීමෙන් කියන්නේ. එතකොට යූඑන්පී නාගරික මන්ත්‍රී කුලියාපිටියේ මුස්ලිම් කඩවලට ගිනි තියන්නේ කොහොමද? මේක අවුළුවන්නේ කවුද? මේ අපරාධ කර කර මේ රට නාස්ති කරන්න එපා. දේශපාලනය කරමු. ඒත් සමාජයක හදවත් ගිනි තිබ්බොත්; සමාජයක හදවත් සිදුරු කළොත්, ඒවා නැවත පිළියම් කරන්න ලෙහෙසි වෙන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. ඒ නිසා, ජාතියක ඉරණමත් එක්ක පාපන්දු කෙළින එක නවත්වන්න කියා ඉල්ලා සිටිමින්, මේ පනත් කෙටුම්පතට අපේ තිබෙන විරුද්ධත්වය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 4.03]

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත මෑත කාලයේදී ඉතාමත්ම

විවාදාත්මක වුණු පනත් කෙටුම්පතක්. මේ පනත් කෙටුම්පත ගැන බැලුවාම, මෑතකදී මෙතරම් අසත්‍ය තොරතුරු ප්‍රචාරය කළ, මෙතරම් වැරදි මත ඇති කළ පනත් කෙටුම්පතක් නැති තරම්. නීතිය පිළිබඳ ඉතාමත්ම හොඳ දැනුමක් තිබෙන, නීති මහාචාර්යවරු පවා මේකේ තිබෙන වගන්ති පිළිබඳ වැරදි අර්ථ නිරූපණයන් දුන්නා. එක වැරදි අර්ථ නිරූපණයක් තමයි, මෙම නීතිය අතීතයට බලපානවාය කියන කාරණය.

අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් යටතේ, 13.(1) ව්‍යවස්ථාවේ ඉතාමත්ම පැහැදිලිව තිබෙනවා, යම් කිසි අපරාධ නීතියක් බලපාන්නේ අනාගතයට පමණයි කියලා. ඒක ඉතාම පැහැදිලියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඒ සියල්ලටම ඉහළ නිසා, එම කරුණ මේ පනත් කෙටුම්පතේ විශේෂයෙන් සඳහන් වීම අවශ්‍ය නැහැ. ඒ වාගේම, මෙම දණ්ඩන වගන්තිය අතීතයට බලපාන්නේ නැහැ. ඒක බොහොම පැහැදිලියි.

අතීතයට බලපාන පරිදි අපි ජාත්‍යන්තර සම්මුතියක් අත්සන් කරලා තිබෙනවා නම්, විශේෂයෙන් වගන්තියක් ඇතුළත් කරලා ප්‍රතිපාදන ඇතුළත් කරන්න පුළුවන් කියලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කළ යුතුයි. මේ පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ගියා. මේ පනත් කෙටුම්පතේ දණ්ඩන වගන්තිය ආපසු ක්‍රියාත්මක වීමට සුළු හෝ ඉඩක් තිබෙනවා නම්, ශ්‍රේෂ්ඨාධිකරණයට මෙයට ඉඩ දෙන්නේ නැහැ. එහෙම තිබුණා නම් කියනවා, "මේ සඳහා ජන මත විචාරණයක් අවශ්‍යයි" කියලා. එහෙම කිව්වේ නැහැ. එසේ ආපසු ක්‍රියාත්මක වන පරිදි retrospective clause එකක් නැත්නම්, කිසිම අවස්ථාවක අපේ රටේ නීතිය අනුව අපරාධයක්, දණ්ඩන වගන්තියක් අතීතයට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එහෙම වෙන්නේ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උත්තරීතර නිසායි. ඒ නිසා ඒ පිළිබඳව කිසිම අවිශ්වාසයක් තබා ගත යුතු නැහැ.

අපි ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා, "Dualist" රටක් කියලා. අපේ රටේ නීතිය අනුව ජාත්‍යන්තර වශයෙන් යම් කිසි ප්‍රඥප්තියක් අත්සන් කරපු පළියට, එය මේ රටේ නීතිය බවට පත් වන්නේ නැහැ. Monist රටවල් ගත්තාම, හොඳම උදාහරණය තමයි නෙදර්ලන්තය. එම රටේ ජාත්‍යන්තර ප්‍රඥප්තියක් ස්වංක්‍රීයවම රටේ නීතිය බවට පත්වෙනවා. අපට එහෙම එකක් නැහැ. එම නිසා මෙම පනත් කෙටුම්පත ගෙන ඒමෙන්, "International Convention for the Protection of All Persons from Enforced Disappearance" කියන ප්‍රඥප්තිය මේ රටේ නීතිය බවට පත්වෙනවාය කියන එක මිථ්‍යා මතයක්. ඒක සම්පූර්ණයෙන්ම වැරැදියි. ඒක මිථ්‍යාවක්. කනගාටුවට කාරණය වන්නේ, ඒ පිළිබඳව වැඩියෙන්ම කථා කළේ මේ රටේ දහස් ගණන් නීතිඥවරුන් බිහි කිරීම සඳහා නීතිය උගන්වපු මහාචාර්යවරු වීමයි. ඒක තමයි කනගාටුවට කාරණය. එහෙම නොවෙයි වෙන්නේ. අපේ රට dualist රටක්. එම නිසා අපට ඕනෑ විධියටයි අපි පනත හදන්නේ. අපි නීති හදන්නේ අපට ඕනෑ විධියටයි. මෙම විවාදය තුළ එක් කාරණයක් සඳහන් වුණා. එහෙම නම්, දණ්ඩ නීති සංග්‍රහයට පමණක් සංශෝධන ගේන්න අපට බැරි ඇයි කියලා සඳහනක් කෙරුණා. දණ්ඩනයක් නම් පමණක් කෙරෙන්නේ, එහෙම නම් අපට ඒක කරන්න තිබුණා. නමුත්, මෙම පනතේ පරාසය ඊට වඩා විශාලයි, වැඩියි. උදාහරණයක් වශයෙන් 15(1) වගන්තියෙහි මෙසේ සඳහන් වෙනවා:

"No person shall be held in secret detention."

ඒ කියන්නේ රහසේ රඳවා තබා ගැනීම තහනම් කියන එකයි. ඒ වාගේ දේවල් දණ්ඩ නීති සංග්‍රහයට ඇතුළත් කරලා වැඩක් නැහැ, දාන්න බැහැ. දණ්ඩ නීති සංග්‍රහයේ තිබෙන්නේ, වරදවල් ප්‍රකාශයට පත් කරලා ඒවාට දඬුවම් නියම කිරීම. ඊටත් එහා ගිහිල්ලා අයිතිවාසිකම් පිළිබඳව, වින්දිතයන්ගේ සහ ඔවුන්ගේ නෑදෑයින්ගේ අයිතිවාසිකම් පිළිබඳව, ඒ වාගේම නීතිඥවරුන්ගේ සහාය ලබා ගැනීම - the right to representation by an attorney-at-law - පිළිබඳව, ඒ ආදිය සියල්ල මේකේ තිබෙනවා. ඒවා දණ්ඩ නීති සංග්‍රහයට දාන්න බැහැ. ඉතින්, වින්දිතයන්ට අදාළ වන එවැනි වැදගත් වෙනත් ප්‍රතිපාදන ගණනාවක් මෙහි තිබෙන නිසා තමයි දණ්ඩ නීති සංග්‍රහයට පමණක් මේක ඇතුළු කරලා, දණ්ඩන වගන්තියක් ඇතුළත් කිරීමට හැකියාව නැත්තේ.

මීට අදාළව අද තිබෙන තත්ත්වය පිළිබඳව මම වැඩියෙන් කථා කරන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, මේ වාගේ නීති කොච්චර ගෙනාවත් වැඩක් නැහැ, ඒවා ක්‍රියාත්මක කළේ නැත්නම්. මේ දවස්වල මහනුවර පැත්තේ විවිධ සිදුවීම් සිදුවෙනවා. ඒ පිළිබඳව අපි කවුරුත් කම්පාවෙලා සිටින්නේ. මම මහනුවර පළාතේ කෙනෙක් නිසා, ඒ පළාතේ ඉපදිලා හැදුණු වැඩුණු කෙනෙක් නිසා මට මේ දවස් ටිකේ සෑම මිනිත්තු කිහිපයකටම සැරයක් දුරකථන පණිවුඩ ලැබෙනවා. මෙන්න මෙතැන සිද්ධියක් වෙනවා, මෙන්න මෙතැන තවත් සිද්ධියක් ඇති වෙනවා කියලා. ඒ තැන් ගැන කියන්න මම කැමැති නැහැ. තවත් අවුස්සන්න මම කැමති නැහැ. තවත් ඇවිස්සෙන්න කිසිම ඉඩක් නොතබා මම කථා කරන්නම්. දැන් තවත් පළාත්වලට පැතිරෙමින් තිබෙනවා කියලා කියනවා. සමහර පළාත්වල බොහොම වගකිව යුතු පුද්ගලයින්ගෙන් ඊයේ ලැබුණු ආරංචිය තමයි, සමහර තැන්වලදී පොලීසිය බලාගෙන සිටියා කියන එක. සමහර තැන්වලදී පොලීසිය කියලා තිබෙනවා, "අපට වෙඩි තියන්න අවසර නැහැ, වෙඩි තියන්න අපට නියෝග දීලා නැහැ" කියන එක. කවුරුත් කියන්නේ නැහැ, මිනිස්සුන්ව මරන්න කියලා. නමුත්, සාමය ආරක්ෂා කර ගැනීම සඳහා බලය පාවිච්චි කරන්න පුළුවන්. පොලීසියට ලබාදී තිබෙන සාමාන්‍ය උපදේශය වන්නේත්, මරන්න වෙඩි තියන්න නොවෙයි, අවස්ථාවේ හැටියට අවම බලය පාවිච්චි කරන්න කියන එකයි. ඒ වාගේම අපේ දණ්ඩ නීති සංග්‍රහය අනුව, ඕනෑම කෙනෙකුගේ දේපළ හෝ ජීවිත ආරක්ෂා කිරීම සඳහා වෙනත් ඕනෑම කෙනෙකුට බලය පාවිච්චි කරන්න පුළුවන්. ඒක ඕනෑම සිවිල් පුද්ගලයෙකුට කරන්න පුළුවන්. කනගාටුවෙන් වුණත් විශේෂයෙන් මම මේ ගැනත් කියන්න ඕනෑ. ඊයේ තැන්නකුඹුර, මැණික්හින්න ප්‍රදේශවල ඇති වුණු සිද්ධිවලදී පොලීසිය කියලා තිබෙනවා, "අපට කරන්න දෙයක් නැහැ, අපට බලයක් නැහැ, අපට කියලා නැහැ" කියලා. ඒ කියන්නේ උඩට වෙඩි තියන්නද යන්නේ? උඩට වෙඩි තියලා මේ වැඩේ කරන්න බැහැ. එම නිසා මේ පිළිබඳව action ගන්න -ක්‍රියාත්මක වෙන්න - ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
Sir, please give me one or two more minutes because this is so important; මේක ඉතාමත් වැදගත් කාරණයක්. මහනුවර ප්‍රදේශයෙන් දැනුත් ලැබෙන ආරංචි තිබෙනවා. අකුරණ ප්‍රදේශයෙන් ආරංචි ලැබෙනවා. ඇත්තද, නැත්තද කියලා අපි දන්නේ නැහැ. ඒ පිළිබඳව සොයා බලන්න විතරයි අපට පුළුවන්. නමුත්, මේ පිළිබඳව වහාම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේ නීති හදන්නේ, හදිසි නීතිය දාලා තිබෙන්නේ කොස් කොටන්න නොවෙයි. ඒ කඩුව දීලා තිබෙන්නේ කොස් කොටන්න නොවෙයි. මේ රටේ හදිසි නීතිය යටතේ preventive detention කරන්න තිබෙනවා. වරදක් කළේ නැතත්, යම් කිසි කෙනෙකුගේ ක්‍රියාවන් නිසා වරදක් වෙන්න ඉඩ තිබෙනවා නම්, ඒ බවට සාක්ෂි තිබෙනවා නම්, හේතු තිබෙනවා නම්, preventive detention සිදු කරන්න පුළුවන්.

[ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා]

මේ හදිසි නීතිය යටතේ අද preventive detention පාවිච්චි කරන්න පුළුවන්. ඒක බොහොම ලේසියි. මේ ප්‍රශ්න අවුස්සන අය ඉන්නවා නම්, ඒ පිළිබඳව සාක්ෂි තිබෙනවා නම්, ඒ පිළිබඳව විශ්වාස තිබෙනවා නම්, -අත්තනෝමතිකව නොවෙයි,- යම්කිසි පදනමක් තිබෙනවා නම් ක්‍රියාත්මක වෙන්නට පුළුවන්. එම නිසා preventive detention පාවිච්චි කරන්න ආණ්ඩුව වහාම ක්‍රියාත්මක විය යුතුයි. හදිසි නීති පනවලා විතරක් වැඩක් නැහැ. ඇඳිරිනීතිය රට විතරක් දාලා වැඩක් නැහැ. සමහර තැන්වලට දවලුත් ඇඳිරිනීතිය දාන්න ඕනෑ. මේකට කොහොමද මුහුණ දෙන්නේ කියලා අපි බොහොම බරපතළ ලෙස සාකච්ඡා කළ යුතුයි. ඊළඟ දින කිහිපයේදී වෙනත් පළාත්වලටත් මේක පැතිරීමේ භයානකකම තිබෙනවා.

අවසාන වශයෙන්, I would like to tell this because my name was mentioned. මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, සිංගප්පූරුවේදී දෙමළ කණ්ඩායම් සමඟ කරපු සාකච්ඡාවකට මා සහභාගී වූ බවට. එයට සහභාගී වුයේ කුමන අවුරුද්දේදීද කියලා නම් මට මතක නැහැ. ඒක සම්පූර්ණ ඇත්ත. මම කවදාවත් "නැහැ" කියලා නැහැ. මේ රටේ තිබෙන ජනවාර්ගික ගැටලුව එක තනි රටක් තුළ විසඳා ගැනීම සඳහා තමයි අපි සාකච්ඡා කෙරුවේ. Global Tamil Forum ඒකේ බොහෝ අදහස් සමඟ මම එකඟ වෙන්නේ නැහැ; I do not agree with the opinions of the Global Tamil Forum. නමුත්, ඔවුන් එක්ක කථා කරන්න ඕනෑ; ඔවුන් එක්ක සාකච්ඡා කරන්නේ නැතිව මේවා කරන්න බැහැ. ඒ සාකච්ඡාවල ප්‍රතිඵලයක් හැටියට තමයි Global Tamil Forum එකට සම්බන්ධ වෙලා හිටපු Reverend Father S. J. Emmanuel වගේ අය අද ලංකාවට එන්නේ. ඒ කාලයේ ඒ ගොල්ලන් කථා කළේ, -

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Wimal Weerawansa, what is your point of Order?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේලා එකඟ වෙච්ච ප්‍රතිපත්ති දහය ඒ TamilNet වාර්තාවේ තිබෙනවා. ඒ දහයේ පළමුවැනි එක තමයි, ලේබලය කුමක් වුවත් අභ්‍යන්තර ස්වයං පාලනයක් ලැබෙන විධියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. ඊළඟට, රණවිරු දඩයම මේ ඔක්කෝම ඒ දහය තුළ තිබෙනවා. තමුන්නාන්සේලා සාකච්ඡා කළා විතරක් නොවෙයි, මේ රට පාවා දෙන එකඟතාවකට ගියා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
That is not a point of Order. එහි තිබෙන්නේ මේ රට තුළ සිටින විවිධ ජන කොටස්වලට තමන්ගේ කටයුතු කර ගැනීමට බලය ලැබෙන පරිදි මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ව්‍යුහය වෙනස් කරන්න ඕනෑ කියලායි. ඒක අද නොවෙයි මම හැමදාම කියපු දෙයක්. ඒක මම දැනුත් කියනවා; ඉදිරියටත් කියනවා.

[பி.ப. 4.14]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்படுதலிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் பற்றிய சர்வதேச சமவாயச் சட்டமென்பது எங்களுக்கு அவசியமானதொன்றாகும். ஏனெனில், வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்பட்டவர்களால் ஏற்படுகின்ற வலியினை உணர்ந்தவர்கள் நாங்கள். எனவே, அத்தகையதொரு விடயம் தொடர்பில் எமது மக்களினதும் எனதும் வேதனைகளைப் பகிர்ந்துகொள்வதற்கு இங்கு வாய்ப்பளித்தமை குறித்து நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். எனது உடன் பிறந்த சகோதரர் வலுக்கட்டாயமாகக் காணாமற்போகச் செய்யப்பட்டவர்; என்னுடன் இருந்த உடன் பிறவாச் சகோதரர்கள் பலர் வலுக்கட்டாயமாகக் காணாமற்போகச் செய்யப்பட்டவர்கள்; நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற தமிழ் பேசுகின்ற மக்களின் உறவுகளில் பலர் காணாமற்போகச் செய்யப்பட்ட வர்கள். இங்கே இருக்கின்ற மக்கள் விடுதலை முன்னணி உள்ளிட்ட இடதுசாரிக் கட்சிகளின் உறுப்பினர்கள் பலரும் காணாமற்போகச் செய்யப்பட்டவர்கள்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Edward Gunasekara to the Chair?

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்து புள்ளே - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of City Planning and Water Supply)
I propose that the Hon. Edward Gunasekara do now take the Chair.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

இந்த நாட்டிலே காணாமற்போகச் செய்யப்பட்ட வர்களுக்கு வடக்கு, கிழக்கு, தெற்கு, மேற்கு என்று திசைகள் கிடையாது. காணாமற்போகச் செய்யப்பட்டவர்களின் வேதனைகளை அவர்களின் உறவுகளே அறிவர். அந்த வேதனைகளை வார்த்தைகளால் கூறி, உணரவைக்க முடியாது. அதனால்தான் இன்று ஒரு வருடமும் 35 நாட்களு மாகக் காணாமற்போன உறவுகளைக் கண்டறிவதற்கான போராட்டத்தில் ஈடுபட்டுள்ள எமது மக்களின் வேதனைகள் பலருக்கும் இங்கே புரியாமல் இருக்கின்றன. தமிழ் அரசியல் கைதிகள் குறித்து நான் கதைக்கின்றபோதெல்லாம், "எமது நாட்டிலே அரசியல் கைதிகள் என எவருமே கிடையாது" என்று சிலர் கூறுகின்றனர். அதேவேளையில், "காணாமற் போனோர் என இங்கு எவருமே இல்லை" என எவராலும் கூற முடியாத வகையில், இன, மத பேதங்களின்றி இந்த நாட்டில் நபர்கள் காணாமற்போன சம்பவங்கள் இடம்பெற்றுள்ளன. எனவேதான் காணாமற்போனோரைக் கண்டறிவது தொடர்பி லான விசாரணைகளை 1971ஆம் ஆண்டிலிருந்து ஆரம்பிக்கும் படி நாம் ஏற்கெனவே கோரியிருந்தோம்.

அதேநேரம், நபர்கள் காணாமற்போன சம்பவங்கள், கொலைச் சம்பவங்கள் என்பன திசை திருப்பப்பட்டுள்ள நிலைமைகளும் இல்லாமல் இல்லை. கொழும்பில் வைத்து 11 தமிழ் இளைஞர்கள் கடத்தப்பட்டபோது, அது தொடர்பிலான குற்றச்சாட்டு திசைதிருப்பப்பட்டது. இப்போது இச்சம்பவம் தொடர்பில் மேற்கொள்ளப்பட்டு வருகின்ற நீதி விசாரணை களிலிருந்து உண்மை வெளிவந்து கொண்டிருக்கின்றது. அதேபோன்று காணாமற்போனோர் தொடர்பில் விசாரணை களை மேற்கொண்டிருந்த ஜனாதிபதி ஆணைக்குழு முன்பா கவும் சில குற்றச்சாட்டுகள் திசைதிருப்பப்பட்டிருந்தன. அவை தொடர்பிலும் நீதி விசாரணை அவசியம் வேண்டும் என்றே நாங்கள் இந்த அரசிடமும் கோரிக்கைகளை முன்வைத் திருந்தோம். அத்தகைய நீதி விசாரணைகளின்போதுதான் அவற்றின் உண்மைகளும் வெளிவரும். இத்தகைய திசைதிருப்பல்களில் அரசியல்வாதிகள் சிலர், ஊடக அதிபர்கள் சிலர், சில அரச சார்பற்ற நிறுவனங்கள் என பல்துறை யினருக்கும் பங்குண்டு. அரசியல் உள்நோக்கங்கள் காரணமாகவும் காழ்ப்புணர்ச்சிகள் காரணமாகவும் சிலரது பிழைப்புக்காகவும் இவை இவ்வாறு திசைதிருப்பப்பட்டன.

அதேபோன்று, பல்வேறு அரசியல் கொலைச் சம்பவங்கள் தொடர்பிலான குற்றச்சாட்டுகளும் திசைதிருப்பப்பட்டன. இன்று அச்சம்பவங்கள் தொடர்பில் நீதி விசாரணைகள் மேற்கொள்ளப்பட்டு உண்மைகள் வெளிவந்துகொண்டிருக் கின்றன. இத்தகைய நிலைமைகள் காணப்படுகின்ற நிலையில், காணாமற்போகச் செய்தல் தொடர்பில் ஒருவர்மீது அல்லது ஒரு தரப்பினர்மீது குற்றச்சாட்டுகள் சுமத்தப்பட்டால், அது பற்றிப் பக்கசார்பற்ற முறையிலான விசாரணைகள் மேற்கொள்ளப்பட்டு, அக்குற்றச்சாட்டு பொய்யானது எனக் கண்டறியப்பட்டால், அதன் உண்மைத் தன்மையைப் பகிரங்கப்படுத்த வேண்டும் என்பதுடன், பொய்யான குற்றச்சாட்டுச் சுமத்தியவருக்கு எதிராக தற்போதுள்ள சட்ட முறைமைகளுக்கு அமைவாக நடவடிக்கை எடுப்பதற்கும் குற்றஞ்சாட்டப்பட்டவருக்கு ஏற்படுகின்ற சமூக, பொருளாதார, உடல், உள ரீதியிலான பாதிப்புகளுக்கேற்ப இழப்பீடுகளை வழங்குவதற்குமான உரிய ஏற்பாடுகளை மேற்படி சட்டமூலம் கொண்டிருக்க வேண்டும் என்பதையும் நாம் தொடர்ந்து வலியுறுத்தி வருகின்றோம்.

'பலிக்கு உட்படுத்தப்பட்டவர்' என்பது காணாமற்போக்கப் பட்ட ஆள் மற்றும் வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப் படுதலின் நேரடி விளைவாகத் தீங்குற்ற எவரேனும் 'தனியாள்' என்று பொருளாகும்' என இந்தச் சட்டமூலத்திலே குறிப்பிடப்பட்டுள்ளது. அதுமட்டுமல்ல, 'காணாமற்போகச் செய்தார்' எனப் பொய்யான குற்றச்சாட்டுச் சுமத்தப்படுபவரும் பலிக்கு உட்படுத்தப்படுகின்றார் என்பதை இந்தச் சபையின் அவதானத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன். அத்துடன், காணாமற்போனோர் தொடர்பிலான குற்றச்சாட்டுகளைத் திசைதிருப்புவதில் முன்னின்று உழைத்தவர்களையும் காணாமற்போகச் செய்தல் தொடர்பில் பக்கச்சார்புடன் செயற்படுகின்றவர்களையும் காணாமற்போனோர் பற்றிய அலுவலகப் பணிகளில் ஈடுபடுத்தக்கூடாது என்ற கோரிக்கையையும் இங்கு நான் முன்வைக்க விரும்புகின்றேன். காணாமற்போனோர் அலுவலக உறுப்பினர்கள் தெரிவு தொடர்பில் காணாமற்போனோரது உறவுகளிடையேயும் சில சிங்களத் தரப்பினரிடையேயும் எதிர்ப்பு நிலை காணப்படுகின்றது. மேற்படி உறுப்பினர்கள் தெரிவானது, "இராணுவத்தையும் இந்த நாட்டையும் காட்டிக் கொடுக்கும் ஏற்பாடு" என சில சிங்களத் தரப்பினர் கூறுகின்றனர். அதேநேரம், "காணாமற்போனோர் தொடர்பான அலுவல கமானது காலம் கடத்தும் செயற்பாடே அன்றி, அதனால் எங்களுக்கு எவ்விதமான தீர்வுகளும் கிட்டாது" எனக் காணாமற்போனோரின் உறவினர்கள் தெரிவிக்கின்றனர்.

யுத்தத்திற்குப் பின்னரான காலப்பகுதியில் எமது மக்கள் சார்ந்து எழுந்த பல பிரச்சினைகளுக்கு உரிய தீர்வுகள் எட்டப் படவில்லை. ஒரு பிரச்சினையுடன் இன்னொரு பிரச்சினை, இன்னொரு பிரச்சினையுடன் மேலுமொரு பிரச்சினை எனப் பிரச்சினைகள் நாளுக்குநாள் பெருகி, ஓர் இடத்தில் தேங்கிக் கிடந்த நிலைமையிலேயே, "இந்தப் பிரச்சினைகளுக்கெல்லாம் உரிய தீர்வுகளைப் பெற்றுத் தருவார்கள்" என வாக்குறுதி யளித்து, இந்த அரசை ஆட்சிக்குக் கொண்டுவந்திருந்தார்கள். ஆனாலும், இன்று வரையில் எமது மக்களது பிரச்சினைகள் எதுவுமே தீர்ந்ததாக இல்லை. மேலும் வேறு பல பிரச்சினைகளும் பெருகி, நாடே பிரச்சினைகளுக்குள்ளா கியுள்ள ஒரு நிலைமையே காணப்படுகின்றது. காணாமற் போனவர்களைக் கண்டறிதல் என்பது வெறும் தகவல்களைப் பெறுதல் என்பதல்ல; உண்மைகள் கண்டறியப்பட வேண்டும்; பாதிக்கப்பட்டவர்களுக்கு நீதி, நியாயங்கள் கிடைக்க வேண்டும்; பரிகாரங்கள் கிட்ட வேண்டும். இவை அனைத்துமே இந்த நாட்டில் மீண்டுமோர் இன ரீதியிலான பிரிவினைகளுக்கு வித்திடாமல், தேசிய நல்லிணக்கத்தைக் கருத்திற்கொண்டு மேற்கொள்ளப்படல் வேண்டும்.

கடந்தகால யுத்தம் என்பது, எதிர்கால தேசிய நல்லிணக்கத்திற்கான பாடமாக அமைய வேண்டுமேயன்றி, எதிர்காலத்தில் இன்னுமொரு யுத்தத்திற்கான பாலமாக இருந்துவிடக்கூடாது. கடந்தகால யுத்தமானது கற்றறிந்த பாடமாக இருக்கவேண்டும். மாறாக, கழற்றியெறிந்த பாடமாக இருக்கக்கூடாது. கற்றறிந்த பாடங்களின் வேதனைமிக்க கதாபாத்திரங்களாகவே இன்று காணாமற்போனோரது உறவினர்கள் காத்திருக்கின்றார்கள். காணாமற்போன தங்களது உறவுகளைத் தேடிச் செல்லும் பயணத்தில், அவர்கள் இன்று கிளிநொச்சி, கந்தசுவாமி ஆலய முன்றலில் திக்குத் தெரியாமல் தவித்துக்கொண்டிருக்கிறார்கள். இவ்வாறு ஜனநாயக ரீதியிலான போராட்டத்தில் ஈடுபட்டாவது காணாமற்போன தங்களது உறவுகளைக் கண்டறிவதற்கான பாதையில் வெளிச்சத்தைக் கொண்டுவரலாம் என்ற அவர்களது எதிர்பார்ப்புகளும் தற்போது தகர்க்கப்பட்டு வருவதாகவே உணரமுடிகின்றது. காணாமற்போனோரைக் கண்டறி

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

வதற்கான அலுவலகம் தொடர்பில் ஆரம்பத்தில் எமது மக்களுக்கு ஒரு நம்பிக்கை இருந்தது. இன்று பொறுப்புமிக்க மக்கள் பிரதிநிதிகளாக இருக்க வேண்டியவர்கள் பலரும் தெரிவித்து வருகின்ற ஒன்றுக்கொன்று முரணான கருத்துகளால், அம்மக்களது நம்பிக்கை சிதைந்துள்ளதாகவே தெரிய வருகின்றது.

எனவே, மேற்படி காணாமற்போனோரைக் கண்டறிவதற்கான அலுவலகம் தொடர்பில், அதன் பணிகள் தொடர்பில் நாட்டு மக்களுக்கு விளக்கமாக அறிவுறுத்தப்படல் வேண்டும். "வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்படுதலிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் பற்றிய சர்வதேச சமவாயம்" என்கின்ற இந்தச் சட்டமூலத்திற்கு அமைவாக, மேற்படி காணாமற்போனோரைக் கண்டறிவதற்கான அலுவலகமும் செயற்படுமா?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Just give me one more minute, Sir.

அல்லது காணாமற்போக்கப்பட்டோரையும் கண்டறிவது தொடர்பில் செயற்படுமா? என்பதுதான் எமது மக்களிடையே நிலவுகின்ற கேள்வியாக இருக்கின்றது. அதாவது, இந்த அலுவலகம் ஆரம்பிக்கப்பட்ட திகதி முதற்கொண்டு எதிர்காலத்தில் காணாமற்போக்கப்படுவோர் தொடர்பில் மாத்திரமே கண்டறியுமா? அல்லது இதற்கு முன்பாகக் கடந்த காலத்தில் காணாமற்போக்கப்பட்டோர் தொடர்பிலும் கண்டறியுமா? இதற்கு முன்பாகக் கடந்த காலத்தில் காணாமற்போக்கப்பட்டோர் தொடர்பிலும் கண்டறியும் என்றால், அது எப்போதிருந்து? என்பது தொடர்பில் மக்களுக்குத் தெளிவுபடுத்தப்படல் வேண்டும். இது சம்பந்தமாக பொதுமக்களுக்கு அறிவுறுத்தப்பட்டு, கலந்துரையாடப்பட்டு, மக்கள் தெளிவினைப் பெற ஏற்பாடுகள் மேற்கொள்ளப்படல் வேண்டும். அவ்வாறில்லாமல், ஒவ்வொரு வரும் ஒவ்வொரு கருத்தை முன்வைத்தால், எமது மக்கள் மத்தியில் தேவையற்ற முரண்பாடுகள் தோற்றுவிக்கப்படும் என்பதைக்கூறி, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 4.23]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත වුණාට පසු ජනාධිපතිතුමා ප්‍රකාශ කර තිබුණා, "මම මේකට අත්සන් තබන්නේ නැහැ." කියා. "ඒ නිසා මේ පනත ක්‍රියාත්මක වන්නේ නැහැ. ඔබ බිය විය යුතු නැහැ. රණ විරුවා සුරක්ෂිතයි." කියාත් එතුමා ප්‍රකාශ කර තිබුණා. නමුත් අපිට මතකයි, 2017 ඔක්තෝබර් මාසයේ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවෙක් -United Nations Special Rapporteur - ලංකාවට ගොඩ බැස්ස දවසේ - හරියටම එදා උදෑසන ඔහු ලංකාවට එනවා නම්- උදෑසනම ජනාධිපතිතුමා එම පනත් කෙටුම්පතට අත්සන් කරලා එය නීතියක් බවට; ක්‍රියාත්මක වීමක් බවට පත් කළා. එහි ප්‍රතිඵලයක් ලෙස අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවනු ලැබුවා. පසුගිය අය වැයෙන් ඒ සඳහා මුදල් වෙන් වුණා. හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ, කොටි හිතවාදීන් ලෙසට දීර්ඝ කාලයක් සමාජයේ ස්ථාපිත වුණු චරිත ගණනාවක් අද රණ විරුවන් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට පත් කර තිබෙනවා. තොරතුරු එක්රැස් කිරීම මිසක්, නඩු පැවරීමේ අයිතියක් අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට නැහැ. ඒක පෙන්වලා තමයි, "බය වෙන්න එපා. මේ පනතින් ඔබට හානියක් නැහැ." කියා තමයි මේ ආණ්ඩුව රටේ ජනතාවට, රණ විරුවන්ට ප්‍රකාශ කළේ. දැන් ඔන්න අතුරුදහන් චිත්‍රපටයේ දෙවන කොටස තමයි ආරම්භ වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේදී මේ පනත් කෙටුම්පත පිළිබඳව විවාද කරන්න එය න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබියදී අපි දෙවතාවක්ම ගිහින් එම පනතේ භයානකත්වය පෙන්නුවාම, අතිගරු ජනාධිපතිතුමා ආණ්ඩුවේ නායකයන්ට කථා කරලා එය කල් දැම්මා. "කල් දැමීම නොවෙයි විය යුත්තේ. මේක නරකයි නම් අද විවාද කරලා සම්මත කළත් නරකයි. හෙට විවාද කරලා සම්මත කළත් නරකයි. මේක සදහටම න්‍යාය පත්‍රයෙන් ඉවත් කරන්න." කියා අපි කිව්වා. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ. දෙවතාවක් කල් දැම්මා. එදා එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවාට බිය වුණා වාගේම, මෙදා මාර්තු මාසයේ ශ්‍රී ලංකාව පිළිබඳ සමාලෝචනයක යෙදෙන මානව හිමිකම් කොමිසමේ සැසි වාරය පැවැත්වෙන නිසා ඔන්න දඩිබිඩියේ මේ පනත් කෙටුම්පත ආපසු පාර්ලිමේන්තුවට ඇවිත් තිබෙනවා.

මේ පනත් කෙටුම්පතින් මොකද වන්නේ? ඇයි අපි මේකට බය වන්නේ? මේ පනත් කෙටුම්පත පිළිබඳ අපිට අවබෝධයක් නැහැ කියා කියමු. මේ ආණ්ඩුවේ ඉන්න ප්‍රාඥයන්ට වාගේ අපිට තේරෙන්නේ නැහැ කියා නේ කියන්නේ. නීතිය පිළිබඳ මහාචාර්යවරුන්ටත් තේරෙන්නේ නැහැ කියා නේ දැන් එතුමන්ලා ප්‍රකාශ කළේ. අපිට තේරෙන්නේම නැහැය කියමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය දරන රටවල් 196 අතුරින් මෙය අත්සන් තබා ක්‍රියාත්මක කිරීම පිළිගෙන තිබෙන්නේ - ratify කර තිබෙන්නේ - රටවල් 58ක් පමණයි. එම සංවිධානයේ සාමාජිකත්වය දරන රටවල් 196න්ම 58ක් පමණයි මෙය පිළිගෙන තිබෙන්නේ. රටවල් 138ක් මෙම පනත තමන්ගේ රටේ ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කර තිබෙනවා. අපිට තේරෙන්නේ නැත්නම්, ලෝක ප්‍රජාව මේ පනත ගැන දරන අදහස මොකක්ද කියා අපි සොයා බලමු. ලෝක ප්‍රජාවේ සාතිශය බහුතරය -යුද්ධයක් තිබුණු රටවල් නොවෙයි, සාමකාමී රටවල් පවා- එය පිළිගන්නේ නැහැ. "මේ පනත අපේ රටේ ස්වාධීනත්වයට, ස්වෛරීභාවයට, රටේ පැවැත්මට අනතුරක්, මෙවැනි ප්‍රඥප්ති අපි අත්සන් නොකළ යුතුයි." කියා ජාත්‍යන්තරයේ සාතිශය බහුතරය- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ රටවල්196න් රටවල් 138ක්ම- මෙම ප්‍රඥප්තිය තමන්ගේ රටේ ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කර තිබෙනවා. ඒ නිසාම මෙම පනත් කෙටුම්පතේ වගන්තියක්වත් කියවන්නේ නැතිව, ප්‍රඥප්තියේ වගන්තියක්වත් කියවන්නේ නැතිව අපිට නිගමනයට එළඹෙන්න පුළුවන්, ලෝකය පුරා සාතිශය බහුතරයක් රටවල් මෙම පනත් කෙටුම්පත ප්‍රතික්ෂේප කරන්නේ මෙය රටකට අවදානම් වන නිසායි කියලා. අද ලෝකයේ බලවතුන් කියන ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය විතරක් නොවෙයි කලාපයේ බලවතා වන ඉන්දියාවත් මෙය තමන්ගේ රට තුළ ක්‍රියාත්මක කරන්න ඉදිරිපත් වෙලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත් කෙටුම්පතේ 3වැනි වගන්තිය අතිශයින්ම භයානකයි. මම එය කියවන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පතේ 3 (1) උප වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

> "යම් තැනැත්තකු රජයේ නිලධරයකු වශයෙන් සිටිමින් හෝ රජයේ බලය පැවරීමක් මත ක්‍රියා කරමින් හෝ රජයේ බලය පැවරීම සහාය සහ අනුදැනුම ඇතිව ක්‍රියා කරමින් -
>
> (අ) වෙනත් යම් තැනැත්තකු සිර භාරයට ගන්නා, රඳවා තබා ගන්නා, අයුතු ලෙස සිරකර තබාගන්නා, පැහැරගෙන යන, අපහරණය කරන හෝ වෙනත් යම් ආකාරයකින් එම තැනැත්තාගේ නිදහස අහිමි කරන; සහ"

රාජ්‍ය අධිකාරිය පිළිබඳවයි මෙහි ප්‍රශ්නය තිබෙන්නේ. ත්‍රස්තවාදියාට මේකේ ප්‍රශ්නයක් නැහැ. පාතාලයට ප්‍රශ්නයක් නැහැ. පැහැරගෙන ගිහින් අතුරුදහන් කළා කියන චෝදනාව පාතාලයටවත්, ත්‍රස්තවාදියාටවත් එන්නේ නැහැ. රජයේ හමුදා ඉලක්ක කර ගනිමින්මයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඊළඟට, මේ පනත් කෙටුම්පතේ අටවන වගන්තියෙන් කියන්නේ මොකක් පිළිබඳවද? උදර්පණය පිළිබඳව. ඒ කියන්නේ, මේ සම්මුතියට අත්සන් තබා තිබෙන වෙනත් රටක්, ඒ රටේ නඩුවක් ඇසීම සඳහා හෝ නඩුවකින් වැරදිකරු බවට පත් කළාවූ හෝ පුද්ගලයෙක් -ලංකාවේ සිටින පුද්ගලයෙක්- ඉල්ලනවා නම්, ලබා දිය යුතුයි කියන එකයි.

මම අහගෙනයි ආණ්ඩුව පැත්තෙන් කිව්වා, -මන්ත්‍රීතුමා කවුද කියලා මට මතක නැහැ.- අපේ රටේ පුරවැසියන්ට මෙය අදාළ නැහැ කියලා. මේ අටවන වගන්තියෙන් ඉතා පැහැදිලිව කියන්නේ, "...යම් තැනැත්තකු උදර්පණය කිරීම සඳහා...." කියලායි. එතකොට පුරවැසියෙකු වන, පුරවැසියෙකු නොවන ඕනෑම පුද්ගලයෙක් "යම් තැනැත්තකු" යන්නෙහි නිර්වචනයට අයත් වනවා. එහෙම නම් අපේ රණවිරුවන් සම්බන්ධයෙන් අනුගමනය කරන්න යන ක්‍රියාදාමය අතිශයින්ම පැහැදිලියි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කොමසාරිස්වරයා ශ්‍රී ලංකාව පිළිබඳව 2015 වසරේදී ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් නිර්දේශ දෙක තමයි ශ්‍රී ලංකාව කළා කියන යුද අපරාධ පිළිබඳව ලෝකයේ ඕනෑම රටක නඩු පැවරීමේ අවස්ථාව - universal jurisdiction - සැලසිය යුතුයි කියන එක සහ එක්සත් ජාතීන්ගේ විශේෂ අධිකරණයක් පිහිටුවා යුද අපරාධ චෝදනා විමර්ශනය කළ යුතුයි කියන එක. මම හිතන විධියට ඒ 38 සහ 40 වගන්ති වෙන්න ඕනෑ. නිශ්චිතව කියන්න මට දැන් මතක නැහැ. එවැනි නිර්දේශ දෙකක් තිබෙනවා. දැන් නඩු අහන්නේ පිට රට. පිට රට නඩු අහන්න ලංකාවේ සිදු වුණු දේ ගැන තොරතුරු කෝ? ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින්ම රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරින්ට රාජ්‍ය ආයතනයක් හදා දීලා තිබෙනවා, "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය" කියලා. රජයේ වියදමින් එන්ජීඕකාරයෝ ටික තොරතුරු හොයලා රාජ්‍ය මුද්‍රාව යටතේ පිට රටවලට ලබා දෙනවා, හමුදාව අහවල් යුද අපරාධ කළා කියලා. එතකොට ඒ රටවල නඩු පවරනවා. ඒ රටවල නඩු පැවරුවාට අපේ රණවිරුවන් සුරක්ෂිතයි කියලා අපි හිතනවා. මොකද, ඒ අය ඉන්නේ ලංකාවේ නිසා. නමුත් එහෙම නැහැ. දැන් පළමුවන පියවරෙන් ඒ පනත සම්මත කළා. තොරතුරු සෙවීම ආරම්භ කළා. දැන් මේ ප්‍රඥප්තිය පිළිගෙන අපි මේ පනත් කෙටුම්පතත් පාර්ලිමේන්තුවේ සම්මත කළොත්, අන්න, විදේශ රටක් අපේ රණවිරුවෙක් ඔවුන්ගේ රටේ පැවැත්වෙන නඩු විභාගයක් සඳහා අවශ්‍යයි කියා ඉල්ලා සිටියොත්, මේ අටවන වගන්තිය යටතේ භාර දීමට අපි බැඳී ඉන්නවා.

අපි දන්නවා, දැනටමත් බ්‍රසීලයෙන් අපේ හිටපු හමුදාපතිවරයෙක් පිළිබඳ මෙවැනි ඉල්ලීමක් ලැබී තිබෙන බව. ඇත්තටම රටට ඉල්ලීමක් ආවේ නැතත් ඒ රටේ නඩු පැවරීමක් සිදු වුණා. මේ ප්‍රඥප්තිය පිළිගැනීමෙන් පසු, මේ පනත් කෙටුම්පත සම්මත කිරීමෙන් පසු, පනතේ අටවන වගන්තිය යටතේ එවැනි රටක් ඉල්ලා සිටියොත්, අදාළ රණවිරුවා ඒ අදාළ රටට භාර දීමට මෙරට නීතියෙනුත් ජාත්‍යන්තර නීතියෙනුත් අපි බැඳී සිටිනවා. අන්න ඒකයි, මේ පනතේ තිබෙන භයානකත්වය.

අපි දන්නවා, හැමෝම පිළිගන්නවා, මේ ආණ්ඩුවට තිබෙන ලොකුම තර්ජනය රටේ ඉන්න ජයප්‍රියම පුද්ගලයා වන මහින්ද රාජපක්ෂ මැතිතුමා කියලා. හිටපු ජනාධිපතිවරයෙක් විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාව යටතේ එතුමාට මුක්තියක් ලැබී තිබෙනවා. ජනාධිපති ධුර කාලයේ කරපු කිසිම වැරැද්දක් සම්බන්ධයෙන් එතුමාට විරුද්ධව මේ රටේ නඩු පවරන්න බැහැ. එහෙම නම් දැන් මොකක්ද කරන්න ඕනෑ? හැබැයි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙන් තොරතුරු එකතු කරලා, වෙනත් රටක නඩු පවරලා, ඒ රටෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ රටට භාර දෙන්න කියලා ඉල්ලා සිටියොත්, මේ අටවන වගන්තිය යටතේ ඒ ඉල්ලීම ඉටු කරන්න ශ්‍රී ලංකා ආණ්ඩුව බැඳී ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මට වැඩිපුර විනාඩි තුනක කාලයක් ලබා දුන්නා. ඒ විනාඩි තුනත් දුන්නා නම් හොඳයි. විමල් රාජපක්ෂ මැතිතුමාගේ කාලයෙන් මට විනාඩි තුනක කාලයක් ලබා දෙන්න. ආණ්ඩුව අතුරුදහන් වීම පිළිබඳව පොඩ්ඩක් කථා කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විමල් රාජපක්ෂ මැතිතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා. ඒකෙන් මට අවශ්‍ය ප්‍රමාණය ගන්න කියා කියා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුද්ගලයින් අතුරුදහන් වීම පිළිබඳව මේ ආණ්ඩුව සංවේදියි. හැබැයි මේ වන විට රටේ ආණ්ඩුව අතුරුදහන් වෙලා තිබෙනවා. මේ රටේ සිංහල සහ මුස්ලිම් ජනතාව අතර, එකිනෙකා අතර ඇති වුණු අවිශ්වාසය වෛරයක් බවට ඔඩු දුවලා, මේ වන විට එය ගැටුමක් බවට පත් වෙලා තිබෙනවා. මේ අවිශ්වාසය දුරු කිරීමේ වගකීම තිබෙන්නේ ආණ්ඩුවට. සෑම පුරවැසියෙකුගේම ආරක්ෂාව සුරක්ෂිත කිරීමේ වගකීම තිබෙන්නේ ආණ්ඩුවට. නමුත් අද මේ රටේ ආණ්ඩුවක් නැද්දෝ කියලා ජනතාවට, ලෝක ප්‍රජාවට හිතෙන ආකාරයෙන් තමයි රටේ කටයුතු සිදු වන්නේ. ඇඳිරි නීතිය ක්‍රියාත්මක වෙනවා කියා කියනවා. හැබැයි ප්‍රචණ්ඩ ක්‍රියාවල නැවතීමක් සිදු වෙලා නැහැ. මේ ගැටුම ඇති වුණේ ඇයි කියන ප්‍රශ්නය පිළිබඳව මේ වන විට රටේ ප්‍රචාරය වන්නේ මිථ්‍යාවක් නිසා සත්‍ය තත්ත්වය පිළිබඳව මේ ගරු සභාව දැනුවත් කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිංහල පුද්ගලයෙක් මැර ප්‍රහාරයකට ලක් වී මිය යාම නොවෙයි ගැටුම ආරම්භ වීමට හේතුව. ඒ ප්‍රහාරය එල්ල කළ අය පොලීසියෙන් ක්ෂණිකව අත් අඩංගුවට ගත්තා, අධිකරණයෙන් රක්ෂිත බන්ධනාගාරගත කළා, රටේ නීතිය ක්‍රියාත්මක වන බව දැක්කා. ජනතාව නීතිය අතට ගන්න ගියේ නැහැ;

නිහඬව තමන්ගේ වැඩවල යෙදී සිටියා. ඒ අතර, පසුගිය ඉරිදා රාත්‍රියේ මිය ගිය පුද්ගලයාගේ ගමේ කඩ මණ්ඩියේ කඩ පහක්

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

ගිනි ගත්තා, පොලිස් ආරක්ෂාව තිබියදී. පොලිස් ආරක්ෂාව තිබියදී! ඒකයි සැකය. ඉන් කඩ දෙකක් මුස්ලිම්, කඩ තුනක් සිංහල. එය සිංහල අය කළාද, මුස්ලිම් අය කළාද, තුන්වැනි පාර්ශ්වයක් කළාද කවුරුවත් දන්නේ නැහැ. හැබැයි, මළ ගෙදර පැමිණෙමින් සිටි බසයක් පොලිසියෙන් නතර කරලා 24 දෙනෙක් අහේතුකව අත් අඩංගුවට ගන්නවා. මළ ගෙදර පැමිණෙන පිරිස් වාහන පිටින් හරවලා යවන්න පොලිසිය පටන් ගන්නවා. මෙන්න මෙතැනින් ඇති වුණු කෝපය තමයි ගැටුමට මූලාරම්භය වන්නේ. එහෙම නැතිව, සිංහල පුද්ගලයෙක් මරා දැම්මා කියලා, සිංහල මිනිස්සු තිරස්චීන විධියට මුස්ලිම් අයට පහර දෙන්න ගියාය කියන එක සම්පූර්ණ අසත්‍ය කථාවක්. ඒ වෙලාවේ පොලිසිය නීතිය ක්‍රියාත්මක කරන්නේ නැතිව, පක්ෂග්‍රාහීව කටයුතු කරනවාය කියන හැඟීම තමයි නීතිය අතට ගන්න ජනතාව පෙළඹෙව්වේ. ඒ නිසා අහේතුකව මේ 24 දෙනා අත් අඩංගුවට ගන්න පොලිසියට කිව්වේ කවුද? මෙහෙම අත් අඩංගුවට ගැනීමෙන් පසුව දිලුම් අමුණුගම මන්ත්‍රීතුමා, "මේ අය නිදහස් නොකළහොත් ගැටුමක් ඇති වීමේ අවදානමක් තිබෙනවා" කියලා පොලිසියට කිව්වාම නියෝජ්‍ය පොලිස්පතිතුමා වහසි බස් දොඩනවා, "ඔබතුමා කලබල නොවී ඉන්න, ඒ හරිය අපි බලා ගන්නම්" කියලා. ඔය තියෙන්නෙ බලා ගත්ත අපූරුව!

අවසාන වශයෙන්, මම අහන්නේ නියෝජ්‍ය පොලිස්පතිට අක්‍රිය වෙන්න කිව්වේ කවුද, ඇඳිරි නීතිය කඩ කරමින් කලබල ඇති කරන්න පුද්ගලයන්ට බලය දුන්නේ කවුද කියන එකයි. මේ ප්‍රශ්නවලට අද විසඳුම් ලැබිය යුතුයි. අපට මතකයි, 1981 යාපනයේ පුස්තකාලය ගිනි තබලා මහා කලබලයක් ඇති කරලා ඉතිහාසයට කළු පැල්ලමක් එකතු කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබියදීයි; ඒ වාගේම 1983 සිංහල-දෙමළ කලබලයක් ඇති කරලා "කළු ජූලිය" කියලා අපේ ඉතිහාසයට කළු පැල්ලමක් එකතු කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබියදීයි කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුස්ලිම් කොංග්‍රසයේ නායක ගරු රවුෆ් හකීම් මැතිතුමා - මගේ මිත්‍රයා- ඊයේ සඳහන් කළා, "පළාත් පාලන මැතිවරණය පැවැත්වීමෙන් පසුව මුස්ලිම් අයට පහර දීමේ ප්‍රවණතාවක් තිබේ" කියලා. ඒ ගැන මම ඉතාමත් කනගාටු වෙනවා. රවුෆ් හකීම් මැතිතුමාට අමතක වුණා; පළාත් පාලන මැතිවරණයට මාස එකහමාරකට කලින් ගිංතොට සිද්ධියක් ඇති වුණු බව; පසුගිය මාස හය තුළ සිදුවීම් තුනක් ඇති වුණු බව. හැබැයි, මේක පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ ඇති වුණු දෙයක් නොවෙයි. කලින් සිටම ආපු එකේ දිගුවක් තමයි මැතිවරණයෙන් පසුවත් යන්නේ. මෙයින් අපට ඇති වාසියක් නැහැ. හැබැයි, මේ කලබලය ඇති වෙන්න කලින් අගමැතිතුමා ඉවත් කිරීම පිළිබඳව රටේ සංවාදයක් තිබුණා; බැඳුම්කර වංචාව පිළිබඳව රටේ සංවාදයක් තිබුණා; බඩු මිල ඉහළ යාම ගැන ජනතාව ඉන්නේ කේන්තියෙන් කියලා මැතිවරණ ප්‍රතිඵල බැලීමෙන් පසුව රටේ සංවාදයක් තිබුණා. ඒ සියල්ල පැත්තකට ගිහිල්ලා අද රටේ මාතෘකාව "සිංහල-මුස්ලිම් සමගිය ගොඩනඟන්නේ කෙසේද?" කියන එකයි. කවුද, අවසාන ලාභය ලබා තිබෙන්නේ? ඒ, මේ ආණ්ඩුවයි; අගමැතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවයි. එදා 1981 යාපනයේ වුණු දේ ගැනත්, 1983 රට පුරාම සිදු වුණු දේ ගැනත් රාජන් හූල් සඳහන් කරනවා. එතුමා කියනවා, 1983දී ඇති වුණු ආණ්ඩු විරෝධය, එක්සත් ජාතික පක්ෂය උපක්‍රමිකව දෙමළ විරෝධයක් බවට හැරෙව්වාය කියලා. "එවැනි දෙයක් යළිත් මේ රටේ සිදු වන්න ඉඩ තියන්න එපා" කියලා ඉතාම ඕනෑකමින් ආණ්ඩු පක්ෂයෙන් ඉල්ලා සිටිමින්, මේ ගැටුමෙන් විපතට පත් සියලුදෙනා වෙනුවෙන්ම ශෝකය පළ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 21ක් තිබෙනවා.

[අ.භා. 4.37]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සාකච්ඡා කරන මාතෘකා කිහිපය අතරින්, විශේෂයෙන්ම "බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය පනත් කෙටුම්පත" ගැන කෙටියෙන් අදහසක් දක්වනවා. මොකද, මේ පනත් කෙටුම්පත අද සම්මත නොකර එකඟ වුණු විධියට ඉදිරියටත් සාකච්ඡා කරාවිය කියලා අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් වාගේම එහි සාමාජිකයෙක්. බලහත්කාරය නිසා අතුරුදහන් වීම පිළිබඳව ඉතිහාසයක් අපට තිබෙනවා. අපි දන්නවා, අද මේ පාර්ලිමේන්තුවෙත් ඉන්නවා කියලා, එදා 'කළු බළල්ලු', 'කහ බළල්ලු', 'ප්‍රා','සා', 'කොළ කොටි' ආදී නම්වලින් ඇවිල්ලා රාජ්‍ය බලය බලහත්කාරයෙන් පාවිච්චි කරලා; රාජ්‍ය බලයට එහා ගිය - ඉක්මවා ගිය- බලයක් පාවිච්චි කරලා අතුරුදහන් කිරීම්වලට ලක් කළ අය. ඇත්තටම මම කැමැති නැහැ, මගේ දරුවෙක්වත්, මාවත්, මා වාගේම සාමාන්‍ය ජනතාවත් තව කවුරු හෝ විසින් බලහත්කාරයෙන් අතුරුදහන් කරනවාට. සුනාමියක් ආවොත් කරන්න දෙයක් නැහැ. සුනාමිය කියන්නේ ස්වභාවික විපතක්. හැබැයි, තව කෙනෙකුගේ බලය විසින් තව කෙනකු අතුරුදහන් කරන්න කාට හෝ පුළුවන්ද? ජාතිවාදයෙන් ඔළුව අවුල් කරගෙන කථා කරන සමහර අයට විවිධ හේතු තියෙන්න පුළුවන්. නමුත් මට හැඟෙන දේ තමයි, තමන්ට රාජ්‍ය බලය ලැබුණු වෙලාවක මිනිසුන් අතුරුදහන් කරන්න බලාපොරොත්තු වන කට්ටියට තමයි මේ පනත් කෙටුම්පතට විරුද්ධ වෙන්න පුළුවන් වන්නේ කියන එක.

මොකද, තමන්ට රාජ්‍ය බලය අරගෙන සාමාන්‍ය ජනතාව, වැඩ වර්ජනය කරන අය, දේශපාලන ක්‍රියාකාරීන් අතුරුදහන් කරන්න කැමැත්තෙන් ඉන්නා කෙනෙකුට මේකට විරුද්ධ වෙන්න පුළුවන්. මම කියන්නේ නැහැ, මෙම නීතිය පාර්ලිමේන්තුවෙන් සම්මත වුණු නිසාම ඊට පසුව අතුරුදහන් කිරීම් නතර වෙනවා කියලා. එහෙම වෙන්නේත් නැහැ. හැබැයි, 1988-89 කාලයේ ඉතිහාසය අපිට මතකයි. අඩු තරමේ අතුරුදහන් වුණු කෙනෙක් එසේ අතුරුදහන් වීම අපරාධයක් කියලාවත් සැලකුවේ නැහැ. එසේ අතුරුදහන් වීම ඔප්පු කළත්, ඒක අපරාධයක් කියලා සැලකුවේත් නැහැ. අපේ රටේ එවැනි ඉතිහාසයක් තිබුණා; සිවිල් යුද්ධ නිසා ඇති වුණු ඉතිහාසයක් තිබුණා. අනාගතයේ එහෙම විය යුතු නැහැ. අනාගතයේ එහෙම නොවෙන්න ජාත්‍යන්තර වශයෙන් ඇමෙරිකාවෙන් ගෙනෙන නීතියක් හෝ තිබෙනවා නම් කමක් නැහැ. ඒකට රට නොවෙයි, ප්‍රශ්නය. ලංකාවේ නීතියක් නැත්නම්, ජාත්‍යන්තරව හෝ සම්මුතියක් තිබෙනවා නම් ඒක හොඳයි කියලා පිළිගන්න ඕනෑ, ජාතිවාදී නරුම මානසිකත්වයෙන් එළියට ඇවිල්ලා. ඒ නිසා අපි මේ ගැන තවදුරටත් සාකච්ඡා කරන්න ඕනෑ කියලා මා කියනවා.

මගේ රටේ ජනතාව මොන පක්ෂයකට අයිති වුණත් -එක්සත් ජාතික පාක්ෂිකයෙක් වුණත්, ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක්

වුණත්, මම අදහස් කරන, මම පිළිගන්නා දේශපාලන මතය පිළිනොගන්නා කෙනෙකු වුණත්- බලහත්කාරයෙන් අතුරුදහන් වෙනවාට මම කැමැති නැහැ. අපිට එහෙම කැමැති වෙන්න පුළුවන්ද? සාමාන්‍ය, සරල අදහසින් ගත්තොත් බලහත්කාරයෙන් පුද්ගලයෙක් අතුරුදහන් කරන්න තව කෙනෙකුට පුළුවන්ද? ඒකට කැමැති වෙන්න පුළුවන්ද? මේ තුළ තිබෙන නීති-රීති, අණපනත් හෝ වගන්ති ගැන නොවෙයි, මම මේ කියන්නේ. හරයෙන් ගත්තොත්, හරයෙන්ම කෙනෙකුට තව කෙනෙකුව බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට එකඟ වෙන්න පුළුවන්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම ගැන කථා කරනවා, බලහත්කාරයෙන් මිනී මරද්දී. මට කනගාටු ඒ ගැනයි. අද අපේ රටේ එක තැනක මිනිසුන් බියෙන් ජීවත් වෙනවා. ඔවුන්ට රිය ගත කරන්න බැහැ. මොකද, සිංහල කෙනා මුස්ලිම් කෙනා මරයිද, මුස්ලිම් කෙනා සිංහල කෙනා මරයිද කියලා බයෙන් ඔවුන් ඉන්නේ. මිනිස්සු මරණයට බයෙන් ජීවත් වෙද්දී, අපි මේ පාර්ලිමේන්තුවේදී බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම ගැන කථා කරනවා. ඒක තමයි ලොකුම විහිළුව. මොකද, අපි කථා කරනවා, "ඔයා බලහත්කාරයෙන් අතුරුදහන් කරන්න ඉඩ දෙන්නේ නැහැ" කියලා. හැබැයි, අපි බලහත්කාරයෙන් මරනවා. බලහත්කාරයෙන් අතුරුදහන් කරන්නේ නැහැ කියලා කථා කරනවා. හැබැයි, අද අපි, මිනිහෙක් තව මිනිහෙක්ව බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට විරුද්ධ වීම ගැන, පක්ෂ වීම ගැන මේ පාර්ලිමේන්තුවේ කථා කරද්දී, බලහත්කාරයෙන් මරනවා. සිංහල කෙනා මුස්ලිම් කෙනා මරන්න හොයනවා, මුස්ලිම් කෙනා සිංහල කෙනා මරන්න හොයනවා. මේ පාර්ලිමේන්තුවේදී අපි බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම වැළැක්වීම ගැන නීති කථා කරනවා. විහිළු නේද? අපි විහිළුවට ලක් වෙලා නේද? මේ පාර්ලිමේන්තුව විහිළුවක් නොවෙයිද? කල්පනා කරලා බලන්න. අද අපි මේ පාර්ලිමේන්තුවේ මෙහෙම කථා කරන එක ගැන කනගාටු වෙන්න ඕනෑ. නමුත් මාතෘකාවක් තිබෙන නිසා, කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඊළඟට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2001 ඉඳලා මේ රටේ කර්මාන්ත, ව්‍යාපාර වෙනුවෙන් බරපතළ තර්ජනයක් වුණු ලෝක වෙළෙඳ සංවිධානය -WTO - සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ යෝජනා හැටියට ගෙනා, 2001 අන්තර් ජාතික වෙළෙඳ හා වාණිජ විෂය භාර අමාත්‍යාංශයේ ඇමතිවරයා ඉදිරිපත් කරලා, 2005 මැයි 12 අමාත්‍ය මණ්ඩලයේ තීරණය අරගෙන, 2006 නැවත මේ පාර්ලිමේන්තුවට ගෙනා ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත - Anti-Dumping and Countervailing Duties Bill - සහ ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත - Safeguard Measures Bill - කියන පනත් කෙටුම්පත් දෙක ගැනත් සාකච්ඡා කරන්න ඕනෑ.

මේ ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු කියන පනත් කෙටුම්පත 2001 ඉඳලා පාර්ලිමේන්තුවේ කථා වෙන එකක්. මම පැහැදිලිව කියනවා, ජනතා විමුක්ති පෙරමුණ හැටියට 2006දී අපි මේකට විරුද්ධ වුණු බව. අපේ විරෝධතාව නිසා පාර්මේන්තුවේ එය සම්මත නොකර නතර කළා. හැබැයි, අපි එතැනින් නතර වුණේ නැහැ. අපේ විරෝධතාවට පදනම් වුණු හේතු එක්ක අපි දිගටම ඔබතුමන්ලා එක්ක සාකච්ඡා කළා; ඔබතුමන්ලා එක්ක හැප්පුණා; වාද-විවාද කළා. අපි කර්මාන්ත මණ්ඩල හම්බ වුණා; ව්‍යාපාරික සංගම් හම්බ වුණා; අපේ රටේ දේශීය කර්මාන්තකරුවන් මුණ ගැහුණා; ඔවුන්ගේ යෝජනා ගෙනාවා. මේ ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු කියන පනත් කෙටුම්පත එක පැත්තකින් හොඳ යෝජනාවක්. ඒ හොඳ අරමුණට අපි සම්පූර්ණයෙන් එකඟයි.

හොඳ අරමුණ තමයි, undervalue කරලා ලංකාවට භාණ්ඩ ගෙනෙන එක වළක්වාගෙන දේශීය කර්මාන්තකරුවා ආරක්ෂා කර ගැනීම කියන අරමුණ. ඒ අරමුණ එක්ක අපට විවාදයක් නැහැ. හැබැයි ඒක WTO එකේ කමිටුවක් නම් කරලා WTO එකේම -ලෝක වෙළෙඳ සංවිධානයේම- අරමුණ එක්ක කටයුතු කරපු එක සම්බන්ධයෙන් අපි සංශෝධන ඉදිරිපත් කළා. ගරු අමාත්‍යතුමනි, ඒ බව ඔබතුමා දන්නවා. මා මෙය සරල උදාහරණයකින් කියන්නම්. මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. ලෝකයේ තිබෙන කසි කබල් භාණ්ඩ ගෙනැල්ලා ලංකාවේ දේශීය කර්මාන්ත, ව්‍යාපාර විනාශ වන එක වළක්වා ගන්න එක රජයේ වගකීමක්. ඒකට අපි එකඟයි. ඒක තමයි undervalue කරන එකට විරුද්ධ වෙන්නේ. හැබැයි, දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමට සෙස් බදු ක්‍රමයක් දැන් තිබෙනවා; සෙස් බදු පැනවීමක් දැන් තිබෙනවා. උදාහරණයකට ගන්න පුළුවන්, බිස්කට් කර්මාන්තය. ලංකාවේ බිස්කට් කර්මාන්තයේ ඉන්නවා, ප්‍රධාන බිස්කට් ව්‍යාපාරිකයන්. ඒ අය බිස්කට් නිෂ්පාදනය කරනවා. පිට රටින් බිස්කට් කිලෝ එකක් ගෙනෙනවා නම් කිලෝ එකට රුපියල් 200ක් බදු ගහනවා. එතකොට, පිට රටවලින් ගෙනැල්ලා රුපියල් 200ක් වැඩිපුර දීලා කන්න කැමැති අයට ඒ බිස්කට් කන්න පුළුවන්. එහෙම නැත්නම් ලංකාවේ බිස්කට් කන්න පුළුවන්. එය විසින් කරනු ලබන්නේ ලංකාවේ ව්‍යාපාරිකයා ආරක්ෂා කරන එකයි. හැබැයි, ඔබතුමන්ලාගේ ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු සහ ආරක්ෂණ පියවර යටතේ නිදහස් වෙළෙඳ පොළ පදනමින් ජාත්‍යන්තර කර්මාන්තකරුවකු කිව්වොත්, 'ලංකාවේ බිස්කට් කර්මාන්තයට ඇතුළු වෙන්න මට මේ බද්ද බාධාවක් වෙලා තිබෙනවා. මේක ඉවත් කර දෙන්න ඕනෑ' කියා, ඔබතුමන්ලා ඒ ව්‍යාපාරිකයාට දේශීය වෙළෙඳ පොළට එන්න ඉඩ හදන්න ඕනෑ. ඒ, ඔබතුමන්ලා ජාත්‍යන්තර නිදහස් වෙළෙඳ ගිවිසුම්වලට අත්සන් කර තිබෙන නිසායි; මේ ළඟදී සිංගප්පූරුව සමඟත් වෙළෙඳ ගිවිසුමක් අත්සන් කළ නිසායි. දේශීයව පනවන මේ බද්ද ඉවත් කරලා ඒ ජාත්‍යන්තර ව්‍යාපාරිකයාට, කර්මාන්තකරුවාට ලංකාවේ වෙළෙඳ පොළට එන්න ඉඩ දෙන්නේ කොහොමද කියන ප්‍රශ්නය දැන් ඔබතුමන්ලාට තිබෙනවා. ඒ වෙනුවෙන් ඔබතුමන්ලා මේ ආරක්ෂණ පියවර යටතේ යෝජනා කරන්නේ දේශීය කර්මාන්තකරුවාටයි.

දේශීය ව්‍යාපාරිකයාට යෝජනා කරනවා, 'ඔබේ කර්මාන්තයට ආනයන වෙළෙඳ පොළෙන් -පිට රටින්- ගෙනෙන භාණ්ඩයකින් තර්ජනයක් තිබෙනවා නම් ඒ තර්ජනය ඔප්පු කරන්න' කියා; 'ඒ තර්ජනය ඔප්පු කළොත් ආරක්ෂා කරන්නම්. නැත්නම් ආරක්ෂා කරන්න බැහැ' කියා. ඕක තමයි කතන්දරය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තර්ජනය තිබෙන දේශීය කර්මාන්තකරුවා මා නම්, මා ඔප්පු කරන්න ඕනෑ මගේ කර්මාන්තයට, මගේ ව්‍යාපාරයට මෙන්න මේ තරම් තර්ජනයක් තිබෙනවා කියා. එය ඔප්පු කිරීම සඳහා මම තොරතුරු ඉදිරිපත් කරන්න ඕනෑ. කර්මාන්තකරුවා තොරතුරු ඉදිරිපත් කරන්න ඕනෑ. බරපතළ හානියක් සම්බන්ධයෙන් නම් දේශීය නිෂ්පාදනයේ ප්‍රමාණය සහ වටිනාකම සොයන්න ඕනෑ. දැන් බිස්කට් හදන එක පැත්තක තියලා මා සොයාගෙන යන්න ඕනෑ, ලංකාවේ බිස්කට් කර්මාන්තයේ දේශීය නිෂ්පාදනය කොච්චර ප්‍රමාණයක්ද කියා. මම ඒ තොරතුරු ටික සොයාගෙන ඇවිල්ලා ඔබතුමාගේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට ඔප්පු කරන්න ඕනෑ. නිෂ්පාදනයේ ධාරිතාව ප්‍රයෝජනයට ගැනීම ගැන සොයන්න ඕනෑ. මගේ නිෂ්පාදනය කොච්චරද, ලංකාවට බිස්කට් කොච්චර ඕනෑද, මිනිස්සු කොච්චර බිස්කට් කනවාද, කොච්චර කන්න හිතාගෙන ඉන්නවාද කියන ටික මම සොයාගෙන එන්න ඕනෑ. ඉන්වෙන්ට්‍රි මට්ටම්වල සිදුවූ වෙනස්වීම්, වෙළෙඳ පොළ කොටස්, අලෙවි මට්ටම්වල සිදු වූ වෙනස් වීම් -ඒ කියන්නේ අර තර්ජනය නිසා අලෙවියේ වෙච්ච වෙනස්කම්- දේශීය කර්මාන්තයේ සේවා නියුක්තියේ සහ

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

වැටුප්වල මිල මට්ටම් ගැන සොයන්න ඕනෑ. මගේ බිස්කට් කර්මාන්තශාලාවේ සේවය කරන 300 දෙනා විතරක් නොවෙයි, ලංකාවේ බිස්කට් කර්මාන්තයේ කීදෙනෙකු ඉන්නවාද, ඒ අයගේ වැටුප් මට්ටම් මොනවාද කියන ටික සොයා ගෙන ගිහින් මම ඔප්පු කරන්න ඕනෑ. මිල මට්ටම්වල වෙනස්වීම්, උද්ධමනය ගැන සොයන්න ඕනෑ. අවුරුදු කීයක ඒවාද කියා මම දන්නේ නැහැ. අධ්‍යක්ෂ ජනරාල්තුමා සතුටු වන කල්ද, එතුමා කැමැති තාක් කල් ද, එතුමා සතුටු කරන්නද කියා මම දන්නේ නැහැ. පලදායිතාව, ලාභ අලාභ, ආයෝජන මත ප්‍රතිලාභ, මුදල් ගලනය, බරපතළ තර්ජනයක් ඇති වීමට අදාළ විය හැකි වෙනත් යම් තොරතුරු ආදි ඔක්කෝම දේශීය කර්මාන්තකරුවා සොයා ඔප්පු කරන්න ඕනෑ. ඔප්පු කරන්න බැරි වුණොත්? මේ කර්මාන්තකරුවා කර්මාන්තය කරන එක පැත්තක තියලා මේ තොරතුරු සොයන්න ඕනෑ, ගරු අමාත්‍යතුමනි. ඒ තොරතුරු ඔප්පු කරගන්න බැරි වුණොත්, අර කියපු බද්ද ඉවත් කරනවා. ඒ බද්ද ඉවත් කරලා විදේශ කර්මාන්තකරුවාට එන්න ඉඩ හදනවා. මොකද, ඒ විදේශ කර්මාන්තකරුවාට ගිහින් ජාත්‍යන්තරයට කියන්න පුළුවන්, 'මෙයාට මේක ඔප්පු කර ගන්න බැරි වුණා. මට ඒ සඳහා යන්න ඉඩ දෙන්න ඕනෑ' කියා. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් මා ඒ කාරණය දැන ගන්න කැමැතියි. [බාධා කිරීමක්] රංගේ බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමා, ඔබතුමා ඔය අභ්‍යන්තර ප්‍රශ්න පොඩ්ඩක් පැත්තක තියලා ඇමතිතුමාට මේ විවාදයට සම්බන්ධ වෙන්න ඉඩ දෙන්න. ඔබතුමා අභ්‍යන්තර ප්‍රශ්න ගැන පසුව කථා කරන්න; මේ සඳහා ඉඩ දෙන්න. මොකද, එතුමා විෂය භාර ඇමතිතුමා නිසා.

ජාත්‍යන්තර කර්මාන්තකරුවෙකුට, ජාත්‍යන්තර තරග කරුවෙකුට අපි කිව්වොත්, ඔයාට එහෙම මේ රටට එන්න බැහැ, අපේ දේශීය කර්මාන්තයට ඔබේ කර්මාන්තය බරපතළ හානියක් බව ඔප්පු වෙලා තිබෙනවා, ඔබේ කර්මාන්තය බරපතළ හානියක් බව දේශීය කර්මාන්තකරුවා ඔප්පු කරලා තිබෙනවා, ඒ නිසා ඔයාට එන්න අයිතියක් නැහැ කියලා, එයා ඒක පිළිගන්නවාද නැද්ද? එයා ඒක පිළිනොගෙන කාර්මික ආරවුල් අධිකරණයට - Industrial Court එකට - ගියොත් අපි මොකද කරන්නේ? ඒ ප්‍රශ්නයට මේ පනත් කෙටුම්පතේ උත්තරයක් නැහැ. මම කියන කාරණය ඇමතිතුමාට තේරෙනවා ඇති කියලා මා විශ්වාස කරනවා. අපි ඔප්පු කරනවා, ජාත්‍යන්තරයෙන් එන කර්මාන්තකරුවා අපේ දේශීය කර්මාන්තයට බරපතළ තර්ජනයක්, ඒ නිසා අපේ දේශීය කර්මාන්තය බිඳ වැටෙනවා කියලා. අපේ කර්මාන්තයේ තත්ත්වය මෙහෙමයි, ජාත්‍යන්තර තරගකරුවා ආවොත් මෙහෙමයි කියලා අපි ඔප්පු කරනවා. ඒ ඔප්පු කිරීම කවුද පිළිගන්නේ? ඒ හේතුව පෙන්වලා අපට ඒ ජාත්‍යන්තර කර්මාන්තකරුවා නවත්වන්න පුළුවන්ද? දැන් අපි පනවා තිබෙන බද්ද නිසා නම් ඒ නැවැත්වීම කරන්න පුළුවන්. මොකද, දැන් පනවා තිබෙන බද්ද නිසා ස්වාභාවික වරණයක් ඇතිවන නිසා. උදාහරණයට බිස්කට් කර්මාන්තයම ගත්තොත්, බිස්කට් කිලෝ එකට රුපියල් 200ක බද්දක් පනවා තිබෙනකොට, බිස්කට් වැඩි මිලට අරගෙන කන්න කැමති කට්ටිය -ඔබතුමන්ලා වාගේ කට්ටිය- අරගෙන කයි. නමුත් සාමාන්‍ය මිනිස්සු කන එකක් නැහැ. [බාධා කිරීමක්] සාමාන්‍ය මිනිස්සු අපේ දේශීය කර්මාන්තයේ තිබෙන මන්චි හෝ මැලිබන් හෝ බිස්කට් කයි. ඇයි ඒ? ඒවායේ මිල ස්වාභාවිකවම මේ බද්ද විසින් පාලනය කරලා තිබෙන නිසා. හැබැයි, දැන් එහෙම නොවෙයි සිද්ධ වෙන්න යන්නේ. දැන් යෝජනා කරනවා, "දේශීය කර්මාන්තකරුවාගේ කර්මාන්තයට පිට රටින් එන කර්මාන්තකරුවා තර්ජනයක් කියලා ඔප්පු කරන්න ඕනෑය" කියලා. ඒක ඔප්පු කර ගන්න බැරි වුණොත් මොකද වෙන්නේ? ඒ වාගේම අපි හිතමු ඒක ඔප්පු කළා කියලා. ඔප්පු කළාට පස්සේ අර විදේශීය කර්මාන්තකරුවා මේ රටට නැවිත් ඉන්නවාද? එහෙම නැවිත් ඉන්නවාය කියලා මේ පනතින් අපට මොකක්ද තිබෙන assurance එක? ඒ විදේශීය කර්මාන්තකරුවාට යන්න පුළුවන්නේ අපට විරුද්ධව Industrial Court එකට. අන්න එතැන තමයි බරපතළ ප්‍රශ්නය තිබෙන්නේ.

ඊළඟට, මේ පනත් කෙටුම්පතේ තිබෙන ලොකුම දේ මේකයි. මම ඒ ගැන සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ අධ්‍යක්ෂ ජනරාල්වරයාම තමයි අවසානයේ තීරණය කරන්නේ, මේ ඔක්කෝම තොරතුරු මත මේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරනවාද නැද්ද කියලා. [බාධා කිරීමක්] ඒක තමයි. දේශීය කර්මාන්තකරුවා කරන ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම හෝ නොකිරීම තීරණය කරන්නේ තනි අධ්‍යක්ෂ ජනරාල්වරයා. දේශීය කර්මාන්තකරුවා මාස ගණනක් තමුන්ගේ කර්මාන්තය නතර කරගෙන ඉඳලා තොරතුරු හොයලා, කර්මාන්තය ගැන ලංකාවේම තොරතුරු හොයලා, මුළු සේවා නියුක්තිය හොයලා, ඵලදායිතාව හොයලා -ඒ ඔක්කෝම හොයලා- ගිහිල්ලා දුන්නාට පස්සේ, ඕනෑ නම් අධ්‍යක්ෂ ජනරාල්වරයාට කියන්න පුළුවන් 'මම මේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරනවා' කියලා. අනික් අතට ඒ කියන්නේ මොකක්ද? අර ජාත්‍යන්තර කර්මාන්තකරුවාට එන්න ඉඩ හදන්න ඕනෑය කියන එකයි. මෙතැන තමයි බරපතළ ප්‍රශ්නය තිබෙන්නේ. මෙහිදී ජාත්‍යන්තර ලෝක වෙළඳ සංවිධානයේ තිබෙන මුළු රාමුවම අපට සම්පූර්ණයෙන් වෙනස් කරන්න බැරි වුණත්, මුළු අවශ්‍යතාවම වෙනස් කරන්න බැරි වුණත් අපි සැලකිය යුතු යෝජනා ප්‍රමාණයක් සංශෝධන හැටියට ලබා දුන්නා. ඒවායින් සැලකිය යුතු ප්‍රමාණයක් ඔබතුමන්ලා පිළිගෙන තිබෙනවා. නමුත් මෙන්න මෙතැන මේ ගැටේ තිබෙනවා. ඒ මොකක්ද? දේශීය කර්මාන්තයට තර්ජනයක් තියෙනවාය කියලා අපි ඔප්පු කළත්, එය විසින් ඒ එන විදේශ කර්මාන්ත ආක්‍රමණය නතර කළ හැකි ද? ඒ ගොල්ලන්ට අවස්ථාවක් තිබෙනවා නේද අපට විරුද්ධව Industrial Court එකට යන්න? ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ කාරණය ගැන මොනවා හරි කියනවාද? දැන්ම මේ ප්‍රශ්නය බේරලා දුන්නොත් ලොකු දෙයක්. මේක තමයි මෙතැන තිබෙන බරපතළම ප්‍රශ්නය. [බාධා කිරීමක්] අධ්‍යක්ෂ ජනරාල්වරයාට පරීක්ෂණයක් නවත්වන්නත් පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි ගැටලුව.

ඊළඟට, මේ පනත් කෙටුම්පතේ තිබෙනවා තවත් කාරණාවක්. විභාග කිරීමේදී, ඒ කියන්නේ දේශීය කර්මාන්තකරුවා job එක නවත්වලා, බිස්කට් හදන එක නවත්වලා, පාවහන් හදන එක නවත්වලා, තමන්ට තිබෙන තර්ජනය ඔප්පු කරන්න යනවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ළඟට. ගිහිල්ලා කියනවා, "මගේ කර්මාන්තයට මෙච්චර තර්ජනයක් තිබෙනවා, දැන් ඉන්දියානු කොම්පැනි එන්න හදනවා, චීන කොම්පැනි එන්න හදනවා, ජාත්‍යන්තර වෙළඳ සංවිධාන යෝජනා අනුව යුරෝපා කර්මාන්තශාලා එන්න හදනවා, ඒ නිසා අපේ කර්මාන්තය කඩා වැටෙනවා" කියලා. ඒ පැමිණිල්ල විභාග කිරීමේදී අධ්‍යක්ෂ ජනරාල්වරයා මුලසුන දැරිය යුතු අතර, රහස්‍යභාවය සුරකීමට ඔහු වගබලා ගත යුතුයි. සහභාගීවීමට උනන්දුවක් දක්වන සියලු පාර්ශ්වයන්ට ස්වකීය අදහස් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් අවස්ථාවක් දෙන්න ඕනෑ. අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ විභාගය කරන්න ඕනෑ. අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ ඔක්කෝම ටික කළාය කියලා හිතමු. ලංකාවේ කර්මාන්තකරුවන් සියයක් පැමිණිලි 100ක් ගෙනාවොත් අධ්‍යක්ෂ ජනරාල්වරයාට මොකද වෙන්නේ? ඒ පැමිණිලි විභාග කරන්න අවුරුදු කීයක් යයි ද?

සභාපති හැටියට ඔහු විතරක් පුටුවේ වාඩි වෙලා කටයුතු කරනවා. මේක කොයිතරම් ප්‍රායෝගික නොවන යෝජනාවක්ද? ඒ නිසා තමයි අපි ඔබතුමන්ලාට තවත් සංශෝධනයක් ඉදිරිපත් කරන්නේ. ඔබතුමන්ලා මෙම පනත් කෙටුම්පත සම්මත කරනවා නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයාට අමතරව අඩුම තරමින් ඔහු නැති වෙලාවක මේ පැමිණිලි විභාග කරලා අවසන් කරන්න ඔහු නම්

කරන තව පුද්ගලයෙක්වත් ඇතුළත් කළ යුතුයි. ඒ මොනවා කළත් ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. මේ හරහා අපේ රටේ දේශීය කර්මාන්ත ආරක්ෂා කරන්න පුළුවන්ද? මම දන්නා තරමට දැන් ඔබතුමන්ලා චීන සිල්ලර කඩවලට පවා ලංකාවට එන්න අවසර දීලා තිබෙනවා. ඒ කියන්නේ, දැන් ලංකාවේ චීන සිල්ලර කඩ දමන්නයි හදන්නේ. දැන් අපේ රටේ පාරිභෝගිකයන්ට තිබෙන්නේ චීන භාෂාව ඉගෙන ගන්න විතරයි. ගරු ඇමතිතුමනි, එහෙම එකක් නැද්ද?

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

ආයෝජකයෙක් එනකොට තමයි එහෙම කරන්න වෙන්නේ. අපේ අදහස ලංකාවට branded goods ගෙන්වා ගන්නයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, Anti-dumping Act එකක් අපට ඕනෑ. අද අපේ රටට සරුංගල් පවා ගෙනෙනවා. අපේ රටේ airport එකට ගියොත්, එහෙම නැත්නම් harbour එකට ගියොත් පෙනෙනවා, ලෝකයේ තිබෙන ඔක්කෝම කුනුගොඩවල් ලංකාවට ගෙනෙන බව. ඒ ගෙන්වන බහුතරයක් දේවල් ගෙනෙන්නේ undervalue කරලා. ඒ කියන්නේ, මිල අඩුවෙන් පෙන්වලා ගෙන්වනවා. ඒ නිසා ලංකාවේ වෙළෙඳ පොළට ආරක්ෂාවක් ඕනෑ.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

ඒක තමයි මම කලින් කිව්වේ,-

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒක තමයි මම කියන්නේ. ඔබතුමන්ලා anti-dumping එක අස්සේ safeguard එකකුත් දානවා නේ.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

අපේ කර්මාන්තකරුවන්ට ඒ දෙකම අවශ්‍යයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, කර්මාන්තකරුවාට ඒ දෙකම අවශ්‍ය බව මාත් පිළිගන්නවා. නමුත් බිස්කට් කර්මාන්තකරුවා බිස්කට් හදන එක පැත්තක තියලා, මේ තොරතුරු කොහොමද හොයා ගන්නේ? මේ තොරතුරු ගන්න පුළුවන් ලංකාවේ තිබෙන යාන්ත්‍රණය මොකක්ද?

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

අපේ Industrial Ministry එකේ ඒ තොරතුරු තිබෙනවා. ඒකට වෙන කොහේවත් යන්න ඕනෑ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මොකක්ද?

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

අපේ Industrial Ministry එකේ Commerce Department එකේ ඒ තොරතුරු ඔක්කෝම තිබෙනවා. නිෂ්පාදනය කළ ඒවා, කවුද නිෂ්පාදනය කරන්නේ යනාදී වශයෙන් ඔක්කෝම තොරතුරු තිබෙනවා. ඒවා ලේසියෙන් ලබා ගන්න පුළුවන්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමා ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් ඒ තොරතුරු ලබා නොදුන්නොත් හෝ ලබා ගන්න බැරි වුණොත්, ඒ මත පදනම් වෙලා කර්මාන්තකරුවාට සහනයක් තිබෙනවා ද, මේ පරීක්ෂණයේදී ඔබතුමන්ගේ දෙපාර්තමේන්තුව අවශ්‍ය පරිදි තොරතුරු ලබා නොදුන්න නිසා මේ කරුණු ඔප්පු කර ගන්න බැරි වුණා කියලා කියන්න? අපි හිතමු, මම කර්මාන්තකරුවෙක් කියලා. මට අවශ්‍ය තොරතුරු ඕනෑ කරලා තිබෙනවා කියලා හිතමු. ආනයනය කරන ලද නිෂ්පාදනයේ තාක්ෂණික ලක්ෂණ සහ එහි ප්‍රයෝජන ඇතුළු එම නිෂ්පාදනය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහ එම නිෂ්පාදනයේ තීරුබදු වර්ගීකරණය, එම නිෂ්පාදනයට අදාළ බදු යනාදියේ තොරතුරු ඕනෑ කරනවා කියලා හිතන්න.

මම බිස්කට් නිෂ්පාදනය කරනවා නම්, මම ඔප්පු කරන්න ඕනෑ, වෙන රටකින් ලංකාවට ආනයනය කරන බිස්කට්වල මට්ටම, ප්‍රමාණය, ඒවාට පනවන බදු යනාදී ඒ සියල්ල. එහෙම නැත්නම් මට මගේ නඩුව ඔප්පු කරන්න බැහැ නේ. ඒක ඔප්පු කරගන්න ප්‍රමාණවත් තරම් තොරතුරු කවුරු හරි මට ලබා නොදුන්නොත්, මට සාක්ෂියක් තිබෙනවාද මේ තොරතුරු ඔප්පු කර ගන්න බැරි වුණේ මගේ නිෂ්පාදනයේ වරදක් නිසා නොවෙයි, මට තොරතුරු සපයපු ආයතනවල වරදක් නිසා කියලා? ඊට උපකාර වන එක වගන්තියක් හරි මේ පනත් කෙටුම්පතේ තිබෙනවාද? එහෙම නම් දැන් එහෙම වගන්තියක් මේ පනත් කෙටුම්පතේ තිබෙන්න එපායැ. ඒ තොරතුරු නිසි පරිදි ඔප්පු කර ගන්න නොහැකිවන කෙනෙකුට ලැබෙන සහනය මොකක්ද?

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

ඒ තොරතුරු ලබා දෙන්න පුළුවන්. ඒකයි මම කියන්නේ. කාටහරි වුවමනා නම් දෙන්න පුළුවන්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මලික් සමරවික්‍රම ඇමතිතුමාගෙන් අපි තොරතුරු ඉල්ලන්න යන්නේ නැහැ නේ.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

අනෙක් එක, එම තොරතුරු නැත්නම් කිසිම දෙයක් නැහැ නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔබතුමා garment ගැන නම් තොරතුරු දෙයි. අනෙක් ඒවා දෙන්නේ කොහොමද?

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඒ තොරතුරු ඔක්කෝම තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳයි. ඔබතුමා ළඟ තොරතුරු තිබෙනවාය කියන එක, අඩුම තරමින් කර්මාන්තකරුවෙකුට කවදා හෝ මේ හැන්සාඩ් වාර්තාවවත් ගෙනිහිල්ලා පෙන්වන්න ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. විෂයභාර ඇමතිතුමා මේ විවාදය වෙලාවේ කිව්වා, "තොරතුරු දෙන්න අමාත්‍යාංශය බැඳිලා ඉන්නවා" කියලා. අඩුම තරමින් නඩුවකදී ඒකවත් ඔප්පු කරයි නේ. මේක බරපතළ කාරණයක් නිසායි මම කියන්නේ.

අද ඔබතුමන්ලා මෙම පනත් කෙටුම්පතට ඉදිරිපත් කළ සංශෝධන පිළිගත්තත්, අද ඔබතුමන්ලා මෙම පනත් කෙටුම්පත සම්මත කරන්නේ අපට එකඟ වෙන්න බැරි ගොඩක් කරුණු තිබියදීයි. ඒ කරුණ මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද, රීති ප්‍රශ්නය ගරු මන්ත්‍රීතුමා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ අවශ්‍ය තොරතුරු ලබා දීම ඒ දෙපාර්තමේන්තුවේ වගකීමක්, ඒ ආයතනයේ වගකීමක් කියන එක පනතට ඇතුළත් කරන්න බැරිද? මොකද, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කියනවා වාගේ නඩු කටයුත්තකදී ඒ කරුණ නිසා බලපෑමක් ඇති වෙන්න පුළුවන්. සත්‍ය තොරතුරු ලබා නොදීමෙන් සහ අවශ්‍ය වෙලාවට තොරතුරු ලබා නොදීමෙන් සාධාරණයක් ඉටු නොවෙන්න පුළුවන්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමන්ලා මේ ඉෂ්ට කරන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙළෙඳ පොළ විවෘත කරන්න කියලා කියන බලපෑමට අදාළ කරුණු. ඒක ලෝක වෙළෙඳ සංවිධානය කාලයක් තිස්සේ ඉඳලා කරන බලපෑමක්. ඒ බලපෑම නිසා අපේ රටේ දේශීය ව්‍යාපාර, කර්මාන්ත සියල්ල අදටත් තිබෙන්නේ හොඳ මට්ටමක නොවෙයි කියලා ඔබතුමා දන්නවා. ඒවා ඉදිරියේදී තවත් අර්බුදයට පත්වන පියවරක් මේක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, එම නිසා අපේ රටේ දේශීය ව්‍යාපාර, කර්මාන්තවලට මීට වඩා ආරක්ෂාවක් ඕනෑ. මා දන්නා තරමට ඔබතුමන්ලා අඩු තරමින් ආරක්ෂණ පියවර -Safeguard Measures- පනත් කෙටුම්පත ගැන දේශීය කර්මාන්ත සංගම් එක්කවත් සාකච්ඡා කරලා නැහැ. ඔයගොල්ලෝ මේවා ඉදිරිපත් කරන්න ඕනෑ කියලා කථා කරලා නැහැ.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
සාකච්ඡා කරලා තිබෙනවා. හැම එක්කෙනා එක්කම සාකච්ඡා කරලායි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු සෙයියිඩ් අලි සාහිර් මවුලානා මහතා.

[4.59p.m.]

**ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா )
(The Hon. Seyed Ali Zahir Moulana)
Sir, since the wide ranging market-oriented economic reforms that have been introduced in late 1970s, Sri Lanka has been pursuing a liberal trade policy. The gradual opening up of the local market to foreign goods has helped us in improving the efficiency and the competitiveness of our domestic entrepreneurs on the one hand, while providing the consumer with a better choice of quality products at reasonable prices on the other. In addition to the free-market reforms that are introduced in a unilateral manner, Sri Lanka also has to honour its market liberalization commitments under the World Trade Organization and several bilateral and regional free trade agreements it has signed with some of its trading partners.

Sir, as the present Government looks forward to relaxing Sri Lanka's trade regime further through gradual reduction of tariffs and other duties and charges, it is very important that we put in place an effective mechanism that can protect our industries, who are mostly SMEs, from unfair competition as well as sudden surge of imports.

I am very happy today, because the Anti-Dumping and Countervailing Duties Bill and the Safeguard Measures Bill, which were presented to Parliament on 11th December, 2017 by the Hon. Minister of Industry and Commerce are precisely for the purpose of

introducing such an effective mechanism that would protect and safeguard our entrepreneurs from any unfair competition posed by foreign suppliers and sudden import surges.

I understand that the two Bills took a significant duration of time before it reached the final stage, since they had to go through several Consultative Committee Meetings and Cabinet decisions, which recommended a number of amendments. Following those amendments, the draft Bills apparently took some more time to obtain the clearance of the Attorney-General on their compliance with our Constitution on each occasion. Nevertheless, we all can be happy today that the two Bills are now before Parliament for its approval.

At the end of last year, on 8th December, 2017 the Sectoral Oversight Committee on Business and Commerce, which was chaired by me, discussed the two Bills in detail. Following our discussions, the Bills Office of Parliament suggested the Legal Draftsman's Department to have a final look at the texts and ensure that there were no discrepancies among the Bills which were printed in the three languages. I wish to convey my sincere thanks to the Legal Draftsman and her officials for completing that task successfully, despite the busy schedule that was made available to them.

I am also thankful to the Ministry of Industry and Commerce as well as the Department of Commerce for the valuable cooperation they extended to us throughout the process since the initial drafting of the two Bills.

As we all agree, Anti-Dumping and Countervailing Duties Bill and Safeguard Measures Bill have been a long -felt need of the country for the reasons I highlighted earlier. With the cooperation of all relevant stakeholders, the two Bills have now been completed and they are ready for the approval of this House. As the Chairman of the Sectoral Oversight Committee on Business and Commerce, I seek the valuable support of the honourable Members of Parliament to pass the respective Bills in a smooth manner.

Thank you very much, Sir.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමා.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
I want to make one clarification on what the Hon. Sunil Handunnethi earlier raised. Firstly, the Industrial Court or the international arbitrator does not arise in this case. Companies cannot go and appeal to them. This Bill supersedes such courts. It is only the dispute settlement body of the WTO that can look into any appeals.

Secondly, the information has to be provided by the company affected and the Department of Commerce will get all the information required from the foreign company which is exporting goods to Sri Lanka.

Thank you.

[பி.ப. 5.04]

**ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා**
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்படுதலிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் பற்றிய சர்வதேச சமவாயச் சட்டமூலம் தொடர்பான விவாதத்தில் உரையாற்றுவதையிட்டு மகிழ்ச்சியடைந்தாலும், குறித்த சட்டங்களின் அமுலாக்கம் பற்றி வேதனைப்பட வேண்டியிருக்கிறது. அந்தவகையில், இந்தச் சபையில் சட்டமூலங்கள் தொடர்பில் விவாதிக் கப்படுவதை ஒரு நகைப்புக்குரிய விடயமாகவே பார்க்கின்றேன். ஏனெனில், இன்று இந்த நாட்டின் பிரஜைகளாக இருக்கின்ற முஸ்லிம்களின் உரிமை, பாதுகாப்பு முதலிய விடயங்களில் சட்டம், ஒழுங்கு சரியாக நிலைநாட்டப்படவில்லை. கொள்ளையர்களும் இனவாதிகளும் வன்முறைச் சம்பவங்களுக்குக் காரணகர்த்தாக்களாக இருக்கின் றவர்களும் சட்டத்தைத் தங்களது கைகளிலே எடுத்திருக்கின்றார்கள். அந்த வகையில் இன்று கண்டி மாவட்டத்தில் ஊரடங்குச் சட்டம் அமுலில் இருக்கத்தக்கதாக, பல்வேறு வன்முறைச் சம்பவங்கள் இடம்பெறுகின்றன. நேற்று முன்தினம் திகனயில் இடம்பெற்ற பாரிய அசம்பாவிதம் தொடர்பில் பல்வேறு உறுப்பினர்களும் இந்தச் சபையிலே தமது அபிப்பிராயங்களையும் கருத்துக்களையும் விசனங் களையும் தெரிவித்தார்கள். குறித்த சம்பவங்கள் தொடர்பில் அதிகாரத்திலுள்ளவர்கள் சட்ட நடவடிக்கை எடுப்பதாகச் சொன்னாலும் இன்னமும் சட்டமும் ஒழுங்கும் மௌனித்த நிலையிலேயே இருக்கின்றது.

இன்று கண்டி மாவட்டத்திலே ஊரடங்குச் சட்டம் அமுல்படுத்தப்பட்டபோதிலும், பல்வேறு அனர்த்தங்கள் இடம்பெற்றுக்கொண்டிருக்கின்றன. இது சம்பந்தமாகக் கிடைக்கப்பெற்ற செய்திகளில் ஊர்ஜிதப்படுத்தப்பட்டவற்றை நான் இந்தச் சபையிலே அறிக்கையிடுவதற்கு விழைகின்றேன். கண்டி, அம்பத்தன பகுதியில் பயணித்த பஸ்களை இடைமறித்து, அதில் பயணித்த முஸ்லிம்களை மாத்திரம் இனம் கண்டு தாக்கியிருக்கின்றார்கள். அக்குறணை முதலாம் கட்டையிலுள்ள வெலேகட பிரதேசத்தில் முஸ்லிம் மக்களுக்குச் சொந்தமான ஓர் அரிசி ஆலையும் மர ஆலையும் மற்றும் பள்ளிவாசல் ஒன்றும் தீக்கிரையாக்கப்பட்டிருக்கின்றன. வீடுகளுக்குக் கல் வீசப்பட்டிருக்கின்றது. அக்குறணை எட்டாம் கட்டையிலே நான்கு கடைகள் இன்று தீக்கிரையாக்கப் பட்டிருக்கின்றன. பள்ளிவாசல் தாக்குதலுக்குள்ளாகியுள்ளது. கட்டுகஸ்தோட்டை, கொஹாகொட வீதியிலுள்ள "சிட்டி மெக்ஸ்" என்ற புடவைக்கடை தீக்கிரையாக்கப்பட்டிருக்கிறது.

[ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා]

கட்டுகஸ்தோட்டை, பொல்கொல்ல வீதியிலுள்ள கலியாண மண்டபம் தாக்கப்பட்டிருக்கிறது. இந்தச் செயல்களில் காடையர்களும் கொள்ளையர்களும் இனவாதிகளும் ஈடுபட்டுக்கொண்டிருக்க, பொலிசாரும் பாதுகாப்புப் படையினரும் பார்வையாளர்களாக இருந்துகொண்டிருக் கின்றார்கள் என்றால், இந்த நாட்டிலே சட்டமும் ஒழுங்கும் எங்கே போய்க் கொண்டிருக்கின்றது? என்று நான் கேட்கின்றேன். ஆகவே, இன்று முஸ்லிம்களுக்கு பாதுகாப்பில்லாத நிலைமையே உருவாகியிருக்கிறது.

இன்று நாட்டிலே நிலைபேறான அபிவிருத்தி பற்றியும் 2025ஆம் ஆண்டில் ஓர் அழகான, அபிவிருத்தியடைந்த நாடாக இலங்கையை மாற்றியமைக்க வேண்டும் என்றும் பேசப்படுகின்றது. அத்துடன், வெளிநாடுகளிலிருந்து முதலீடுகளைப் பெற்றுக்கொள்வதற்கான முயற்சிகளிலும் அரசு ஈடுபடுகின்றது. ஆனால், இலங்கையிலே சமாதானம் கிடையாது; முஸ்லிம்கள் அமைதியாக வாழ முடியாதுள்ளது; அவர்கள் வாழ்விடங்கள் மற்றும் பள்ளிவாசல்களை இழந்திருக் கிறார்கள்; அவர்களின் கடைகள் தீக்கிரையாகியுள்ளன; இந்த நிலையில் முஸ்லிம்கள் எதிர்காலமே இல்லாதவர்களாகப் பின்தள்ளப்பட்டிருக்கின்றார்கள். இந்த நிலைமை நீடிக்கக்கூடாது!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා**
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
Sir, please give me one more minute.

இந்த நிலைமையை அவசரமாக நீக்கிவிட வேண்டும். கௌரவ பிரதம மந்திரி அவர்கள் சட்டமும் ஒழுங்கும் அமைச்சைப் பொறுப்பேற்றதன் பின்புதான் இந்தப் பிரச்சினை விஸ்வரூபம் எடுத்திருக்கின்றது. எனவே, குறித்த செயற்பாடுகள் உடனடியாக நிறுத்தப்பட வேண்டும். காடையர்களும் இனவாதிகளும் சட்டத்தையும் ஒழுங்கையும் கையிலெடுத்து இந்த நாட்டிலே அமைதியை இல்லாமற்செய்வதற்கு மேற்கொள்கின்ற முயற்சியை ஒருகாலமும் அனுமதிக்க முடியாது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டிலுள்ள முஸ்லிம்கள் சம அந்தஸ்துடைய பிரஜைகளாகவும் நிம்மதியாகவும் வாழ்வதற்கு வழிசெய்ய வேண்டும்; அவர்களுடைய வாழ்வுரிமையை உறுதிப்படுத்த வேண்டும் என்று நான் இந்த உயரிய சபையிலே வேண்டிக்கொள்கிறேன். பள்ளிவாசல் என்பது சமாதானத் தையும் சௌஜன்யத்தையும் போதிக்கின்ற மற்றும் தொழுகையை நிறைவேற்றுகின்ற ஓர் இடமாகக் காணப்படுகின்றது. ஆனாலும், இன்று பல்வேறு பள்ளிவாசல்களும் சுக்குநூறாக்கப்பட்டுத் தீக்கிரையாக் கப்படுகின்றன. ஆகவே, இந்த நிலைமையை மாற்றியமைக்கின்ற தீர்மானத்தை, அவசரமாக மேற்கொள்ள வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன். அதிகாரத்தையும் சட்டத்தையும் ஒழுங்கையும் தங்களுடைய கைகளிலே எடுத்துக்கொண்டு இந்தப் பிரச்சினைகளுக்கு முகம் கொடுக்கவேண்டும் என்று பாதிக்கப்பட்ட மக்களும் நினைப்பார்களேயானால், நிலைமை படுமோசமாகிவிடும் என நான் எச்சரிக்கின்றேன். ஆகவே, இந்த நாட்டில் அதிகாரத்திலுள்ள எல்லோரும் சமாதானம், அமைதி நிலவும் வகையில் நடவடிக்கை எடுப்பதற்கு முன்வரவேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

இந்த வன்செயல்களில் ஈடுபடுவதற்கு நாடு பூராவுமுள்ள காடையர்கள் சேர்க்கப்பட்டிருக்கின்றார்கள். இன்று எல்லாப் பிரதேசங்களிலுமுள்ள காடையர்களும் வன்முறையை விரும்புகின்றவர்களும் இந்தப் பிரச்சினையின் பின்னால் நிறுத்தப்பட்டிருக்கின்றார்கள். ஆனால், பௌத்த பெரும்பான்மை மக்கள் சமாதானத்தை விரும்புகின்ற நல்லவர்களாக இருக்கின்றார்கள். இந்த நிலையில் சட்டம், ஒழுங்கு அமைச்சுக்குப் பொறுப்பான கௌரவ பிரதம மந்திரி அவர்கள் தன்னுடைய கடமையைச் சரியாகச் செய்ய முடியாதுபோனால், குறித்த அமைச்சுப் பதவியிலிருந்து விலகிவிடவேண்டும் என்று இறுதியாகக் கூறி, விடைபெறுகின்றேன். வாய்ப்புக்கு நன்றி.

[අ.භා. 5.12]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன இராஜாங்க அமைச்சர்)
The Hon. Palitha Range Bandara - State Minister of Irrigation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කෙටි වේලාවක් හෝ ලබා දීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මේ රටේ පසුගිය කාලපරිච්ඡේදයේදී -මීට අවුරුදු තුනහමාරකට, හතරකට ඉස්සෙල්ලා- පුද්ගලයින් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් ගැන අපට දිගින් දිගටම අසන්නට ලැබුණා; දකින්නට ලැබුණා. එය ඉතාමත්ම අප්‍රසන්න තත්ත්වයක්. අද ඒ තත්ත්වයෙන් මිදිලා, ඒ තත්ත්වය වෙනස් කර ගැනීමට නව රජයට පුළුවන්කමක් ලැබිලා තිබෙනවා. දණ්ඩ නීති සංග්‍රහයේ 351, 352 වගන්තිවලින් "අපහරණය" සහ "පැහැරගෙන යාම" පිළිබඳව දණ්ඩ නීති සංග්‍රහය නිර්මාණය කරන යුගයේදීම අපරාධයක් විධියට හඳුන්වා දී තිබෙනවා. ඒ වාගේම 356 වන වගන්තිය යටතේ "අපහරණය" සහ "පැහැරගෙන යාම" කියන වරද සම්බන්ධයෙන් දඬුවම් නියම කරන්නත් කටයුතු කර තිබෙනවා. ලැබෙන දඬුවම එකින් එකට වෙනස්. ඒ කියන්නේ, ඝාතනය කිරීම, තොරතුරු ලබා ගැනීම, එහෙම නැත්නම් රඳවා තබා ගැනීම, දේපළ ලබා ගැනීම වාගේ අරමුණු හේතු කරගෙන පැහැර ගැනීම් සිදු කරනවා නම්, ඒ සඳහා ලැබෙන දඬුවමේ එක් එක් වෙනස්කම් තිබුණා. නමුත්, අද මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතෙන් "අතුරුදහන් කිරීම" සහ "පැහැරගෙන යාම" සඳහා නිශ්චිත දඬුවමක්, ඒ වාගේම මහාධිකරණයේ අධි චෝදනා පත්‍රයක් යටතේ විභාග කරන තත්ත්වයක් ඇති කරලා තිබීම අනාගතයේදීත් මේ අතුරුදහන් කිරීම්වලට වැට බැඳීමට හොඳ අවස්ථාවක් කියන එක සිහිපත් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ උද්ගත වෙලා තිබෙන කලහකාරී තත්ත්වය පිළිබඳවත් වචන කීපයක් මේ කෙටි කාලය තුළ කථා කරන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. සිංහල වේවා, ද්‍රවිඩ වේවා, මුස්ලිම් වේවා මේ ඕනෑම භාෂාවක් කථා කරන ඕනෑම ජාතියක් -මේ සියලුදෙනාම- ශ්‍රී ලාංකික ජනතාව. මේ ශ්‍රී ලාංකීය ජනතාව එකට එක්කාසු වෙලා ජීවත් විය යුතුයි. නමුත්, අතළොස්සක් දෙනා මේ සංහිඳියාවට බාධා කරමින් තැන් තැන්වල මිනිසුන්ට හිරිහැර කරමින්, දේපළ විනාශ කරමින්

වැඩකටයුතු කරන්නට පියවර ගන්නවා නම්, එය මර්දනය කිරීම අප රජයේ වග කීමක් විධියටත් මම දකිනවා. අතුරුදහන් වූ මිනිසුන් පිළිබඳව සොයා බලනවා වාගේම, මිනිසුන් ජීවත් කරවීමේ වගකීමද අප සතුව තිබෙනවාය කියන කාරණය සිහිපත් කරන්නට ඕනෑ. අන්තර්ජාලය, social media තුළින් දිගින් දිගටම මේ රටේ ජනතාව කුපිත කරවන්නට කටයුතු කළා. අන්තර්ජාල අපරාධ සම්බන්ධව පොලිස් දෙපාර්තමේන්තුවේ වෙනම අංශයක් පිහිටුවා තිබෙනවා. එම අංශයට පුළුවන්කම තිබෙන්න ඕනෑ, ජනතාව කුපිත කරවන අන්දමෙන් ප්‍රකාශ නිකුත් කරන, එවැනි ක්‍රියා කරන උදවිය සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ ක්‍රියා කරන්න. වෙනත් නීතිවලට යන්න ඉස්සෙල්ලා අපට එතැනින් පටන් ගැනීමට හැකියාව තිබෙනවා. එම ක්‍රියාදාමය කළා නම්, මිනිසුන් කුපිත කරවීම හා පෙලඹවීම වාගේ දේවල් කරන එක මර්දනය කරන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ බුද්ධි අංශ ගණනාවක් තිබෙනවා. ඒ බුද්ධි අංශවලට කාර්ය භාරය තමයි, රජයට විරුද්ධව සහ රටේ සාමය කඩවන ආකාරයෙන් ක්‍රියාත්මක වන දේවල් පිළිබඳව තොරතුරු ඒක රාශී කිරීම සහ පාලකයන්ට දැනුම් දීම. බුද්ධි අංශවලින් එම කාර්යය සිදු වුණාද? මාස ගණනාවක්, අවුරුදු ගණනාවක් තිස්සේ මේ කෙරුණු පෙළගැස්ම පිළිබඳව සොයා බැලුවාද? එහෙම සොයා බැලුවේ නැද්ද? සොයා බැලුවේ නැත්නම්, වාර්තා කළේ නැත්නම් ඒ උදවිය සම්බන්ධව ගත යුතු ක්‍රියා මාර්ගය මොකක්ද? මෙන්න මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම  රජයක් වශයෙන් අපේ වගකීමක් කියලා මම කියන්නට ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 89වැනි වගන්තියේ ඉඳලා -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න. ඉක්මනින් මගේ කථාව අවසන් කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 89 වන වගන්තියේ සිට 96 වන  වගන්තිය දක්වා වගන්තිවල ඇතුළත් කර තිබෙන්නේ දේපළ සහ ජීවිත ආරක්ෂා කිරීම සඳහා පුද්ගලික ආරක්ෂාවේ අයිතිය පිළිබඳවයි. මෙම පුද්ගලික ආරක්ෂාවේ අයිතිය පදනම් කරගෙන තමයි වෙඩි තැබීමේ නියෝග සකස් කරලා තිබෙන්නේ. "මැණික්හින්නේදී කලහකාරීන් කණ්ඩායමක් මර්දනය කිරීම සඳහා අහසට වෙඩි තිබ්බා." කියලා ඊයේ මාධ්‍යවල පළ වෙලා තිබුණා මම දැක්කා. මේ කලහකාරි සිද්ධිය සිදු කරන්නට ආවේ, මේ අපරාධ කරන්නට ආවේ උඩින් යන කුරුල්ලන් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පයින් බිමින් එන මිනිසුන්. එහෙම නම් මෙතැනදී කුරුල්ලන්ට වෙඩි තියලා වැඩක් නැහැ. එහෙම නම් වෙඩි තැබිය යුත්තේ මේ කලහකාරි දේවල් කරන්න එන, අපරාධ කරන්න එන උදවියටයි. දණ්ඩ නීති සංග්‍රහයේ 89වැනි වගන්තියේ සිට 96වැනි වගන්තිය දක්වා තිබෙන පුද්ගලික ආරක්ෂාවේ අයිතිය අදාළ තමන්ගේ ජීවිතත්, තමන්ගේ  දේපළත්, අනුන්ගේ ජීවිතත්, අනුන්ගේ දේපළත් ආරක්ෂා කිරීමටයි. ඒ සඳහා දණ්ඩ නීති සංග්‍රහය ආශ්‍රයෙන් සකස් කර තිබෙන වෙඩි තැබීමේ නියෝග ක්‍රියාත්මක කිරීමට පොලිසිය බැඳී සිටිනවා. පොලිසියේ නිලධාරීන් දණ්ඩ නීති සංග්‍රහයේ 89වැනි වගන්තියේ සිට 96වැනි වගන්තිත්, වෙඩි තැබීමේ නියෝගත් දන්නේ නැති නිසා තමයි කුරුල්ලන් එළවන්න උඩට වෙඩි තියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එසේ නොකළ යුතුයි. මෙම තත්ත්වය මර්දනය කළ යුතුයි. එහෙම නම් දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කරන්න නොදන්නා පොලිස් නිලධාරීන්ට එය ඉගැන්වීමත්, දන්නා නිලධාරීන් දණ්ඩ නීති සංග්‍රහය අනුව සහ වෙඩි තැබීමේ නියෝග අනුව ක්‍රියා කිරීමත් අත්‍යවශ්‍යයි කියන කරුණ මම සඳහන් කරන්න කැමැතියි.

මම තව එක කරුණක් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙම තත්ත්වය මර්දනය කිරීමට යම් කෙනෙකුට බැරි නම් සති දෙකකට පොලිසිය මට භාර දෙන්න, සති දෙකක් ගතවීමට පෙර  නීතියට අනුව මෙම තත්ත්වය මර්දනය කරන හැටි මම කරලා පෙන්වන්නම්. මෙවැනි දේවල් කරන්න දෙන්නේ නැතිව ජනතා දේපළත්, ජනතා ජීවිතත් ආරක්ෂා කරවන හැටි, පොලිසිය ක්‍රියාත්මක කරවන හැටි සතියක් ඇතුළත මම කරලා පෙන්වන්නම් කියන කාරණය සඳහන් කරමින් ඔබතුමාට ස්තුති කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු එස්. ශ්‍රීතරන් මහතා.

[பி.ப. 5.17]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டிலே வலுக்கட்டாயமாகக் காணாமலாக்கப்பட்டவர்கள் சம்பந்தமான விடயங்களை வெளியிலே கொண்டுவருவதற் கான சர்வதேச சமவாயச் சட்டமூலம் இந்தச் சபையிலே சமர்ப்பிக்கப்பட்டதையிட்டு முதலிலே நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அதேநேரம் இதனைக் கொண்டுவருவதற்குக் கிட்டத்தட்ட இரண்டரை வருடங்கள் எடுத்திருக்கிறது என்பது மிகவும் கவலைக்குரியது. இந்த நாட்டிலே அதிகமானோர் வலுக்கட்டாயமாகக் காணாமலாக்கப்பட்டார்கள். குறிப்பாக, வடக்கு, கிழக்குவாழ் தமிழர்கள் 1983ஆம் ஆண்டுக்குப் பின்னர் தமக்கு நடந்த அநீதிகளுக்கு எதிராக மனித நேயத்தோடும் ஜனநாயக முறைப்படியும் முன்னெடுத்த போராட்டங்கள் எல்லாம் ஆயுத முனையில் அடக்கப்பட்டன; அந்த மக்கள் ஆயுத ரீதியாகத் தாக்கப்பட்டனர்; அந்தநேரத்தில்தான் அவர்கள் துப்பாக்கிகளைப் பற்றிச் சிந்திக்கவேண்டிய நிலைமை ஏற்பட்டது. அந்த நிலைமையை அரசுதான் அவர்கள்மீது திணித்தது. அதன் பின்னர் நீண்ட பெரும் போராட்டத்துக்கு மத்தியில் 2009ஆம் ஆண்டிலே பல்லாயிரக்கணக்கான மக்கள் கொன்றொழிக்கப்பட்டார்கள்; ஆயிரக்கணக்கானவர்கள் காணாமல் போனார்கள். இந்த நாட்டிலே இதனை விசாரிப்பதற்காகப் பல்வேறுபட்ட ஆணைக்குழுக்களை அரசாங்கம் நியமித்தது. குறிப்பாக தமிழர்கள் மீதான ஓர் இனப்படுகொலையை மேற்கொண்ட மஹிந்த ராஜபக்ஷவும் அவருடைய சகோதரர் கோத்தாபய ராஜபக்ஷவும் இந்த நாட்டிலே செய்த அதிபயங்கரமான யுத்தம் மற்றும் கொடூரமான கொலைகளினால் பல்வேறுபட்டவர் களும் காணாமலாக்கப்பட்டார்கள்.

மக்கள் முள்ளிவாய்க்காலிலிருந்து வவுனியாவுக்கு வந்தபோது, “நீங்கள் சரணடையுங்கள்! உங்களை விடுவிக்கிறோம்!" என ஒலிபெருக்கிமூலம் அறிவிக்கப்

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

பட்டபோது, இராணுவத்திடம் நேரடியாக ஒப்படைக்கப்பட்ட பலருடைய நிலைமை இன்றும் கேள்விக்குறியாகவே காணப் படுகின்றது. இந்த விடயங்கள் பற்றிக் கண்டறிவதற்குத்தான் அப்போதைய மஹிந்த ராஜபக்ஷ அரசாங்கம் முதன்முதலில் நல்லிணக்க ஆணைக்குழுவை - LLRCஐ நியமித்தது. இருந்தபோதிலும் அந்த மக்கள் நல்லிணக்க ஆணைக்குழு முன் சென்று சுதந்திரமாகத் தங்களுடைய வாக்குமூலங்களை அளிக்க முடியாதவாறு, அந்த நேரத்தில் இராணுவப் புலனாய்வாளர்களும் பொலிஸ் புலனாய்வாளர்களும் இலங்கையிலுள்ள ஏனைய புலனாய்வாளர்களும் தெருக்களிலே வைத்து அந்த மக்களைத் தடுத்தார்கள். அதாவது, குறித்த ஓர் இடத்திலே வாக்குமூலம் பெறப்படுகின்றது என்றால், இன்னோர் இடத்தில் கொட்டகைகள் அமைத்து "இங்கேதான் வாக்குமூலம் பெறப்படுகின்றது" என்று அந்த மக்களிடம் கூறி, அவர்களை அங்கு செல்லவிடாது தடுக்கப்பட்டதன்மூலம் அவர்களின் வாக்குமூலங்கள் வேறு திசைகளில் சிதறடிக்கப்பட்டன. இவ்வாறான நிலைமையிலும் நல்லிணக்க ஆணைக்குழுவின் நீதிபதிகள் கொடுத்த அறிக்கையில் குறிப்பிடப்பட்டிருந்த 200க்கும் மேற்பட்ட விடயங்களில் நான்கு விடயங்கள் முக்கியமானவையாக இருக்கின்றன. அதாவது, இந்த நாட்டிலே இனரீதியான யுத்தம் நடந்திருக்கிறது; அந்த யுத்தத்தின் காரணமாக இந்த மக்கள் கொன்றொழிக் கப்பட்டிருக்கின்றார்கள்; அவர்களுக்கு நீதியான விசாரணை வேண்டும்; அதேநேரம், இந்த நாட்டிலே இருக்கின்ற இனப்பிரச்சினை தீர்க்கப்பட வேண்டும்; இந்த நாட்டிலே நடந்திருக்கின்ற பிரச்சினைகளுக்கான தீர்வைச் சரியான முறையில் அணுக வேண்டும் என்றெல்லாம் கூறப்பட்டுள்ளது. ஆனால், இந்த விடயங்களைக்கூட அரசாங்கம் கிஞ்சித்தும் தன்னுடைய கவனத்திலே எடுக்கவில்லை. பின்னர் மேலும் ஏமாற்றுவதற்காக முன்னாள் நீதிபதி மக்ஸ்வெல் பரணகம தலைமையிலே ஜனாதிபதி ஆணைக்குழுவை உருவாக்கியது. ஆனால், இந்த ஜனாதிபதி ஆணைக்குழுவானது மக்களிடம் விசாரணை செய்த நேரத்தில், "உங்களுக்கு ஆடு தரவா? கோழி தரவா?" என்று இழக்காரமான முறையில் கேட்டதே தவிர, சரியான முறையில் நீதியைத் தரவில்லை.

இவற்றையெல்லாம் கடந்து 2011- 2015 வரையில் ஜெனீவாவில் இடம்பெற்ற ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையின் கூட்டத்தொடரில் எடுக்கப்பட்ட தீர்மானங்களுக் கமைவாக, 2015ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் ஜெனீவாப் பிரகடனத்தின் 30(1)இன் கீழுள்ள சகல விடயங்களையும் இலங்கை ஏற்றுக்கொண்டது. அப்பொழுது வெளிநாட்டமைச் சராக இருந்த கௌரவ மங்கள சமரவீர அவர்கள் "காணாமற்போனோர் தொடர்பில் காரியாலயம் அமைக் கின்றோம்; அவர்கள் தொடர்பில் உடனடித் தீர்வைக் கொண்டுவருகின்றோம்; அவர்களைக் கண்டுபிடித்து உறவினர்களிடம் ஒப்படைக்கின்றோம்; நீதியை வழங்குகின்றோம்" என்று கூறினார். ஆனால், இரண்டரை வருடங்கள் கடந்தும் இதுவரை அந்த நீதி நிலைநாட்டப்படவில்லை. இந்த நிலையில் இன்றைய நாளில் இந்தச் சட்டமூலம் விவாதிக்கப்படுகின்றது. அதற்கான ஆணையாளர்கள் நியமிக்கப்பட்டிருக்கின்றார்கள். இந்த நிலையில் எங்கே குறித்த அலுவலகம் அமையும்? கொழும்பிலே அமைந்தால், வடக்கிலும் கிழக்கிலும் இருக்கின்றவர்கள் எவ்வாறு கொழும்புக்கு வந்து உரிய சாட்சியங்களையும் மற்றும் விடயங்களையும் முன்வைப் பார்கள்? எனவே, வடக்கிலும் கிழக்கிலும் காணாமற்போனோர் பற்றிய அலுவலகங்கள் குறைந்தது நான்கையேனும் நிறுவி, அங்கு அந்த மக்கள் யாருடைய இடைஞ்சலும் இல்லாமல் குறிப்பாக புலனாய்வுத் துறையினருடைய இடைஞ்சல்கள் இல்லாமல், சர்வதேச மேற்பார்வையோடு சுதந்திரமாகத் தங்களுடைய சாட்சியங்களை அளிப்பதற்கு வழிசெய்ய வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இதிலே சர்வதேசத்தினுடைய கவனிப்பு மிகமிக முக்கியம். குறிப்பாக, அமெரிக்கா கூடிய கரிசனையைச் செலுத்த வேண்டும்; பிரித்தானியா அதன் கரிசனையைக் காட்ட வேண்டும்; இந்தியா தன்னுடைய பங்களிப்பை வழங்க வேண்டும். அதாவது, இந்த விடயத்திலே வெளிப்படையான விசாரணை நடைபெறுவதற்கு ஐரோப்பிய நாடுகள் உதவ வேண்டும். Fire zone என்று சொல்லப்படுகின்ற இடத்திலிருந்து போர் நிறுத்தம் செய்யப்பட்ட வலயங் களுக்குள் செல்லுமாறு மக்களிடம் கூறப்பட்டதன் பின்னர் அங்கு கொல்லப்பட்ட மக்களுக்கு மற்றும் காணாமல் ஆக்கப்பட்டவர்களுக்கு நீதி கிடைப்பதற்கு வழி செய்ய வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Your time is over.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
தங்களுடைய பிள்ளைகளை ஒப்படைத்த பெற்றோர், கணவனை ஒப்படைத்த மனைவிமார், தங்களுடைய தாய், தந்தையரை ஒப்படைத்த பிள்ளைகள் தொடர்ந்தும் போராடிக் கொண்டிருக்கின்றார்கள். அந்தப் போராட்டத்திற்கு ஒரு வருடம் முடிந்திருக்கின்றது. ஆனால், இந்த நாட்டிலே யாருடைய கண்ணுக்கும் அவர்களின் நிலைமை தெரியாதிருப்பது நியாயமல்ல. அவர்களுக்கு அதற்கான நீதி இன்னமும் கிடைக்காமையால் தொடர்ந்தும் போராடிக் கொண்டிருக்கின்றார்கள். ஆகவே, இவர்களுக்கு நீதி கிடைக்க வேண்டுமானால் சர்வதேசத்தினுடைய மேற்பார்வையின்கீழ், சர்வதேச சமூகத்தினுடைய பிரசன்னத்தோடு இந்த விடயம் விசாரிக்கப்பட்டு நியாயம் வழங்கப்பட வேண்டுமென்று நான் குறிப்பிடுகின்றேன். ஐரோப்பிய நாடுகள் மற்றும் அமெரிக்கா இந்த விடயங்களிலே மென்மேலும் - கூடுதலாகத் தங்களுடைய கரிசனையைக் காட்டவேண்டும் என்பதைத்தான் நாங்கள் வலியுறுத்துகின்றோம். மிக முக்கியமாக, இவ்வாறு காணாமற்போனவர்களுடைய குடும்பங்களுக்கு நீதி கிடைக்க வேண்டும். குறிப்பாக Father Francis அவர்களுடைய தலைமையிலே 48 இற்கும் மேற்பட்டவர்கள் சரணடைந் திருந்தார்கள். அவர்களைக் கொண்டுசென்ற வாகனம் எங்கே? அவர்கள் எங்கே?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please wind up now.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
விடுதலைப் புலிகளினுடைய மூத்த உறுப்பினர் பாலகுமாரனுடைய மகன் கட்டுப்பாட்டுப் பகுதிக்குள் வந்ததற் கான சான்றுகள் இருக்கின்றன. அந்த அடையாளங்களை Lanka Guardian பத்திரிகை வெளியிட்டது, BBC செய்தியாளர்

பிரான்சிஸ் ஹரிசன் தன்னுடைய twitter இலே வெளியிட்டிருந்தார். இவையெல்லாம் நடந்தும்கூட இந்த நாட்டிலே நீதி கிடைக்கவில்லை. சரணடைந்த புலித்தேவனும் அவரோடு சென்ற அரசியல் பொறுப்பாளர் நடேசனும் கொல்லப்பட்டார்கள். இவ்வாறாக மிகுந்த அநியாயங்கள் இந்த நாட்டிலே நடந்தன. மிகக் கொடூரமாக நடந்த அந்த யுத்தத்திலே அந்த மக்கள்மீது யுத்தக் குற்றங்கள் புரியப்பட்டன. மன்னார் ஆயர் இராயப்பு ஜோசப் அவர்கள் குறிப்பிட்டதுபோல 2009ஆம் ஆண்டிலே 1,40,000க்கும் மேற்பட்டவர்கள் கொல்லப்பட்டும் காணாமற்போயும் இருக்கின்றார்கள். எனவே, அரசாங்கம் 2015ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் சர்வதேசச் சட்ட வல்லுநர்களின் - நீதியாளர்களின் உதவிகளை ஏற்றுக்கொள்வதாகக் கூறியதன் பிரகாரம், இதனை விசாரித்து அந்த மக்களுக்கு நீதியை வழங்கவேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.25]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයේදී වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව දීම ගැන බොහොම ස්තුතියි. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය පනත් කෙටුම්පත ගැන අද කරීක මන්ත්‍රීවරුන් විශාල පිරිසක් අදහස් දැක්වූවා. ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය ගැනත් කථා කළ යුතුව තිබෙනවා. මහජන නියෝජිතයන් හැටියට අප මේ වාගේ චර්යා ධර්ම සංග්‍රහයකින් බැඳෙනවාට වැඩිය ආකල්පමය වශයෙන් චර්යා ධර්ම අපේ හදවත් තුළ තිබෙනවා නම් වඩා වැදගත් කියලා මම හිතනවා.

මෑත වකවානුව තුළ නිරන්තරයෙන්ම රට ගිනි තියන, ගිනි අවුළන තත්ත්වයක් අපි දකිනවා. නිරන්තරයෙන්ම අපට ඇවිළෙන්නට බලපාන කාරණා ඇති කරනවා. සමහර දේශපාලන බලවේග තමන්ට දේශපාලන බලය ලබා ගැනීම සඳහා ජාතිය අවුළවනවා; ආගම් භේද වපුරනවා; භාෂා භේදයන්, ජාති, කුල මල භේද ඇති කරනවා. මේවා තුළින් අපේ ජනතාව අවුස්සලා යම්කිසි වාසි, වරප්‍රසාද ලබා ගන්න සිංහල හෝ දෙමළ හෝ මුස්ලිම් හෝ කුමන හෝ තරාතිරමක දේශපාලනඥයෙකු උත්සාහ කරනවා නම්, ඒක චර්යා ධර්මවලට පටහැනි කාරණාවක් වෙනවා. ඒවා කවුරු කළත් වැරදියි. සමහරු දකින විධියට සිංහල මන්ත්‍රීවරුන්ට ජාතිවාදය අවුස්සන ප්‍රකාශ කිරීම හොඳ නැහැ; නමුත්, දෙමළ සහ මුස්ලිම් අය ඒක කරන විට ඒක හොඳයි. මුස්ලිම් අය ජාතිවාදය වපුරුවනවා නම් ඒකත් නරකයි, දෙමළ අය ජාතිවාදය වපුරුවනවා නම් ඒකත් නරකයි.

විශේෂයෙන් අපට කියන්නට තිබෙන කාරණය මෙයයි. ලෝකය තුළ අපි තවමත් බඩගාන දුප්පත් රටක් බවට පත් වීමට බලපා තිබෙන ප්‍රධාන කාරණය අපි තුළ තිබෙන ජාතික අසමගියයි. අපි තවමත් අපේ තිබෙන පරණ අවි ආයුධ ටික තමයි කරේ තියාගෙන යන්නේ. ජාතිය, කුලය, ආගම කියන භේද ටික අරගෙන තමයි අපි හැමදාම අපේ වංශය කබල් ගාන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකවත්ම නැති මිනිස්සු තමයි හැම තිස්සේම වංශය කබල් ගාන්නේ. හිතන්නට බොහෝ දේවල්, කරන්නට බොහෝ දේවල් තිබෙන, ශක්තියක් තිබෙන උසස් මිනිස්සු, පරිණාමයෙන් උසස් තත්ත්වයකට පත් වුණු මිනිසුන්ට ජාතිය, ආගම, කුලය, භාෂාව, වර්ගවාදයන්, ගෝත්‍රිකවාදයන් වැදගත් වෙන්නේ නැහැ.

අපි යුද්ධයක් නිසා අවුරුදු තිහක් බැට කෑවා. ඒ තුළින් අපේ දේපොළ විනාශ වුණා; අපේ ජීවිත විනාශ වුණා; සම්පත් විනාශ වුණා; රටේ ආර්ථිකය බිඳ වැටුණා; අපේ රට ගිනි ගෙන දැවුණා. ලෝකය තුළ, ජාත්‍යන්තරය තුළ අපි කොන් වුණා. විශාල වශයෙන් අපේ රට අගාධයකට ගියා. සමහරු මේවාට පිදුරු දැම්මා, සමහරු මේවාට වතුර දැම්මා. දෙමළ ජනතාව මැරෙද්දී අපේ ජනතාව ඔල්වරසන් හඬ නැඟුවා. අපේ සිංහල ජනතාව මැරෙද්දී දෙමළ ජනතාව ඔල්වරසන් හඬ නැඟුවා. නමුත් දෙපැත්තේම මැරෙන්නේ කාගේ කාගේත් දරුවෝ; අපේ රටේ සංවර්ධනය, අපේ රටේ අනාගතය භාර ගන්න ඉන්න ප්‍රජාව කියන එක අපි අමතක කරන්නට හොඳ නැහැ. අද මේ සිද්ධ වෙන්නේ මොකක්ද? අද සිද්ධ වෙන්නෙත් ඒ දේමයි. එදා අපි දෙමළ ජන වර්ගය සමඟ රණ්ඩු වුණා. අද අපි නිරායාසයෙන්ම මුස්ලිම් ජාතිකයන් සමඟ ගැටුමකට ඇදී යමින් සිටිනවා. මේ වැරැද්ද කොහෙන් පටන් ගත්තාද කියන කාරණය සොයනවාට වැඩිය වැරැද්ද ඇති වෙච්ච සැණින්ම සිංහල, දෙමළ, මුස්ලිම් හැම කෙනෙකුටම මේ වැරැද්ද වහන්නට, මේ වැරැද්ද මෙතැනින් පසුව නවත්වන්නට පුළුවන් නම් මම හිතන විධියට අපි ඒක රටට කරන විශාල සේවයක්.

ගිනි ගෙන දැවෙන දේපොළ ගැන facebook එකේ සමහර posts දාලා තිබෙන අන්දම අපි දකිනවා. "කොහොමද අපේ ගැම්ම බ්‍රෝ" කියලා සඳහන් කර තිබෙනවා, මම ඊයේ දැක්කා. එහෙම තමයි දමන්නේ. මේ ගිනි ගෙන දැවෙන්නේ අපේ රටේ සම්පත්; අපේ රටේ දේපොළ, වස්තුව. එක තැනක එක ජනවර්ගයක දෙයක් ගිනි ගන්නකොට, හෙට තව දේවල් ගිනි ගනීවි. දෙමළ ත්‍රස්තවාදී යුද්ධය නිසා අපි ලබපු අත්දැකීම් තිබෙනවා. එයින් මේ රට අවුල් ජාලයක් බවට පත් වුණා. එක ගිනි කූරකින් සමහර විට කඩයක් දෙකක් ගිනි ගනීවි. හැබැයි, කඩයක් දෙකක් ගිනි ගන්නකොට ඒ ගිනි ජාලාවලින් රටක් ගිනි ගනීවි. එම නිසා මේවා ලඝු කර සලකන්නට එපා කියන කරුණ මේ අවස්ථාවේදී අපි කාටත් කියන්න අවශ්‍යයි.

මනුෂ්‍ය ඝාතනය කියන එක කවුරු කළත් වැරදියි. සිංහල කවුරු හෝ මැරුණොත් ජාතියක් හැටියට අපි කම්පා වෙනවා. ඒ මරණකරුගේ භාර්යාව, සමීප ඥාතීන්, දරුවන් යන සියල්ලන්ටම ඒ වේදනාව දැනෙනවා. දෙමළ, මුස්ලිම් කුමන ජාතියක කෙනෙකු මැරුණත් ඒ වේදනාව ඒ අයටත් සාපේක්ෂයි.

මේ අලුත් ගැටුම තුළ මේ වන විට ජීවිත ගණනාවක් විනාශ වෙලා තිබෙනවා. මම කියන්නේ මේ පාර්ලිමේන්තුවේ සිටින සිංහල-දෙමළ-මුස්ලිම්, පක්ෂ-විපක්ෂ අපි සියලුදෙනා එකතු වෙලා අද ඇවිළෙමින්, හිස ඔසවමින් පවතින ගින්න නිවන්න උත්සාහ කරමු කියලායි. අපි මේවාට පිදුරු දමන්න අවශ්‍ය වෙන්නේ නැහැ කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් කියනවා. ජාතිය ගැන කථා කරනකොට ඒක බොහොම ආවේගශීලීයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තත්පර 30ක කාලයක් ලබා දෙන්න.

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

ආගම ගැන කථා කරනකොට, ඒක බොහොම ආවේගශීලීයි. තරහා යන්නේ නැති මිනිසකුට වුණත් තමන්ගේ අම්මා ගැන, තමන්ගේ තාත්තා ගැන කියනකොට ඇඟේ රෝම කූප කෙළින් වෙලා බොහොම ආවේගශීලී වෙනවා. ජාතිය ගැන, ආගම ගැන, කුලය ගැන කථා කරනකොට මිනිසුන් නිරන්තරයෙන් ආවේගශීලී වෙනවා. මේ රටේ සමස්ත ජනතාව නියෝජනය කරමින් මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ සිටින සිංහල, දෙමළ, මුස්ලිම් විවිධ පක්ෂවල ගෞරවනීය මැති ඇමතිතුමන්ලා සියලුදෙනාමත්, මේ රටේ ඇවිළෙමින් තිබෙන ගින්දර නිවන්න එකතු වෙමු; මේ අවස්ථාවේ බුද්ධිමත්ව කටයුතු කරමු කියා ඉල්ලා සිටිමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා.

[பி.ப. 5.32]

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்படுதலிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் பற்றிய சர்வதேச சமவாயச் சட்டமூலம் சம்பந்தமான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி கூறுகின்றேன். வலுக்கட்டாயமாக காணாமற்செய்யப்படுவதென்பது உண்மையில் கொலை செய்வதைவிடக் கொடுமையானது. கொலை செய்தால் அந்த விநாடியுடன் அந்த விடயம் முற்றுப்பெற்றுவிடும். ஆனால், வலுக்கட்டாயமாகக் காணாமற்செய்யப்பட்டால் பாதிக்கப்பட்டவர் சார்ந்த குடும்பத்துக்கு வாழ்நாள் முழுவதும் துயரம் நிறைந்ததாகவே இருக்கும். அவ்வாறானவர் உயிருடன் உள்ளாரா அல்லது இறந்து விட்டாரா? என அறியாது உறவினர்கள் படும் வேதனைகள் மட்டிட முடியாதவை. கடந்த காலங்களில் வலுக்கட்டாயமாகக் காணாமற்செய்யப்பட்டமை மிகக் கொடூரமான விடயமாகும். அதிலும் அரச படைகளால் மேற்கொள்ளப்பட்ட சம்பவங்களே அதிகமென அடித்துக்கூறலாம். வலுக்கட்டாயமாகக் காணாமற்செய்யப்படுவதில் அதிகம் பாதிக்கப்பட்டது தமிழினமாகும். அடுத்தபடியாக தமிழ், சிங்கள ஊடகவியலாளர்களைக் குறிப்பிடலாம்.

இறுதி யுத்தத்தின்போது வைத்தியசாலைகளில் சிகிச்சை பெறுவதற்காக அனுமதிக்கப்பட்ட நோயாளிகளுக்கு என்ன நடைபெற்றது? அவர்களைக்கூடக் கடத்திச் சென்று காணாமலாக்கியிருக்கின்றார்கள். சம்பந்தப்பட்டவர்கள் வைத்தியசாலையில் இறந்திருந்தால் உண்மையில் குறித்த பதிவு அந்த வைத்தியசாலையில் இருக்க வேண்டும். அந்த நேரத்தில் வவுனியா, மன்னார் மற்றும் புல்மோட்டை வைத்தியசாலைகளில் காயப்பட்ட நோயாளிகளுக்குச் சிகிச்சை அளிக்கப்பட்டபோதிலும் குறித்த இறப்புக்கள் அங்கு ஒழுங்காகப் பதியப்பட்டிருக்கவில்லை. காரணம் என்ன? அந்த வைத்தியசாலைகளை இராணுவம் முழுமையாகத் தங்களுடைய கட்டுப்பாட்டுக்குள் வைத்திருந்தமையாகும். அதனால் அங்கிருந்த ஊழியர்கள் அந்த விடயங்களைச் சரியாகக் கவனிக்கமுடியவில்லை. எனவே, கடத்தப்பட்டவர்கள், தப்பியவர்கள் மற்றும் இறந்து தகனம் செய்யப்பட்டவர்களின் தகவல்களின்றி குடும்பத்தினர் தவித்துக்கொண்டிருக்கின்றார்கள். இது இலங்கையில் மிக மோசமான நிலையை உருவாக்கியிருக்கின்றது. அதுமட்டுமல்ல, தப்பி வந்த மக்களைப் பாதுகாப்புக்காகச் செட்டிகுளம் தடை முகாமுக்கு வருமாறு கூறிவிட்டு, இரவு நேரங்களில் அங்கிருந்து அவர்களைக் கடத்திச் சென்றிருக்கின்றார்கள். மேலும், அவர்கள் அந்த முகாமிலிருந்து இன்னொரு முகாமுக்கு மாற்றப்பட்டார்களா, இல்லையா? என்று தெரியாமல் அந்த மக்கள் தவித்தனர். இறுதியில் அவர்களின் விபரங்கள் காணாமல் போனோர் பட்டியலில் சேர்த்துக்கொள்ளப்பட்டன என்பதுதான் உண்மை.

இறுதி யுத்தம் முள்ளிவாய்க்கால் மண்ணில் கொடூர முகங்கொண்டு தோற்றம் பெற்றது. அப்பொழுது நிராயுதபாணிகளைச் சரணடையுமாறு கோரியது அரச இராணுவம்! வெளியேறிய மக்களுக்குப் பாதுகாப்புத் தருவதாக ஒலிபெருக்கிகள்மூலம் மூலைக்குமூலை பகிரங்க அறிவித்தல் கொடுத்தது கடந்தகால அரசாங்கம்! போராளிகளைச் சரணடையுமாறு கோரியதுடன் பாதுகாப்புத் தருவதாகவும் கூறியது. "சரணடையாதுவிட்டால் கைது செய்யப்படுவீர்கள்! கைது செய்யப்பட்டால் கடுமையான நடவடிக்கை எடுக்கப்படும்" என்றெல்லாம் ஒலிபெருக்கிமூலம் அறிவிக்கப்பட்டது. அரசியல்துறைப் பொறுப்பாளர் நடேசன் மற்றும் புலித்தேவன் உள்ளிட்ட பலர் வெள்ளைக்கொடியுடன் சரணடைந்தனர். அவர்கள் இருவரும் சித்திரவதையின் பின்னர் படுகொலை செய்யப்பட்டதற்கான ஆதாரங்கள் 'போட்டோ'க்களாக வெளிவந்தன. அதேபோல்தான் தமிழீழ விடுதலைப் புலிகளின் தலைவர் வேலுப்பிள்ளை பிரபாகரன் அவர்களின் மகனான சிறுவன் பாலச்சந்திரன்கூட சரணடைந்தபின் காணாமல் ஆக்கப்பட்டுள்ளான். அதற்கான 'வீடியோ' ஆதாரங்கள்கூட உள்ளன என்பது இந்த இடத்தில் கூறிவைக்க வேண்டிய விடயமாகும். அதுமட்டுமல்ல, ஏனைய போராளிகள் பலர் வலுக்கட்டாயமாகக் காணாமல் ஆக்கப்பட்டனர். வெள்ளைக் கொடியுடன் சரணடைந்த தமிழீழ விடுதலைப் புலிகள் 110 பேரின் விபரம் எரிக் சொல்ஹெய்ம் மற்றும் ஐ.நா. ஊடகப் பிரிவினூடாக வெளிப்படுத்தப்பட்டது என்பதை உங்களுக்குத் தெரியப்படுத்த விரும்புகின்றேன். அவர்களில் குறிப்பிட்ட சிலரைச் சொல்லலாம். அதாவது, மூத்த உறுப்பினர் பாலகுமாரன் மற்றும் அவரது மகன் சூரியதீபன் ஆகிய இருவரும் வட்டுவாகலில் ஒரு மரத்தின் கீழிருந்த நிலையில் படம் வெளிவந்திருந்தது. ஆனால், பின்னர் அவர்கள் காணாமற்போயிருந்தார்கள். எனவே, அந்தக் குடும்பம் எவ்வளவு கஷ்டப்படும் என்பது உங்களுக்குத் தெரிந்திருக்கும். சரணந்த நேரத்தில் அந்தக் குடும்பம் இரண்டாகப் பிரிந்தது. ஒரு தாதியாகக் கடமைபுரிந்த அவரின் மனைவியும் தனது அடுத்த பிள்ளையுடன் இராணுவத்தினரிடமேதான் சரணடைந்தார். இறுதியாக என்ன நடந்தது? இதற்குச் சாட்சிகள் இருக்கின்றன.

அடுத்து, பேச்சாளரான இளந்திரையன் காயமடைந்த ஒரு போராளியாவார். அவரது கைத்தாங்கல் தடியுடன் அவரை இராணுவத்தினரிடம் ஒப்படைத்தார் அவரது மனைவி. அவருக்கு என்ன நடந்தது? இன்றுவரை அவர் காணாமற்போனவராகத்தான் இருக்கின்றார். அவர்கள் மாத்திரமல்ல, பரா, எழிலன், யோகி, கரிகாலன், புதுவை இரத்தினதுரை எனப் பட்டியல் நீண்டுகொண்டே செல்கின்றது. பல்லாயிரம் பொதுமக்கள் முன் பகிரங்கமாக இராணுவத்திடம் சரணடைந்தவர்கள் எப்படிக் காணாமல்

போகமுடியும்? இதுவரை எந்த அரசாவது இதற்குப் பொறுப்புக் கூறியுள்ளதா? இல்லையே! அல்லது இராணுவமாவது பொறுப்பேற்றுக்கொண்டதா? இல்லையே! உண்மையைக் கண்டறியும் செயற்பாடாயினும் சரி, உருப்படியாக நிறைவேறியதா? அதுகூட நடைபெறவில்லை!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please now wind up.

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)
செல்வபுரத்தில் வைத்து சரணடைந்த மக்கள் எப்படிக் காணாமற்போக்கப்பட்டார்கள்? இன்று இந்த நாட்டிலுள்ள பௌத்த துறவிகள் துறவிகளாகவே இல்லை. அவர்கள் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

***අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. EDWARD GUNASEKARA *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon.Sivamohan, please wind up. Your time is almost over.

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)
Ok.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා.

[අ.භා. 5.38]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු කථානායකතුමනි, 2017 පෙබරවාරි 9 වන දින ගැසට් පත්‍රයේ පළ කරන ලද බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියට අදාළ විධිවිධාන සැලසීම පිණිස වූ පනත් කෙටුම්පත විවාදයට ගන්නා අවස්ථාවේදී කරුණු කීපයක් මේ ගරු සභාව හමුවේ තැබීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. 2015 ජනවාරි 8වැනි දා මේ රටේ යම් කිසි වෙනසක් ඇති කරන්නට ඕනෑය කියලා ජනතාව අපට ඡන්දය දුන් බව අපි දන්නවා. ගරු කථානායකතුමනි, අද ඒ වෙනස ගැන සමහරු කථා කරන දේවල් දිහා බැලුවාම පෙනෙනවා, ඒ බොහෝ අය හරියට නින්දෙන් අවදි වෙලා වාගේ කථා කරන බව. 2015 ජනවාරි 8වැනි දාට කලින් මේ රටේ තිබුණු යුගය පිළිබඳව මා අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු මානව හිමිකම් පිළිබඳව වූ ඒ සියලු ආයතන විසින් මේ රට කළු පැල්ලමක් තිබෙන රටක් හැටියට නම් කරලායි තිබුණේ. ජාත්‍යන්තර සම්මුතීන් සියල්ල උල්ලංඝනය කිරීම නිසා අපට ලෝකයට යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඇමෙරිකා එක්සත් ජනපදයට, ඕස්ට්‍රේලියාවට, කැනඩාවට, මහා බ්‍රිතාන්‍යයට අපි යනකොට එදා ලෝක ප්‍රජාව අපි කෙරෙහි දැක්වූ ආකල්පය මොකක්ද කියලා අපට මතකයි. අපි අපේ රට කොයි විධියට සංවර්ධනය කරන්න කටයුතු කළත්, මේ රටේ ආර්ථිකය නඟා සිටුවන්න කටයුතු කළත්, අපට තනියම ජීවත් වන්න පුළුවන්කමක් නැහැ, ගරු කථානායකතුමනි. සමහරු නම් හිතනවා, ලංකාව තුළ සිට අපි වෙන රටවල් ගැන හිතන්න ඕනෑ නැහැයි කියලා. අවස්ථානුකූලව අනික් හැම රටකින්ම වාගේ යම් යම් දේවල් මේ රටට අවශ්‍ය වනවා. අපි අනික් රටවලින් ඒ ආනයනයන් ලබන කොට ඒවා මේ රට විකුණන, එහෙම නැත්නම් මේ රටට අහිතකර, ඒ එක්කම මේ රට විදේශිකයන්ට ලියා දෙන තත්ත්වයක් තිබුණා කියලායි බොහෝදෙනෙකු හිතන්නේ. හැබැයි, ඒ නිසා මේ රටේ ඇති වූ ව්‍යසනය අවුරුදු 30ක් තුළ තිබුණු ත්‍රස්තවාදී යුද්ධයට වඩා බොහොම භයංකර වුණා. අපි යුද්ධය අවසන් කළා. හොඳයි, දැන් අපි රටක් හැටියට ඉස්සරහට යන්නේ කොහොමද? ඒ පිළිබඳව වර්තමාන රජය දිගින් දිගටම කටයුතු කළාය කියලා මා හිතනවා. ඒ නිසා තමයි එක්සත් ජාතීන්ගේ ඇතැම් ප්‍රඥප්තීන්වලට අපට කැමැත්තෙන් හරි අකැමැත්තෙන් හරි සමහර වෙලාවට එකඟ වන්න සිදුවන්නේ.

අද බොහෝ දෙනෙකු වීරයන් වාගේ කථා කළා. ගරු කථානායකතුමනි, ඒ කාලයේ සිටි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්වරිය අපේ රටට පැමිණි වෙලාවේ උද්ඝෝෂණ කරපු හැටි අපි දැක්කා. ඒ වෙලාවේ සමහරු එතුමියට විවාහ යෝජනා පවා ඉදිරිපත් කළා. එහෙම මැති ඇමතිවරු හිටපු ආණ්ඩුවක් තමයි පසුගිය කාලයේ තිබුණේ. ඒ කාලයේ ප්‍රජාතන්ත්‍රවාදය අබ මල් රේණුවක තරමටවත් සැලකුවේ නැහැ. අද අතුරුදහන්වුවන් පිළිබඳව අපි කථා කරන කොට උතුරු නැඟෙනහිර යුද්ධය නිසා සමහර විට ද්‍රවිඩ ජනතාව වෙන්න පුළුවන්, මුස්ලිම් ජනතාව වෙන්න පුළුවන්, ඒ වාගේම අපේ හමුදාවේ අය වෙන්න පුළුවන්, මේ සියලුදෙනා පිළිබඳව අපි අනිවාර්යයෙන්ම සැලකිලිමත් විය යුතුයි.

පසුගිය රජය කාලයේ මේ රටේ මාධ්‍ය නිදහස කොහොමද තිබුණේ කියලා අපි දන්නවා. එදා අපට මාධ්‍ය නිදහස ගැන කථා කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. එක්නැළිගොඩ වැනි අය අද ජීවතුන් අතර ඉන්නවාද, නැද්ද කියලා අපි දන්නේ නැහැ. ඒ බිරිඳට සහ දරුවන්ට අඩු ගණනේ එතුමා සම්බන්ධයෙන් මරණ සහතිකයක් දෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ; අඩු ගණනේ තුන් මාසේ දානය, අවුරුද්දේ දානය දෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ වාගේ ඉතාමත් අකාරුණික තත්ත්වයකට මේ රට පත් වෙලා තිබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

යම් තැනැත්තෙකු අයුතු ලෙස සිර භාරයට ගැනීම, රඳවා තබා ගැනීම, පැහැරගෙන යෑම, අපහරණය කිරීම, වෙනත් යම් ආකාරයකින් එම තැනැත්තාගේ නිදහස අහිමි කිරීම සම්බන්ධයෙන් මේ පනත් කෙටුම්පතින් කටයුතු කරනවා. මේ කාරණය බුදු දහම තුළ තිබෙන දෙයක් නේ. මේ රට බුදු දහමේ ආභාසය ලැබූ වසර 2,500ක ඉතිහාසයක් තිබෙන රටක්. එවැනි ශිෂ්ටාචාරයක් තිබුණු රටක බුදු දහම තුළින්; සිංහලකම තුළින් මේ සියල්ල අපට උගන්වා තිබෙනවා. සමහර වෙලාවට සිංහල ජනතාව මුස්ලිම් ජනතාව පිළිබඳව වැරදි කෝණයකින් බලා අද මේ රටේ යම් යම් ප්‍රශ්න ඇතිවන්න හේතු වුණේ එවැනි දේවල් පිළිබඳව සැලකිලිමත් නොවීම නිසා වෙන්න පුළුවන්. අවුරුදු 400ක පමණ කාලයක් තිස්සේ අපේ රට ඉංග්‍රීසින්ගේ, පෘතුගීසින්ගේ, ලන්දේසීන්ගේ යකඩ සපත්තුවට පෑගෙමින් තිබුණා. අපි නිදහස ලබා ගන්න කොට මහාමාන්‍ය ගරු ඩී.එස්. සේනානායක මැතිතුමා සමඟ සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, බර්ගර් සියලු ජන කොටස් බොහොම හොඳින් එකට වාඩි වෙලා කටයුතු කළා. ඒ නිසා අපේ රටේ ජීවත් වූ ඒ සහෝදර ජාතීන්ගේ එක ලේ බිඳක් සොලවන්නේ නැතුව අපේ රට ගොඩ නඟන්න එදා අපට පුළුවන්කම ලැබුණා.

"යහ පාලනය" කියන්නේ වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම මානව හිතවාදිව කටයුතු කිරීමයි. යම් තැනැත්තකු සිර භාරයට ගැනීම, රඳවා තබා ගැනීම, පැහැර ගෙනයාම, අපහරණය කිරීම හෝ නිදහස අහිමි කිරීම පිළිගැනීම ප්‍රතික්ෂේප කරන හෝ යම් තැනැත්තකුගේ වර්තමානයේ සිටින ස්ථානය වලංගු හේතුවක් නොමැතිව හෙළිදරවු කිරීමට අසමත් වන යම් තැනැත්තෙක් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ වරදට වරදකරු වනවා.

අද සමහර පොලිසිවල සිදුවන සිදු වීම් ගැන අපි දන්නවා. සමහර පුද්ගලයන් අල්ලාගෙන යනවා. සමහර විට ඔවුන් ඉන්නවාද, මළාද කියලා පවුලේ අයට දැන ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඇතැම් නීතිරීති වෙනස් වන ආකාරයට ලෝකයාත් එක්ක අපට ජීවත් වෙන්න සිද්ධ වනවා. එතකොට අපේ රටටත් යම්කිසි යහ පාලන වැඩ පිළිවෙළකට යන්න පුළුවන් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඔබතුමාගේ මූලිකත්වයෙන් මන්ත්‍රීවරුන් සඳහා සදාචාර සම්පන්න චර්යා ධර්ම සංග්‍රහයක් නිර්මාණය කරලා තිබෙනවා. මා හිතන හැටියට ඒ චර්යා ධර්ම සංග්‍රහය තුළ බොහෝ දේවල් ගැබ්වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව තුළ වුණත් මන්ත්‍රීවරුන් හැසිරෙන ආකාරය දිහා බැලුවාම, මොන චර්යා ධර්මයක්ද කියලා හිතෙනවා. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්නේ නැහැ. පැමිණීම පිළිබඳව විතරක් නොවෙයි, ඇඳුම පිළිබඳවත් කටයුතු කරන්න සිද්ධ වනවා.

සමහර මන්ත්‍රීවරුන්ගේ ඇඳුම් පිළිබඳව අපට හිතන්න සිද්ධ වනවා. සමහර මන්ත්‍රීවරුන්ගේ ඇඳුම දිහා බැලුවාම "මන්ත්‍රීවරයෙක්" කියලා කියන්න ලජ්ජයි. එම නිසා කථානායකවරයා හැටියට ඔබතුමා මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම සංග්‍රහයක් ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.45]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී දෙමළ ජාතික සන්ධානයේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ රටටත්, අපේ ආරක්ෂක හමුදාවන්ටත් විරුද්ධව බරපතළ, හානිකර ප්‍රකාශ රාශියක් සිදු කළා. මේ හැම කරුණක්ම ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වාර්තා වනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නායකත්වයෙන් පවතින මේ පාර්ලිමේන්තුව තුළ අපේ රටට විරුද්ධව, අපේ රටේ ආරක්ෂක හමුදාවන්ට විරුද්ධව සිදු කරන මෙවැනි නින්දිත ප්‍රකාශ පිළිබඳව, මේ ආණ්ඩුව නියෝජනය කරන කිසිම කෙනකු උත්තර නොදීම පිළිබඳව මා බලවත් සේ කනගාටු වනවා. විශේෂයෙන්ම යුද්ධයේ අවසාන කාල පරිච්ඡේදයේදී නඩේසන්, පුලිදේවන්, බාලචන්ද්‍රන් සම්බන්ධයෙන් සිදු වූ දේවල් ගැන දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු දුක් සෝ සුසුම් හෙළනවා. ඇත පළාත්වල, කහටගස්දිගිලියේ සිට අනුරාධපුරයෙන් එහාට අහිංසක දරුවන් පැහැර ගෙන ගිය විධිය, අහිංසක දරුවන්ගේ ලේ ගත් විධිය, යුද හමුදාවේ සාමාජිකයන් අත් අඩංගුවට අරගෙන හිරබාරයේ තබාගෙන වධ දුන් විධිය ගැන කථා කරන්න එක්සත් ජාතික පක්ෂයට හෝ මේ ආණ්ඩුව නියෝජනය කරන කිසිම මන්ත්‍රීවරයකුට අද හැකියාව නැති එක ගැන මා ඉතාම කනගාටු වනවා. රටට විරුද්ධව දේශ ද්‍රෝහී ප්‍රකාශ කරන්නට, ව්‍යවස්ථාපිත වශයෙන් ලැබූ ජන වරම විකෘති කරලා, කෘත්‍රිමව ලැබූ විපක්ෂ නායක ධුරයට වැඩි වෙලාවක් දීලා, රටට බනිනවන, මාතෘ භූමියට බනිනවන පාර්ලිමේන්තුවක් බවට ඔබතුමාගේ නායකත්වයෙන් යුත් මේ පාර්ලිමේන්තුව පත් කරලා තිබෙනවා. මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් අපි සියලුදෙනාම සහෝදරත්වයෙන් ජීවත් වන්න ඕනෑ. කිසි කෙනකුට අබ මල් රේණුවක, අංශු මාත්‍රයක හානියක් වනවාට මනුෂ්‍යයන් විධියට අපි කැමැති නැහැ. එය සිංහල වෙන්න පුළුවන්, දෙමළ වෙන්න පුළුවන්, මුස්ලිම් වෙන්න පුළුවන්. හැබැයි අද මේ රටේ ආරක්ෂක හමුදාවන්ට චෝදනා කරනවා. එදා එල්ටීටීඊ සංවිධානය පාසල් දරුවන් පැහැරගෙන ගියා; ළමා සොල්දාදුවන් බලහත්කාරයෙන් බඳවා ගත්තා. නමුත් මේවා ගැන කථා කරන්න ආණ්ඩුව නියෝජනය කරන කොන්ද පණ තිබෙන මන්ත්‍රීවරයෙක් අද නැහැ . රටට බණිනවා, මාතෘ භූමියට බණිනවා. රටේ ඒකීයභාවය ආරක්ෂා කරන බවට දිවුරුම් දුන් හමුදාවන්ට බණිනවා; යුද අපරාධකාරයන් කියලා බණිනවා. මේ ආණ්ඩුවට තිබෙන්නේ දේශ ද්‍රෝහිකම් විතරයි. ජාතිවාදීන් කියලා අර්ථ නිරූපණය කරන්න පුළුවන්. කොටි සංවිධානයෙන් වෙච්ච අපරාධ පිළිබඳව කථා කරන්නේ නැත්තේ ඇයි?

ගරු කථානායකතුමනි, ඔබතුමා විසින් අත්සන් තබනු ලබන මේ පනත් කෙටුම්පතින් එල්ටීටීඊ සංවිධානය විසින් සිදු කරන ලද අතුරුදහන්වීම් පිළිබඳව කිසිම ක්‍රියාමාර්ගයක් ගන්න බැහැ. ඔබතුමා අත්සන් තබනු ලබන මේ පනත් කෙටුම්පතින් පුළුවන් වන්නේ, මේ රටේ ආරක්ෂක හමුදා ඇතුළු නිල හමුදාවන්ට

වගකීම් පවරන්න විතරයි. ඒ නිසා ඔබතුමා අත්සන් කරන්නේ ජාතියේ මළගමටයි. රටට හානිකරන දේශ ද්‍රෝහීන්ට විරුද්ධව කිසිම පියවරක් ගන්න මේ පනත් කෙටුම්පතින් හැකියාවක් නැහැ. ඒ නිසා තමයි දකුණු ආසියාවේ කිසිම රටක් මේ ජාත්‍යන්තර සම්මුති පනතට අත්සන් කරන්නේ නැත්තේ. බ්‍රිතාන්‍ය අගමැතිනි තෙරේසා මේ කියනවා, "මගේ රටේ යුද අපරාධ ගැන කථා කරන්න එන්න එපා"යි කියලා.

අපේ රටේ නායකයන්ට කොන්ද පණ නැහැ. ඔවුන්ට කොන්දක් නැහැ එහෙම ප්‍රකාශයක් කරන්න. නිවට ජිනීවා යෝජනාවලදී තමුන්ගේ රටට විරුද්ධව යෝජනා සම්මත කරන්න සම අනුග්‍රාහකත්වය දරපු නායකයන් තමයි මේ ආණ්ඩුව තුළ ඉන්නේ. ඒ ජිනීවා යෝජනාවල ක්‍රියාවලිය තමයි මේ අකුරක් නැර ක්‍රියාත්මක වෙන්නේ. එහි පළමුවැනි පියවර හැටියට තමයි අතුරුදහන් වූවන්ගේ කාර්යාලය පිහිටුවන්නේ. රටට හැම දාම ද්‍රෝහී වෙච්ච, ඒ දේශ ද්‍රෝහී බලවේගය තමයි අද අතුරුදහන් වූවන්ගේ ලේකම් කාර්යාලයේ නියෝජිතයන් බවට පත් කරලා තිබෙන්නේ.

එංගලන්තයේ තෙරේසා මේ ගරු අගමැතිතුමිය කියන්නේ, "මගේ රටට විරුද්ධව යුද අපරාධ පිළිබඳව කථා කරන්න එන්න එපා" කියලායි. තමුන්නාන්සේලා ආදර්ශයට ගන්න යුරෝපයේ, මානව හිමිකම් අගය කරන එංගලන්තයේ නායිකාව තමයි මේ ප්‍රකාශය කරන්නේ. සිංහල වෙන්න පුළුවන්, දෙමළ වෙන්න පුළුවන්, මුස්ලිම් වෙන්න පුළුවන් මේ රටේ අහිංසක ළමයි ගස්වල ගහලා මරපු කොටි ගැන -නඩේසන් ගැනයි, බාලචන්ද්‍රන් ගැනයි, පුලිදේවන් ගැනයි- කථා කරන්න අද කවුරුවත් නැහැ. අවසාන සටන් ක්‍රියාවලියේදී ආරක්ෂක හමුදාව ජීවිත පරිත්‍යාග කරලා කටයුතු කළා. ඔවුන් ඒ අවස්ථාවේදී බර අවි පාවිච්චි කළා නම් විශාල පිරිසක් මිය යන්න ඉඩකඩ තිබුණු බව අපි දන්නවා. අපේ රටේ හමුදාව බර අවි ආයුධ භාවිත කරන්නේ නැතිව තම ජීවිත විශාල ප්‍රමාණයක් පරිත්‍යාග කළා.

මේ පනත් කෙටුම්පතට විරුද්ධව විශාල ජන මතයක් ගොඩ නැඟී තිබුණු බව අපි දන්නවා. අතුරුදහන් වූවන්ගේ කාර්යාලයක් මේ රටේ ආරම්භ වෙනවා. අද ඒ පිළිබඳ ජන මතයක් නැහැ. අද රටේ හැම ක්ෂේත්‍රයකම උද්ඝෝෂණ පැන නැඟිලා තිබෙනවා. මහපොළ ආධාරය නැතිව -මහපොළ අරමුදල හොරකම් කරලා- විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් උද්ඝෝෂණය කරනවා. රටේ දේශීය කර්මාන්තකරුවන් උද්ඝෝෂණය කරනවා. රටේ ගොවි ජනතාව පොහොර ටික නැතිව, වතුර ටික නැතිව අද උද්ඝෝෂණය කරනවා. අද රජයට විරුද්ධව ජන මතයක් ගොඩ නැඟිලා තිබෙනවා. මේ ගොඩ නැඟෙන ජන මතය යටපත් කරන්න පුළුවන් වෙන්නේ හදිසි නීතිය දාලා; බයිනෙත්තුව පෙන්වලා. සාම්ප්‍රදායිකව තමුන්ගේ පරණ කෙරුවාවෙන්ම තමයි මේ ජන මතය යටපත් කරන්න පුළුවන් වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
රටේ ජන වර්ග අතර ගැටීම් ඇති කරලා, මේ රට තුළ ගොඩ නැඟෙන ආණ්ඩු විරෝධී බලවේගය යටපත් කරන්න හදනවා. මේ ආණ්ඩුවට විරුද්ධව ජනතාව මහ පාරට බහිනවා. ඔවුන් මහ පාරට බහින එක වළක්වන්න දරන උත්සාහයක් තමයි අද මේ ආණ්ඩුව කරන්නේ.

මේ ප්‍රඥප්තිය විවිධ රටවල්වලට ගෙනා බව අපි දන්නවා. මේ ප්‍රඥප්තිය ඉන්දියාවට ගෙනාවා; ඉන්දියාව එය ප්‍රතික්ෂේප කළා. බංග්ලා දේශයට ගෙනාවා; බංග්ලා දේශය එය ප්‍රතික්ෂේප කළා. දකුණු ආසියාවේ රටවල් සියල්ල ප්‍රතික්ෂේප කළා. හැබැයි, තමුන්ගේ පැවැත්ම සඳහා බටහිර රූකඩ ක්‍රියා පිළිවෙළම අනුගමනය කරමින් ඒ වෙත යන්න ආණ්ඩුවට අවශ්‍යයි.

අද රටේ ගින්නක් ඇවිළෙනවා. ඒ ගින්නට සිංහල, දෙමළ, මුස්ලිම් අපි සියලු දෙනාම විරුද්ධයි. මේ රට සාමකාමී රටක්. මේ රට තුළ යහ පැවැත්මෙන් ජීවත් වෙන්න පුළුවන් විධියට හැම මිනිහෙකුටම අයිතිවාසිකම් තිබෙනවා. ඒ ඇවිළෙන ගින්නට පිදුරු දැම්මේ -බේරුවල සිද්ධියට ගින්න දැම්මේ- තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ඇතැම් අය බව අපි දන්නවා. හලාල් උද්ඝෝෂණය හරහා මේ රටේ ජන වර්ග අතර වෛරය ඇති කරන්න එක්සත් පක්ෂය නියෝජනය කරන ඇමතිවරු තමයි දේශන පවත්වමින් මේ ජාතිවාදී කෝලාහල ඇති කරන්නේ. ජනතාව සාමකාමීව විසුරුවා හරින්න පුළුවන් හැකියාව පොලීසියට ලබා දීලා තිබියදී, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය නායකයන් අද රට තුළ වෛරය ඇති කිරීම සඳහා මේ දේශපාලන කුමන්ත්‍රණයට හවුල්වෙලා සිටිනවා. ඒ නිසා රට ගිනි තියන්නේ නැතිව ගෙදර යන්න කියලා අපි ආණ්ඩුවට කියනවා. මට කථා කරන්න වේලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ගරු අබ්දුල්ලාහ් මහරූෆ් මන්ත්‍රීතුමා.

[ပ.ව. 5.53]

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
கௌரவ சபாநாயகர் அவர்களே, இன்று நான் மனவேதனையுடன் எனது உரையினை ஆற்றவேண்டியவனாக இருக்கின்றேன். காணாமலாக்கப்பட்டவர்கள் பற்றி இந்த மேலான சபை சிந்தித்துக்கொண்டிருக்கின்றது. மக்ஸ்வெல் பரணகம ஆணைக்குழுவினது அறிக்கையின் பிரகாரம் காணாமலாக்கப்பட்டோரின் தொகை இருபதாயிரம் என்று கூறப்பட்டது. காணாமலாக்கப்பட்டோரின் தொகை ஓர் இலட்சம் என்றும் அறுபதாயிரம் என்றும் நாற்பதாயிரம் என்றும் வெவ்வேறு எண்ணிக்கையில் கூறப்பட்டபோதிலும் குறித்த குழுவினது அறிக்கையின்படி, அது மேலும் குறைவடைந்து இருபதாயிரமாக மாறியுள்ளது. எவ்வாறாயினும், இன்று எமது முஸ்லிம் சமூகம் மிகக் கேவலமான முறையிலே தாக்கப்பட்டுக்கொண்டிருக்கின்றது. அவர்களுடைய சொத்துக்களும் உடைமைகளும் சூறையாடப்படுகின்றன. நான் பேசிக்கொண்டிருக்கின்றபோதும்கூட கண்டியிலே வட்டகெதர, உடத்தலவத்த என்ற பகுதிகளில் அசம்பாவிதங்கள் இடம்பெற்றுக்கொண்டிருக்கின்றன. கட்டுகஸ்தோட்டையிலுள்ள 'சிட்டி மெக்ஸ்' என்ற பாரிய துணிக்கடை எரிந்துகொண்டிருக்கின்றது.

இன்று நாங்கள் காணாமலாக்கப்பட்டவர்கள் சம்பந்தமாகப் பேசிக்கொண்டிருக்கிறோம். 1983, 1990 மற்றும் 2009ஆம் ஆண்டுகளில் நடைபெற்ற இனப் படுகொலைகள், அழிவுகள் மற்றும் ஆட்கள் காணாமலாக்கப்பட்ட சம்பவங்களினால் இன்று எமது நாடு சர்வதேசத்திற்கு முகம்கொடுக்க முடியாத அளவுக்குத் தலைகுனிந்து நிற்கின்றது. ஜெனீவாவிலுள்ள ஐ.நா. மனித உரிமைகள் பேரவையிலும் இந்த நாட்டினுடைய மதிப்பு, இன்று கீழிறங்கிக் கொண்டிருக்கின்றது. அதேநேரம் இந்த நாட்டின்

[ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා]

தேயிலையைக் கொள்வனவு செய்வதன்மூலம் இந்த நாட்டுக்கு அந்நியச்செலாவணியை ள்ளிக்கொடுத்துக்கொண்டிருக்கின்ற, தேவையான அளவு பெற்றோலிய உற்பத்திகளை வழங்கி இந்த நாட்டின் பொருளாதார அபிவிருத்தியில் பாரிய பங்களிப்பைச் செய்கின்ற அரபு மற்றும் முஸ்லிம் நாடுகளின் தலைவர்கள் இன்று இந்த நாட்டில் இடம்பெறுகின்ற அசம்பாவித நிகழ்வுகளைப் பார்த்து வெட்கித்துப் போயிருக்கின்றார்கள்.

இந்த நாட்டின் பாதுகாப்புப் படையினரும் பொலிஸாரும் பார்த்துக்கொண்டிருக்கும்போதே எமது சமூகத்தின் உயிர்களும் உடைமைகளும் பறிக்கப்பட்டுக்கொண்டிருக்கின்ற கேவலமான ஒரு நிலைமை இன்று காணப்படுகின்றது. இவ்வாறான சம்பவங்கைள எவ்வாறு தடுக்கலாம் என்பது பற்றி எல்லாம் சர்வதேசத்திலே புலனாய்வுத்துறையினர் பல்வேறு விதமாகச் சிந்தித்துக் கொண்டிருக்கின்றபோது, எமது புலனாய்வுத்துறை செயலற்றதாக, செத்துப் போனதாக - மடிந்து போனதாகக் காணப்படுகின்றது. இதனால்தான் இன்று நாங்கள் மிகக் கேவலமான முறையிலே தாக்கப்பட்டுக் கொண்டிருக்கின்றோம். அன்று அளுத்கம, தம்புள்ள, அநுராதபுரம், ஜிந்தோட்டை, அம்பாறை என்றும் நேற்று முன்தினம் திகன, தெல்தெனிய என்றும் எமது முஸ்லிம் சமூகம் பாதிக்கப்பட்டிருக்கிறது. இந்தத் தாக்குதல்களினால் அழிக்கப்பட்டிருக்கின்ற முஸ்லிம்களுடைய எத்தனையோ வீடுகள் மற்றும் கடைகளைப் பற்றியும் பறிக்கப்பட்ட எத்தனையோ உயிர்களைப் பற்றியும் நாங்கள் சிந்தித்துக்கொண்டிருக்கின்றோம்.

அங்கு அப்துல் பாஸித் என்ற ஒரு சகோதரர், தாக்குதலிலிருந்து தப்புவதற்காக தாய், தகப்பன் மற்றும் குடும்பத்தினரை வீட்டிலிருந்து வெளியேற்றிவிட்டபோதிலும் அவர் வெளியே வரமுடியாதவாறு அடைத்துவைக்கப்பட்ட நிலையில் தீக்கிரையாக்கப்பட்டிருக்கின்றார் என்பது உங்களுக்குத் தெரியும். முதலிலே, குமாரசிங்க என்ற ஒரு சகோதரரின் கொலையுடன் சம்பந்தப்பட்டதாகக் கூறப்பட்டுக் கைது செய்யப்பட்ட 4 முஸ்லிம் சகோதரர்களுக்கும் உரிய தண்டனை வழங்கப்பட வேண்டுமென்று கூறிய அந்தச் சமூகத்தினர், கொலையுண்டவரின் குடும்பத்தவருக்கு 15 இலட்சம் ரூபாயைக் கொடுப்பதற்குத் தீர்மானித்திருந்தனர். அந்த வேளையிலே, திட்டமிட்டு இந்தச் சதியை அங்கு அரங்கேற்றியிருக்கிறார்கள்.

மஹிந்த அரசினை 4 வருடங்களிலே வீட்டுக்கு அனுப்பியது இனவாத குரோத சக்திகள். அன்று செயற்பட்ட ஞானசார தேரருடைய இன்றைய பத்திரிகை அறிக்கையைப் பாருங்கள்! “கொன்றால் கொல்லுவோம்” என்று கூறுகின்ற அந்தத் தேரருக்கு நாம் ஒன்றைக் கூறுகின்றோம். அதாவது, ஆயிரம் வருடங்களுக்கு மேலாக வாழ்ந்துகொண்டிருக்கின்ற முஸ்லிம் சமூகம் எந்தவொரு ‘பன்சலை’யையும் அழிக்கவில்லை; எந்த ஒரு பௌத்த கலாசார பீடத்தையும் அழிக்கவில்லை.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have two more minutes.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
இருந்தபோதிலும், சம்பந்தப்பட்டவர்கள் இந்த முஸ்லிம் சமூகத்தின் உணர்வுகளை மதிக்க முடியாதவர்களாக இருக்கிறார்கள்.

சிரேஷ்ட உறுப்பினர்களான நானும் அலி ஸாஹிர் மௌலானா போன்றவர்களும் 20 வருடங்களுக்கு மேலாக இந்தச் சபையிலே இருந்தாலும், நாங்கள் எங்களுடைய மாவட்டங்களிலே கௌரவிக்கப்பட்டவர்கள் அல்லர்; எந்தவித சலுகையும் எங்களுக்கு வழங்கப்படவில்லை; பொருளாதார ரீதியாககவோ, அபிவிருத்தி ரீதியாகவோ, வேலைவாய்ப்பு ரீதியாகவோ நாங்கள் கவனத்திற்கொள்ளப் பட்டவர்களும் அல்லர். அவ்வாறிருந்தும் எங்களுடைய ஆட்சியாளர்கள் என்று கூறிக்கொண்டு மேதகு ஜனாதிபதி அவர்களையும் மாண்புமிகு பிரதம மந்திரி அவர்களையும் நாங்கள் கீழ்த்தரமாக விமர்சித்தால், அதனையிட்டு இந்தச் சபையிலே யாரும் ஆத்திரமடையத் தேவையில்லை; ஆத்திரப்படவும் கூடாது. காரணம், திருகோணமலை மாவட்டம் சார்பிலே இந்த நாட்டினுடைய ஜனாதிபதியை உறுதி செய்தவன் நான். அன்று கௌரவ சம்பந்தன் அவர்களும் சகோதரர் ரவூப் ஹக்கீம் அவர்களும் அது குறித்த முடிவை அறிவிக்காதிருந்த ஒரு சூழலிலே, இந்த ஆட்சிக்காக முதலில் உதவி புரிந்தவர்கள் நாங்கள். இன்று எங்களுடைய மனம் புண்பட்டு வேதனைப்பட்டுக்கொண்டிருக்கின்றது. ஏனெனில், இன்று முஸ்லிம் சமூகத்தினர் நாடளாவிய ரீதியில் தூக்கத்தை இழந்திருக்கின்றார்கள். “நீங்கள் எதற்காகப் பாராளுமன்றத்திற்குச் செல்கின்றீர்கள்? இராஜினாமா செய்துவிட்டு வீட்டுக்கு வாருங்கள்!” என்று அவர்கள் கூறுகிறார்கள்.

எமது சமூகம் ஒரு வரலாற்றைக் கொண்டது. பக்கத்திலிருக்கின்ற இந்திய நாட்டை ஏறக்குறைய 840 வருடங்கள் முஸ்லிம்களே ஆண்டிருக்கின்றார்கள். ஆனால், அங்கு எந்தக் கோயிலும் அழிக்கப்படவில்லை. ஆயிரக்கணக்கான வருட வரலாற்றைக் கொண்ட இந்த முஸ்லிம் சமூகமானது, ஆட்சியாளர்களுக்கும் மன்னர்களுக்கும் உறுதுணையாக இருந்தது மட்டுமல்ல, இந்த நாட்டினுடைய விடுதலைக்காகவும் போராடியிருக்கின்றது.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please conclude your speech.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
கௌரவ சபாநாயகர் அவர்களே, அரை நிமிடத்தில் என்னுடைய பேச்சை முடித்துக்கொள்கின்றேன்.

இன்று இங்கு சிறந்த முறையில் செயற்படக்கூடிய பல அமைச்சர்கள் இருக்கின்றார்கள். கௌரவ சரத் பொன்சேகா போன்றவர்களுக்குச் சட்டம், ஒழுங்குக்குப் பொறுப்பான அமைச்சைக் கொடுத்துப் பாருங்கள்! அவர் இந்தப் பிரச்சினையை உடனடியாக நிறுத்தக்கூடிய சக்தியைப் பெற்றிருக்கின்றார். இன்றைய நிலையில் பாதுகாப்புப் படையினர் மற்றும் பொலிசார் கையாலாகாதவர்களாக இருக்கின்றனர். அதாவது, அவர்கள் பார்த்துக் கொண்டிருக்கின்றபோதே முஸ்லிம்களின் சொத்துக்கள் அழிக்கப்பட்டிருக்கின்றன. எனவே, இந்தச் செயல்கள் உடனடியாக நிறுத்தப்பட வேண்டும் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next speaker is the Hon.Gnanamuthu Srineshan. You have five minutes.

[பி.ப. 5.58]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ சபாநாயகர் அவர்களே, வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்படுதலிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் என்கின்ற அடிப்படையில் கொண்டுவரப்பட்ட இந்தச் சட்டமூலம் தொடர்பாக எனது கருத்துக்களையும் இங்கு பதிவு செய்ய விரும்புகின்றேன். "வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்படுதலிலிருந்து ஆட்களைப் பாதுகாத்தல்" என்ற வாசகத்தைப் பார்க்கின்றபோது எதிர்காலத்தில் வலுக்கட்டாயமாகக் காணாமலாக்கப்படுவதிலிருந்து ஆட்களைப் பாதுகாத்தல் என்கின்ற அர்த்தத்தைக் கொடுக் கின்றதே ஒழிய, கடந்த காலத்தில் காணாமலாக்கப் பட்டவர்களுக்கு என்ன நடக்கப் போகின்றது என்பது பற்றித் தெளிவில்லாத ஒரு நிலைமையே காணப்படுகின்றது. அதேநேரம், காணாமலாக்கப்பட்டவை இந்த நாட்டின் பெறுமதியான உயிர்கள் என்பதை நாங்கள் மறந்துவிடக் கூடாது. ஆடுகள், மாடுகள், கோழிகள், குருவிகள் என்பன பற்றி நாங்கள் பேசவில்லை. மனிதர்கள் காணாமலாக்கப்பட்டது பற்றித்தான் பேசுகின்றோம். அந்த அடிப்படையில் காணாமலாக்கப்பட்டவர்கள் என்று ஒரு பகுதியினரும் காணாமலாக்கியவர்கள் என்று ஒரு பகுதியினரும் காணப்படுகின்றார்கள். அத்துடன் காணாமலாக்கப்பட்டவர்களைத் தேடுகின்றவர்கள் என்று இன்னுமொரு பகுதியினர் காணப்படுகின்றார்கள். இவற்றைவிட, காணாமலாக்கியவர்களை, அந்தக் குற்றவாளிகளைப் பாதுகாக்க வேண்டும் என்று நினைக்கின்ற மேலுமொரு பகுதியினரும் இருக்கத்தான் செய்கின்றார்கள்.

